# 1

# ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

## 1.1 සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකා ආර්ථිකය නිදහසින් පසු ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ වඩාත් අසීරුතම කාලපරිච්ඡේදය සඳහා 2022 වසරේ දී මුහුණ දුන් අතර, පැවති දැඩි ආර්ථික දුෂ්කරතා හේතුවෙන් මහජන නොසන්සුන්වීම් මෙන්ම දේශපාලන කැළඹීම් ද ඇති විය. එවකට පැවති දුර්වල ආර්ථික තත්ත්වයන් තවදුරටත් පිරිහීම වැළැක්වීම සඳහා රජය සහ මහ බැංකුව මගින් කඩිනම් මෙන්ම මනාව සම්බන්ධීකරණය වූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය විය. මෙම ප්‍රතිපත්ති පිළියම් ක්‍රියාමාර්ග මගින් විශාල පිරිසකට කෙටි කාලීනව බලපෑම් ඇති වුවද, පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට වඩාත් අහිතකර අධි උද්ධමනය, ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් පරිහානියට පත්වීම සහ ශ්‍රී ලංකාව ලෝකයේ සෙසු රටවලින් සම්පූර්ණයෙන්ම දුරස්ථ වීම වැනි දැඩි ආර්ථික අස්ථාවරවීම් මගින් ඇති විය හැකි අයහපත් ප්‍රතිඵලවලින් ආර්ථිකය සහ එහි කොටස්කරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය විය. මෙම ප්‍රයත්නයන්හි යහපත් ප්‍රතිඵල 2022 වසරේ අග භාගයේ සිට දක්නට ලැබුණි. සමාජ-ආර්ථික ස්ථායීතාව නැවත ස්ථාපිත කිරීම ඉලක්ක කරගත් යම් ස්ථායී සමතුලිතයකට කෙටි කාලීන වශයෙන් ළඟා වීමට ශ්‍රී ලංකාව සමත් වූ අතර, විදේශීය මූල්‍ය ආයතනවලින් අපේක්ෂිත සහාය ලැබීම ද ආරම්භ විය.

දිගු කාලයක් මුළුල්ලේ පවතින අයවැය හිඟය සහ විදේශීය ජංගම ගිණුමෙහි හිඟය යන ද්විත්ව හිඟයන් හා සමගාමීව, තිරසාර නොවන සාර්ව ආර්ථික ආකෘතියකට අනුගතව සිටි ශ්‍රී ලංකා ආර්ථිකය, ගෝලීය සහ දේශීය මූලාශ්‍ර මගින් පැන නැගුණු අවදානම් රාශියකට මුහුණ දීම හේතුවෙන්, 2022 වසරේ මුල් කාලය වන විට එහි සියලුම ආර්ථික ස්වාරක්ෂක භාවිත කොට අවසන් විය. දුර්වල ප්‍රතිපත්තිමය තීරණ ගැනීම් හේතුවෙන් තවදුරටත් උග්‍ර වූ ආර්ථිකයේ දීර්ඝ කාලීනව මුල් බැස ගත් දුර්වලතා මගින් රට බහුවිධ ව්‍යසනයක් වෙත යොමු කරන ලදී. නුසුදුසු කාලයක දී සිදු කළ බදු අඩු කිරීම්, කිසිදු පූර්ව සූදානමකින් තොරව කාබනික කෘෂිකර්මාන්තය වෙත කඩිනමින් යොමු වීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග, නොකැළැල් ණය සේවාකරණ වාර්තාවක් එලෙසම පවත්වා ගැනීමේ නිරර්ථක උත්සාහයන් මධ්‍යයේ රටේ නිල සංචිත අඩු වීම, විනිමය අනුපාතිකයෙහි ගැළපීම් ප්‍රමාද වීම මෙන්ම පූර්ව අනතුරු ඇඟවීම් කෙරෙහි අවධානය යොමු නොකිරීම යනාදිය හේතුකොට ගෙන සමස්ත ආර්ථිකයට අතිවිශාල කම්පන ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස, උග්‍ර විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය සහ විනිමය අනුපාතිකය මත පීඩන සමඟ ගෙවුම් ශේෂය මත වූ පීඩන ඉහළ යෑම, ජීවනෝපායන් විශාල වශයෙන් අහිමි වීම මධ්‍යයේ උද්ධමනය අඛණ්ඩව ඉහළ යෑම හා ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම, රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා විශාල වීම, රාජ්‍ය ණය තිරසාර නොවන මට්ටම් කරා ළඟා වීම හා අවදානම් අධිමිල විශාල ලෙස ඉහළයෑම, ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් දැඩි ලෙස පහත වැටීම හේතුවෙන් විදේශ මූල්‍යනය වෙත වූ ප්‍රවේශය සීමා වීම, සමාජ-ආර්ථික හා සමාජ-දේශපාලනික අර්බුද පෙර නොවූ අන්දමින් උත්සන්න වීම සහ ව්‍යාපාරික විශ්වාසය ශීඝ්‍රයෙන් පහළ යෑම ඇතුළු ගැටලු රැසක් හේතුවෙන් ආර්ථිකය දැඩි බලපෑමකට ලක් විය. අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟ වීම හා සලාකකරණය, ජීවන වියදම හා නිෂ්පාදන පිරිවැය අධික ලෙස ඉහළ යෑම සහ සුබසාධනය හා ජීවනෝපායන් අහිමිවීම් මධ්‍යයේ ව්‍යාපාර මෙන්ම සාමාන්‍ය ජනතාව ද එක සේ දැඩි පීඩාවට පත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ශීඝ්‍රයෙන් වර්ධනය වූ සමාජ නොසන්සුන්තාව සමඟ නිර්මාණය වූ දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් ආර්ථිකය තවදුරටත් පසුබෑමට ලක්වීම වළක්වාලීම සඳහා ගත යුතු ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා නැවත නිර්ණය කිරීමේ කඩිනම් අවශ්‍යතාවක් මතු විය.


ගෙවුම් තුලනය මත වූ පීඩන ඉහළ යෑම මධ්‍යයේ, 2022 වසරේ මාර්තු මාසය ආරම්භයේ දී විනිමය අනුපාතිකයේ ක්‍රමානුකූල ගැළපීමක් සඳහා ඉඩ හරින ලදී. කෙසේ වෙතත්, ඉන් අනතුරුව විනිමය අනුපාතිකය වෙළඳපොළ මගින් තීරණය වීමට ඉඩ හැරීමත් සමඟ එය අධික ලෙස අවප්‍රමාණය වූ අතර, ඒ සඳහා වෙළඳපොළ සමපේක්ෂණ හැසිරීම් බොහෝ දුරට හේතු විය. උද්ධමන අපේක්ෂා පාලනය කිරීම ඉලක්ක කරගත් ශක්තිමත් සන්නිවේදන උපාය මාර්ගයක් අනුගමනය කරමින්, ඉල්ලුම් පීඩන මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී සැලකිය යුතු ලෙස මුදල් ප්‍රතිපත්තිය දැඩි කළ අතර, 2022 වසරේ අප්‍රේල් මාසය වන විට අවම මට්ටමක පැවති භාවිත කළ හැකි නිල සංචිත ප්‍රමාණය හමුවේ විනිමය අනුපාතිකය ස්ථාවර කිරීමට ක්‍රියාමාර්ග ගත්තේය. මේ අතර, රට වෙත විදේශ විනිමය ලැබීම් හිඟවීම සහ නිල සංචිත සැලකිය යුතු ලෙස අඩු වීම මධ්‍යයේ අත්‍යවශ්‍ය ආනයන සඳහා වූ ඉල්ලුම හැකි උපරිමයෙන් සපුරාලීම සඳහා මහ බැංකුව විසින් වෙළඳපොළ වෙත විදේශ විනිමය ලබා දෙන ලදී. තවද, අපනයන ඉපැයීම් රට තුළට ගෙන්වා ගැනීම හා එම මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම මත බලපත්‍රලාභී බැංකු විසින් මහ බැංකුව වෙත විදේශ විනිමය අනිවාර්යයෙන් විකිණීමේ අවශ්‍යතාවය අඛණ්ඩව පවත්වාගෙන යෑම මෙන්ම, විනිමය අනුපාතිකයෙහි දිනක් තුළ සිදු විය හැකි දැඩි විචලන අවම කිරීම සඳහා විනිමය අනුපාතිකය පිළිබඳ දෛනික මාර්ගෝපදේශ සැපයීම ආරම්භ කළ අතරම, අත්‍යවශ්‍ය ආනයනවලට ප්‍රමුඛතාව ලබා දීමට සහ සුදුසු පාලන ක්‍රියාමාර්ග හරහා ප්‍රාග්ධන ගලායෑම සීමා කිරීම සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුව අවශ්‍ය පියවර ගත්තේය. තවද, දැඩි සමාජ-ආර්ථික පීඩන මධ්‍යයේ, මහ බැංකුවෙහි ඵලදායී සන්නිවේදනය හා සමගාමීව අඛණ්ඩව මූල්‍ය අංශය අධීක්ෂණය කිරීම හා යෝග්‍ය නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම හමුවේ, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කෙරිණි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) සහාය ලබා ගැනීම සම්බන්ධයෙන් තීරණයකට එළඹීමට නොහැකිව මාස ගණනාවක් ගත කිරීමෙන් පසුව, 2022 වසර මුල දී ජා.මූ. අරමුදලේ සහාය ලබා ගැනීමට රජය පියවර ගැනීම ආරම්භ කළේය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය තිරසාර නොවන මට්ටමකට පැමිණ ඇති බව ජා.මූ. අරමුදල ඒ වන විටත් තක්සේරු කර තිබුණු බැවින්, ජා.මූ. අරමුදලෙන් ඕනෑම ආකාරයක මූල්‍ය සහායක් ලබා ගැනීමට පෙර රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා කටයුතු කළ යුතු විය. රාජ්‍ය ණය සේවාකරණය තවදුරටත් සිදු කළ නොහැකි තීරණාත්මක අවස්ථාවකට ළඟා වීමෙන් අනතුරුව, 2022 වසරේ අප්‍රේල් මස මැද භාගයේ දී තාවකාලික ක්‍රියාමාර්ගයක් වශයෙන්, ණය ගෙවීම අත්හිටුවන බව ප්‍රකාශයට පත් කරමින් විදේශ ණය, ප්‍රධාන වශයෙන් ද්විපාර්ශ්වික සහ වාණිජ ණය සේවාකරණය, රජය විසින් අත්හිටුවන ලද අතර, නොපියවූ ණය ප්‍රමාණය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා නිල සහ පෞද්ගලික ණය හිමියන්ගෙන් සහාය ඉල්ලා සිටින ලදී. මීට සමගාමීව, රජය විසින් රාජ්‍ය ආදායම ඉහළ නැංවීම, රජයේ වියදම් සීමා කිරීම, රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, ආනයන පාලන ක්‍රියාත්මක කිරීම හා බලශක්ති සැපයුම සීමා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ආරම්භ කළ අතර, අත්‍යවශ්‍ය වියදම් පියවා ගැනීමට මෙන්ම වඩාත් අවදානමට ලක්විය හැකි ජන කොටස් සඳහා සහාය සැපයීමට ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික හවුල්කරුවන්ගෙන් මූල්‍ය සහාය ලබා ගැනීමට ද කටයුතු කරන ලදී. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී විස්තීර්ණ ණය පහසුකමක් සඳහා රජය ජා.මූ. අරමුදල සමඟ කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවකට එළැඹුණු අතර, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන මගින්, අපේක්ෂිත තිරසාර ණය ඉලක්කවලට අනුකූලව ණය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා නිල ණය හිමියන්ගෙන් මූල්‍ය සහතිකවීම් ලබා ගැනීමට කටයුතු කළේය. 2023 වසරේ මාර්තු මාසයේ දී ජා.මූ. අරමුදලෙහි විධායක මණ්ඩලය විසින් මාස 48ක් සඳහා වූ දළ වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 3ක විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ අනුමත කරන ලද අතර, පසුගිය දශක කිහිපය තුළ රටේ වර්ධන විභවතාව සීමා කිරීමට මුල් වූ ව්‍යුහාත්මක බාධාවන් සඳහා පිළියම් යොදමින්, ශ්‍රී ලංකාව නැවත යථා තත්ත්වයට පත් කිරීම අරමුණු කරගත් ආර්ථික ගැළපුම් වැඩසටහනක් ද මෙයට ඇතුළත් වේ. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ තුළින් සාක්ෂාත් කරගැනීමට නියමිත බහුවිධ ඉලක්ක අතර ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය හරහා රාජ්‍ය ණයෙහි තිරසාර බව නැවත ස්ථාපිත කරගැනීම ආර්ථිකයේ ස්ථිරසාර වර්ධනයක් අත්කර ගැනීම සඳහා වූ ගමන් මගෙහි ප්‍රධාන සංධිස්ථානයක් වේ. කෙසේ වෙතත්, ණය ප්‍රතිව්‍යුහගතකරණය තුළින් කෙටි කාලීනව මූල්‍ය අංශය කෙරෙහි අභියෝග ඇති කළ හැකි බැවින් එවැනි අභියෝග සඳහා රජය සහ මහ බැංකුව පූර්වෝපායිකව පිළියම් යෙදීම තුළින් මූල්‍ය පද්ධති ස්ථායීතාවය ඉදිරි කාලයේ දී තවදුරටත් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

රජය සහ මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ප්‍රතිසංස්කරණ මේ වන විට සැලකිය යුතු සාර්ථකත්වයක් සාක්ෂාත් කරගෙන ඇත. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී උද්ධමනය ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ උපරිම මට්ටම දක්වා ඉහළ යෑමෙන් අනතුරුව සැලකිය යුතු අන්දමේ නිර්-උද්ධමන මාවතක් කරා ප්‍රවේශ වී ඇති අතර, 2022 වසරේ පළමු භාගයේ දී සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වූ විනිමය අනුපාතිකය ඉන් පසුව ස්ථායීව පවතිමින්

රූප සටහන 1.1

**2022 වසර තුළ සිදු වූ සමාජ-ආර්ථික අර්බුදය, ස්ථාවරත්වය යළි ඇති කිරීම සඳහා ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ එහි ප්‍රතිඵල**



*2023 වසරේ මුල් කාලයේ දී අතිප්‍රමාණය විය. තවද, විදේශීය ජංගම ගිණුමේ හිඟය මධ්‍යස්ථ මට්ටමක පැවති අතර, නිල සංචිත ප්‍රමාණය ක්‍රමානුකූලව ඉහළ නැංවිණි. එමගින් 2023 වසරේ මාර්තු මාසය ආරම්භයේ සිට විනිමය අනුපාතිකයේ නම්‍යශීලීබව යළි ස්ථාපිත කිරීමට හැකි විය. අපේක්ෂිත පරිදි විදේශ විනිමය ලැබීම් යථා තත්ත්වයට පත් වීම හා 2023 වසර තුළ දී ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් කිරීම සහ රාජ්‍ය මූල්‍ය අංශයේ පුළුල් ප්‍රතිසංස්කරණ මගින් ඉදිරියේ දී රටේ ආර්ථික අභිවෘද්ධිය ළඟාකර ගැනීම සඳහා මග පෑදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.*

*නිදහසින් පසු මෙරට ඉතිහාසය මුළුල්ලේම මෙවැනි සාර්ව ආර්ථික අර්බුද නැවත නැවතත් අත්විඳ ඇතත්, රටක් වශයෙන් තවමත් අවබෝධ කර ගැනීමට අපොහොසත් වූ බොහෝ පාඩම් පිළිබඳව 2022 වසරේ දී ඇති වූ මෙම සමාජ-ආර්ථික අර්බුදය මගින් අවධාරණය කර ඇත. දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ අවශ්‍යතාව; නිසි සැලැස්මකින් තොරව සිදු කරනු ලබන ප්‍රතිපත්ති අත්හදාබැලීම්වල අහිතකර බලපෑම්; ඉදිරි දැක්මක් නොමැති ජනප්‍රිය ප්‍රතිපත්තිවල අයහපත් සුබසාධන බලපෑම් මෙන්ම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි ප්‍රමාද වීම්, සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්ති විශ්ලේෂණ නොසලකා හැරීම්, මනාව ස්ථාපිත ආර්ථික මූලධර්ම පිළිබඳ අවධානය යොමු නොකිරීම හා විශේෂඥ අදහස් නොසලකා හැරීම්වල ඇති පිරිවැය, මෙම ආර්ථික අර්බුදය මගින් නැවත අවධාරණය කර ඇත. ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ එකවර සිදු කිරීම තුළින් පැන නැගුණු පිරිවැය සාමාන්‍ය ජනතාවට සහ ව්‍යාපාරවලට විශාල වශයෙන් දැරීමට සිදු විය. මෙම පසුබිම තුළ, පසුගිය දශක හත හමාරකට වඩා වැඩි කාලයක් පුරාවට ආර්ථිකය තුළ මුල් බැසගත් ව්‍යුහාත්මක ගැටලු විසඳීම සඳහා මේ තීරණාත්මක අවස්ථාවේ දී අත්‍යවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා රජය, මහ බැංකුව සහ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන් සිය සහාය ලබා දිය යුතුය. එවැනි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වුවහොත්, දිගින් දිගට ම මූල්‍ය සහනාධාර ලබා ගැනීමට සිදු වීම, දිගින් දිගට ම විදේශීය ණය මත යැපීම හා ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලීන්ට යොමු වීමට සිදු වීමත් සමඟ තිරසාර නොවන හා ඉතා අස්ථාවර ආර්ථික ක්‍රියාවලීන් මගින් රට දිගු කාලීන ආර්ථික ප්‍රගතියක් සහ සමෘද්ධිය අත්කර ගැනීම වළක්වමින් මහජනතාව මත අනවශ්‍ය පීඩනයක් ඇති කරනු ඇත. එබැවින්, වත්මන් අර්බුදයෙන් අත්මිදීම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නය තුළ, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ ක්‍රියාත්මක වන වැඩසටහනෙහි සඳහන් වන ප්‍රතිපත්තීන් ද ඇතුළත්ව ස්ථාවර සහ මනා ලෙස සම්බන්ධීකරණය කළ ප්‍රතිපත්ති ඉදිරි කාලයේ දී යළිත් අර්බුදයක් ඇති වීම වළක්වා ගැනීම සඳහා කාලෝචිත ලෙස ක්‍රියාත්මක කළ යුතුය.*

## 1.2 2022 වසරේ සාර්ව ආර්ථික ප්‍රවණතා

### මූර්ත අංශයේ ප්‍රවණතා සහ උද්ධමනය

**වසංගතයෙන් පසු ආර්ථිකයේ යථා තත්ත්වයට පත්වීම නැවත ආපසු හරවමින් ඇති වූ දේශීය හා ගෝලීය අභියෝග මධ්‍යයේ උත්සන්න වූ පෙර නොවූ ආර්ථික අර්බුදයේ තීව්‍ර බලපෑම් ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන, ශ්‍රී ලංකා ආර්ථිකය නිදහසෙන් පසු ඉතිහාසයේ වාර්තා වූ දරුණුතම ආර්ථික සංකෝචනය, 2022 වසරේ දී වාර්තා කළේය.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික පුරෝකථනයන්ට අනුව, මූර්ත ද.දේ.නි.ය 2021 වසරේ වාර්තා වූ සියයට 3.5ක වර්ධනයට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 7.8කින් සංකෝචනය විය. සාර්ව ආර්ථික අසමතුලිතතා විසඳාලීමෙහි පැවති ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ප්‍රමාදයන්හි බලපෑම පිළිබිඹු කරමින්, අනෙකුත් එවැනි දුර්වලතා අතර, විශේෂයෙන් ම මෑත වසරවල දී බදුකරණයට සහ කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අදාළව මනා සුදානමකින් තොරව සහ කාලෝචිත නොවන පරිදි සිදු කළ ප්‍රතිසංස්කරණ මධ්‍යයේ, දිගු කලක සිට පවත්නා අයවැය හිඟයන් සහ විදේශීය ජංගම ගිණුම් හිඟයන් යන ද්විත්ව හිඟයන්ගෙන් සමන්විත දිගු කාලීන සාර්ව ආර්ථික දුර්වලතා 2022 වසරේ දී තවදුරටත් උග්‍ර විය. විදේශ විනිමය හිඟය හේතුවෙන් හටගත් උග්‍ර ඉන්ධන හිඟයෙහි ප්‍රතිඵලයක් ලෙස, සැපයුම් දාමයට බාධා ඇති වීම, දිගු කාලීන විදුලිය ඇනහිටීම්, ආනයන පාලනය යනාදිය හමුවේ අමුද්‍රව්‍ය හිඟයක් ඇති වීම සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම හේතුවෙන් ආර්ථික කටයුතු සැලකිය යුතු ලෙස මන්දගාමී විය. තවද, ඉහළ යන ගෝලීය බලශක්ති මිල ගණන් සහ විනිමය අනුපාතිකයේ අවප්‍රමාණය වීම් හමුවේ ප්‍රධාන උපයෝගිතාවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමෙන් සැපයුම් අංශයේ පීඩන තවත් උත්සන්න වූ අතර, ශීඝ්‍රයෙන් ඉහළ ගිය උද්ධමනය සහ බදු ඉහළ නැංවීම් හේතුවෙන් කුටුම්භවල වැය කළ හැකි ආදායමට බලපෑම් එල්ල විය. මෙම වාතාවරණය තුළ, ආර්ථිකයේ අධි උද්ධමනකාරී තත්ත්වයක් සහ ආර්ථික අවපාතයක් දක්වා මග පෑදිය හැකි දැවැන්ත ආර්ථික ව්‍යසනයක් වැළැක්වීමේ අරමුණ ඇතිව, රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළියම් යෙදීමේ සහ පාලනයන් පැනවීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක්

**1.1 සංඛ්‍යා සටහන**

**සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය (2018-2022)**

| දර්ශකය | ඒකකය | 2018 | 2019 | 2020 | 2021 (අ) | 2022 (ආ) |
|---|---|---|---|---|---|---|
| **මූර්ත අංශය (ඇ)** | | | | | | |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | සියයට | 2.3 | -0.2 | -4.6 | 3.5 (ආ) | -7.8 |
| පවත්නා වෙළෙඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් බිලියන | 15,352 | 15,911 | 15,672 | 17,600 (ආ) | 24,148 |
| ඒක පුද්ගල ද.දේ.නි. (ඈ) | එ.ජ. ඩොලර් | 4,372 | 4,082 | 3,858 | 3,997 (ආ) | 3,474 |
| **විදේශීය අංශය** | | | | | | |
| වෙළෙඳ ශේෂය (ඇ) (ඈ) | ද.දේ.නි.යේ % වශයෙන් | -10.9 | -9.0 | -7.1 | -9.2 | -6.7 |
| ජංගම ගිණුමේ ශේෂය (ඇ) (ඈ) | ද.දේ.නි.යේ % වශයෙන් | -3.0 | -2.1 | -1.4 | -3.7 | -1.9 |
| සමස්ත ශේෂය | එ.ජ. ඩොලර් මිලියන | -1,102.9 | 376.6 | -2,327.7 | -3,966.6 | -2,806.1 |
| විදේශීය නිල සංචිත | එ.ජ. ඩොලර් මිලියන | 6,919.2 | 7,642.4 | 5,664.3 | 3,139.2 | 1,897.6 |
| **රාජ්‍ය මූල්‍ය අංශය (ඇ)** | | | | | | |
| වර්තන ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -1.1 | -3.4 (ඉ) | -7.5 | -7.3 | -6.4 |
| ප්‍රාථමික ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | 0.6 | -3.4 (ඉ) | -4.4 | -5.7 | -3.7 |
| සමස්ත අයවැය ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -5.0 | -9.0 (ඉ) | -10.6 | -11.7 | -10.2 |
| මධ්‍යම රජයේ ණය (ඊ) | ද.දේ.නි.යේ % වශයෙන් | 78.4 | 81.9 | 96.5 | 100.1 | 113.8 (උ) |
| **මුදල් අංශය සහ උද්ධමනය** | | | | | | |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) (ඌ) | සියයට | 13.0 | 7.0 | 23.4 | 13.2 | 15.4 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය ($M_{2b}$ හි) (ඌ) | සියයට | 15.9 | 4.2 | 6.5 | 13.1 | 6.2 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය (එ) | සියයට | 4.3 | 4.3 | 4.6 | 6.0 | 46.4 |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු මාසයේ දී නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.
(ඈ) 2015 සිට කාර්තුමය සාමාන්‍ය විනිමය අනුපාතිකය යොදාගෙන ද.දේ.නි. එ.ජ. ඩොලර්වලින් ගණනය කර ඇත.
(ඉ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත්කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.
(ඊ) 2012 ජනවාරි මාසයේ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් සහ 2022 ජනවාරි මස 01 දින රුපියල් මිලියන 25,217ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 31,446කි) ඇතුළත් වේ.
(උ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ නොගෙවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොලී ගෙවීම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළව නොගෙවූ ණය පොලී ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ.
(ඌ) වසර අවසානයේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය
(එ) කො.පා.මි. දර්ශකය (2013=100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ගනු ලැබීය. ගෙවුම් තුලන පීඩන පාලනය කිරීම සඳහා වන අනෙකුත් ක්‍රියාමාර්ග සමග සිදු කරන ලද සැලකිය යුතු මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ ක්‍රියාමාර්ග, බදුකරණයෙහි සහ උපයෝගිතා සැපයීම්වලට අදාළ මිල ගණන්වල සිදු කළ පෙර නොවූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ මෙන්ම ඉන්ධන සලාක ක්‍රමය යනාදී ක්‍රියාමාර්ග හරහා අධික මිල පීඩනයන් පාලනය කිරීමට, විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු කිරීමට, විදේශීය හා රාජ්‍ය මූල්‍ය අංශයේ ආතතීන් අවම කිරීමට, ආර්ථික කටයුතු සඳහා සහාය වීමට මෙන්ම, කෙටි කාලීනව සැලකිය යුතු ගැළපුම් පිරිවැයන් සහිතව වුව ද ආර්ථිකය ස්ථාවරත්වය කරා මෙහෙය වීමට රුකුලක් ලැබුණි. මේ අතර, රජය විසින් අරමුදල් පහසුකමක් සඳහා ජා.මූ. අරමුදලෙන් සහාය ඉල්ලා සිටි අතර, ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන් සමග ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ ඉදිරියේ දී සිදු කිරීමට නියමිත සාකච්ඡාවල අතුරු ක්‍රියාමාර්ගයක් ලෙස ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීම නිවේදනය කරන ලදී. රජයේ සහ මහ බැංකුවේ මෙම කඩිනම් සහ විසඳුම් ලබාදීමේ ක්‍රියාමාර්ග, ආර්ථික කටයුතු අඩපණ වීම පාලනය කිරීමට මෙන්ම ආර්ථිකය පිළිබඳ ජනතාවගේ විශ්වාසය ගොඩ නැංවීමට සහාය විය.

**වසංගතයෙන් පසු ආර්ථිකයේ යථා තත්ත්වයට පත්වීම ආපසු හරවමින්, 2022 වසරේ දී මූර්ත ආර්ථිකය පුළුල් ලෙස සංකෝචනය විය.** 2019 වසරේ සිට සුළු ප්‍රගතියක් පෙන්නුම් කළ කෘෂිකාර්මික අංශය, පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 4.6කින් සංකෝචනය විය. ප්‍රධාන වශයෙන් රසායනික පොහොර හා කෘෂි රසායනවල පැවති උග්‍ර හිඟය, අමුද්‍රව්‍ය පිරිවැය ඉහළ යෑම මෙන්ම, සැපයුම් දාමයේ අවහිරතා මෙමගින් පිළිබිඹු විය. වී, තේ, එළවළු, සත්ව නිෂ්පාදන සහ කරදිය ධීවර කර්මාන්තය හා කරදිය ජලජීව වගාව යන උප අංශ කෘෂිකාර්මික අංශයේ සංකෝචනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර,

**1.2 රූප සටහන**
**ද.දේ.නි.යෙහි වර්ධනය සඳහා ආංශික දායකත්වය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

තෙල් සහිත පලතුරු භෝග වගාව සහ වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන යන උප අංශවල වර්ධනයන් වසර තුළ දී වාර්තා විය. අමුද්‍රව්‍යවල උග්‍ර හිඟය සහ යෙදවුම් පිරිවැය ඉහළ යෑම මධ්‍යයේ ඉදිකිරීම් සහ නිෂ්පාදන උප අංශවල කාර්යසාධනය දුර්වලවීම මූලික වශයෙන් හේතුකොටගෙන කර්මාන්ත අංශය 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 16.0කින් සැලකිය යුතු ලෙස සංකෝචනය විය. බලශක්ති අර්බුදය සහ දැඩි මුදල් තත්ත්වයන් ද කර්මාන්ත උප අංශයේ ක්‍රියාකාරිත්වය මත අහිතකර බලපෑම් ඇති කළේය. 2022 වසර තුළ දී, කර්මාන්ත අංශයෙන් සියයට 28.0කට දායකත්වය සපයන ඉදිකිරීම් උප අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 20.9කින් සංකෝචනය වූ අතර, සමස්ත කර්මාන්ත අංශය සඳහා සියයට 59ක පමණ දායකත්වයක් සපයන සමස්ත නිෂ්පාදන අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 12.6කින් සංකෝචනය විය. නිෂ්පාදන අංශය තුළ, අඟුරු හා ඛනිජ තෙල් පිරිපහදු නිෂ්පාදන සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන උප අංශ, පිළිවෙළින්, සියයට 58.2කින් සහ සියයට 14.2කින් සැලකිය යුතු ලෙස සංකෝචනය වූ අතර, රෙදිපිළි, නිමි ඇඳුම්, සම් හා සම් භාණ්ඩ නිෂ්පාදන උප අංශය 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 8.1ක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, පතල් හා කැණීම් කටයුතු 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 31.0කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. කොවිඩ්-19 වසංගතයෙන් අනතුරුව සේවා අංශයේ කටයුතු ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත්වීමත් සමඟ සේවා අංශය, 2022 වසරේ පළමු කාර්තුවේ දී ශක්තිමත් කාර්යසාධනයක් පෙන්නුම් කළ ද, ඉන් අනතුරුව උත්සන්න වූ ආර්ථික අවහිරතා හේතුවෙන් සේවා අංශය තවදුරටත් ප්‍රසාරණය වීම අඩපණ වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එම අංශය 2022 වසර තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 2.0කින් සමස්තයක් ලෙස සංකෝචනය විය. නවාතැන්, ආහාර හා පාන වර්ග උප අංශය මෙන්ම, භාණ්ඩ හා මගී ප්‍රවාහන උප අංශය, පිළිවෙළින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 27.0කින් සහ සියයට 3.5කින් ශක්තිමත් ලෙස වර්ධනය වුවද, තොග හා සිල්ලර වෙළඳාම, මූල්‍ය සේවා සහ දේපළ වෙළඳාම යන උප අංශවල වාර්තා වූ සැලකිය යුතු පහළ යෑම් හේතුවෙන් සේවා අංශයේ කාර්යසාධනය මන්දගාමී විය.

**නාමික අගයන් සැලකූ විට, ශ්‍රී ලංකා ආර්ථිකය පෙර වසරේ දී වාර්තා කළ සියයට 12.3ක වර්ධනයට සාපේක්ෂව, වසර තුළ ඉහළ ගිය අවධමනකයේ බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 37.2කින් ප්‍රසාරණය විය.** කෙසේ වෙතත්, විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන්, සමස්ත ආර්ථිකයේ ප්‍රමාණය 2021 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 88.5 සමඟ සැසඳීමේ දී 2022 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 77.1ක් දක්වා පහළ ගියේය. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය 2021 වසරේ දී පැවති එ.ජ. ඩොලර් 3,997 සිට 2022 වසරේ දී එ.ජ. ඩොලර් 3,474ක් දක්වා පහළ ගියේය. වියදම් ප්‍රවේශය අනුව, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 69.2ක් පමණ වන පරිභෝජන වියදම, ආර්ථිකයේ නාමික වර්ධනය සඳහා විශාල වශයෙන් දායක වෙමින් 2021 වසරේ දී වාර්තා කළ සියයට 8.4ක ඉහළ යෑමට සාපේක්ෂව 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 34.3කින් ප්‍රසාරණය විය. ඒ අනුව, කාලපරිච්ඡේදය තුළ උද්ධමනයෙහි සිදු වූ ශීඝ්‍ර ඉහළ යෑම පිළිබිඹු කරමින්, කුටුම්භ පරිභෝජන වියදම, පෙර වසරේ වාර්තා කළ සියයට 9.4ක ඉහළ යෑම හා සාපේක්ෂව 2022 වසරේ දී සියයට 39.0ක ඉහළ අනුපාතයකින් ප්‍රසාරණය විය. රජයේ පරිභෝජන වියදම, 2021 වසරේ දී වාර්තා කළ සියයට 2.3ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 3.8කින් වර්ධනය විය. මේ අතර, ආයෝජන වියදම, 2021 වසරේ දී වාර්තා කළ සියයට 25.1ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 28.4කින් වර්ධනය විය. ඒ අනුව, නාමික දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආයෝජනය, පෙර වසරේ පැවති සියයට 36.7 හා සාපේක්ෂව 2022 වසරේ දී සියයට 34.4ක් විය. රුපියල අවප්‍රමාණය වීමේ සහාය ලබමින් අපනයන කැපී පෙනෙන ලෙස ඉහළ යෑම සහ ආනයන පාලනයන් මෙන්ම, මන්දගාමී සමාහාර ඉල්ලුම මධ්‍යයේ ආනයන

### 1.2 සංඛ්‍යා සටහන
### කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2015) යටතේ දළ ජාතික ආදායම (අ)(ආ)


| ආර්ථික කටයුතු | රු. බිලියන | | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (%) | | වර්ධනය (%) | | වර්ධනය සඳහා දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2021 (ඇ) | 2022 | 2021 (ඇ) | 2022 | 2021 (ඇ) | 2022 | 2021 (ඇ) | 2022 |
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **949.9** | **906.5** | **7.3** | **7.5** | **0.9** | **-4.6** | **0.1** | **-0.3** |
| කෘෂිකර්මාන්තය සහ වන වගාව | 812.4 | 783.4 | 6.2 | 6.5 | 0.8 | -3.6 | 0.1 | -0.2 |
| ධීවර කර්මාන්තය | 137.6 | 123.1 | 1.1 | 1.0 | 1.5 | -10.5 | 0.0 | -0.1 |
| **කර්මාන්ත** | **3,937.9** | **3,309.8** | **30.2** | **27.5** | **5.7** | **-16.0** | **1.7** | **-4.8** |
| පතල් සහ කැණීම් කර්මාන්ත | 288.0 | 198.7 | 2.2 | 1.7 | 1.4 | -31.0 | 0.0 | -0.7 |
| නිෂ්පාදන කර්මාන්ත | 2,247.2 | 1,963.3 | 17.2 | 16.3 | 7.4 | -12.6 | 1.2 | -2.2 |
| විදුලිය, ගෑස්, ජලය සහ කසළ කළමනාකරණය | 230.0 | 220.0 | 1.8 | 1.8 | 2.2 | -4.3 | 0.0 | -0.1 |
| ඉදිකිරීම් | 1,172.8 | 927.7 | 9.0 | 7.7 | 4.4 | -20.9 | 0.4 | -1.9 |
| **සේවාවන්** | **7,414.3** | **7,265.1** | **56.9** | **60.5** | **3.5** | **-2.0** | **2.0** | **-1.1** |
| තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම සහ නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 3,149.8 | 3,230.3 | 24.2 | 26.9 | 1.3 | 2.6 | 0.3 | 0.6 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 421.8 | 415.9 | 3.2 | 3.5 | 18.0 | -1.4 | 0.5 | 0.0 |
| මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම | 1,375.3 | 1,163.3 | 10.5 | 9.7 | 7.5 | -15.4 | 0.8 | -1.6 |
| වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 1,294.6 | 1,286.3 | 9.9 | 10.7 | 1.8 | -0.6 | 0.2 | -0.1 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 1,172.8 | 1,169.4 | 9.0 | 9.7 | 2.2 | -0.3 | 0.2 | 0.0 |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය** | **12,302.1** | **11,481.4** | **94.4** | **95.5** | **4.0** | **-6.7** | **3.7** | **-6.3** |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු-සහනාධාර | 735.9 | 536.5 | 5.6 | 4.5 | -3.6 | -27.1 | -0.2 | -1.5 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය** | **13,037.9** | **12,017.8** | **100.0** | **100.0** | **3.5** | **-7.8** | **3.5** | **-7.8** |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | -294.1 | -304.2 | | | 12.6 | -3.5 | | |
| **වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම** | **12,743.8** | **11,713.6** | | | **4.0** | **-8.1** | | |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සීමා වීමෙහි බලපෑම පිළිබිඹු කරමින් වෙළඳපොළ මිල ගණන් යටතේ භාණ්ඩ හා සේවා සඳහා වූ ශුද්ධ විදේශීය ඉල්ලුම 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 34.1කින් සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. ඒ අනුව, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස භාණ්ඩ හා සේවා සඳහා ශුද්ධ නාමික විදේශීය ශේෂය 2021 වසරේ වාර්තා වූ සියයට -7.4 හා සාපේක්ෂව, 2022 වසරේ දී සියයට -3.6ක් විය.


### 1.3 රූප සටහන
### ආයෝජන සහ ඉතිරිකිරීම්
### (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2022 වසර තුළ දී දුර්වල සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ශ්‍රම ඵලදායීතාව කෙරෙහි අභියෝග එල්ල වුවද, ආර්ථිකයේ සේවා වියුක්ති මට්ටම් සුළු වශයෙන් පහළ ගියේය.** වැඩ කළ හැකි වයසේ ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස ශ්‍රම බලකාය පෙන්නුම් කරන ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය, 2021 වසරේ වූ සියයට 49.9ට සාපේක්ෂව ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනයෙහි ඉහළ යෑමත් සමඟ 2022 වසරේ දී සියයට 49.8ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය. පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය පෙර වසරේ වාර්තා වූ සියයට 71.0 සිට 2022 වසර තුළ දී සියයට 70.5ක් දක්වා පහළ යෑමක්

**1.4 රූප සටහන**
**සේවා වියුක්ති අනුපාතිකය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වාර්තා කළේය. හිතකර වර්ධනයක් පෙන්නුම් කරමින්, ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2021 වසරේ වාර්තා වූ සියයට 31.8 හා සාපේක්ෂව 2022 වසර තුළ දී සියයට 32.1ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, සේවා වියුක්ති අනුපාතය 2022 වසරේ දෙවන සහ තුන්වන කාර්තුවල දී යම් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ ද, වාර්ෂික සේවා වියුක්ති අනුපාතය 2021 වසරේ වූ සියයට 5.1 හා සාපේක්ෂව 2022 වසරේ දී සියයට 4.7ක් දක්වා පහළ ගියේය. මේ අතර, උග්‍ර ඉන්ධන හිඟයන්, වරින් වර සිදු කළ විදුලිය විසන්ධි කිරීම් මෙන්ම, ආනයන සීමාවන් සමඟ අමුද්‍රව්‍ය හිඟවීම හේතුවෙන් සැපයුම් මාර්ග වෙත වූ දිගු කාලීන බලපෑම යනාදිය මගින්, සලකා බලන කාලපරිච්ඡේදය තුළ ප්‍රශස්ත අන්දමින් ශ්‍රමය යෙදවීම කෙරෙහි බාධා පැමිණි අතර, එය කිසියම් දුරකට ආර්ථිකයේ එකතු කළ නිෂ්පාදන අගය මන්දගාමී වීම සඳහා දායක වී ඇත. ඒ අනුව, වැඩ කළ පැයක් සඳහා එකතු කළ අගය (2015 මිල ගණන් අනුව), 2021 වසරේ දී වාර්තා වූ වැඩ කරන පැයකට රුපියල් 768.08ක සිට 2022 වසරේ දී


**1.3 සංඛ්‍යා සටහන**
**පවත්නා වෙළඳපොළ මිල අනුව සමස්ත ඉල්ලුම සහ ඉතුරුම් - ආයෝජන පරතරය (අ)(ආ)**

| ශීර්ෂය | රුපියල් බිලියන | | වර්ධනය (%) | | ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස (%) | |
|---|---|---|---|---|---|---|
| | 2021 (ඇ) | 2022 | 2021 (ඇ) | 2022 | 2021 (ඇ) | 2022 |
| **1. දේශීය ඉල්ලුම** | **18,901.2** | **25,005.2** | **13.6** | **32.3** | **107.4** | **103.6** |
| 1.1 පරිභෝජනය | 12,434.3 | 16,700.6 | 8.4 | 34.3 | 70.6 | 69.2 |
| පෞද්ගලික | 10,769.7 | 14,973.3 | 9.4 | 39.0 | 61.2 | 62.0 |
| රාජ්‍ය | 1,664.6 | 1,727.3 | 2.3 | 3.8 | 9.5 | 7.2 |
| 1.2 ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) | 6,467.0 | 8,304.6 | 25.1 | 28.4 | 36.7 | 34.4 |
| **2. ශුද්ධ විදේශීය ඉල්ලුම** | **-1,301.0** | **-857.5** | **-34.7** | **34.1** | **-7.4** | **-3.6** |
| භාණ්ඩ හා සේවා අපනයන | 2,980.3 | 5,187.9 | 23.2 | 74.1 | 16.9 | 21.5 |
| භාණ්ඩ හා සේවා ආනයන | 4,281.3 | 6,045.4 | 26.5 | 41.2 | 24.3 | 25.0 |
| **3. මුළු ඉල්ලුම (ද.දේ.නි.) (1+2)** | **17,600.2** | **24,147.7** | **12.3** | **37.2** | **100.0** | **100.0** |
| **4. දේශිය ඉතුරුම් (3-1.1)** | **5,165.9** | **7,447.2** | **22.9** | **44.2** | **29.4** | **30.8** |
| පෞද්ගලික | 6,456.3 | 8,987.6 | 19.9 | 39.2 | 36.7 | 37.2 |
| රාජ්‍ය | -1,290.4 | -1,540.4 | -9.3 | -19.4 | -7.3 | -6.4 |
| **5. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඈ)** | **-395.5** | **-621.4** | **6.5** | **-57.1** | **-2.2** | **-2.6** |
| **6. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම (ඈ)** | **1,034.7** | **1,159.5** | **-10.1** | **12.1** | **5.9** | **4.8** |
| **7. ජාතික ඉතුරුම් (4+5+6)** | **5,805.1** | **7,985.3** | **17.7** | **37.6** | **33.0** | **33.1** |
| **8. ඉතුරුම්-ආයෝජන පරතරය** | | | | | | |
| දේශීය ඉතුරුම්-ආයෝජන (4-1.2) | -1,301.0 | -857.5 | | | | |
| ජාතික ඉතුරුම්-ආයෝජන (7-1.2) | -661.9 | -319.3 | | | | |
| **9. විදේශීය ජංගම ගිණුම් ශේෂය (2+5+6) (ඈ) (ඉ)** | **-661.9** | **-319.3** | | | | |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයෙන් කුමන හෝ වෙනසක් වනුයේ ගණනය කිරීමේ දී ඇතිවන කාල පමාව හේතුවෙනි.
(ඉ) විදේශීය ජංගම ගිණුම් ශේෂය ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස එ.ජ. ඩොලර්වලින් වාර්ෂික ඇස්තමේන්තු ගණනය කර, මෙම වාර්තාවේ 5වන පරිච්ඡේදයේ 5.1 සංඛ්‍යා සටහනේ දක්වා ඇත. එම අගය 2022 වසරේ දේශීය මුදල් අගයෙන් ගණනය කිරීමේ දී වෙනසක් වනුයේ විනිමය අනුපාතයන්හි සැලකිය යුතු විචලනයන් හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**1.5 රූප සටහන**
**මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)**




(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම, පිළිවෙළින්, 2023 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දත්ත නිකුත් කිරීමේ සිට ආරම්භ කරන ලද අතර පැරණි පදනම් වර්ෂය වන 2013=100 ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව, 2023 වසරේ ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වැඩ කරන පැයකට රුපියල් 686.57ක් දක්වා සියයට 10.6කින් පහළ ගියේය.

**පාරිභෝගික මිල උද්ධමනය 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ඉතිහාසගත ඉහළ මට්ටමක් කරා ළඟා වූ අතර ඉන් අනතුරුව දැඩි මුදල් තත්ත්වයන්හි බලපෑම සහ සැපයුම් අංශයේ අවහිරතා ක්‍රමානුකූලව ලිහිල් වීමත් සමඟ පහළ යෑම ඇරඹිණි.** සැපයුම් අවහිරතා, පරිපාලිත මිල ගණන් සම්බන්ධයෙන් වරින් වර සිදු කරන ලද සංශෝධන, ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම යනාදිය හේතුවෙන් ආහාර, බලශක්ති සහ ප්‍රවාහන ක්ෂේත්‍රවල මිල ගණන් ඉහළ යෑම් හා ඒවායේ පසු බලපෑම් ඇතුළු විවිධ අංශවලින් ඇති වූ මිල පීඩන සහ පසුගිය වසර කිහිපය තුළ ක්‍රියාත්මක කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්තිවල පසු බලපෑම හේතුවෙන් ඇති වූ සමස්ත ඉල්ලුම් පීඩන පිළිබිඹු කරමින් 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ උද්ධමනය ශීඝ්‍ර ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2022 වසර අග භාගයේ සිට උද්ධමනය අඩුවීම සඳහා සැලකිය යුතු ලෙස දැඩි කරන ලද මුදල් ප්‍රතිපත්තියේ බලපෑම සහ අත්‍යවශ්‍ය ආනයන සඳහා ප්‍රමුඛත්වය දීම වැනි අනෙකුත් ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාමාර්ගවල බලපෑම මෙන්ම ආහාර සහ බලශක්ති මිල ගණන් අඩු වීම හේතු විය. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී සියයට 57.2ක් දක්වා පහළ යෑමට පෙර, 2021 වසර අවසානයේ දී පැවති සියයට 12.1 සිට 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 69.8ක් දක්වා ඉහළ ගියේය. ඒ හා සමාන ප්‍රවණතාවක් අනුගමනය කරමින්, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2021 වසර අවසානයේ පැවති සියයට 14.0ට සාපේක්ෂව 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 73.7ක් වාර්තා කළ අතර 2022 වසර අවසානය වන විට සියයට 59.2ක අගයක් වාර්තා කළේය. වෙනස් වන වියදම් රටා සහ වෙළඳපොළෙහි පවතින භාණ්ඩ හා සේවා වෙනස්වීම් සැලකිල්ලට ගනිමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද. යන දර්ශකවල පදනම් වර්ෂය 2013 සිට 2021 දක්වා සංශෝධනය කරන ලදී. 2022 වසර අග භාගයේ නිරීක්ෂණය කරන ලද මතුපිට උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාවය 2023 වසර දක්වා ද අඛණ්ඩව පැවතුණි. ඒ අනුව, විදුලි ගාස්තු සංශෝධනය කිරීමේ සමස්ත බලපෑම 2023 වසරේ මාර්තු මාසයේ දී උද්ධමනය ගණනය කිරීමට ඇතුළත් වී ඇති බැවින් මෑත මාසවලට සාපේක්ෂව අඩු වේගයකින් වුව ද කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2023 වසරේ මාර්තු මාසයේ දී සියයට 50.3ක් දක්වා තවදුරටත් පහළ ගියේය. මේ අතර, ජා.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2023 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 53.6ක් ලෙස සටහන් විය. ශ්‍රී ලංකා රුපියල මෑතක දී අතිප්‍රමාණය වීමත් සමඟ ආනයනික භාණ්ඩ මිල ගණන් තවදුරටත් පහළ යෑමේ ලක්ෂණ නිරීක්ෂණය වූ අතර, 2023 වසරේ මාර්තු මාසය අවසානයේ දී සිදු කරන ලද ඛනිජ තෙල් මිල ගණන් සංශෝධන ඉදිරි මාසවල දී උද්ධමනය පහළ යෑම වේගවත් වීම සඳහා උපකාරී වනු ඇත. නිතර උච්චාවචනය වන ආහාර සහ බලශක්ති මිල ගණන් ඉවත් කිරීමෙන් පසුව මනින ලද සහ යටිදැරි ඉල්ලුම මත පදනම් වූ පීඩන පෙන්නුම් කරන මූලික උද්ධමනය ද 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ ඉහළ ගොස් ඉන් පසුව පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. මූලික උද්ධමනයේ මෙම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් මෑත වසරවලදී මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ පසු බලපෑම හේතුවෙන් ඇති වූ ඉල්ලුම ඉහළ යෑම, ආනයනික භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම මෙන්ම ආපනශාලා හා හෝටල්, සෞඛ්‍යය, අධ්‍යාපනය වැනි ආහාර නොවන කාණ්ඩවල පිරිවැය ඉහළ යෑම හේතු විය. ඒ අනුව, කො.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2021 වසර අවසානයේ දී වාර්තා කළ

1

**විශේෂ සටහන 1**

## ශ්‍රී ලංකාවේ නිර්-උද්ධමන (උද්ධමනය පහළ යෑමේ) ක්‍රියාවලිය


2022 වසරේ දී පැවති ඉහළ උද්ධමනය ගෝලීය සංසිද්ධියකි. කොවිඩ්-19 වසංගතයත් සමග ඉතා ලිහිල් වූ මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල පසු බලපෑම, රුසියාව සහ යුක්‍රේනය අතර යුද්ධය හේතුවෙන් ඉන්ධන හා ඉන්ධන නොවන වෙළඳ භාණ්ඩ හිඟය තවදුරටත් උග්‍ර වීම සහ සැපයුම් ක්‍රියාවලියේ ගැටලු හා සමගාමීව සැපයුම් ධාරිතාව සීමා වීම ආදියෙහි බලපෑම පිළිබිඹු කරමින් 2022 වසරේ දී ගෝලීය උද්ධමනය සියයට 8.8ක් (IMF, 2023) දක්වා ඉහළ ගියේය. ගෝලීය මෙන්ම දේශීය සාධක මගින් ඇති වූ බලපෑම හේතුවෙන්, නිදහසින් පසු ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ විශාලතම මිල ඉහළ යෑම් වාර්තා කරමින් 2022 වසරේ දී පෙර නොවූ පරිදි ඉහළ උද්ධමනයක් ශ්‍රී ලංකාව විසින් ද අත්විඳින ලදී. කෙසේ වෙතත්, 2022 වසර අවසාන කාලයේදී නිර්-උද්ධමන ක්‍රියාවලියක මූලික සලකුණු පෙන්නුම් කරමින් උද්ධමනය එහි උපරිම මට්ටමේ සිට පහළ යෑම ආරම්භ විය. ඉදිරි කාලය තුළ දී ඉලක්කගත මට්ටම් දක්වා උද්ධමනය පහළ යෑම සඳහා සාධක කිහිපයකින් සහාය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. උද්ධමන අපේක්ෂා කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරමින් උද්ධමනය පිළිබඳව විවිධ වැරදි වැටහීම් සහ වැරදි අර්ථකථන හේතුවෙන් මහජනතාව ව්‍යාකූලත්වයට පත් වන පසුබිමක් තුළ, උද්ධමනය සහ නිර්-උද්ධමනය පිළිබඳ සංකල්ප සහ පසුගිය කාලයේදී ගෝලීය වශයෙන් නිර්-උද්ධමනය පැවති අවස්ථා සහ ඒවායේ ලක්ෂණ මෙන්ම, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ අපේක්ෂිත නිර්-උද්ධමන ක්‍රියාවලිය පිළිබඳව, අවබෝධ කර ගැනීම වැදගත් වේ.

### උද්ධමනය පිළිබඳ සංකල්පය

උද්ධමනයේ වෙනස්වීම ඇතැම්විට මිල මට්ටමේ අනුරූප වෙනස් වීමක් යනුවෙන් වැරදි ලෙස අර්ථකථනය කෙරේ. පාරිභෝගික මිල දර්ශකයක් මගින් මනිනු ලබන පොදු මිල මට්ටම මගින් ආර්ථිකයේ සියලුම මිල ගණන්වල සාමාන්‍යය නියෝජනය කරනු ලබයි. ශ්‍රී ලංකාවේ මිල මට්ටම් පිළිබඳ වඩාත් බහුලව භාවිත වන මිනුම් වන්නේ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) වේ. එහෙත්, උද්ධමනය යනු කාලයත් සමග පොදු මිල මට්ටම ඉහළ යන වේගය වන අතර, එය සාමාන්‍යයෙන් කාලපරිච්ඡේද දෙකක් අතර, පාරිභෝගික මිල දර්ශකයේ ප්‍රතිශතාත්මක වෙනස ලෙස දැක්වේ. එබැවින්, පෙර කාලපරිච්ඡේදය හා සැසඳීමේදී උද්ධමනය පහළ යෑම මගින් පොදු මිල මට්ටමේ පහත වැටීමක් නිරූපණය වීම අනිවාර්ය නොවන අතර පොදු මිල මට්ටම වැඩිවීමේ වේගය අඩුවීමක් එමගින් පෙන්නුම් කෙරේ.

උද්ධමනය ගණනය කිරීම සඳහා බහුලවම භාවිත වන මිනුම් වන්නේ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස් වීම සහ මාසික ලක්ෂ්‍යමය වෙනස් වීම වේ. පෙර මාසයට සාපේක්ෂව සලකා බලනු ලබන මාසයේ මිල හැසිරීම් වෙනස්වීම පිළිබඳ තක්සේරු කිරීම මාසික ලක්ෂ්‍යමය උද්ධමනය ගණනය කිරීම මගින් සිදුවේ. එබැවින්, මෙම ගණනය කිරීම 'මිල ගණන්වල ගතිකතාව (price momentum)' හෝ 'උද්ධමනයෙහි ගතිකතාව (momentum of inflation)' ලෙස ද හැඳින්වේ. කෙසේ වෙතත්, පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය, සලකා බලනු ලබන මාසයේ මිල ගණන් වෙනස්වීම් සහ ඊට අනුරූපව වසරකට පෙර වාර්තා වූ මිල ගණන් වෙනස්වීම් යන සාධක දෙක මත රඳා පවතී. වසරකට පෙර වාර්තා වූ මිල ගණන් වෙනස්වීම 'පදනම් බලපෑම (base effect)' ලෙස හඳුන්වනු ලබන අතර, එය පදනම් කාලපරිච්ඡේදයේ (එනම් වසරකට පෙර) මාසික ලක්ෂ්‍යමය උද්ධමනය වෙනස් වීම හරහා වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ වෙනසට දායක වේ. කො.පා.මි.ද.හි (පදනම් වර්ෂය 2013=100)[1] සහ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයෙහි මෑතකාලීන හැසිරීම් රූප සටහන වි.ස. 1.1හි දැක්වේ. එම රූප සටහන මගින් යම් මාසයක (උදා. 2022 දෙසැම්බර්) වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය අනුරූප මාසයේ පාරිභෝගික මිල දර්ශකය සහ මාස 12කට පෙර (එනම් 2021 දෙසැම්බර්) එහි අගය මත රඳා පවතින බව නිරූපණය කරයි.

**රූප සටහන වි.ස. 1.1**
**කො.පා.මි.ද.හි හැසිරීම සහ උද්ධමනය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


1 2023 පෙබරවාරි මාසයේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කො.පා.මි.ද. (පදනම් වර්ෂය 2013=100) ගණනය කිරීම නවතා දමන ලද අතර, එය කො.පා.මි.ද. (පදනම් වර්ෂය 2021=100) ලෙස සංශෝධනය කරන ලදී. 2023 ජනවාරි මාසයේ සිට කො.පා.මි.ද. (2021=100) මත පදනම්ව ගණනය කරන ලද උද්ධමන (වාර්ෂික ලක්ෂ්‍යමය) අගයයන් ලබා ගත හැකිය.

තවද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදයේ මාසික ලක්ෂ්‍යමය උද්ධමනය (ගතික බලපෑම) සහ මාස 12කට පෙර අනුරූප කාලපරිච්ඡේදයේ පැවති මාසික ලක්ෂ්‍යමය උද්ධමනය (පදනම් බලපෑම) අතර වෙනස මගින් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ මාසික වෙනස දළ වශයෙන් ගණනය කළ හැකිය.[2] එබැවින්, ශ්‍රී ලංකාවේ උද්ධමන හැසිරීම ගණනය කිරීම සඳහා, විශේෂයෙන්ම අපේක්ෂිත නිර්-උද්ධමන ක්‍රියාවලිය තක්සේරු කිරීම සඳහා, වසරකට පෙර කාලපරිච්ඡේදය තුළ පැවති මිල මට්ටම්වල හැසිරීම එනම්, සංඛ්‍යානමය පදනම් බලපෑම සහ මිල මට්ටම්වල අපේක්ෂිත අනාගත හැසිරීම එනම්, අපේක්ෂිත මිල ගතිකතාව පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. රූප සටහන වි.ස. 1.2 මගින් මිලෙහි ගතිකතාව සහ පදනම් බලපෑම අනුව මෑතකාලීන උද්ධමනයේ වෙනස්වීම නිරූපණය කරයි. විශේෂයෙන්ම වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය අඩු මට්ටමක පවතින කාලපරිච්ඡේද තුළ දී, මිලෙහි ගතික බලපෑම සහ පදනම් බලපෑම එකතු කිරීම මගින් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ මාසික වෙනස දළ වශයෙන් ගණනය කළ හැකි බව එම රූප සටහනෙන් නිරූපණය කරයි.

**ශ්‍රී ලංකාවේ උද්ධමනය සඳහා හේතු වන සාධක**

කුඩා විවෘත ආර්ථිකයක් වන ශ්‍රී ලංකාවේ සමස්ත උද්ධමනය, දේශීය උද්ධමනය මෙන්ම ආනයනික උද්ධමනය මත රඳා පවතී. දේශීය උද්ධමනය කෙරෙහි ඉල්ලුම් අංශයේ සාධක, සැපයුම් අංශයේ සාධක සහ අනාගත උද්ධමනය පිළිබඳ ආර්ථික පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා බලපායි. ආර්ථික වර්ධනය හා එහි ප්‍රතිඵල, අනාගත මිල විචලනයන් පිළිබඳ මහජනතාවගේ අපේක්ෂා සහ ආර්ථිකයේ සමස්ත ඉල්ලුම් තත්ත්වයන්ට බලපෑම් කිරීම අරමුණු කරගත් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති (එනම්, මුදල් ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය) ඉල්ලුම් අංශයේ සාධක වන අතර, රජයේ සැපයුම් අංශයේ ප්‍රතිපත්තිවල ප්‍රතිඵල හෝ ස්වාභාවික විපත්, ගෝලීය සිදුවීම් වැනි වෙනත් බාහිර තත්ත්වයන් සැපයුම් අංශයේ සාධක වේ. ශ්‍රී ලංකාවේ ජනතාව සැලකිය

### රූප සටහන වි.ස. 1.2
### මිලෙහි ගතික බලපෑම සහ පදනම් බලපෑම අනුව උද්ධමනයේ හැසිරීම
### (කො.පා.මි.ද. මත පදනම්, 2013=100)




*මෙම ආසන්න අගය උද්ධමනය ප්‍රතිශතය කුඩා සංඛ්‍යාවක් වූ විට පමණක් වලංගු වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

යුතු ආනයනික භාණ්ඩ ප්‍රමාණයක් පරිභෝජනය කරන බැවින්, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන්වල විචලනයන් ද රටේ උද්ධමනය කෙරෙහි බලපානු ලබයි. මීට අමතරව, විනිමය අනුපාතිකයේ වෙනස්වීම් ද උද්ධමනය කෙරෙහි බලපායි. නිදසුනක් වශයෙන්, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම මගින් (බොහෝ ආනයන එ.ජ. ඩොලරයට අනුව අගය කර ඇති බැවින්) දේශීය ව්‍යවහාර මුදල් අනුව ආනයන මිල ගණන් ඉහළ යනු ඇත.

**නිර්-උද්ධමනය යනු කුමක්ද?**

නිර්-උද්ධමනය යනු ආර්ථිකයක පොදු මිල මට්ටම ඉහළ යාමේ වේගය අඩුවීමක් ලෙස අර්ථකථනය කළ හැකිය. මීට අමතරව, වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය තිරසාර පදනමින් පහළ යෑමක් ලෙස ද එය අර්ථ දැක්විය හැක. නිර්-උද්ධමනය යනු, උද්ධමනය අපේක්ෂිත මට්ටමට ළඟා වී මිල ස්ථායීතාව යථා තත්ත්වයට පත් වන තෙක් කෙටි කාලීනව සිට මැදි කාලීනව සිදුවන ක්‍රියාවලියකි. ඉහළ උද්ධමනයක් පැවතීමෙන් අනතුරුව නිර්-උද්ධමනය ඇති වීම, අවධමනයෙන් වෙනස් වන බව සැලකිල්ලට ගැනීම වැදගත් වන අතර, අවධමනය යනු සාමාන්‍ය මිල මට්ටම් තිරසාර පදනමකින් පහළ යෑම වේ. නිර්-උද්ධමන මගින් උද්ධමනය පහළ මට්ටමකට ළඟා වන අතර, එවැනි කාලපරිච්ඡේදයක් තුළදී ද මිල ගණන් ඉහළ ගියද එය අඩු වේගයකින් සිදු වේ.

සාමාන්‍යයෙන්, මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම මෙන්ම සැපයුම් අංශයේ තත්ත්වයන් හිතකර වීම හේතුවෙන් ක්‍රමානුකූලව නිර්-උද්ධමන ක්‍රියාවලිය සිදු වේ. උද්ධමනය නැවත ඉලක්කගත මට්ටමට ගෙන ඒම සහ ඉන් අනතුරුව තිරසාර මට්ටමක පවත්වා ගැනීම මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමෙහි අරමුණ වේ. නිර්-උද්ධමනය සඳහා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම සහ

---

2 පහත ගණිතමය නිරූපණයෙන් පෙන්වා දී ඇති පරිදි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය ($\pi t$), සලකා බලන මාසයක පාරිභෝගික මිල දර්ශක අගය ($p_t$) සහ ඊට අනුරූප මාස 12කට පෙර පැවති පාරිභෝගික මිල දර්ශක අගය ($p_{t-12}$) මත රඳා පවතියි.

$$\pi_t = \left[\frac{p_t - p_{t-12}}{p_{t-12}}\right] \times 100 \approx \left[\ln p_t - \ln p_{t-12}\right] \times 100$$

ස්වභාවික ලඝුගණක (natural logarithms, ln) භාවිතයෙන් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයෙහි ගණිතමය නිරූපණය ආසන්නව ගණනය කළ පසු, අනුයාත මාස දෙකක වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ වෙනස පහත පරිදි දැක්විය හැකිය.

$$\pi_t - \pi_{t-1} \approx \{[\ln p_t - \ln p_{t-12}] - [\ln p_{t-1} - \ln p_{t-13}]\} \times 100$$

$$\pi_t - \pi_{t-1} \approx \{[\ln p_t - \ln p_{t-1}] - [\ln p_{t-12} - \ln p_{t-13}]\} \times 100$$

සලකා බලනු ලබන විචල්‍යය (එනම් උද්ධමනය) ප්‍රතිශතාත්මක අගය අනුව කුඩා සංඛ්‍යාවක් වූ විට පමණක් ස්වභාවික ලඝුගණක භාවිත කරමින් දළ වශයෙන් ගණනය කිරීම වලංගු වන බව සැලකිය යුතු කරුණකි.

විරැකියාව ඉහළ යෑම වැනි අහිතකර තත්ත්වයන් කෙටි කාලීනව ඇති විය හැකිය. කෙසේ වෙතත්, කෙටි කාලීන අහිතකර තත්ත්වයන්ට සාපේක්ෂව උද්ධමනය ඉහළ යෑම හේතුවෙන් ආර්ථිකයට වන අවහිරතා අඩු වීම මගින් ආර්ථිකයට ලැබෙන දිගු කාලීන වාසි ඉතා වැඩි වේ. මේ අතර, දිගු කාලීනව පවතින අවධමනය ආර්ථික කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බැවින්, ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් නිර්-උද්ධමන කාලපරිච්ඡේදයන් අතරතුර අනාගතයේදී ඇති විය හැකි අවධමනය මගින් සිදු විය හැකි අවදානම් පිළිබඳ සුපරීක්ෂාකාරී විය යුතුය (Bernanke, 2012).


ගෝලීය වශයෙන් සැලකිය යුතු නිර්-උද්ධමනයන් පැවති කාලපරිච්ඡේද වාර්තා වී තිබේ. 1980 දශකයේ මුල් කාලයේ දී එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුවෙහි අධිපති ධූරය පෝල් වොල්කර් විසින් දැරූ සමයේ, එක්සත් ජනපදයේ උද්ධමනය අඩුවීම පුළුල් ලෙස සාකච්ඡා කරන ලද සාර්ව ආර්ථික ප්‍රතිඵලයකි (මෙය 'වොකර් නිර්-උද්ධමනය (Volcker disinflation)' ලෙස හැඳින්වේ). 1970 දශකයේ සහ 1980 දශකයේ මුල් කාලයේදී එක්සත් ජනපදයේ පොදු මිල මට්ටම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් වාර්ෂික උද්ධමන අනුපාතිකය, 1980 වසරේදී පැවති සියයට 13.5ක උපරිමයක සිට 1983 වසර වන විට සියයට 3.2ක් දක්වා පහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළ එක්සත් ජනපද ආර්ථිකය අවපාත ද්විත්වයකට මුහුණ දුන් අතර, ඒවා නිර්-උද්ධමනය සඳහා ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති හේතුවෙන් එම ආර්ථික අවපාත ඇති වූ බවට බොහෝ විට සැලකේ. කෙසේ වෙතත්, 'වෝකර් නිර්-උද්ධමනය' මගින් 1980 සහ 1990 දශකවල එක්සත් ජනපදයේ දිගු කාලීන ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය පදනම සපයන ලදී. මේ අතර, 1970 දශකයේ මුල් කාලයේදී ජපානය සහ ජර්මනිය තුළ ද ඉහළ උද්ධමන මට්ටමක් වාර්තා විය. කෙසේ වෙතත්, 1970 දශකයේ අග භාගය වන විට මෙම රටවල් දෙක තුළ අනෙකුත් දියුණු ආර්ථිකයන්ට සාපේක්ෂව අඩු උද්ධමනයක් වාර්තා විය. දිගු කාලීනව උද්ධමනය මූල්‍ය සංසිද්ධියක් යන අවබෝධය මත පදනම්ව, අදාළ රජයන් සහ මහ බැංකු දැඩි විනයකින් ක්‍රියාත්මක වීම මෙම නිර්-උද්ධමන ක්‍රියාවලියේ සාර්ථකත්වයට හේතු විය (Nelson, 2007). තවද, ඵලදායීතාව වැඩිදියුණු කිරීම ද නිර්-උද්ධමන ක්‍රියාවලිය සඳහා උපකාරී වේ. සැපයුම් අංශයේ ඵලදායී ප්‍රතිපත්ති හරහා දිගු කාලීනව විභව දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය කිරීම තුළින් සමස්ත ඉල්ලුම් පීඩන අඩු කළ හැකිය. 1970 දශකයේ සහ 1980 දශකයේ මුල් කාලයේදී ඉහළ මට්ටම්වල පැවති ගෝලීය උද්ධමනය සැලකිය යුතු ලෙස පහළ යෑම සඳහා ඵලදායිතාව ඉහළ නැංවීම, නියාමන සීමා ඉවත් කිරීම සහ ගෝලීයකරණය ඉහළ යෑම වැනි සාධක ද හේතු වූ බව සැලකේ (Rogoff, 2004).

**ශ්‍රී ලංකාවේ අපේක්ෂිත නිර්-උද්ධමන ක්‍රියාවලිය**

අපේක්ෂා කළ පරිදි නිර්-උද්ධමන ක්‍රියාවලිය ආරම්භ වී ඇති බව තහවුරු කරමින් ශ්‍රී ලංකාවේ උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේදී වාර්තා වූ එහි උපරිම මට්ටම වන සියයට 70 (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) සිට පහළ යෑම ආරම්භ විය. මෙම ක්‍රියාවලිය සඳහා දැඩි මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් අඩු වූ සමස්ත ඉල්ලුම් පීඩන, දේශීය සැපයුම් තත්ත්වයන්හි අපේක්ෂිත වර්ධනයන්, විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු වීම, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම, සහ එවැනි පහළ යෑම් දේශීය වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම ආදී ආර්ථික සාධක මගින් සහාය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංඛ්‍යානමය වශයෙන් සලකා බැලීමේදී නිර්-උද්ධමන ක්‍රියාවලිය සඳහා මිලෙහි ගතිකතාව සහ පදනම් බලපෑම යන සාධක ද්විත්වයම හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, මේ අතුරින් පදනම් බලපෑම වැඩි වශයෙන් දායකත්වයක් ලබා දෙනු ඇත.

තවද, සංඛ්‍යානමය සාධකවල බලපෑම් උද්ධමනය සඳහා හේතු වන සාධක සහ අපේක්ෂිත ආර්ථික ප්‍රවණතා මගින් තක්සේරු කළ හැකිය. 2023 සහ 2024 වසරවලදී ගෝලීය උද්ධමනය පහත යනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (2023) අපේක්ෂා කරයි. ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන්වල අපේක්ෂිත පහළ යෑම නියමිත පරිදි සහ විනිවිදභාවයෙන් යුතුව දේශීය වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වන්නේ නම් ආනයනික උද්ධමනයෙහි මිලෙහි ගතිකතාව 2023 වසරේ දී සැලකිය යුතු ලෙස පහළ මට්ටමක තබා ගත හැකිය. තවද, ගෙවුම් ශේෂ වර්ධනය වීම මධ්‍යයේ, විනිමය අනුපාතිකය ස්ථායී ලෙස පැවතීම මේ සඳහා උපකාරී වනු ඇත. මෑතකදී දක්නට ලැබුණු එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම අඛණ්ඩව පැවතියහොත් ආනයනික උද්ධමනය පහළ යෑමට සහ මෙම ආනයන හා සම්බන්ධ වක්‍ර බලපෑම් අඩු කිරීමට එය උපකාරී වන අතර ම, එමගින් නිර්-උද්ධමන ක්‍රියාවලියට සහාය ලැබෙනු ඇත. මේ අතර, ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම පිළිබිඹු කරමින් 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ ආනයන මිල ගණන් අසමානුපාතික ලෙස ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් ම 2022 වසරේ මැද භාගයේ දී පමණ ආනයනික වෙළඳ භාණ්ඩ මිල ගණන් මාසික ලක්ෂ්‍යමය පදනම මත විශාල ලෙස ඉහළ ගියේය. මෙම ඉහළ යෑම 2023 වසරේ දී සැලකිය යුතු සෘණාත්මක පදනම් බලපෑමක් හරහා ආනයනික උද්ධමනයට හිතකර ලෙස බලපානු ඇති අතර, එය නිර්-උද්ධමන ක්‍රියාවලියට සහාය වෙනු ඇත (රූප සටහන වි.ස. 1.2). මේ අතර, දේශීය උද්ධමනය සලකා

**රූප සටහන වි.ස. 1.3**
**මතුපිට උද්ධමන පුරෝකථන**
**කො.පා.මි.ද.* (කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %)**




*සටහන: 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වූ දත්ත කො.පා.මි.ද. (2013=100) මත පදනම් වන අතර 2023 වසරේ පළමු කාර්තුව සඳහා වූ දත්ත කො.පා.මි.ද. (2021=100) මත පදනම් වේ. පුරෝකථන, පවතින සියලුම දත්ත මත පදනම් වේ.


මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

බැලීමේ දී, පෙර නොවූ අන්දමේ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමේ ක්‍රියාමාර්ග සහ අතිශය දැඩි රාජ්‍ය මූල්‍ය ස්ථාවරය හේතුවෙන් මිල ඉහළ යෑම සැලකිය යුතු ලෙස අඩු වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මීට අමතරව, පසුගිය මාස කිහිපය තුළ දී දේශීය සැපයුම් තත්ත්වයන්හි යම් වර්ධනයන් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ආහාර උද්ධමනය හා සම්බන්ධ මිල ඉහළ යෑම් ඇතැම් මාසවලදී සෘණ අගයන් ද වාර්තා කළේය. උද්ධමනය පහළ දැමීමේ ප්‍රයත්නයට සහාය වෙමින් වැඩිදියුණු වූ සැපයුම් තත්ත්ව 2023 වසරේදී ද අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, විවිධ බදු සම්බන්ධයෙන් රජය විසින් සිදු කරන ලද වෙනස්කම් මෙන්ම 2022 වසරේ සහ 2023 වසරේ මුල් කාලයේදී උපයෝගීතා ගාස්තු සංශෝධන කිරීම, සහ ඒවායේ වක්‍ර බලපෑම් පොදු මිල මට්ටම එක් වරක් පමණක් ඉහළ යෑමට හේතු විය. තවද, ගෙවුම් ශේෂ අර්බුදය හේතුවෙන් දේශීය සැපයුම් තත්ත්වයේ දක්නට ලැබුණු බොහෝ හිඟතා සහ අවහිරතා හේතුවෙන් 2022 වසරේ දී සැපයුම් අංශයේ සාධක උද්ධමනය සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. සැපයුම් අවහිරතා මෙන්ම බදු සහ උපයෝගිතා ගාස්තු ඉහළ දැමීම හේතුවෙන් 2022 වසරේදී දේශීය මිල ගණන්, මාසික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ ගිය අතර ඒ හේතුවෙන් වූ සැලකිය යුතු සංඛ්‍යානමය පදනම් බලපෑම 2023 වසරේ දී උද්ධමනය සඳහා හිතකර ලෙස බලපානු ඇත (රූප සටහන වි.ස. 1.2). එම නිසා, මිල ගණන් ඉහළ යෑම මන්දගාමී වීම සහ සැලකිය යුතු අන්දමේ පදනම් බලපෑමෙහි සහාය ඇතිව ඉදිරි කාලය තුළ දී දේශීය උද්ධමනය පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආනයනික සහ දේශීය උද්ධමනයෙහි අපේක්ෂිත වෙනස්වීම් මෙන්ම සැපයුම් තත්ත්වයන් වර්ධනය වීම ආදියෙහි ප්‍රතිඵලයක් වන රටේ සමස්ත උද්ධමනය, 2023 වසරේ දී තිරසාර පදනමකින් පහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් අපේක්ෂිත නිර්-උද්ධමන මාවත සාක්ෂාත් කර ගැනීමට හැකි වනු ඇත.

මහ බැංකුවේ 'උද්ධමන ව්‍යාප්ති සටහන (Inflation Fan Chart)' මගින් කාර්තුමය පදනමින්, උද්ධමනය සඳහා වන පුරෝකථන විශ්‍රම්භ ප්‍රාන්තර (Confidence Intervals, CI) ආකාරයෙන් ඉදිරිපත් කරයි. උද්ධමන පුරෝකථනය වටා ඇති අවිනිශ්චිතතා විශ්‍රම්භ ප්‍රාන්තර මගින් පෙන්නුම් කරන අතර, පුරෝකථන කාල පරාසය ඉහළ යෑමත් සමග උද්ධමන පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතා විශාල වේ. කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා වන මහ බැංකුවේ නවතම පුරෝකථන උද්ධමන ව්‍යාප්ති සටහන ඇසුරින් රූප සටහන වි.ස. 1.3හි දැක්වා ඇත.

2022 වසරේ දී උපරිම අගයට පැමිණ ඇතැයි ඇස්තමේන්තු කර ඇති ගෝලීය උද්ධමනය, මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම, සැපයුම් දාම යථා තත්ත්වයට පත් වීම සහ බලශක්ති හා වෙනත් වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2023 වසර තුළ දී පහළ ගොස් 2024 වසරේ දී තවදුරටත් අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. රූප සටහන වි.ස. 1.4 මගින් තෝරාගත් රටවල මෑතකාලීන මුදල් ප්‍රතිපත්ති වාර්තා අනුව එම රටවල උද්ධමන පුරෝකථන නිරූපණය කෙරෙයි. එමගින් බොහෝ රටවල උද්ධමනය 2022 වසරේ දී එම මහ බැංකුවල උද්ධමන ඉලක්කවලට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බව පෙන්වා දෙයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ මෙන්ම මෙම රටවලද 2023 වසරේ දී වේගවත් නිර්-උද්ධමන ක්‍රියාවලියක් අපේක්ෂා කරයි.

**රූප සටහන වි.ස. 1.4**
**ගෝලීය වශයෙන් නිර්-උද්ධමන පුරෝකථන**




මූලාශ්‍ර: ඇමරිකා එක්සත් ජනපදය 2023 මාර්තු පළ කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තාව; එක්සත් රාජධානිය 2023 පෙබරවාරි පළ කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තාව; යුරෝ කලාපය 2022 දෙසැම්බර් පළ කරන ලද යුරෝ කලාපයේ කාර්ය මණ්ඩල සාර්ව ආර්ථික පුරෝකථන; ඉන්දියාව 2022 සැප්තැම්බර් පළ කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තාව; තායිලන්තය 2022 සිව්වන කාර්තුවේදී පළ කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තාව

**උද්ධමන අපේක්ෂා සහ උද්ධමන පුරෝකථනවල කාර්යභාරය**

මනා ලෙස පාලනය වූ උද්ධමන අපේක්ෂා මගින් ද රටේ නිර්-උද්ධමන ක්‍රියාවලිය ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. උද්ධමන අපේක්ෂා මගින් ආර්ථිකයක පාර්ශ්වකරුවන් විසින් අනාගතයේදී මිල ගණන් වෙනස් වනු ඇතැයි අපේක්ෂා කරන ආකාරය පිළිබිඹු කරයි. වර්තමානයේ සිදු කරන වියදම්, ණය ගැනීම් සහ ආයෝජන තීරණ කෙරෙහි උද්ධමන අපේක්ෂා මගින් බලපෑම් කළ හැකි බැවින් මහජනයාගේ අපේක්ෂා අනුව යම්තාක් දුරට සැබෑ උද්ධමනය රඳා පැවතීම හේතුවෙන් උද්ධමන අපේක්ෂා වැදගත් වේ. එම නිසා, මැදි කාලීන උද්ධමන ඉලක්කයට වඩා ආර්ථික නියෝජිතයින්ගේ දැනට පවතින උද්ධමන අපේක්ෂා වැඩි නම් එම අපේක්ෂා වෙනස් කිරීම සඳහා මහ බැංකුවක් විසින් පූර්ව සූදානමකින් යුතුව ගනු ලබන ක්‍රියාමාර්ග නිර්-උද්ධමන ක්‍රියාවලියක ඇතුළත් වේ. 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ උද්ධමනය ඉහළ යෑමත් සමග උද්ධමන අපේක්ෂා යම් ප්‍රමාණයකට අස්ථාවර විය. කෙසේ වෙතත්, සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පූර්වෝපායික ලෙස ක්‍රියාත්මක කිරීම මෙන්ම මැදි කාලීන උද්ධමන පුරෝකථන ප්‍රකාශයට පත් කිරීම ඇතුළුව කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතුව මුදල් ප්‍රතිපත්තිය සන්නිවේදනය කිරීමේ උපාය මාර්ග හේතුවෙන් මහජනතාවගේ අපේක්ෂිත උද්ධමන මට්ටම අඛණ්ඩව පහළ යෑමක් මෑතකදී නිරීක්ෂණය වූ අතර, එය මහ බැංකුවේ විශ්වසනීයත්වය ඉහළ නැංවීමට ද උපකාරී විය. නිර්-උද්ධමන ක්‍රියාවලිය සාර්ථකව සිදු වීමත් සමග මහ බැංකුවේ උද්ධමන ඉලක්කයට අනුකූලව මැදි කාලීනව උද්ධමන අපේක්ෂා පාලනය කිරීම තවදුරටත් යහපත් වනු ඇත.

පුරෝකථනය කළ කෙටි හා මැදි කාලීන උද්ධමන ගමන් මග නිරන්තරයෙන් සන්නිවේදනය කිරීම නිර්-උද්ධමන ක්‍රියාවලියේ ප්‍රධාන අංගයක් ලෙස පවතී. මේ සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති විවරණයන්ගෙන් අනතුරුව ප්‍රකාශයට පත් වන මාධ්‍ය නිවේදනවල සහ සුදුසු පරිදි අනෙකුත් සන්නිවේදන ක්‍රම හරහා උද්ධමන ව්‍යාප්ති සටහන අඛණ්ඩව ප්‍රකාශයට පත් කරනු ඇත. මැදි කාලීන උද්ධමන පුරෝකථනය සහ උද්ධමන ඉලක්කය අතර යම්කිසි වෙනසක් පවතී නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපත්තිමය පියවර කඩිනමින් ගත යුතුය. උද්ධමන ගමන් මග පිළිබඳව නිරන්තරයෙන් හා විනිවිදභාවයෙන් යුතුව සන්නිවේදනය කිරීම, මිල ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීම සහ පවත්වා ගැනීම සඳහා වන මහ බැංකුවේ කැපවීම සහතික කිරීමේ යාන්ත්‍රණයක් ලෙස ද ක්‍රියා කරයි.

තවද, මහ බැංකුව විසින් 2023 වසරේ දෙවන භාගයේ සිට ඉදිරි දැක්මක් සහිත (forward looking) අර්ධ වාර්ෂික මුදල් ප්‍රතිපත්ති වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරනු ඇත. මෙම වාර්තාව මගින් ප්‍රධාන වශයෙන් උද්ධමනය සඳහා වන මැදි කාලීන පුරෝකථන සහ පුරෝකථන සඳහා තුඩු දුන් සාධක මෙන්ම ප්‍රකාශයට පත් කරන ලද පුරෝකථනවලින් සැබෑ උද්ධමනය අපගමනය වී තිබේ නම් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් ද සිදු කරනු ඇත.

ඉහත සාකච්ඡා කළ පරිදි මහ බැංකුව පිළිබඳ විශ්වාසනීයත්වය නිර්-උද්ධමන ක්‍රියාවලිය සඳහා ප්‍රධාන සාධකයක් වේ. මෙමගින් උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට සහාය වනු ඇත. මහ බැංකුව පිළිබඳ විශ්වසනීයත්වය මහ බැංකුවේ ස්වාධීනත්වයට බෙහෙවින් සම්බන්ධ වේ. එහිදී, අපේක්ෂිත නව ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීම මහ බැංකුවේ ස්වාධීනත්වය සහ විශ්වසනීයත්වය වර්ධනය කිරීමට විශාල දායකත්වයක් සපයනු ඇති අතර, එය වර්තමානයේ පවතින නිර්-උද්ධමන ක්‍රියාවලියට සහාය වී උද්ධමන අපේක්ෂා තවදුරටත් පාලනය කරනු ඇත.

---

**මූලාශ්‍ර**

1. Bernanke, B. S. (2002). Deflation: Making Sure "it" Doesn't Happen Here, Remarks by Governor Ben S. Bernanke Before the National Economists Club, Washington, DC November, 21.
2. International Monetary Fund (IMF), (2023). World Economic Outlook Update Jan 2023: Inflation Peaking amid Low Growth, Washington, DC: International Monetary Fund.
3. Nelson, E. (2007). The Great Inflation and Early Disinflation in Japan and Germany. International Journal of Central Banking, 3(4), 23-76.
4. Rogoff, K. (2004). Globalization and Global Disinflation, Federal Reserve Bank of Kansas City conference on Monetary Policy and Uncertainty: Adapting to a Changing Economy.

සියයට 8.3 හා සැසඳීමේ දී 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී සියයට 47.7ක් ලෙස සටහන් විය. ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය ද 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී පැවති සියයට 10.8ට සාපේක්ෂව 2022 වසරේ දෙසැම්බර් මාසය අවසාන වන විට සියයට 57.5ක් දක්වා ඉහළ ගියේය. මතුපිට උද්ධමනයට සමාන අන්දමින්, මූලික උද්ධමනය ද 2023 වසරේ මුල් භාගය තුළ අඛණ්ඩව පහළ ගියේය. ඒ අනුව, කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2023 වසරේ මාර්තු මාසයේ දී සියයට 39.1ක් දක්වා පහළ ගිය අතර ජා.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2023 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 50.1ක් දක්වා පහළ ගියේය. මූලික උද්ධමනය අඛණ්ඩව පහළ යෑම සඳහා ඉල්ලුම මත පදනම් වූ උද්ධමන පීඩන සහ අහිතකර උද්ධමන අපේක්ෂා පාලනය සඳහා මහ බැංකුව විසින් ගෙන ඇති ශක්තිමත්


ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතු විය. මේ අතර, 2022 වසරේ සැප්තැම්බර් මාසය දක්වා උද්ධමනය වැඩි වූ කාල සීමාව තුළ ඉහළ මට්ටමක පැවති උද්ධමන අපේක්ෂා, නිර්-උද්ධමන කාල සීමාව තුළ සමස්තයක් ලෙස පහළ යෑමේ ප්‍රවණතාවක් අනුගමනය කළේය.

### විදේශීය අංශයේ ප්‍රවණතා

**විදේශීය මූල්‍ය ලැබීම් අඩු මට්ටමක පැවතීම, දළ නිල සංචිත අඩු වීම සහ විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස ඉහළ අවප්‍රමාණයකට ලක්වීම මධ්‍යයේ ශ්‍රී ලංකාවේ විදේශීය අංශය 2022 වසරේ දී දැඩි ගෙවුම් තුලන ආතතීන්ට මුහුණ දුන් අතර, එම තත්ත්වය තවදුරටත් උග්‍රවීම වළක්වා ගැනීමට සහ විදේශීය තුලනය යථා තත්ත්වයට පත් කිරීමට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රාශියක් අවශ්‍ය විය.** රජය, 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන් සමග ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමේ අපේක්ෂාවෙන් අතුරු කාලසීමාවක් සඳහා ණය සේවාකරණය අත්හිටුවීම ප්‍රකාශයට පත්කළ අතර අරමුදල් සපයා ගැනීම සඳහා ජා.මූ. අරමුදල වෙතින් සහාය ඉල්ලා සිටියේය. රජය සහ මහ බැංකුව විදේශ විනිමය ගෙවීම් සීමා කිරීමට පියවර ගත් අතර විදේශ විනිමය ලැබීම් ප්‍රවර්ධනය කිරීමට ද කටයුතු කළේය. සැලකිය යුතු ලෙස දැඩි කරන ලද මුදල් ප්‍රතිපත්තියේ සහ අඩු ඉල්ලුම් තත්ත්වවල බලපෑම පිළිබිඹු කරමින් ආනයන ඉල්ලුම කැපී පෙනෙන ලෙස අඩු විය. පවතින සීමාකාරී ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන යමින් ආනයන ප්‍රමුඛතා ක්‍රියාමාර්ග මාලාවක් ආරම්භ කරන ලදී. මෙම සීමාවන්ට, තෝරාගත් ආනයන තාවකාලිකව අත්හිටුවීම් සහ බලපත්‍ර සහ ආන්තික තැන්පතු අවශ්‍යතා පැනවීම ඇතුළත් විය. එසේම, අවිධිමත් වෙළඳපොළෙහි ක්‍රියාකාරකම් අධෛර්යමත් කිරීමේ අරමුණින් තෝරාගත් ආනයන ගෙවීම් ක්‍රම සඳහා සීමාවන් පනවන ලදී. ප්‍රාග්ධන ස්වභාවයේ ඇතැම් විදේශ විනිමය ගෙවීම් සඳහා වූ සීමාවන් ද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. තවද, සංක්‍රමණික සේවකයන් සඳහා මුදල් මත පදනම් වූ සහ මුදල් මත පදනම් නොවූ ඉලක්කගත දිරිගැන්වීම් තුළින් නිල මාර්ග හරහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් දිරිමත් කරන ලදී. විනිමය අනුපාතිකයෙහි සිදු වූ ඉහළ අවප්‍රමාණය වීම, විවෘත ගිණුම් වැනි ඇතැම් ගෙවීම් ක්‍රම යටතේ සිදු කළ ආනයන සීමා කිරීම සහ ආනයන සඳහා ඇති ඉල්ලුම අඩුවීම යනාදිය නිල විනිමය අනුපාතිකය සහ අවිධිමත් වෙළඳපොළෙහි පිරිනමන විනිමය අනුපාතිකය අතර පැවති ඉහළ පරතරය නිවැරදි කිරීමට හේතු විය. මෙය, විධිමත් මාර්ග ඔස්සේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් තවදුරටත් දිරිමත් කළේය. 2022 වසරේ දෙවන භාගයේ දී ආනයන වියදම් පහත වැටීම සහ අපනයන ඉපැයීම් ශක්තිමත් මට්ටමක පැවතීම හේතුවෙන් වෙළඳ හිඟයෙහි සැලකිය යුතු අඩු වීමක් නිරීක්ෂණය විය. සංචාරක ඉපැයීම් ඉහළ යෑම නිසා සේවා ගිණුමේ අතිරික්තය යම් ප්‍රමාණයකට ඉහළ ගියේය. කෙසේ වෙතත්, ප්‍රවාහනය, ගුවන් සහ මුහුදු භාණ්ඩ ප්‍රවාහනය සහ තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ අංශය වෙත වූ ලැබීම් ඇතුළු සේවා ගිණුමේ අනෙකුත් සියලුම අංශ පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතුණි. 2022 වසරේ දෙවන භාගයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සැලකිය යුතු වර්ධනයක් තිබියදීත් 2022 වසරේ දී ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය අඩු වූ අතර, උපචිත පදනම මත සම්පාදනය කරන ලද ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය, පෙර වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී සුළු වශයෙන් අඩු විය. මෙම ප්‍රවණතා හමුවේ, ජංගම ගිණුම් හිඟය 2021 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.7 සිට 2022 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.9ක් දක්වා අඩු විය. කොළඹ කොටස් වෙළඳපොළෙහි (ප්‍රාථමික වෙළඳපොළ මිලදී ගැනීම් ඇතුළුව) සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත ශුද්ධ විදේශීය ආයෝජන ලැබීම් වාර්තා වී තිබියදීත්, රජය වෙත වූ විදේශීය ලැබීම් අඩුවීම හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. මේ අතර, දළ නිල සංචිත පෙර වසර අවසන් වන විට වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 3.1ට සාපේක්ෂව 2022 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 1.9ක් දක්වා අඩු විය. කෙසේ වෙතත්, 2022 වසර අවසානය වන විට, චීන මහජන බැංකුවෙන් ලබා ගත් එ.ජ. ඩොලර් බිලියන 1.4ට පමණ සමාන විදේශ විනිමය හුවමාරු පහසුකම ද මෙයට ඇතුළත් වූ අතර එය භාවිත කිරීමේ කොන්දේසිවලට යටත් වේ. මහ බැංකුව, 2022 වසරේ දී ප්‍රධාන වශයෙන් බලපත්‍රලාභී බැංකු විසින් සිදු කළ අනිවාර්ය විකුණුම්වලින්, එ.ජ. ඩොලර් බිලියන 2.1ක් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් අවශෝෂණය කර ගත් අතර, ඉන්ධන, ගල් අඟුරු සහ ආහාර පිසීමට යොදා ගන්නා ගෑස් යනාදී අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට අවශ්‍ය විදේශ විනිමය සපුරාලීම සඳහා එ.ජ. ඩොලර් බිලියන 2.7ක් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සපයන ලදී. 2022 වසර තුළ අතිශය අභියෝගාත්මක තත්ත්වයන් යටතේ අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම සහතික කිරීම

1

**1.6 රූප සටහන**
**ගෙවුම් තුලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සඳහා, විදේශ විනිමය කළමනාකරණය කිරීමේ දී මහ බැංකුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. මේ අතර, විදේශීය මූල්‍යන මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීමට තිබූ හැකියාව අඩු වීම සහ වාණිජ ණයවල වටිනාකම විශාල වශයෙන් තක්සේරු කිරීමේ වෙනස්කම්වලට ලක්වීම පිළිබිඹු කරමින්, 2021 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 51.8ක් වූ රටේ මුළු විදේශීය ණය ප්‍රමාණය 2022 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 49.7ක් ලෙස වාර්තා විය. නොපියවා ඉතිරිව ඇති රජයේ විදේශීය ණයවල කැපී පෙනෙන වැඩිවීමක් තිබියදීත්, වෙළඳපොළ මිල ගණන් අනුව තක්සේරු කළ රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය අඩුවීම හේතුවෙන්, රජයේ මුළු විදේශීය වගකීම් ප්‍රමාණය සමාන මට්ටම්වල පැවතුණි. ඉන්ධන, ඖෂධ සහ පොහොර ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා රජය විසින් ද්විපාර්ශ්වික ණය ආකාරයෙන් කලාපීය රටවලින් හදිසි ණය පහසුකම් රැසක් ලබාගෙන ඇති හෙයින් එමගින් 2022 වසර තුළ දී සැලකිය යුතු විදේශීය ණය ලැබීම් ප්‍රමාණයක් වාර්තා කළේය. ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන්ට ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් විදේශීය ණය ආපසු ගෙවීමේ ප්‍රමාණය අඩු වීමෙන් යම් සහනයක් ලැබුණි. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාවයේ සැලකිය යුතු හිඟය විනිමය අනුපාතිකය මත පීඩනයක් ඇති කළ අතර, 2022 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැළපීමක අවශ්‍යතාවය මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. කෙසේ වෙතත්, පසුව වෙළඳපොළ සමපේක්ෂණ හමුවේ විනිමය අනුපාතිකය සැලකිය යුතු ඉහළ අවප්‍රමාණයකට ලක් විය. ඒ අනුව, 2022 වසරේ අප්‍රේල් මස අවසානය වන විට, ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 41.4කින් සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. 2022 වසරේ මැයි මස මැද සිට, අධික සමපේක්ෂණ හේතුවෙන් දිනක් තුළ විනිමය අනුපාතිකයෙහි සිදුවන ඕනෑම සැලකිය යුතු උච්ඡාවචනයක් මැඩපැවැත්වීමේ අරමුණින්, මහ බැංකුව විසින් අන්තර් බැංකු බරිත සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකයට අදාළ වන මධ්‍ය විනිමය අනුපාතිකයක් සහ විචලන සීමාවන් ප්‍රකාශනයට පත් කිරීම මගින් වෙළඳපොළ වෙත මාර්ගෝපදේශ ලබා දීම ආරම්භ කරන ලදී. විනිමය අනුපාතිකය අධික ලෙස අවප්‍රමාණය වීමෙන් සහ විචලනය වීමෙන් සාර්ව ආර්ථිකය වෙත සිදු වීමට තිබූ අහිතකර බලපෑම් අවම කර ගැනීමට උපකාරී වෙමින්, එතැන් සිට විනිමය අනුපාතිකය ස්ථාවර කිරීමට මෙම පියවර ඵලදායී විය. මෙම ප්‍රවණතා පිළිබිඹු කරමින්, මුදල් වර්ග කිහිපයකින් සැදුම්ලත් පැසකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි සිදුවන වෙනස්කම් සහ එමගින් විදේශීය තරගකාරිත්වය මනිනු ලබන නාමික සඵල විනිමය අනුපාතික (නා.ස.වි.අ.) සහ මූර්ත සඵල විනිමය අනුපාතික (මූ.ස.වි.අ.) දර්ශක 2022 වසරේ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය. සමස්තයක් වශයෙන්, මූ.ස.වි.අ. දර්ශකය දර්ශකාංක 100 සීමාවට වඩා සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, විනිමය අනුපාතිකය ජාත්‍යන්තර වෙළඳාම සඳහා ප්‍රමාණවත් ලෙස තරගකාරීව පවතින බව එමගින් පිළිබිඹු විය.

ශ්‍රී ලංකාව 2023 වසරේ මාර්තු මාසයේ දී **විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) මිලියන 2,286ක් (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 3,000ක්) සඳහා ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය ලබා ගත් අතර, එම වැඩසටහන යටතේ වි.ගැ.හි. මිලියන 254ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 333ක) පළමු වාරිකය 2023 වසරේ මාර්තු මාසයේ දී ලබා දෙන ලදී.** විස්තීර්ණ ණය පහසුකමෙන් සහාය දක්වන වැඩපිළිවෙළ සම්බන්ධයෙන් ජා.මූ. අරමුදල සමඟ 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ඇති කර ගත් නිලධාරී මට්ටමේ එකඟතාවයෙන් පසුව, ශ්‍රී ලංකාව මූල්‍ය සහතික ලබා ගැනීම සඳහා ද්විපාර්ශ්වික ණය හිමියන් සමඟ සාකච්ඡා ආරම්භ කළ අතර වාණිජ ණය හිමියන් සමඟ යහපත් අරමුණු ඇතිව වැඩපිළිවෙළක් වෙත යොමු විය. තවද, ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සියලුම පූර්ව ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීමට ශ්‍රී ලංකාව විසින් පියවර ගන්නා ලදී. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා, 2023 වසරේ මුල් කාලපරිච්ඡේදයේ සිට හිතකර ක්‍රියාමාර්ගයන් කිහිපයක් ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ

**විශේෂ සටහන 2**

## ශ්‍රී ලංකාවේ ආර්ථික ගැළපුම් වැඩසටහන සඳහා ආධාර වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ

**හැඳින්වීම**

ගෝලීය සහ දේශීය කම්පන හේතුවෙන් සාර්ව ආර්ථිකයෙහි පවතින ව්‍යුහාත්මක ගැටලු මගින් ඇති කරන ලද අවදානම් සහ අස්ථාවර තත්ත්වයන්වලට ශ්‍රී ලංකා ආර්ථිකය නිරන්තරයෙන් මුහුණ දෙමින් සිටියි. ආර්ථිකය මත පැවැති පීඩනය තවත් ඉහළ නංවමින්, පෙර සූදානමකින් තොරව ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති වෙනස්කම් හා සමඟ 2020 වසරේ සිට කොවිඩ්-19 වසංගතය ආරම්භ වීම නිසා ආර්ථික තත්ත්වය දැඩි ලෙස දුර්වල විය. එහි ප්‍රතිඵලයක් ලෙස, රට දැඩි ගෙවුම් තුලන අර්බුදයකට මුහුණ දුන් අතර, ඉන් අනතුරුව 2022 වසරේ දී ගැටලු රාශියකට මුහුණ දුන්නේය. ආර්ථිකය ඉහළ ස්ථාවරත්වයක් කරා යොමු කිරීම සඳහා 2022 වසරේ මුල් භාගයේ සිට ප්‍රතිපත්තිමය මැදිහත්වීම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. සාර්ව ආර්ථික ස්ථායීකරණ වැඩසටහනකට යටත්ව මූල්‍ය ආධාර ලබා ගැනීම සහ ඊට අදාළව රාජ්‍ය ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු ආරම්භ කිරීම මෙම ක්‍රියාවලියේ දී ගනු ලැබූ ප්‍රධාන පියවර වේ. ගෙවුම් තුලනයට සහායවීම සඳහා සහ රජයේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට සහාය දැක්වීම ඇතුළු විවිධ අරමුණු සඳහා ශ්‍රී ලංකාව 2022 වසරට පෙර, වරින් වර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) වැඩසටහන් ගණනාවකට යොමුවිය. කෙසේ වෙතත්, පෙර අවස්ථාවල දී මෙන් නොව, ශ්‍රී ලංකා ඉතිහාසය තුළ මෙතෙක් වාර්තා වූ දුෂ්කරම ආර්ථික අර්බුදය හමුවේ විස්තීර්ණ ණය පහසුකමක් ලබා ගැනීම සඳහා 2022 වසරේ දී ජා.මූ. අරමුදල සමඟ සාකච්ඡා ආරම්භ කළේය. ණය ප්‍රමාණය අධික ලෙස වර්ධනය වීම මෙන්ම රාජ්‍ය මූල්‍ය හා ගෙවුම් තුලන මූල්‍යන අවශ්‍යතා අඛණ්ඩව ඉහළ යෑම හමුවේ ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල සාර්ථකත්වය සීමා විය. ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් අඛණ්ඩව පහත හෙළීම් මධ්‍යයේ විදේශීය මූල්‍යන සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රවේශය සීමිත වී ඇති අතර, එමගින් නව අරමුදල් රැස්කිරීම සහ පවතින ණය සේවාකරණය අතිශයින් අභියෝගාත්මක විය. භාවිතා කළ හැකි දළ නිල සංචිත ශූන්‍ය මට්ටමට ආසන්න වීම, විනිමය අනුපාතිකය පෙර නොවූ අන්දමින් අවප්‍රමාණය වීම, ඉන්ධන, විදුලිය සහ අනෙකුත් අත්‍යවශ්‍ය ආනයනික ද්‍රව්‍ය ලබාගැනීමට මහජනතාවට දුෂ්කර වීම, ඉල්ලුම් පීඩන සහ සැපයුම් හිඟතා හේතුවෙන් සාමාන්‍ය මිල මට්ටම් පැවති මට්ටමේ සිට වේගවත් ලෙස ඉහළ යෑම ආදිය මගින් මූල්‍ය පද්ධති ස්ථායීතාව අභියෝගයට ලක්වූ අතර, 2022 වසරේ මුල් භාගයේ දී සමාජ හා දේශපාලන ගැටුම් යළි යළිත් සිදුවිය. මෙවැනි පසුබිමක් තුළ, ආර්ථික ස්ථායීතාව ඇති කිරීම සඳහා බාහිර පාර්ශ්වයක සහාය අවශ්‍ය වූ අතර, ශ්‍රී ලංකා බලධාරීන් විසින් ජා.මූ. අරමුදල සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදී. යෝජිත ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජා.මූ. අරමුදලෙහි කාර්ය මණ්ඩල කණ්ඩායම සමඟ වසරකට අධික කාලයක් පුරා අඛණ්ඩව සාකච්ඡා කිරීම සහ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ නියමිත පූර්ව ක්‍රියාමාර්ග ගැනීම සාර්ථකව අවසන් කිරීම මෙන්ම නිල ණය හිමියන්ගෙන් මූල්‍ය සහතිකවීම් ලැබීම හේතුවෙන් 2023 වසරේ මාර්තු මස අග දී විස්තීර්ණ ණය පහසුකම සඳහා අනුමැතිය ලබා ගැනීමට හැකි විය. මෙම ආර්ථික ගැළපුම් වැඩසටහනේ විශේෂ ලක්ෂණ, විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ අපේක්ෂිත වර්ධනයන්, ඉදිරි කාලපරිච්ඡේදය තුළ ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා වන රටේ කැපවීම, වසර හතරක් පුරා මෙම වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පහත කොටස් මගින් කෙටියෙන් සාකච්ඡා කෙරේ.

**ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමෙහි අරමුණු සහ ක්‍රියාපටිපාටිය**

මාස 48ක වැඩපිළිවෙළක් සහිත වත්මන් ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ ඇති සමස්ත මුදා හැරීම් ප්‍රමාණය වන විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) බිලියන 2.286ක් (එ.ජ. ඩොලර් බිලියන 3ක් පමණ) රජයේ අයවැය සඳහා සහාය පිණිස යොදා ගැනීමට නියමිතය. එසේ වුවත්, විස්තීර්ණ ණය පහසුකම යටතේ වූ ලැබීම්, දළ නිල සංචිත වලට දායක වෙමින් ගෙවුම් තුලනයට ද සහාය වේ. අර්ධ වාර්ෂිකව සිදු කරන සමාලෝචනවලට සහ ඉන් පසුව ලැබෙන විධායක මණ්ඩල අනුමැතියට යටත්ව මෙම අරමුදල් මුදා හැරීම සමාන කොටස් නවයක් යටතේ බෙදා සිදු කරනු ඇත. විධායක මණ්ඩලයේ අනුමැතිය ලැබුණු වහාම පළමු වාරිකය 2023 වසරේ මාර්තු මාසයේ දී ලැබුණි. මෙම වැඩසටහන මගින්, සාර්ව ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීම පුළුල් ලෙස අරමුණු කෙරේ. ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම, ආදායම වැඩි කිරීම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය කඩිනමින් සිදු කිරීම, මිල ස්ථායීතාව යථා තත්ත්වයටපත් කිරීම සහ බාහිර ස්වාරක්ෂක යළි ගොඩනැගීම, මූල්‍ය ස්ථායීතාව සහතික කිරීම, දූෂණ අවදානම් සහගත තත්ත්වයන් අවම කිරීම සහ ආර්ථික වර්ධනය තවදුරටත් ඉහළ නැංවීම යන වැදගත් අංශ මත ශක්තිමත් පදනමක් නිර්මාණය කිරීම හරහා සමස්ත ආර්ථිකයේ ස්ථායීතාව ළඟා කර ගැනීමට මෙම වැඩසටහන මගින් අපේක්ෂා කෙරේ.

**පූර්ව ක්‍රියාමාර්ග සහ ව්‍යුහාත්මක මිණුම්දඬු**

2022 වසරේ මුල් භාගයේ දී ජා.මූ. අරමුදල සමග විස්තීර්ණ ණය පහසුකමක් සඳහා සාකච්ඡා ආරම්භ කිරීමේ සිට 2023 වසරේ මාර්තු මාසය වන විට ශ්‍රී ලංකාව පූර්ව ක්‍රියාමාර්ග නවයක් සම්පූර්ණ කර ඇති අතර ව්‍යුහාත්මක වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණයක් ද සකස් කර ඇත. විස්තීර්ණ ණය පහසුකම යටතේ ඉදිරි

## රූප සටහන වි.ස. 2.1
## ජා.මු. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ වූ ව්‍යුහාත්මක මිණුම් දඬු

### රාජ්‍ය මූල්‍ය, රජය සතු ව්‍යවසායයන් සහ ආරක්ෂණ ජාලවලට අදාළ ප්‍රතිසංස්කරණ

- මාසිකව සූත්‍රය මත පදනම් වූ ගැළපීම් සමගින් ඉන්ධන මිල ගණන් ඒවායෙහි පිරිවැය ආවරණය වන මට්ටමට සැකසීම — අඛණ්ඩව
- අර්ධ වාර්ෂික සූත්‍රය මත පදනම් වූ ගැළපීම් සමග අවසන් පරිභෝජකයා ගෙවිය යුතු විදුලි ගාස්තු ලැයිස්තුව එහි පිරිවැය ආවරණය වන මට්ටමට සැකසීම — අඛණ්ඩව
- සුභසාධන ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමයට සහ ප්‍රතිලාභීන් හඳුනාගැනීම සඳහා නව සුදුසුකම් නිර්ණායකයන්ට **පාර්ලිමේන්තු අනුමැතිය** — 2023 වසරේ මැයි මස අවසානයට
- **ලං.වි.ම., ලං.බ.නී.සං., ශ්‍රී ලන්කන් ගුවන් සමාගම සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීමේ පුළුල් උපාය මාර්ගයට කැබිනට් අනුමැතිය** — 2023 වසරේ ජූනි මස අවසානයට
- වැඩසටහන් පරාමිතීන්වලට අනුකූලව **2024 වසරේ දී රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට සහාය වීම සඳහා ආදායම් රැස් කිරීමේ ක්‍රියාමාර්ග සඳහා කැබිනට් අනුමැතිය** — 2023 වසරේ ජූලි මස අවසානයට
- **ITMIS ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම**, ආයතන 220ක් වෙත (ජාතික අයවැය ක්‍රියාත්මක කිරීමේ ආයතන) එහි ආවරණය පුළුල් කිරීම — 2023 වසරේ සැප්තැම්බර් මස අවසානයට
- වැඩසටහන් පරාමිතීන්වලට අනුකූලව **2024 වසරේ දී විසර්ජන පනත් කෙටුම්පත පළමුවර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම** — 2023 වසරේ ඔක්තෝම්බර් මස අවසානයට
- වැඩසටහන් පරාමිතීන්ට අනුකූලව **2024 වසරේ විසර්ජන පනත සහ වියදම් ප්‍රතිපාදන සඳහා පාර්ලිමේන්තු අනුමැතිය** — 2023 වසරේ දෙසැම්බර් මස අවසානයට
- ජා.මු. අරමුදලේ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර **නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීතියක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම** — 2023 වසරේ දෙසැම්බර් මස අවසානයට
- **විදුලිබල සහනාධාරය නිවැරදිව මැනීම සඳහා තොග සැපයුම් ගනුදෙනු ගිණුම වැඩිදියුණු කිරීම** සහ පිරිවැය ආවරණය වීම පදනම් කරගත් විදුලි ගාස්තු සහ රජයේ සංක්‍රාම අවශ්‍යතා තීරණය කිරීම සඳහා එය භාවිතා කිරීම ආරම්භ කිරීම. — 2023 වසරේ දෙසැම්බර් මස අවසානයට

### මූල්‍ය අංශය

- විශාලතම රාජ්‍ය බැංකු දෙකක් සහ පුද්ගලික අංශයේ විශාලතම බැංකු තුනක් සඳහා **බැංකු තත්ත්ව විනිශ්චය කිරීමේ අභ්‍යාසයේ වත්කම් තත්ත්ව සමාලෝචන අංගය සම්පූර්ණ කිරීම** — 2023 වසරේ අප්‍රේල් මස අවසානයට
- ජා.මු. අරමුදලේ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර **බැංකු පනතේ සම්පූර්ණ සංශෝධනයක් සඳහා කැබිනට් අනුමැතිය** — 2023 වසරේ ජූනි මස අවසානයට
- බැංකු පද්ධතියේ ප්‍රාග්ධනය සහ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟයන් පියවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැලැස්මක් ගොඩනැගීම සහ ශක්‍යතාවයක් නොමැති බව තක්සේරු කර ඇති බැංකුවලට මැදිහත්වීම — 2023 වසරේ ජූලි මස අවසානයට
- **පුද්ගලික මූලාශ්‍රවලින් ප්‍රාග්ධන හිඟයන් පියවා ගැනීමට නොහැකි ශක්‍යතා සහිත බැංකු සඳහා රජය විසින් ප්‍රාග්ධනය නැවත යෙදවීම වෙනුවෙන් ප්‍රමාණය, කාලය, උපකරණ සහ නියමයන් සහ කොන්දේසි මුදල් අමාත්‍යාංශය විසින් තීරණය කිරීම** — 2023 වසරේ ඔක්තෝම්බර් මස අවසානයට
- ජා.මු. අරමුදලේ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර **බැංකු පනතේ සම්පූර්ණ සංශෝධනයක් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය** — 2023 වසරේ දෙසැම්බර් මස අවසානයට

### මුදල් හා විනිමය අනුපාතික ප්‍රතිපත්ති

- ජා.මු. අරමුදලේ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර **නව මහ බැංකු පනතේ සම්පූර්ණ සංශෝධනයක් සඳහා කැබිනට් අනුමැතිය** — 2023 වසරේ අප්‍රේල් මස අවසානයට

### පාලනය

- ජා.මු. අරමුදලේ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර, පුළුල් වත්කම් පියවා ගැනීමේ ප්‍රතිපාදන අපේක්ෂාවෙන්, **දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සමග සමපාත වෙමින් නව දූෂණ විරෝධී නීති සම්පාදනය කිරීම** — 2023 වසරේ ජූනි මස අවසානයට
- ශ්‍රී ලංකාවේ දූෂණ විරෝධී රාමුව විනිශ්චය කිරීම සඳහා **ජා.මු. අරමුදල ප්‍රමුඛව පාලනය පිළිබඳ විනිශ්චය කිරීමේ තාක්ෂණික සහාය ලබා දෙන මෙහෙයුමෙහි වාර්තාව ප්‍රකාශයට පත් කිරීම** — 2023 වසරේ සැප්තැම්බර් මස අවසානයට

මූලය: ජා.මු. අරමුදල (2023). ශ්‍රී ලංකාව: විස්තීර්ණ ණය පහසුකම යටතේ වන වැඩපිළිවෙලක් සඳහා සිදුකළ ඉල්ලීම - මාධ්‍ය නිවේදනය, කාර්ය මණ්ඩල වාර්තාව සහ ශ්‍රී ලංකාව සඳහා වන විධායක අධ්‍යක්ෂකගේ ප්‍රකාශය

වසර හතර තුළ පුළුල් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට මග පෑදීම සඳහා මෙම පූර්ව ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීම හේතු විය. ශ්‍රී ලංකාව විසින් දැනටමත් සම්පූර්ණ කර ඇති පූර්ව ක්‍රියාමාර්ග අතරට, වැඩසටහන් පරාමිතීන්ට අනුකූලව 2023 වසරේ දී රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට සහාය වීම සඳහා වන ආදායම් වැඩි කර ගැනීමේ ක්‍රියාමාර්ග සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම, 2022 වසර සඳහා වන සංශෝධිත අයවැය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම, 2023 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම, මාසික වශයෙන් ඛනිජ තෙල් මිල ගණන් වෙනස් කිරීමේ ක්‍රමවේදය සහ වර්ෂයකට දෙවතාවක් පිරිවැය පිළිබිඹු කෙරෙන පරිදි විදුලි ගාස්තු සංශෝධනය කිරීමේ ක්‍රමවේදය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම, නව මහ බැංකු පනතට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සහ මහ බැංකුව සතු අර්බුද කළමනාකරණ කාර්යයන්හි ප්‍රධාන අංග ශක්තිමත් කරමින් බැංකු පනත සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම, බැංකු පද්ධතිය විනිශ්චය කිරීමේ ක්‍රියාවලිය සඳහා ස්වාධීන ආයතනයක සේවය ලබා ගැනීම සහ ඉදිරි කාලීන මූර්ත ප්‍රතිපත්ති පොලී අනුපාතික අඛණ්ඩව ඉහළ යාම සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100කින් වැඩි කිරීම ඇතුළත් වේ.

ඉහත සඳහන් ක්‍රියාමාර්ගවලට අමතරව, වැඩසටහනේ පරාමිතීන්වලට අනුකූල වන පරිදි 2023 වසර සඳහා වන අයවැයට පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම, 2023 වසර සඳහා වන ආදායම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීතිමය සංශෝධන සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම සහ බැංකු සඳහා අදාළ වන හදිසි ද්‍රවශීලතා ආධාරක රාමුව යාවත්කාලීන කිරීම යන වැදගත් ඉදිරි පියවර තුනක් ද ක්‍රියාත්මක කරන ලදී. තවද, රූප සටහන වි.ස. 2.1හි විස්තර කර ඇති පරිදි, රාජ්‍ය මූල්‍ය සම්බන්ධ ගැටලු, රජය සතු වාණිජ ව්‍යවසායයන්, සමාජ ආරක්ෂණ ජාල ප්‍රතිසංස්කරණ, මුදල් හා විනිමය අනුපාතික ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය අංශය සහ පාලනය සම්බන්ධ ප්‍රතිසංස්කරණවලට අදාළ ව්‍යුහාත්මක මිණුම්දඬු කිහිපයක් ශ්‍රී ලංකාව විසින් ඉදිරි කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

**වැඩසටහන් ප්‍රගතිය අධීක්ෂණය කිරීම**

ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක (QPCs), හිඟ විදේශීය ණය වගකීම් හා සම්බන්ධ අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායක (CPC) සහ ජා. මූ. අරමුදලේ VIII වගන්තිය ප්‍රකාර බැඳීම්, දර්ශක ඉලක්ක (ITs) සහ මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තියෙන් සමන්විත පුළුල් යාන්ත්‍රණයක් අනුව විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළෙහි ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කෙරේ. රජයේ අයවැයෙහි ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් උත්පාදනය කිරීමේ අවශ්‍යතාවය, ශුද්ධ ජාත්‍යන්තර සංචිත ගොඩනැගීම මගින් දළ නිල සංචිත මට්ටම් වැඩිදියුණු කිරීම, මහ බැංකුව විසින් රජය වෙත ලබා දෙන ශුද්ධ ණය ක්‍රමයෙන් අඩු කිරීම ආදිය ශ්‍රී ලංකාව සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක වේ. විදේශීය ණය නොගෙවීම හේතුවෙන් නව හිඟ විදේශීය ණය එකතු නොකිරීම සම්බන්ධයෙන් අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායකයක් පවතින අතර, එය බලධාරීන් විසින් අඛණ්ඩව අධීක්ෂණය කරමින්, එම අවස්ථා සපුරාලීමට නොහැකි වුවහොත් ජා.මූ. අරමුදල වෙත ක්ෂණිකව වාර්තා කෙරේ. මීට අමතරව, තවත් ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායකයක් තුළ, ජංගම විදේශීය ගනුදෙනු සඳහා වන ගෙවීම් සහ හුවමාරු සම්බන්ධයෙන් තවදුරටත් සීමා පැනවීම, බහු විදේශ විනිමය ක්‍රියාමාර්ගයන් (multiple currency practices) හඳුන්වාදීම හෝ වෙනස් කිරීම, ජා. මූ. අරමුදලේ VIII වගන්තියට අනුකූල නොවන ගෙවීම් හා සම්බන්ධ ද්විපාර්ශ්වික ගිවිසුම් සම්පූර්ණ කිරීම සහ ගෙවුම් තුලන අරමුණු සඳහා ආනයන සීමාකිරීම් තවදුරටත් පැනවීම හෝ වෙනස් කිරීම තහනම් වේ. මිල ස්ථායීතාවය යථා තත්ත්වයට පත් කරමින් ඉලක්කගත මට්ටමට ළඟා වීම සඳහා ශ්‍රී ලංකාව උද්ධමනය අඛණ්ඩව අඩුකිරීමේ මාවතක ගමන් කරන බව සහතික කිරීමට නිශ්චිත ඉලක්කගත දිනවල දී වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය අධීක්ෂණය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තියක් ඇතුළත් කර ඇත. තවද, ප්‍රධාන වශයෙන් මධ්‍යම රජයේ බදු ආදායම, සමාජ ආරක්ෂණ ජාල වියදම්, ඉන්ධන සහ විදුලිය සඳහා වන වාණිජමය නොවන වගකීම්වල පිරිවැය මෙන්ම භාණ්ඩාගාර ඇපකර සම්බන්ධයෙන් දර්ශක ඉලක්ක නිශ්චිතව දක්වා ඇත. විශේෂයෙන්ම, ණය තිරසාරභාවය ළඟා කර ගැනීමේ දී අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා සාධාරණ කාල රාමුවක් තුළ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීමේ අරමුණින්, සෑම වැඩසටහන් සමාලෝචනයකදීම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රගතිය තක්සේරු කරනු ලැබේ. රූප සටහන වි.ස. 2.2හි වැඩසටහනට අදාළ ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක සහ දර්ශක ඉලක්ක පෙන්නුම් කර ඇත.

**විදේශීය මූල්‍යන පරතරය සහ මූල්‍යන මූලාශ්‍ර**

විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන සඳහා ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වෙතින් එ.ජ. ඩොලර් බිලියන 3.75ක අමතර සහයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඉන් එ.ජ. ඩොලර් මිලියන 900ක් 2023 වසරේ දී ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම සහ ස්වාරක්ෂක ගොඩනැංවීම හේතුවෙන් 2027 වසරේ දී ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු මගින් අරමුදල් රැස් කිරීම සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමට ශ්‍රී ලංකාවට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම අරමුදල් ඇතුළු විදේශ රාජ්‍ය ණය සේවා සහන මගින් විදේශීය මූල්‍යන පරතරයන් අවම කරමින් ශ්‍රී ලංකාවට සිය දළ ජාත්‍යන්තර සංචිත යළි ගොඩනැංවීමට ඉඩ ප්‍රස්ථාව සලසනු ලැබේ.


1

### රූප සටහන වි.ස. 2.2
### ශ්‍රී ලංකාව යෝජිත ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක (QPCs), අඛණ්ඩ කාර්යසාධන නිර්ණායක (CPC) සහ දර්ශක ඉලක්ක (ITs)
**(නිශ්චිතව සඳහන් කර නොමැති නම්, වසර ආරම්භයේ සිට සමුච්චිත පදනමින්)**

| | | 2022 | 2023 | | | |
|---|---|---|---|---|---|---|
| **යෝජිත පරිමාණාත්මක කාර්ය සාධන නිර්ණායක** | | දෙසැම්බර් අවසානයට (සැබෑ අගය) | මාර්තු මස අවසානයට දර්ශක ඉලක්ක | ජූනි මස අවසානයට කාර්ය සාධන නිර්ණායක/ දර්ශක ඉලක්ක | සැප්තැම්බර් මස අවසානයට දර්ශක ඉලක්ක | දෙසැම්බර් අවසානයට කාර්ය සාධන නිර්ණායක/දර්ශක ඉලක්ක |
| මධ්‍යම රජයේ ප්‍රාථමික ශේෂය (අවම සීමාව) | රු.බිලියන | -895 | 56 | -113 | -160 | -209 |
| වැඩසටහනෙහි ශුද්ධ නිල ජාත්‍යන්තර සංචිත (වැඩසටහනෙහි ශුද්ධ ජාත්‍යන්තර සංචිත, අවම මට්ටම කාලපරිච්ඡේදය අවසානයේ තත්ත්වය) | එ.ජ.ඩො. මිලියන | -3,540 | -3,188 | -2,830 | -2,068 | -1,592 |
| ශ්‍රී ලංකා මහ බැංකුවෙන් රජයට ලබා දුන් ශුද්ධ ණය (උපරිම සීමාව, කාලපරිච්ඡේදය අවසානයේ තත්ත්වය) | රු.බිලියන | 2,834 | 2,890 | 2,890 | 2,840 | 2,740 |
| මධ්‍යම රජයේ හිඟ වියදම් තත්ත්වය (උපරිම සීමාව) | රු.බිලියන | 60 | 30 | 0 | 0 | 0 |
| **යෝජිත අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායක (වැඩසටහන ආරම්භයේ සිට සමුච්චිත පදනමට)** | | | | | | |
| මූල්‍ය නොවන රාජ්‍ය අංශයෙහි සහ මහ බැංකුව විසින් නොගෙවා එකතු වූ හිඟ නව විදේශීය වගකීම් (උපරිම සීමාව) | එ.ජ.ඩො. මිලියන | 0 | 0 | 0 | 0 | 0 |
| **යෝජිත දර්ශක ඉලක්ක** | | | | | | |
| මධ්‍යම රජයේ බදු ආදායම (අවම සීමාව) | රු.බිලියන | 1,751 | 650 | 1,300 | 2,100 | 2,940 |
| මධ්‍යම රජයේ සමාජයීය වියදම් (අවම සීමාව) | රු.බිලියන | 142 | 35 | 70 | 120 | 187 |
| ඉන්ධන සහ විදුලිය සඳහා වාණිජමය නොවන බැඳීම්වල පිරිවැය (රජයේ සංක්‍රාම අඩු කළ විට) (උපරිම සීමාව) | රු.බිලියන | - | 0 | 0 | 0 | 0 |
| භාණ්ඩාගාර ඇපකර (උපරිම සීමාව) | රු.බිලියන | 1,159 | 1,700 | 1,700 | 1,700 | 1,700 |

මූලය: ජා.මූ. අරමුදල (2023). ශ්‍රී ලංකාව: විස්තීර්ණ ණය පහසුකම යටතේ වන වැඩපිළිවෙලක් සඳහා සිදුකළ ඉල්ලීම - මාධ්‍ය නිවේදනය, කාර්ය මණ්ඩල වාර්තාව සහ ශ්‍රී ලංකාව සඳහා වන විධායක අධ්‍යක්ෂකගේ ප්‍රකාශය

### රූප සටහන වි.ස. 2.3
### යෝජිත මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තිය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ උද්ධමනය)




මූලය: ජා.මූ. අරමුදල (2023). ශ්‍රී ලංකාව: විස්තීර්ණ ණය පහසුකම යටතේ වන වැඩපිළිවෙලක් සඳහා සිදුකළ ඉල්ලීම - මාධ්‍ය නිවේදනය, කාර්ය මණ්ඩල වාර්තාව සහ ශ්‍රී ලංකාව සඳහා වන විධායක අධ්‍යක්ෂකගේ ප්‍රකාශය

**ජා. මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ අපේක්ෂිත ප්‍රවණතා**

ජා. මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන මගින් අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිඵල කිහිපයක් පහත පරිදි වේ:

- **ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම:** ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව ණය මූල්‍යනය සහ ණය සේවාකරණය සම්බන්ධ නිශ්චිත ඉලක්ක සපුරාගත යුතුය. තවද, ණය අඩු කිරීම සහතික කිරීම, ණය නොගෙවී නැවත ආයෝජන අවදානම් කළමනාකරණය කිරීම, ණය සේවාකරණ අවශ්‍යතාවලින් ඇති කෙරෙන විදේශ පීඩන නැවත ඇති වීම වළක්වා ගැනීම සහ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන ක්‍රියාත්මක වන කාල සීමාව තුළ මූල්‍යන පරතරයන් පියවා ඇති බව සහතික කිරීම සඳහා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ස්වෛරීත්ව අවදානම් සහ ණය තිරසාර රාමුව (SRDSF) යටතේ හඳුන්වා දෙන ලද ප්‍රමාණාත්මක ඉලක්ක මගින් ණය ප්‍රතිව්‍යුහගත

### රූප සටහන වි.ස. 2.4
### 2022 වසරේ සිට 2027 වසර දක්වා විදේශීය මූල්‍යන පරතරය සහ වැඩසටහන් මූල්‍යන

එ.ජ.ඩොලර් මිලියන

| | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | එකතුව 2022-27 |
|---|---|---|---|---|---|---|---|
| මූල්‍යන පරතරය (අ) | -2,834 | -4,939 | -4,843 | -5,018 | -3,608 | -3,911 | -25,153 |
| වැඩසටහන් මූල්‍යන (ආ) | 2,834 | 4,939 | 4,843 | 5,018 | 3,608 | 3,911 | 25,153 |
| ජා.මු. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම | 0 | 663 | 665 | 663 | 662 | 329 | 2,982 |
| ජාත්‍යන්තර මූල්‍ය ආයතනයේ අයවැය සහාය | 0 | 900 | 850 | 700 | 700 | 600 | 3,750 |
| ලෝක බැංකුව | | 250 | 400 | 400 | 400 | 300 | 1,750 |
| ආසියානු සංවර්ධන බැංකුව | | 650 | 450 | 300 | 300 | 300 | 2,000 |
| වෙනත් | | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ණය නොගෙවා සිටීම: විදේශීය නොගෙවා එකතු වූ ණය | 2,834 | | | | | | 2,834 |
| ණය සහන | | 3,376 | 3,328 | 3,655 | 2,246 | 1,482 | 14,087 |
| ස්වෛරීත්ව බැඳුම්කර (වෙළඳපොළ ප්‍රවේශය) | | 0 | 0 | 0 | 0 | 1,500 | 1,500 |
| හිඟය (අ+ආ) | 0 | 0 | 0 | 0 | 0 | 0 | |
| දළ ජාත්‍යන්තර සංචිත | 1,898 | 4,431 | 6,128 | 8,520 | 10,888 | 14,208 | |
| ව්‍යාපෘති ණය | 1,473 | 1,400 | 1,542 | 1,585 | 1,633 | 1,682 | |

මූලය: ජා.මූ. අරමුදල (2023). ශ්‍රී ලංකාව: විස්තීර්ණ ණය පහසුකම යටතේ වන වැඩපිළිවෙලක් සඳහා සිදුකළ ඉල්ලීම - මාධ්‍ය නිවේදනය, කාර්ය මණ්ඩල වාර්තාව සහ ශ්‍රී ලංකාව සඳහා වන විධායක අධ්‍යක්ෂකගේ ප්‍රකාශය

කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවනු ලබයි. මෙම අවශ්‍යතා සපුරාලීම මගින් ණය හිමියන් සහ ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය නැවතත් තිරසාර මට්ටමට පත් වීම සහතික කරනු ඇති අතර, එමගින් ශ්‍රී ලංකාවේ අනාගත ණය ගැනීම් හා සම්බන්ධ දුෂ්කරතා සහ අවදානම් අධිමිල ලිහිල් වේ.

ජා.මු. අරමුදල විසින් ණය තිරසාරභාවය සම්බන්ධයෙන් සිදු කරන ලද විශ්ලේෂණය අනුව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හරහා ශ්‍රී ලංකාව විසින් සාක්ෂාත් කර ගත යුතු තිරසාර ණය ඉලක්ක පහත පරිදි වේ:

- ණය තොගය: 2032 වසර වන විට රාජ්‍ය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙන් සියයට 95ට වඩා අඩු වීම.
- විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙන් පසු අවධිය තුළ දළ මූල්‍යන අවශ්‍යතා: 2027-2032 කාල පරිච්ඡේදය තුළ දී මධ්‍යම රජයේ වාර්ෂික දළ මූල්‍යන අවශ්‍යතාවල සාමාන්‍යය ද.දේ.නි.යෙන් සියයට 13ට වඩා පහළ මට්ටමක පැවතීම.
- විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙන් පසු අවධිය තුළ විදේශ මුදලින් ණය සේවාකරණය: මධ්‍යම රජයේ වාර්ෂික විදේශ මුදලින් ණය සේවාකරණය 2027-2032 දක්වා කාලපරිච්ඡේදය තුළ සෑම වසරකම ද.දේ.නි.යෙන් සියයට 4.5කට වඩා පහළ මට්ටමක පැවතීම.
- විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි මූල්‍යන පරතරයන්: විදේශ මූල්‍යන පරතරයන් පියවීම සඳහා ප්‍රමාණවත් වන පරිදි 2023-2027 කාලපරිච්ඡේදය තුළ ණය සේවාකරණය අඩු කිරීම.

■ **වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සහ රාජ්‍ය මූල්‍ය විනය:** රාජ්‍ය මූල්‍ය අංශය සහ ඊට අදාළ ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන මගින් කර ඇති අවධාරණය කිරීම තුළ, ආදායම් වර්ධනය කර ඇති ක්‍රියාමාර්ග සහ වියදම් තවදුරටත් තාර්කිකකරණය කිරීම හරහා රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරාලීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රකරණ ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉදිරි කාලයේ දී රාජ්‍ය අයවැය හිඟය මහ බැංකුව තුළින් මූල්‍යනය කිරීමට ඇති අවකාශය සීමිත වීම තුළ පවතින සංක්‍රාන්ති කාලසීමාව තුළ එවැනි අවශ්‍යතා මතු නොවන බව සහතික කිරීම සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කිරීම රජයෙන් අපේක්ෂා කෙරේ. ඒ අතරතුර කාලයේ දී, රජය සතු ව්‍යවසායන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පුළුල් වැඩසටහන හරහා රාජ්‍ය මූල්‍ය ආදායමෙන් අනවශ්‍ය ලෙස ආදායම් අහිමිව යෑම විසඳනු ඇත.

■ **වැඩිදියුණු වූ පරිපාලන සහ වගවීමේ රාමුව සඳහා වන නීතිමය වෙනස්කම්:** යෝජිත මහ බැංකු පනත වැනි නව නීති, බැංකු පනත සහ පවතින නීතිවලට සිදු කෙරෙන වෙනත් සංශෝධන ආදිය මගින් රටේ ආර්ථික කළමනාකරණයට අදාළ ආයතනික සහ නියාමන රාමුව ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියට සමගාමීව, නව දූෂණ විරෝධී නීතියක් දකුණු ආසියාවේ ප්‍රථම වරට මෙරට හඳුන්වාදීමට නියමිත අතර, එමගින් ස්වාධීන දූෂණ විරෝධී කොමිසමක් ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සපයයි. අයවැය සම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීමට සහ රාජ්‍ය මූල්‍ය සම්බන්ධ වගවීමේ යාන්ත්‍රණය වැඩි දියුණු කිරීමට නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීතියක් පනවනු ලැබේ.

- **සමාජ ආරක්ෂණ ජාල ප්‍රතිසංස්කරණය කිරීම:** මෑත වසරවල සමාජ ආරක්ෂණ ජාල හා බැඳුණු වියදම් සහ එම ප්‍රතිලාභීන්ගේ ඉහළ යෑමක් පැවතිය ද, ප්‍රතිලාභීන් ආවරණය කිරීම සහ ඔවුන් තෝරා ගැනීම සම්බන්ධ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා සැලකිය යුතු ඉඩකඩක් ඇති බව හඳුනාගෙන ඇත. දැනට පවතින සමාජ ආරක්ෂණ ජාල රාමුවේ පවතින ගැටලු සැලකිල්ලට ගනිමින්, සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වල කාර්යක්ෂමතාවය, ආවරණය සහ ඉලක්ක කරණය වැඩිදියුණු කිරීම සඳහා විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන මගින් ඇතැම් ආයතනික ප්‍රතිසංස්කරණ නියම කර ඇත.

- **මිල ස්ථායීතාව යළි ස්ථාපිත කිරීම:** සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හරහා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ උද්ධමනය ඉලක්කගත පරාසය වෙත ස්ථාවර නිර්-උද්ධමන මාවතක් ඔස්සේ නැවත ගෙන ඒමෙන්, මිල ස්ථායීතාව යළි ස්ථාපිත කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි. මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස රාජ්‍ය අයවැය හිඟය මහ බැංකුව තුළින් මූල්‍යනය කිරීම පියවරෙන් පියවර අඩු කිරීමට අපේක්ෂා කෙරේ. විනිමය අනුපාතිකයෙහි වැඩි නම්‍යශීලී බවක් පවත්වා ගැනීම සහ අනාගත කම්පනයන්ට ඔරොත්තු දීම සඳහා සංචිත නැවත ගොඩනැංවීම ද මිල ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීමට ඇති කැපවීමට ඇතුළත් වේ.

- **මූල්‍ය ආයතන සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ශක්තිමත් කිරීම:** ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය රාජ්‍ය අංශය වෙත දැඩි ලෙස නිරාවරණය වී ඇති බවත්, ප්‍රාග්ධනීකරණය මධ්‍යස්ථව ඇති බවත් සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමකින් අනතුරුව මූල්‍ය පද්ධතිය ප්‍රාග්ධන හා විදේශ විනිමය හිඟයකට මුහුණ දිය හැකි බවත් ජා.මූ. අරමුදලෙහි අදහසයි. මේ අනුව, ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බැංකු සැලකිය යුතු ප්‍රාග්ධන හා විදේශ විනිමය හිඟයකට මුහුණ පෑමේ හැකියාවක් පවතී. එබැවින්, රාජ්‍ය බැංකුවල අවදානම්වලට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා වත්කම්වල ගුණාත්මකභාවය සමාලෝචනය කිරීමෙන් අනතුරුව පද්ධතිමය වශයෙන් වැදගත් වන බැංකුවල ප්‍රාග්ධනය යළි ස්ථාපිත කිරීමට සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී. මේ අතර, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය වඩාත් ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය අංශයේ අධීක්ෂණය සහ අර්බුද කළමනාකරණ රාමුව ශක්තිමත් කරනු ඇත.

මෙම විශේෂිත ප්‍රතිලාභවලට අමතරව, ආයෝජකයන්ගේ විශ්වාසය වර්ධනය කිරීම, ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම සහ වෙළඳපොළ වෙත නැවත ප්‍රවේශ වීමේ හැකියාව ඇති කිරීම ආදිය හරහා ජා.මූ. අරමුදලෙහි සහාය ඇති විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන මගින් ආර්ථිකයට වක්‍රාකාර ධනාත්මක බලපෑම් ඇති කරනු ඇත. ජා.මූ. අරමුදල විසින් ඉදිරිපත් කර ඇති ඉලක්කවල අභියෝගාත්මක ස්වභාවය සැලකිල්ලට ගනිමින්, වැඩසටහන ක්‍රියාත්මක වන කාලසීමාව පුරා එය සාර්ථකව නිම කිරීම සහතික කිරීම සඳහා බලධාරීන්ට විශාල උත්සාහයක් හා කැපවීමක් කිරීමට සිදුවනු ඇත. එසේම, විශේෂයෙන්ම ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඇති විය හැකි අප්‍රසාදය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි මහජන විරෝධය සැලකිල්ලට ගනිමින්, මෙම වැඩසටහන ක්‍රියාත්මක වන කාලසීමාව තුළ දේශපාලන හා සමාජීය ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා, මුල් කාලයේ දී කළ යුතු කැපකිරීම් තුළින් දිගු කාලීන ආර්ථික ප්‍රතිලාභ අත්කර ගත හැකි ආකාරය පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම අවශ්‍ය වේ.

**ජා.මූ. අරමුදල් වැඩසටහනෙන් ඔබ්බට ගිය ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය**

දිගු කාලයක සිට නොසලකා හරින ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අනුව ජා.මූ. අරමුදලේ වැඩසටහනෙහි සාර්ථකත්වය බොහෝ දුරට රඳා පවතියි. ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මගින් ආර්ථිකයේ තරගකාරිත්වය ඉහළ නැංවීම, ඵලදායීතාව ඉහළ නැංවීමට පදනමක් සැපයීම, සම්පත් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ එමගින් වර්ධන විභවතාව ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දී සිටින දැඩි ආර්ථික අර්බුදය මගින්, ජා.මූ. අරමුදලෙහි ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයෙන් ඔබ්බට ගිය, පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර සම්පාදනය කරන ලද හා පෞද්ගලික උවමනාවන් සහිත දේශපාලන බලපෑම්වලින් තොර ජාතික ප්‍රතිපත්ති හරහා ඉදිරියේ ඇති දිගුකාලීන ව්‍යුහාත්මක ගැටලු තිරසාර ලෙස විසඳීමේ වැදගත්කම ඉස්මතු කරයි. වෙළඳ භාණ්ඩ අපනයන සහ සංචාරක කර්මාන්තය, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ඇතුළත් විභවතාවක් ඇති සේවා අපනයන යනාදී අංශවල විවිධාංගීකරණය ඉහළ නංවා ගනිමින් සහ විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගනිමින්, තාක්ෂණික නවෝත්පාදනය සහ වෙළඳාම හා ආයෝජන තුළින් ලෝක ආර්ථිකය වෙත සම්බන්ධ කිරීම මගින් ආර්ථිකයේ ඵලදායීතාව සහ නිෂ්පාදනය ඉහළ නැංවීමට, ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය යොමු විය යුතුය. රාජ්‍ය ආයතනවල මහජන වගවීම සහතික කිරීම සඳහා නීතිමය රාමු ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වන අතර, එමගින් රටේ ආර්ථික සුබසාධනයේ කල් පැවැත්ම සහතික කිරීම සඳහා අදාළ බලධාරීන් විසින් ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ක්‍රියාත්මක කිරීමේදී පවතින නෛතික බලතල ක්‍රියාත්මක කළ යුතුය. මෙවැනි ප්‍රතිසංස්කරණ,

ජා.මූ. අරමුදලේ වැඩසටහනෙහි ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට අනුපූරක වෙමින්, ශ්‍රී ලංකාව විසින් හැකි ඉක්මනින් සාර්ව ආර්ථික ස්ථායීතාවය අත්කර ගැනීම සහ එය පවත්වා ගැනීම සහතික කරනු ඇත.

**නිගමනය**


ශ්‍රී ලංකාව 1965 වසරේදී ජා.මූ. අරමුදල සමඟ ඇති කරගත් පළමු වැඩසටහනේ සිට මේ දක්වා වැඩසටහන් 16කට සම්බන්ධ වුවද, බලධාරීන් විසින් සාර්ථකව ක්‍රියාත්මක කර ඇත්තේ ඉන් කිහිපයක් පමණකි. මේ සඳහා, විශේෂයෙන්ම, දැඩි සාර්ව ආර්ථික ගැළපුම් අවශ්‍ය වූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ දිගු කාලීන සුබසාධන ප්‍රතිලාභ වර්ධනය කිරීම අරමුණු කරගත් ජනප්‍රිය නොවන ප්‍රතිපත්තිවලට අදාළ කොන්දේසි සපුරාලීමට කැපවීමක් නොදැක්වීම හේතු වී ඇත. එබැවින්, අනාගතයේ දී ජා.මූ. අරමුදල වෙතින් ණය ආධාර ලබා ගැනීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නැවත යොමු වීමේ අවශ්‍යතාවය අවම කරමින්, ශ්‍රී ලංකාව සිය ප්‍රතිපත්ති සම්පාදනය තුළට මෙම ප්‍රතිසංස්කරණ එක් කර ගැනීම අත්‍යවශ්‍ය වන අතර, වත්මන් ජා.මූ. අරමුදලේ වැඩසටහනෙහි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මෙන්ම ආර්ථිකය වැඩි ස්ථාවරත්වයක් සහිත ඉහළ වර්ධන මාවතක් කරා ඉක්මනින් පරිවර්තනය කිරීමට සහාය වීම සඳහා ඉන් ඔබ්බට ගිය ප්‍රතිසංස්කරණ ද ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

මූලාශ්‍රය

1. International Monetary Fund. (2023). Sri Lanka: Request for an Extended Arrangement Under the EFF - Press Release; Staff Report; and Statement by the Executive Director for Sri Lanka. 116. International Monetary Fund, Washington D.C.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ක්‍රියාකාරකම් දිරිමත් කිරීම සහ වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතිකයක් වෙත නැවත යොමු වීමේ අරමුණින්, දෛනික විනිමය අනුපාතිකයෙහි විචලන සීමාවන් ක්‍රමානුකූලව ලිහිල් කිරීමට ද බලපත්‍රලාභී බැංකු විසින් මහ බැංකුව වෙත වූ විදේශ විනිමය අනිවාර්ය විකුණුම් අවශ්‍යතාව ලිහිල් කිරීමට ද කටයුතු කළ අතර, ඉන්පසුව 2023 වසරේ මාර්තු මස මුල සිට එම අවශ්‍යතාව සම්පූර්ණයෙන් ඉවත් කිරීමට මහ බැංකුව ක්‍රියා කරන ලදී. 2023 වසරේ මුල් කාලපරිච්ඡේදයේ සිට විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු වීම ආරම්භ වූ අතර, සේවා අංශයට විදේශ විනිමය ලැබීම්, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ විවිධ ආයෝජන සඳහා වූ මූල්‍ය ප්‍රවාහයන් සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ සඳහා අවසන් එකඟතාවයකට පැමිණීමත් සමඟ

**1.7 රූප සටහන**
**විනිමය අනුපාතිකය හා දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළඳපොළ විශ්වාසය වැඩිදියුණු වීම ඒ සඳහා දායක විය. විදේශ විනිමය වෙළඳපොළ තත්ත්වයන් වැඩිදියුණු වීමේ බලපෑම හේතුවෙන්, 2022 වසරේ මුල් භාගයේ දී දක්නට ලැබුණු විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිවැරදි කරමින් විනිමය අනුපාතිකය 2023 වසරේ මාර්තු මස මුල දී ඉහළ අතිප්‍රමාණය වීමක් පෙන්නුම් කළ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ සැලකිය යුතු මැදිහත් වීමක් තුළින් ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් මිලදී ගැනීම දළ නිල සංචිත ගොඩනැගීමට ද උපකාරී විය. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළෙහි අරමුදල් ආධාර සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් සිදු කරන ලද විදේශ විනිමය මිලදී ගැනීම් සමඟ, දළ නිල සංචිත 2023 වසරේ මාර්තු මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 2.7ක් දක්වා ශක්තිමත් වූ අතර, වැඩිදියුණු වූ වෙළඳපොළ අපේක්ෂාවන් පිළිබිඹු කරමින් 2023 වසරේ මාර්තු මස අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 10.9කින් අතිප්‍රමාණය විය. විනිමය අනුපාතිකය තීරණය කිරීමේ දී ඉඩ දී ඇති වැඩි නම්‍යශීලීභාවය පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා රුපියල 2023 වසරේ මාර්තු මස අවසානයේ සිට යම් විචලනයක් පෙන්නුම් කළේය.

**ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ ලබා දෙන අරමුදල් රජයේ මූල්‍යන අවශ්‍යතා සඳහා දායක කරගැනීමේ අරමුණින් රාජ්‍ය අයවැය සඳහා රැකුලක් ලෙස යෙදවීමට යෝජනා කරන ලදී.** කෙසේ වුවත්, මෙම ලැබීම්, ණය ප්‍රතිව්‍යුහගතකරණයට ලක් නොවන රජයේ විදේශ විනිමය ණය ආපසු ගෙවීමට යොදා ගැනීම තුළින්, ඒ සඳහා මහ බැංකුවේ සංචිත යොදා ගැනීම වැළකෙන අතර, ගෙවුම් තුලනයේ පවතින ගැටලු අවම කිරීමට ද


1

එය උපකාරී වනු ඇත. තවද, අත්‍යවශ්‍ය ආනයන මූල්‍යනය සඳහා පහසුකම් සැලසිය හැකි වන පරිදි දළ නිල සංචිත ද එමඟින් ශක්තිමත් විය හැකිය.

## රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රවණතා

**මැදි කාලීනව ණය තිරසාරභාවය තහවුරු කිරීමේ අරමුණ ඇතිව රජය විසින් රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලද අතර, රාජ්‍ය මූල්‍ය අංශයේ දුර්වලතාවන්ට පිළියම් යෙදීම සඳහා පුළුල් රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ආරම්භ කරන ලදී.** 2022 වසර මුල් භාගයේ දී ආදායම් රැස් කිරීම පහළ යෑම සහ ඉහළ දේශීය පොලී අනුපාතික සහ උද්ධමනය හේතුවෙන් ඉලක්කගත මට්ටම ඉක්මවා වියදම් ඉහළ යෑම හේතුවෙන්, 2022 අයවැයෙහි ඉදිරිපත් කළ අයවැය පුරෝකථන කරා ළඟා වීම අපහසු බව පැහැදිලි විය. 2022 අප්‍රේල් මාසයේ සිට රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කර ගැනීම සඳහා රජය විසින් පියවර මාලාවක් ක්‍රියාත්මක කරනු ලැබූ අතර, ආදායම් වැඩිදියුණු කරගැනීමේ ක්‍රියාමාර්ග සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කර ගැනීමේ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීමේ අරමුණින්, 2022 සැප්තැම්බර් මාසයේ දී 2022 අතුරු අයවැය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගන්නා ලදී. 2022 වසරේ දී ක්‍රියාත්මක කරන ලද ආදායම් වැඩිදියුණු කරගැනීමේ ක්‍රියාමාර්ග සහ ආර්ථිකයේ මිල මට්ටම් ඉහළ යෑම හේතුවෙන්, රාජ්‍ය ආදායම 2022 වසරේ දී රුපියල් බිලියන 1,979.2ක් දක්වා සියයට 35.8ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, විශාල අවධමනකය සමඟ නාමික ද.දේ.නි.යෙහි ඇති වූ සැලකිය යුතු වර්ධනය හේතුවෙන්, රාජ්‍ය ආදායම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2021 වසරේ පැවති සියයට 8.3ක සිට 2022 වසරේ දී සියයට 8.2ක් දක්වා පහළ ගියේය. ආදායම් බදු, එකතු කළ අගය මත බද්ද, වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද සහ මද්‍යසාර මත පනවන ලද සුරා බදු හා දුම්වැටි මත පනවන ලද නිෂ්පාදන බදුවලින් ලත් ආදායම් ඉහළ යෑම, රජයේ බදු ආදායමෙහි නාමික වර්ධනයට ඉවහල් විය. කෙසේ වෙතත්, ආනයන වියදම පහත වැටීමේ බලපෑම පිළිබිඹු කරමින්, ආනයන බදු, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සහ සෙස් බද්දෙන් රැස් කළ ආදායම 2022 වසර තුළ දී අඩු විය. මේ අතර, ගාස්තු හා අයකිරීම් සහ 2021 වාර්ෂික ගිණුම් වාර්තාව මත පදනම්ව මහ බැංකුව විසින් රජය වෙත සිදු කරන ලද ලාභ පැවරුම් ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන්, රැස් කළ බදු නොවන ආදායම ඉහළ ගියේය. 2022 වසරේ දෙවන භාගයේ දී සහ 2023 වසරේ මුල් කාලයේ දී ක්‍රියාත්මක කෙරුණු ආදායම් වැඩිදියුණු කරගැනීමේ ක්‍රියාමාර්ග කිහිපයකම සම්පූර්ණ බලපෑම 2023 වසරේ දී ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, රජයේ වියදම් තාර්කීකරණ පියවර ක්‍රියාත්මක කළ ද, 2022 වසරේ දී රාජ්‍ය වියදම සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 27.0කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, නාමික ද.දේ.නි.යෙහි කැපී පෙනෙන වර්ධනයත් සමඟ, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, රාජ්‍ය වියදම පෙර වසරේ පැවති සියයට 20.0ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 18.5ක් දක්වා පහළ ගියේය. දේශීය පොලී ගෙවීම්, වැටුප් සහ වේතන, සහ සහනාධාර හා පැවරුම් වෙනුවෙන් ඉහළ ගිය වියදම, පුනරාවර්තන වියදම් ඉහළ යෑම සඳහා හේතු විය. ඒ සමඟම, විශේෂයෙන් ම, ඉන්ධන ආනයනය කිරීම සඳහා ඉන්දීය ණය පහසුකම ඔස්සේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ණය ලබා දීම සහ පොහොර සහ එල්.පී. ගෑස් (ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව) ආනයනය කිරීම සඳහා ලෝක බැංකුව විසින් ලබා දුන් අරමුදල් භාවිත කරමින් රාජ්‍ය ව්‍යවසායයන් වෙත ණය ලබා දීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් ද 2022 වසරේ දී සියයට 23.1ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, නාමික වශයෙන් සමස්ත රාජ්‍ය මූල්‍ය හිඟය පෙර වසරේ පැවති රුපියල් බිලියන 2,057.9ක සිට 2022 වසරේ දී රුපියල් බිලියන 2,460.0ක් දක්වා පුළුල් විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, රාජ්‍ය මූල්‍ය හිඟය, 2021 වසරේ දී සියයට 11.7ක් වූ අතර, නාමික ද.දේ.නි.යෙහි ඇති වූ කැපී පෙනෙන වර්ධනය හේතුවෙන් 2022 වසරේ දී එය සියයට 10.2ක් දක්වා පහත වැටුණි. රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙන වර්තන ගිණුමේ හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස

**1.8 රූප සටහන**
**රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයෙහි සාරාංශය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**




මූලය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

2021 වසරේ දී පැවති සියයට 7.3ක (රුපියල් බිලියන 1,290.4) සිට 2022 වසරේ දී සියයට 6.4ක් (රුපියල් බිලියන 1,540.4) දක්වා පහළ ගියේය. මේ අතර, 2021 වසරේ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.7ක් (රුපියල් බිලියන 1,009.5ක්) වූ ප්‍රාථමික ගිණුමේ හිඟය, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කර ගැනීමේ ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් සහ නාමික වශයෙන් යන දෙආකාරයෙන් ම සංකෝචනය වෙමින් 2022 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.7ක් (රුපියල් බිලියන 894.8) දක්වා අඩු විය.


**අහිතකර ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් සහ ණය ආපසු ගෙවීම තාවකාලිකව අත්හිටුවීම හමුවේ විදේශීය මූලාශ්‍රවලින් මූල්‍යනය සීමා වීම හේතුවෙන් 2022 වසරේ දී අයවැය හිඟය මූල්‍යනය සඳහා ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍ර මත, විශේෂයෙන්ම බැංකු අංශය මත, යැපීමට රජයට සිදු විය.** ඒ අනුව, දේශීය මූලාශ්‍ර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2021 වසරේ දී සමස්ත මූල්‍යනයෙහි ප්‍රතිශතයක් ලෙස වාර්තා වූ සියයට 100.7ට (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.8ට) සාපේක්ෂව, 2022 වසරේ දී සමස්ත මූල්‍යනයෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 82.7ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 8.4ක්) විය. රාජ්‍ය සුරැකුම්පත් සඳහා වෙළඳපොළ අභිරුචිය අඩු වීම හමුවේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දී දැක්වූ සෘජු දායකත්වය සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සෘජුව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම් හේතුවෙන්, 2022 වසරේ දී රුපියල් බිලියන 1,338.4ක ශුද්ධ මූල්‍යනයක් වාර්තා කරමින්, මහ බැංකුව රජයෙහි විශාලතම මූල්‍යන මූලාශ්‍රය වශයෙන් අඛණ්ඩව කටයුතු කළේය. ආර්ථික අර්බුදය හේතුවෙන් මහජනතාවට ඇති වූ දුෂ්කරතා අවම කිරීම සඳහා බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික මූලාශ්‍රවලින් අරමුදල් ලැබීම හේතුවෙන් 2022 වසර තුළ දී ශුද්ධ විදේශීය මූල්‍යනය රුපියල් බිලියන 424.8ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.8ක්) විය. 2021 වසරේ දී, විදේශීය මූල්‍යනය රුපියල් බිලියන 13.9ක (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.1ක) ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය. මේ අතර, පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව, භාණ්ඩාගාර බිල්පත් තොගයේ උපරිම සීමාව 2022 ජූනි මාසයේ දී රුපියල් බිලියන 3,000ක සිට රුපියල් බිලියන 4,000ක් දක්වා ඉහළ දැමුණු අතර, ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික හේතුවෙන් භාණ්ඩාගාර සුරැකුම්පත්වල මුහුණත් අගය අනුව ණය ගැනීමේ අවශ්‍යතාව ඉහළ යෑමේ හේතුවෙන්, 2022 නොවැම්බර් මාසයේ දී මෙම සීමාව රුපියල් බිලියන 5,000ක් දක්වා තවදුරටත් ඉහළ නංවන ලදී.

**2021 වසර අවසානය වන විට වාර්තා වූ රුපියල් බිලියන 17,614.2ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 100.1ක්) වූ මධ්‍යම රජයේ නොපියවූ ණය, 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 27,492.0ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 113.8) දක්වා ඉහළ ගියේය.** විශාල අයවැය හිඟයේ බලපෑම, විනිමය අනුපාතිකයේ හටගත් තියුණු අවප්‍රමාණය වීම හේතුවෙන් ඇති වූ අගයේ විචලනය (Parity change) සහ රජය සතු ව්‍යාපාර ව්‍යවසයායයන් යටතේ මින් පෙර වාර්තා කරන ලද තෝරාගත් ණය වගකීම් කිහිපයක් මධ්‍යම රජය යටතේ යළි වර්ගීකරණය කිරීමෙහි බලපෑම මෙම ඉහළ යාමට හේතු විය. නාමික වශයෙන් ගත් කළ, දේශීය ණය සහ විදේශීය ණය 2022 වසර අවසානය වන විට, පිළිවෙළින්, සියයට 35.5කින් සහ සියයට 91.2කින් ඉහළ ගියේය. 2021 වසර අවසානයට මුළු දේශීය ණයෙන් නිරූපණය කල සියයට 62.8ක දායකත්වයට සාපේක්ෂව 2022 වසර අවසානයේ දී සියයට 57.9ක නිරූපණයක් පෙන්නුම් කරමින් භාණ්ඩාගාර බැඳුම්කර සමස්ත දේශීය ණය සඳහා වැඩි දායකත්වයක් ලබා දුන් අතර දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය කෙරෙනු ඇතැයි පවතින සමපේක්ෂණ සහ දිගු කාලීන රාජ්‍ය සුරැකුම්පත් සඳහා වෙළෙඳපොළ අභිරුචිය අඩු වීම හේතුවෙන්, 2022 වසර අවසානය වන විට භාණ්ඩාගාර බිල්පත් තොගය රුපියල් බිලියන 4,113.9ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**දැඩි ලෙස පහත වැටුණු දළ නිල සංචිත සහ ප්‍රමාණවත් නොවන විදේශීය මූල්‍යන ප්‍රවාහ හමුවේ, දළ මූල්‍යන අවශ්‍යතා ඉහළ යෑම සහ විශාල විදේශීය ණය සේවාකරණ වගකීම් ආසන්න සහ මැදි කාලීනව ගෙවීමට නියමිත වීම හේතුවෙන්, ණය ප්‍රතිව්‍යුහගතකරණ ප්‍රයත්න නිම වන තෙක්, ද්විපාර්ශ්වික සහ වාණිජ විදේශීය ණය සේවාකරණ තාවකාලිකව අත්හිටුවමින් 2022 අප්‍රේල් මස 12 වැනි දින ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය නිවේදනය කිරීමට රජයට සිදු විය.** එහි ප්‍රතිඵලයක් ලෙස, පෙර වසරේ දී රුපියල් බිලියන 786.3ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.5ක්) වූ විදේශීය ණය සේවාකරණ ගෙවීම්, 2022 වසරේ දී රුපියල් බිලියන 487.4ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.0ක්) දක්වා පහත වැටුණි. සමාලෝචනයට ලක් කෙරෙන කාලය තුළ දී, දේශීය පොලී අනුපාතික තියුණු ලෙස ඉහළ යෑම සහ දේශීය ණය ඉහළ යෑම මූලික කරගෙන, දේශීය ණය සේවාකරණ ගෙවීම්, 2021 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 1,594.3ට (ද.දේ.නි.යෙහි

1

**1.9 රූප සටහන**
**මධ්‍යම රජයේ නොපියවූ ණය**
**(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**





මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රතිශතයක් ලෙස සියයට 9.1ක්) සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් බිලියන 2,510.3ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10.4ක්) දක්වා ඉහළ ගියේය. ඒ අනුව, සමස්ත ණය සේවාකරණ ගෙවීම්, 2021 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 2,380.6ක (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13.5ක්) සිට 2022 වසරේ දී රුපියල් බිලියන 2,997.6ක් දක්වා (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12.4ක්) ඉහළ ගියේය. සමාලෝචිත කාලය තුළ දී, පොලී ගෙවීම් සහ ණය ආපසු ගෙවීම්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, සියයට 6.5ක් සහ සියයට 5.9ක් විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ තුළ පවතින අභිරුචීන් දුර්වල කළ, දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් පැවති අවිනිශ්චිතතා සමනය කිරීම සඳහා රජය විසින් 2023 මාර්තු මස අග දී දේශීය ණය ප්‍රශස්තකරණ පරාමිතීන් පිළිබඳ වැඩිදුර තොරතුරු බෙදා හරින ලදී. රජයේ සමස්ත ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය නුදුරු කාලයේ දී ණය හිමියන් වෙත නිවේදනය කිරීමට බලාපොරොත්තු වන අතර, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමෙහි අපේක්ෂිත ණය තිරසාරාත්මක ඉලක්ක සමඟ අනුගත වෙමින් ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය එමගින් කඩිනම් කෙරෙනු ඇත.

## මුදල් අංශයේ ප්‍රවණතා

**ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසර මුළුල්ලේ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර 2022 අප්‍රේල් මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 700කින් සැලකිය යුතු ලෙස ඉහළ නැංවීය.** ඉහළ යන උද්ධමන පීඩන පාලනය කිරීම, විදේශීය අංශයේ අවදානම් සමනය කිරීම හා උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සහ එමගින් අධි උද්ධමනකාරී තත්ත්ව හා දීර්ඝ කාලයක් ආර්ථික ක්‍රියාකාරකම් පිරිහීම වැළැක්වීම සඳහා එවැනි දැඩි මුදල් ප්‍රතිපත්තියක් අවශ්‍ය විය. ඒ අනුව, මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ආරම්භ කළ 2021 වසරේ අගෝස්තු මාසයේ සිට මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, 2022 වසර අවසානය වන විට ප්‍රතිශතාංක 10කින් ඉහළ නැංවිණි. 2022 අප්‍රේල් මාසයේ දී පෙර නොවූ ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 700කින් ඉහළ නැංවීම ඉල්ලුම හේතුවෙන් ඇති වූ උද්ධමන පීඩන තවදුරටත් ඇති වීම පාලනය කිරීම සහ එමගින් අහිතකර උද්ධමන අපේක්ෂා ඉහළ යෑම වැළැක්වීම, විදේශීය අංශයේ පීඩන ලිහිල් කිරීම මෙන්ම වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහයේ නිරීක්ෂණය වූ විෂමතා නිවැරදි කිරීමට උපකාරී විය. මීට අමතරව, තෝරාගත් ණය උපකරණ මත මෙන්ම විදේශ විනිමය තැන්පතු සඳහා පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කිරීම ඇතුළු නියාමන ක්‍රියාමාර්ග මහ බැංකුව විසින් ගනු ලැබූ අතර, එමගින් මුදල් තත්ත්වයන් දැඩි කිරීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්වීම් ඉතා කාර්යක්ෂම ලෙස වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම සඳහා අවකාශ සැලසුණි. මේ අතර, අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා පහසුකම් සැලසීමට මහ බැංකුව විසින් විදේශ විනිමය විකිණීම, ශුද්ධ පදනම මත රජයේ විදේශීය ණය ආපසු ගෙවීම්, බැංකු පද්ධතිය වෙතින් මහජනතාව ශුද්ධ පදනම මත මුදල් ආපසු ගැනීම් සහ දේශීය බැංකු සමඟ පැවති ගැනුම්-විකුණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් කල්පිරීම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, විශේෂයෙන්ම 2022 වසරේ පළමු භාගය තුළ දී විශාල හිඟ මට්ටමක අඛණ්ඩව පැවතිණි. කෙසේ වෙතත්, වෙළඳපොළ අවශ්‍යතා මත ද්‍රවශීලතාව සැපයීමට දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම මධ්‍යයේ මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලදී ගැනීම සහ තැන්පතු පොලී අනුපාතික ඉහළ යෑම හේතුවෙන් බැංකු පද්ධතිය වෙත වූ ව්‍යවහාර මුදල් තැන්පතු ඉහළ යෑම වැනි සාධක පිළිබිඹු කරමින් 2022 වසරේ අග භාගයේ දී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ක්‍රමයෙන් වර්ධනය වීමක් නිරීක්ෂණය විය. ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ යෑම වේගයෙන් වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම, දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවැති හිඟ ද්‍රවශීලතා තත්ත්ව සහ අවදානම් ඉහළ මට්ටමක පැවතීම ආදියෙහි බලපෑම හේතුවෙන් 2022

**1.10 රූප සටහන**
**නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයෙහි සහ තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසරේ දී වෙළඳපොළ තැන්පතු සහ ණය පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමෙන් අනතුරුව, රජයේ ණය ගැනීමේ අවශ්‍යතාවය ඉහළ යෑම සහ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය හා සම්බන්ධ වෙළඳපොළ තත්ත්වයන්හි ඉහළ අවිනිශ්චිතතා මධ්‍යයේ ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතිකවල ඉහළ යෑම්වලට අසමානුපාතික ලෙස රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික 2022 වසරේ දී විශාල ලෙස ඉහළ ගියේය. තවද, විවට වෙළඳපොළ කටයුතු හරහා වෙළඳපොළ අවශ්‍යතා මත ද්‍රවශීලතාව සැපයීම සිදුකරන අතරම, බලපත්‍රලාභී වාණිජ බැංකු මහ බැංකුවේ නිත්‍ය පහසුකම් මත අධික ලෙස රඳා පැවතීම අවම කිරීමටත්, එමගින් දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවයේ අසමමිතික ව්‍යාප්තිය අඩු කිරීමටත් අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග 2023 ජනවාරි මාසයේ දී හඳුන්වා දෙන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දේශීය මුදල් වෙළඳපොළ එක්දින ද්‍රවශීලතාව ඉහළ ගිය අතර, අන්තර් බැංකු ඒක්ෂණ වෙළඳපොළෙහි සහ ප්‍රතිමිලදී ගැනුම් වෙළඳපොළෙහි ක්‍රියාකාරිත්වය වර්ධනය විය. වැඩිදියුණු වූ රුපියල් ද්‍රවශීලතා තත්ත්වය සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ සම්බන්ධයෙන් සාර්ථක ලෙස අවසන් එකඟතාවයකට පැමිණීමේ අපේක්ෂාව මත ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය වීමත් සමඟ 2022 වසර අවසානයේ දී සහ 2023 වසරේ මුල් කාලයේ දී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වීමක් නිරීක්ෂණය විය. එසේම, වෙළඳපොළ පොලී අනුපාතිකවල අක්‍රමවත් ලෙස ඉහළ යෑම නිවැරදි කරමින් අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික ද 2022 වසර අග භාගයේ සිට ක්‍රමයෙන් අඩු වීම ආරම්භ විය. කෙසේ වෙතත්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ පිළිබඳව අවසන් එකඟතාවයකට පැමිණීම සඳහා සියලු 'පූර්ව ක්‍රියාමාර්ග' සපුරාලීමේ අවශ්‍යතාවය සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික තවදුරටත් දැඩි කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගෙන, 2022 සැප්තැම්බර් මාසයේ කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුම අවසන් කිරීමේ එකඟතාවයකට පැමිණීමේ දී ජා.මූ. අරමුදල විසින් යෝජනා කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාතික විශාල ලෙස ඉහළ නැංවීමට සාපේක්ෂව, මහ බැංකුවේ සහ ජා.මූ. අරමුදලේ කාර්ය මණ්ඩලයේ එකඟතාවයකට අනුව 2023 මාර්තු මාසයේ මුල් කාලයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100කින් ඉහළ නැංවිණි. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගය මෙන්ම දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රමෝපාය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලැබීමත් සමඟ අවදානම් පහළ යෑමේ හැකියාව අවධාරණය කරමින්, මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික අතර පරතරය අඩු කිරීමේ අවශ්‍යතාව වෙළඳපොළ වෙත දැනුම් දුන්නේය. ඒ අනුව, අපේක්ෂා කළ පරිදි ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික අතර පරතරය අඩු කරමින් වෙළඳපොළ පොලී අනුපාතික අඛණ්ඩව පහළ ගියේය. මේ අතර, රජය විසින් 2023 මාර්තු මස අවසානයේ දී දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය පිළිබඳ වැඩි විස්තර ලබා දුන් අතර, ඉන් පසුව භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස පහළ යෑමට එය උපකාරී විය.

**රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ විදේශ මුදලින් නාමනය කරන ලද දේශීය ණය රුපියල්වලින් ගණනය කිරීමේ දී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම මධ්‍යයේ 2022 වසරේ මුල් කාලයේ දී සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වූ පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වර්ධනය, ඉන් පසුව ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සංකෝචනය වීම හේතුවෙන් මන්දගාමී විය.** පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2021 වසර අවසානයේ වාර්තා වූ සියයට 13.2ට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 15.4ක් ලෙස වාර්තා වූ අතර, එ.ජ.

1

**1.11 රූප සටහන**
**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය (අ)**





(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ. ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කළ පසු[1] පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය 2022 වසර අවසානය වන විට සියයට 7ක් පමණ දක්වා මන්දගාමී වී ඇති බව ඇස්තමේන්තු කර ඇත. විදේශ මුදලින් නාමනය කරන ලද ණය සහ අත්තිකාරම් රුපියල්වලින් ගණනය කිරීමේ දී විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය වීම නිසා සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් නොපියවූ ණය ප්‍රමාණය, රුපියල්වලින් සැලකූ විට, 2022 වසරේ මුල් කාලයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, දැඩි මුදල් තත්ත්ව සහ ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2022 වසරේ මැද භාගයේ සිට අඛණ්ඩව සංකෝචනය විය. ඒ අනුව, 2022 වසර අවසානය වන විට පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සියයට 6.2ක් දක්වා මන්දගාමී විය (රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කළ පසු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.3ක සංකෝචනය වීමක් ඇස්තමේන්තු කර ඇත).[2] එසේ වුවද, රාජ්‍ය ආදායම අඩු මට්ටමක පැවතීම සහ විදේශීය මූල්‍යන සඳහා ප්‍රවේශය සීමා වීම මධ්‍යයේ රජය දේශීය මූල්‍යනය, විශේෂයෙන් ම මහ බැංකුව මත, අඛණ්ඩව රඳා පැවතීම පිළිබිඹු කරමින් බැංකු පද්ධතිය මගින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය 2022 වසරේ දී විශාල ලෙස ඉහළ ගියේය. 2021 වසරේ දී බැංකු පද්ධතිය මගින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 1,284.4ක වැඩිවීමක් වාර්තා වූ අතර, 2022 වසර තුළ දී එය රුපියල් බිලියන 1,638.7කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය වැඩිම දායකත්වයක් සැපයීය. දුර්වල මූල්‍ය කාර්යසාධනය සහ විදේශ මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේ දී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම පිළිබිඹු කරමින් බැංකු පද්ධතිය වෙතින් රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබා ගත් ණය ද සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය. මේ අතර, වෙළෙඳපොළ තුළ විදේශ විනිමය ද්‍රවශීලතාව සීමිත වීම මධ්‍යයේ 2022 වසරේ මුල් කාලයේ දී ණය ආපසු ගෙවීම සහ වසර පුරා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීම මූල්‍යනය සඳහා නිල සංචිත උපයෝගී කර ගැනීම හේතුවෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් අඩුවීම සමඟ 2022 වසර තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස සංකෝචනය විය. කෙසේ වෙතත්, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්හි සුළු වර්ධනයක් 2022 වසර අග භාගයේ දී නිරීක්ෂණය විය. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් ද, විශේෂයෙන් ම වසර අවසාන කාලය වන විට, වර්ධනයක් වාර්තා කළේය.

**1.12 රූප සටහන**
**පුළුල් මුදල් ($M_{2b}$) වර්ධනය හා තුඩුදුන් සාධක (අ)**




(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ. ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1 මෙහිදී සියලුම විදේශ මුදලින් නාමනය කරන ලද අගයන් 2022 පෙබරවාරි මස අවසානයේ පැවති විනිමය අනුපාතිකය භාවිත කරමින් රුපියල්වලින් ගණනය කිරීමෙන් මුදල් සැපයුමේ වර්ධනය ඇස්තමේන්තු කර ඇත.

2 මෙහිදී සියලුම විදේශ මුදලින් නාමනය කරන ලද ණය 2022 පෙබරවාරි මස අවසානයේ පැවති විනිමය අනුපාතිකය භාවිත කරමින් රුපියල්වලින් ගණනය කිරීමෙන් පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය ඇස්තමේන්තු කර ඇත.

### මූල්‍ය අංශයේ ප්‍රවණතා

**පවතින ආර්ථික අර්බුදයේ බහුවිධ බලපෑම් මධ්‍යයේ 2022 වසරේ දී මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව අඛණ්ඩව පවත්වා ගැනුණි.** ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම, බැංකු අංශය රාජ්‍ය අංශය වෙත වැඩි වශයෙන් නිරාවරණය වීම, ආර්ථිකය සංකෝචනය වීම, උග්‍ර විදේශ විනිමය හිඟය, උද්ධමනය ඉහළ මට්ටමක පැවතීම සහ 2022 වසරේ අප්‍රේල් මාසයේ දී රජය විසින් ද්විපාර්ශ්වික සහ වාණිජ ණය සම්බන්ධ විදේශ ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම පිළිබඳව නිවේදනය කිරීම වැනි සාධක මූල්‍ය අංශයේ ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිය යුතු හා පෙර නොවූ අන්දමේ අහිතකර බලපෑම් ඇති කළේය. එසේ වුවද, විචක්ෂණශීලී නියාමන ක්‍රියාමාර්ග සහ නියාමන ලිහිල් කිරීම් මගින් වසර තුළ දී මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව රැක ගැනීමට පහසුකම් සැලසුණි. ණයවල ගුණාත්මකභාවය අඛණ්ඩව පහළ යෑම, ද්‍රවශීලතාවය මත පීඩනය උග්‍ර වීම, ණය හානිකරණ ඉහළ යෑම හේතුවෙන් ලාභදායීත්වය පහළ මට්ටමක පැවතීම, සහ ප්‍රාග්ධන ස්වාරක්ෂක පිරිහීම හේතුවෙන් ඇති වූ සුවිශාල අභියෝග මධ්‍යයේ වුව ද 2022 වසර තුළ බැංකු අංශයේ ස්ථායිතාව පවත්වාගෙන යන ලදී. ණය වර්ධනය මන්දගාමී වීම, ලාභදායීත්වය අඩු වීම සහ අදියර 3 යටතේ පවතින ණය මගින් පිළිබිඹු වන අක්‍රීය ණය ඉහළ යෑම වැනි අභියෝග මධ්‍යයේ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය, ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක සහිතව 2022 වසර තුළ දී, වත්කම් හා තැන්පතු අනුව ගත් කල, සිය අඛණ්ඩ වර්ධනය පවත්වා ගැනීමට සමත් විය. මේ අතර, රක්ෂණ අංශය 2022 වසර තුළ දී රක්ෂණ ව්‍යාප්තියේ අඩුවීමක් සහිතව වත්කම් පදනම සහ දළ ලියාපදිංචි වාරිකය (Gross written Premium) අනුව සුළු වර්ධනයක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් ආර්ථික අර්බුදයේ බලපෑම් හේතුවෙන් ප්‍රාථමික අලෙවිකාර සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්, විශ්‍රාම අරමුදල් සහ අනෙකුත් උප අංශවල මිශ්‍ර කාර්යසාධනයක් මෙම කාලපරිච්ඡේදය තුළ පෙන්නුම් කළේය.

**2022 වසර තුළ දී මූල්‍ය වෙළඳපොළ ද විවිධ අංශ වෙතින් ඇති වූ පීඩනවලට ඔරොත්තු දීමට සමත් වූ අතර, 2022 වසර අග භාගයේ සිට යළි යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කළේය.** 2022 වසරේ පළමු භාගය තුළ අඛණ්ඩව ඉහළ හිඟ මට්ටමක පැවති මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, ප්‍රධාන වශයෙන් මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් 2022 වසර අවසානය වන විට සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ අතර, අරමුදල් ණයට ගැනීමට හෝ අතිරික්ත අරමුදල් තැන්පත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලබන නිත්‍ය පහසුකම් මත මුදල් වෙළඳපොළෙහි සහභාගීත්ව ආයතන අඛණ්ඩව රඳා පැවතීම සහ වෙළඳපොළ සහභාගිවන්නන් අතර අවදානම් සඳහා මුහුණ දීමට ඇති අකමැත්ත වැඩි වීමත් සමඟ මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් දුර්වල කාර්යසාධනයක් වාර්තා කළේය. 2023 වසරේ මුල් භාගයේ සිට නිත්‍ය පහසුකම් මත රඳා පැවතීම සීමා කිරීමට මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග, අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ සහ ප්‍රතිමිලදී ගැනිමේ වෙළඳපොළ විශාල වශයෙන් සක්‍රීය කිරීමට උපකාරී විය. 2022 වසර තුළ පැවති ගෙවුම් තුලන පීඩන සහ අහිතකර වෙළඳපොළ අපේක්ෂා හේතුවෙන් විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය වීමත් සමඟ දේශීය විදේශ විනිමය වෙළඳපොළ ද්‍රවශීලතා හිඟ තත්ත්වයන්ට මුහුණ දුන් අතර, ජා. මූ. අරමුදලේ විස්තීරණ ණය පහසුකම ලබා ගැනීමත් සමඟ ඇතිවූ ධනාත්මක වෙළඳපොළ අපේක්ෂා සහ විනිමය අනුපාතික සම්බන්ධයෙන් නිකුත් කරන දෛනික වෙළඳපොළ මාර්ගෝපදේශ හා මහ බැංකුව වෙත විදේශ විනිමය අනිවාර්යයෙන් විකිණීමේ අවශ්‍යතාව ඉවත් කිරීමේ ක්‍රියාමාර්ග සමඟ 2023 වසරේ මුල් භාගයේ සිට යම් හිතකර වර්ධනයන් දක්නට ලැබුණි. අයහපත් සාර්ව ආර්ථික තත්ත්වයන් පවතින පසුබිමක් තුළ ස්ථාවර ආදායම් සුරැකුම්පත් සඳහා ඉහළ ඵලදාවක් පැවතීම සහ ඍණාත්මක වෙළඳපොළ අපේක්ෂා පිළිබිඹු කරමින් කොටස් වෙළඳපොළ 2022 වසර තුළ දුර්වල කාර්යසාධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, වසර තුළ දී කොටස් වෙළඳපොළ වෙත ශුද්ධ විදේශ විනිමය ගලා ඒම් වාර්තා විය. මෙම අභියෝගාත්මක ආර්ථික පරිසරය තුළ මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සඳහා මූල්‍ය යටිතල පහසුකම් අඛණ්ඩව සහාය සැපයීය.

## 1.3. ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම

**රුසියාව හා යුක්‍රේනය අතර පවතින යුද්ධය සහ චීනයේ කොවිඩ්-19 වසංගතය යළි ව්‍යාප්ත වීම සමඟ ඉහළ ගිය උද්ධමනය පාලනය කිරීම අරමුණු කරගනිමින් ගෝලීය වශයෙන් මහ බැංකු එකම කාලසීමාවක දී ප්‍රතිපත්ති පොලී අනුපාතික දැඩි කිරීම හමුවේ, ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් 2022 වසරේ දී දැඩි ලෙස පහත වැටී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.** ජා.මූ. අරමුදල විසින් 2023 වසරේ ජනවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්මට

**1.4 සංඛ්‍යා සටහන**

**ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම (අ)**

| ශීර්ෂය | 2021 (ආ) | 2022 (ඇ) | 2023 (පුරෝකථන) | 2024 (පුරෝකථන) |
|---|---|---|---|---|
| **ලෝක නිෂ්පාදිතය** | **6.2** | **3.4** | **2.9** | **3.1** |
| සංවර්ධිත ආර්ථික | 5.4 | 2.7 | 1.2 | 1.4 |
| ඇමරිකා එක්සත් ජනපදය | 5.9 | 2.0 | 1.4 | 1.0 |
| යුරෝ කලාපය | 5.3 | 3.5 | 0.7 | 1.6 |
| එක්සත් රාජධානිය | 7.6 | 4.1 | -0.6 | 0.9 |
| ජපානය | 2.1 | 1.4 | 1.8 | 0.9 |
| නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික | 6.7 | 3.9 | 4.0 | 4.2 |
| නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වන ආසියාව | 7.4 | 4.3 | 5.3 | 5.2 |
| චීනය | 8.4 | 3.0 | 5.2 | 4.5 |
| ඉන්දියාව | 8.7 | 6.8 | 6.1 | 6.8 |
| **ලෝක වෙළඳ පරිමාව (භාණ්ඩ හා සේවා)** | **10.4** | **5.4** | **2.4** | **3.4** |
| **මිල හැසිරීම** | | | | |
| පාරිභෝගික මිල | | | | |
| සංවර්ධිත ආර්ථික | 3.1 | 7.3 | 4.6 | 2.6 |
| නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික | 5.9 | 9.9 | 8.1 | 5.5 |
| වෙළඳ භාණ්ඩ මිල | | | | |
| ඉන්ධන | 65.8 | 39.8 | -16.2 | -7.1 |
| ඉන්ධන නොවන | 26.4 | 7.0 | -6.3 | -0.4 |

(අ) වෙනත් සඳහනක් නොමැති විට වාර්ෂික ප්‍රතිශත වෙනස
(ආ) සංශෝධිත
(ඇ) ඇස්තමේන්තු

මූලය: World Economic Outlook (2023 ජනවාරි), ජා.මූ. අරමුදල

(World Economic Outlook) අනුව, ගෝලීය ආර්ථික වර්ධනය 2021 වසරේ දී ඇස්තමේන්තු කළ සියයට 6.2ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 3.4ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇතැයි පුරෝකථනය කර ඇත. මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම සමඟ ඉල්ලුම මත බලපෑම් ඇතිවීමත්, ඉහළ උද්ධමනය මගින් කුටුම්භවල මිල දී ගැනීමේ හැකියාව පහළ යෑම හා ආර්ථිකය පිළිබඳ විශ්වාසය බිඳ දැමීමත් හේතුවෙන්, 2022 වසරේ දී සංවර්ධිත රටවල ආර්ථික තත්ත්වයන් සැලකිය යුතු ලෙස පිරිහීමට ලක් විය. රුසියාව සහ යුක්‍රේනය අතර පවතින යුද්ධය, යුරෝපා කලාපයේ බලශක්ති සැපයුම දැඩි ලෙස අඩාල වීමට බලපෑ අතර, එය බලශක්ති මිල ගණන් සහ ඇතැම් ආහාර මිල ගණන් ඉහළ නැංවීම හරහා නිෂ්පාදනයට හා පරිභෝජනයට බාධා ඇති කරමින් අවිනිශ්චිතතා ඇති කිරීමට හේතු විය. විශාල වශයෙන් කොවිඩ්-19 වසංගතය නැවත ව්‍යාප්ත වීම සමඟ සමාජ සහ ආර්ථික කටයුතු සීමා කිරීම හේතුවෙන් 2022 වසරේ දී චීනයේ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී විය. තවද, දැඩි ගෝලීය මූල්‍ය තත්ත්වයන්, ඉහළ උද්ධමනය මධ්‍යයේ පාරිභෝගික වියදම් අඩු වීම, විදේශීය ඉල්ලුම අඩු වීම සහ රුසියාව සහ යුක්‍රේනය අතර යුද්ධයේ බලපෑම හේතුවෙන් නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ක්‍රියාකාරකම් 2022 වසරේ දී ශීඝ්‍ර ලෙස පහත වැටුණි.

**උද්ධමනය පාලනය කිරීම සඳහා වූ ගෝලීය ක්‍රියාකාරකම් මධ්‍යයේ ඇති වූ දැඩි මූල්‍ය තත්ත්වයන් සහ රුසියාව හා යුක්‍රේනය අතර යුද්ධය අඛණ්ඩව පැවතීම, 2023 වසරේ දී ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම්වලට බලපෑම් කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, චීනය නැවත ආර්ථික හා සමාජීය කටයුතු සඳහා විවෘත කිරීම මගින් මෙම බලපෑම යම්තාක් දුරට සමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2023 වසරේ ජනවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්මට අනුව, ගෝලීය ආර්ථික වර්ධනය 2023 වසරේ දී සියයට 2.9ක් දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, ඉන්පසුව 2024 වසරේ දී සියයට 3.1ක් දක්වා ඉහළ යෑමක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. දියුණු ආර්ථිකයන්හි වර්ධනය 2022 වසරේ දී වාර්තා වූ සියයට 2.7 සිට 2023 වසරේ දී සියයට 1.2ක් දක්වා සැලකිය යුතු ලෙස පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. එක්සත් ජනපදය, යුරෝපා කලාපීය ආර්ථිකයන් සහ එක්සත් රාජධානිය ඇතුළු දියුණු ආර්ථිකයන් බොහොමයක් 2023 වසරේ දී මන්දගාමී වර්ධනයක් අත්විඳිනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රමයෙන් ලිහිල් කිරීම සහ බලශක්ති වෙළඳපොළ ස්ථාවර වීම හමුවේ 2024 වසරේ දී දියුණු ආර්ථිකයන්හි වර්ධනය මධ්‍යස්ථ ලෙස ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදේශීය ඉල්ලුම අඩුවීම, ප්‍රධාන වශයෙන් රෙදිපිළි සහ ඇඟලුම් ඇතුළු අපනයන අඩු වීමට හේතු විය හැකි බැවින්, දියුණු ආර්ථිකයන්හි ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම ශ්‍රී ලංකාවේ අපනයන කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය. එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන ගමනාන්තයන් වන බැවින්, මෙම කලාපවලින් ඇති වන ඉල්ලුම යම්කිසි ආකාරයකින් අඩු වීම ශ්‍රී ලංකාවේ අපනයන ක්‍රියාකාරිත්වය කෙරෙහි සැලකිය යුතු ඍණාත්මක බලපෑමක් ඇති කරනු ලබන අතර, එමගින් ආර්ථික වර්ධනයට බලපෑම් ඇති කරනු ලබයි. තවද, දියුණු ආර්ථිකයන්හි ආදායම් මට්ටම්වල වර්ධනය පහළ යෑම, එම රටවලින් පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය අඩුවීමට බලපානු ඇත. මේ අතර, ප්‍රධාන වශයෙන් නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියාවේ, විශේෂයෙන් චීනයේ අපේක්ෂිත ආර්ථික වර්ධනය සහ රුසියාව සම්බන්ධයෙන් පුරෝකථනය කර ඇති ඉහළ ආර්ථික වර්ධනය හේතුවෙන් නැගී එන වෙළඳපොළ

සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ආර්ථික ක්‍රියාකාරකම් 2022 වසරේ දී වාර්තා වූ සියයට 3.9 සිට 2023 වසරේ දී සියයට 4.0ක් දක්වා සුළු වශයෙන් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ගේ අධික පමණ ආර්ථික වර්ධනය, 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත. දැඩි මූල්‍ය තත්ත්ව සහ භූ දේශපාලනික අර්බුදවලට අමතරව, දියුණු ආර්ථිකයන්හි පහළ ගිය ඉල්ලුම් තත්ත්ව මගින් ඇතිවන බලපෑම් සහ අඛණ්ඩ මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග ඇතුළු විවිධ ආකාරයේ බාධා මගින් නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට බලපෑම් සිදු කරනු ඇත. සංචාරක හා විශේෂයෙන් ම ඉදිකිරීම් ආශ්‍රිත අංශ ඇතුළත් විදේශීය ආයෝජන ක්ෂේත්‍ර හරහා ශ්‍රී ලංකාව, චීනය හා ඉන්දියාව සමඟ දිගු කාලීන ආර්ථික සම්බන්ධතා පවත්වන බැවින් චීනයේ ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත වර්ධනය සහ ඉන්දියාවේ ආර්ථික වර්ධනය ශක්තිමත් වීමේ ප්‍රවණතාවය ශ්‍රී ලංකාවට වාසිදායක විය හැකිය.

**2022 වසරේ දී ගෝලීය උද්ධමනය උපරිම මට්ටමට පැමිණ ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර, ඉල්ලුම පහළ යෑම සහ වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම මධ්‍යයේ 2023 වසරේ දී එය පහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත.** 2023 වසරේ ජනවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්මට අනුව, ලෝකයේ පාරිභෝගික භාණ්ඩ මිල ගණන්, 2021 වසරේ දී වාර්තා වූ සියයට 4.7ට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 8.8කින් ඉහළ ගියේය. 2022 වසරේ දී උද්ධමනය ඉහළ යෑම සඳහා ඉල්ලුම් මෙන්ම සැපයුම් සාධක බලපෑ අතර, ඉල්ලුම් පාර්ශ්වයෙන්, වසංගතයෙන් පසු අතිශය ලිහිල් කරන ලද මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල පසු බලපෑම් අඛණ්ඩ මිල පීඩනයන්ට හේතු විය. සැපයුම් අංශය සම්බන්ධයෙන් ගත් කළ, රුසියාව සහ යුක්‍රේනය අතර පවතින යුද්ධය හේතුවෙන් උග්‍ර වූ ප්‍රධාන වෙළඳ භාණ්ඩවල හිඟය මෙන්ම ධාරිතාවයෙහි සීමා වීම් සහ සැපයුම් දාම කෙරෙහි වූ බාධාවන් මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම සඳහා හේතු විය. කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කිරීම, ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම, සැපයුම් දාම වෙත වූ බාධාවන් ලිහිල් වීම සහ බලශක්ති හා අනෙකුත් වෙළඳ භාණ්ඩවල මිල ගණන් පහළ යෑම යන සාධක හමුවේ, උද්ධමනය ඉදිරි කාල සීමාව තුළ පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. ඒ අනුව, ගෝලීය උද්ධමනය, 2023 වසරේ දී සියයට 6.6ක් දක්වා සහ 2024 වසරේ දී සියයට 4.3ක් දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ වුවද, උද්ධමනයේ පුරෝකථනය කර ඇති මට්ටම් තවමත් වසංගත තත්ත්වයට පෙර පැවති සියයට 3.5 මට්ටමට වඩා ඉහළ මට්ටමක පවතී. 2022 වසරේ දී දේශීය මිල ඉහළ යෑම සඳහා මෙම ගෝලීය මිල ගණන්වල දායකත්වය සැලකිය යුතු ලෙස හේතු වූ බැවින් ගෝලීය බලශක්ති සහ අනෙකුත් වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම ශ්‍රී ලංකාවට වාසිදායක වනු ඇත. ගෝලීය මිල ගණන්වල අපේක්ෂිත පහළ යෑමට අනුකූලව කාලෝචිත හා විනිවිදභාවයකින් යුතුව දේශීය මිල ගණන් සඳහා ගැළපීම් කළහොත්, ආනයනික උද්ධමනය සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පවත්වා ගත හැකි අතර, එය රට අත් කර ගැනීමට අපේක්ෂිත නිර්-උද්ධමන ක්‍රියාවලියට සහාය වනු ඇත.

**ඉහළ යන උද්ධමන පීඩන සහ අහිතකර උද්ධමන අපේක්ෂා සැලකිල්ලට ගනිමින් ලොව පුරා බොහෝ මහ බැංකු වසංගතය හමුවේ ක්‍රියාත්මක කළ උත්තේජක ක්‍රමයෙන් අඩු කරමින් 2022 වසරේ දී සිය ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම ආරම්භ කළහ.** උද්ධමනය, 2021 වසරේ සිට අපේක්ෂිත ප්‍රමාණයට වඩා වේගයෙන් සහ අඛණ්ඩව වැඩි වෙමින් පවතී. 2022 වසරේ දී, දියුණු ආර්ථිකයන්හි උද්ධමනය 1982 වසරෙන් පසු වාර්තා වූ ඉහළම මට්ටමට ළඟා විය. ඉහළ යන මිල පීඩනය, දියුණු ආර්ථිකයන් සහ බොහෝ නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි මුදල් ප්‍රතිපත්ති එකම කාලසීමාවක දී දැඩි කිරීමට හේතු විය. කොවිඩ්-19 වසංගත කාලය තුළ ෆෙඩරල් අරමුදල් අනුපාතිකය ශුන්‍යයට ආසන්නව පවත්වාගෙන ගිය එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව, 2022 වසරේ දී ෆෙඩරල් අරමුදල් ඉලක්ක අනුපාතිකය පදනම් අංක 425කින් සැලකිය යුතු ලෙස ඉහළ නැංවූ අතර, 2023 වසරේ මේ දක්වා කාලය තුළ දී තවත් පදනම් අංක 50කින් වැඩි කර ඇත. ඊට අමතරව, වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාවට නැංවූ මූල්‍ය තත්ත්වයන් ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රමයෙන් දැඩි කිරීමේ පියවරක් ලෙස ෆෙඩරල් සංචිත බැංකුව, භාණ්ඩාගාර සුරැකුම්පත්, නියෝජිතායතන ණය සහ නියෝජිතායතන දේපළ ඇපකර සහිත ණය සුරැකුම්පත් තොගය අඛණ්ඩව අඩු කරන ලදී. එමෙන්ම, දුර්වල ආර්ථික වර්ධනයක් පුරෝකථනය කළ ද, එංගලන්ත මහ බැංකුව සිය බැංකු අනුපාතිකය 2022 වසරේ දී පදනම් අංක 325කින් සහ 2023 වසරේ මේ දක්වා කාලය තුළ දී පදනම් අංක 75කින්, 2008 වසරේ අග සිට මේ දක්වා කාලය තුළ පැවති ඉහළම මට්ටමකට වැඩි කළේය. යුරෝපීය මහ බැංකුව ද සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික 2022 වසරෙහි ශුන්‍ය මට්ටමේ සිට

2023 වසරේ මාර්තු වන විට සියයට 3.5ක් දක්වා අඛණ්ඩව ඉහළ නංවන ලදී. තවද, යුරෝපීය මහ බැංකුව විසින්, යුරෝ පද්ධතියෙහි (Eurosystem) වත්කම් මිලදී ගැනීමේ වැඩසටහන යටතේ එහි සුරැකුම්පත් තොගය අඩු කිරීමක් නිවේදනය කරන ලදී. තවද, ප්‍රධාන දියුණු ආර්ථිකයන් 2023 සහ 2024 වසරවල බොහෝ විට මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අදාළව අපේක්ෂිත මාවත සහ අඛණ්ඩ දැඩි මුදල් ප්‍රතිපත්ති තත්ත්වයන් පිළිබඳ ඉදිරි මගපෙන්වීම් සපයන ලදී. බොහෝ රටවල සමස්තයක් ලෙස එලදා වක්‍රයට අදාළ පොලී අනුපාතික ඉහළ යෑම සමග දැඩි මුදල් ප්‍රතිපත්තිය සඳහා මූර්ත ආර්ථික ක්‍රියාකාරකම් සහ මූල්‍ය වෙළඳපොළ ප්‍රතිචාර දකිවා ඇති අතර, ශ්‍රම වෙළඳපොළ මන්දගාමී වීම සහ නිවාස වෙළඳපොළ මිල මට්ටම් අඩුවීමේ සලකුණු පෙන්නුම් කරමින් පවතී. කෙසේ වෙතත්, දියුණු ආර්ථිකයන්හි දැඩි මුදල් ප්‍රතිපත්තිය හේතුවෙන් ශ්‍රී ලංකාව ඇතුළු නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් වෙත ලැබෙන ප්‍රාග්ධන ප්‍රවාහ සඳහා බලපෑමක් සිදු විය හැකිය. මේ අතර, ඉහළ යන උද්ධමන පීඩනයන් සමනය කිරීමට නැගී එන වෙළඳපොළ සහ දියුණු වෙමින් පවතින රටවල ආර්ථිකයන්ගේ මහ බැංකු ද 2022 වසරේ දී දැඩි ප්‍රතිපත්ති අනුගමනය කරන ලදී. ඒ අනුව, ඉන්දියානු සංචිත බැංකුව, මැලේසියානු මහ බැංකුව, තායිලන්ත මහ බැංකුව, පිලිපීන මහ බැංකුව, සහ ඉන්දුනීසියානු බැංකුව වැනි අනෙකුත් මහ බැංකු උද්ධමනය පාලනය කිරීම සඳහා 2022 වසරේ දී මෙන්ම 2023 වසරේ මුල් කාලයේ දී ඔවුන්ගේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නංවන ලදී. මීට වෙනස්ව යමින්, 2022 වසරේ දී කොවිඩ්-19 හේතුවෙන් සිදුවූ දිගු කාලයක් පුරා පැවති සමාජ සහ ආර්ථික කටයුතු සීමා කිරීම සහ දේපළ වෙළඳාම් අංශයේ ගැටලු හේතුවෙන් බලපෑමට ලක් වූ ආර්ථිකය, නැවත යථා තත්ත්වයට පත් කිරීමේ උත්සාහයක් ලෙස 2022 වසරේ දී චීන මහජන බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදී.

**විශේෂයෙන් ම රාජ්‍ය සුරැකුම්පත්වල ඉහළ එලදා අනුපාතික ඇතුළු ඉහළ පොලී අනුපාතික මධ්‍යයේ, දියුණු ආර්ථිකයන්හි බැංකු අංශය මූල්‍ය අර්බුදයක සලකුණු පෙන්නුම් කළේය.** 2023 මාර්තු මාසයේ දී, එක්සත් ජනපදයේ සිලිකන් වැලි බැංකුව (Sillicon Valley Bank) බිඳ වැටුණු අතර, එය එක්සත් ජනපද ඉතිහාසයේ වාර්තා වූ දෙවන විශාලතම බැංකු අසාර්ථක වීම වන අතර, 2008 ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසු වාර්තා වූ විශාලතම බැංකු අසාර්ථක වීම විය. ඉහළ යන උද්ධමනය මැඩපැවැත්වීම සඳහා ෆෙඩරල් සංචිත බැංකුව 2022 වසරේ දී පොලී අනුපාතික විශාල ලෙස ඉහළ නැංවූ හෙයින්, එක්සත් ජනපද භාණ්ඩාගාර සුරැකුම්පත්වල වෙළඳපොළ වටිනාකම සැලකිය යුතු ලෙස පහත වැටුණි. බොහෝ බැංකු එක්සත් ජනපද භාණ්ඩාගාර සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ බැවින්, වෙළඳපොළ වටිනාකම පහත වැටීම හේතුවෙන් ඔවුන්ගේ ආයෝජන කලඹෙහි අලාභ සිදු වූ අතර, ප්‍රාග්ධන සංචිත අඩු වීමෙන් ඔවුන්ගේ ශේෂ පත්‍ර දුර්වල විය. සිලිකන් වැලි බැංකුවෙහි ණය කලඹ තුළ ෆින්ටෙක් සමාගම් සහ ආරම්භක ව්‍යාපාර කෙරෙහි වැඩි නැඹුරුවක් තිබූ අතර එමගින් එහි අවදානම ඉහළ ගියේය. විශාල එක්සත් ජනපද බැංකු සමූහයක් විසින් මුදවා ගන්නා ලද ෆස්ට් රිපබ්ලික් (First Republic) බැංකුව ඇතුළු තවත් එක්සත් ජනපද බැංකු කිහිපයක් ද එම සංසිද්ධිය හේතුවෙන් මූල්‍ය අර්බුදයකට ලක් විය. මීට අමතරව, ක්‍රිප්ටෝ ව්‍යවහාර මුදල් (Cryptocurrency) ආශ්‍රිත සමාගම් සමග වැඩි වශයෙන් ගනුදෙනු කිරීම හේතුවෙන් 2023 වසරේ මාර්තු මාසයේ දී එක්සත් ජනපදයේ සිල්වර්ගේට් බැංකුව ද (Silvergate Bank) අසාර්ථක වූ අතර, එම හේතුව නිසාම එක්සත් ජනපදයේ සිග්නේචර් (Signature) බැංකුවේ මෙහෙයුම්, නියාමන ආයතන විසින් අත්හිටුවන ලදී. මෙම අසාර්ථකත්වයන්ට ප්‍රතිචාර වශයෙන්, එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව සහ එක්සත් ජනපද රාජ්‍ය ආයතන විසින් මූල්‍ය අර්බුදයක පසුවන බැංකුවලට ද්‍රවශීලතාවය ලබා දීම සහතික කිරීම සහ අසාර්ථක වූ බැංකුවල තැන්පතු නැවත ලබා දීම සඳහා පියවර මාලාවක් නිවේදනය කරන ලදී. එක්සත් ජනපදයේ බැංකු අංශයට අමතරව, ස්විට්සර්ලන්තය පදනම් කරගත් ගෝලීය ආයෝජන බැංකුවක් සහ මූල්‍ය සේවා සමාගමක් වන ක්‍රෙඩිට් ස්විස් (Credit Suisse), 2023 වසරේ මාර්තු මාසයේ දී මූල්‍ය අර්බුදයක සලකුණු පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, ස්විට්සර්ලන්තයේ මහ බැංකුව වන ස්විට්සර්ලන්ත ජාතික බැංකුව (Swiss National Bank) විසින් මූල්‍ය කටයුතු ඉහළ නැංවීම සඳහා ලබා දුන් හදිසි ණය පහසුකමකින් එහි බිඳවැටීම වළක්වාලීය. ස්විට්සර්ලන්තයේ විශාලතම බැංකු ආයතනය වන යූ.බී.එස්. (UBS) විසින් ක්‍රෙඩිට් ස්විස් ආයතනය පසුව පවරා ගන්නා ලද අතර ස්විස් ජාතික බැංකුව සහ ස්විට්සර්ලන්ත රජය විසින් එම ගනුදෙනුව කඩිනම් කරන ලදී. තවද, පවතින බැංකු අර්බුදය හේතුවෙන් දියුණු ආර්ථිකයන් තුළ වෙළඳපොළ කැළඹීමක් ඇති කළ අතර, එක්සත් ජනපදයේ සහ යුරෝපීය බැංකු

අංශයේ කොටස්වල වටිනාකම් මත සැලකිය යුතු අලාභයක් ඇති කර තිබේ. මේ අතර, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව, කැනඩාවේ මහ බැංකුව, එංගලන්ත මහ බැංකුව, ජපාන මහ බැංකුව, යුරෝපීය මහ බැංකුව සහ ස්විස් ජාතික බැංකුව ගෝලීය මූල්‍ය පද්ධතියේ ද්‍රවශීලතා ගැටලු වළක්වා ගැනීම සඳහා 'ස්ථාවර එක්සත් ජනපද ඩොලර් ද්‍රවශීලතා විදේශ විනිමය හුවමාරු පහසුකම්' හරහා ද්‍රවශීලතා සැපයීම වැඩි කිරීම සඳහා සහයෝගීතා ක්‍රියාමාර්ගයක් 2023 වසරේ මාර්තු මාසයේ දී නිවේදනය කළහ. එසේ වුවද, ගෝලීය බැංකු ආයතනවල වර්තමානයේ පවතින ආතතීන් සහ ඒ ආශ්‍රිතව අනෙකුත් අංශ වෙත සිදුවන බලපෑම්, ආර්ථික දැක්මට සැලකිය යුතු අවදානම් ඇති කිරීමේ මූලාශ්‍රයක් බවට පත්විය හැකි අතර, ඒ හේතුවෙන් නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට ද බලපෑම් ඇති විය හැකිය. එපමණක් නොව, මෙම තත්ත්වය මත ප්‍රධාන මහ බැංකුවලට ඔවුන්ගේ ප්‍රතිපත්ති දිශානතිය හෝ අනාගත ප්‍රතිපත්ති අනුපාතික ගැළපීම්වල වේගය ගැන නැවත සිතා බැලීමට සිදුවන හෙයින්, මෙම මූල්‍ය කැළඹීම ගෝලීය වශයෙන් අපේක්ෂිත දැඩි මූල්‍ය තත්ත්වයන්ගෙන් අපගමනය වීමට හේතු විය හැක. මේ අතර, මූල්‍ය අර්බුදය විසඳීම සඳහා විශාල ද්‍රවශීලතා ප්‍රතිපාදන සැපයීම තුළින් ඉල්ලුම් පීඩන ඉදිරියේ දී වර්ධනය විය හැකි අතර, එය ලොව පුරා විශාල වශයෙන් අපේක්ෂා කෙරෙන නිර්-උද්ධමන ප්‍රවණතාවයට තර්ජනයක් විය හැක.

**සමස්තයක් ලෙස ගෝලීය ආර්ථිකයේ ඉදිරි දැක්මට ඇති අවදානම් තුළින් ගෝලීය වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු විය හැකි අතර, උද්ධමනය වඩා ඉහළ මට්ටමක් දක්වා වැඩි විය හැකි බව පිළිබිඹු කරයි.** ධනාත්මක අවදානම් සැලකීමේ දී, විශේෂයෙන්ම වසංගතය ආශ්‍රිත රාජ්‍ය මූල්‍ය ආධාර මෙන්ම අතිශය දැඩි ශ්‍රම වෙළඳපොළ සහ ඉහළ වැටුප් වර්ධනයන්හි දායකත්වයෙන් ඉහළ ගිය අතිරික්ත පුද්ගලික ඉතුරුම් මගින් සිදුවිය හැකි ඉල්ලුම ඉහළ යෑම තුළින් පරිභෝජනය වැඩි වීමට ඉඩ ප්‍රස්ථා පවතී. තවද, දියුණු ආර්ථිකයන්හි ශ්‍රම වෙළඳපොළ තත්ත්වයන් ලිහිල් වීම, වැටුප් හා බැඳුණු උද්ධමනය අඩු වීම සහ භාණ්ඩ මිලෙහි තියුණු පහත වැටීම හේතුවෙන් වේගවත් නිර්-උද්ධමනය තවත් හිතකර ප්‍රතිඵලයකි. කෙසේ වෙතත්, බොහෝ සෘණාත්මක අවදානම් 2023 වසරේ දී ගෝලීය ඉදිරි දැක්මට බලපෑ හැකිය. කොවිඩ්-19 වසංගතයේ දිගු කාලීන බලපෑම් සහ උත්සන්න වෙමින් පවතින දේපළ වෙළඳාම් අර්බුදය මධ්‍යයේ චීන ආර්ථිකයේ යථා තත්ත්වයට පත්වීම මන්දගාමී වීම ලොව පුරා ඉල්ලුම් ආශ්‍රිත සහ සැපයුම් දාම ආශ්‍රිත ගැටලු ඇති කරමින් සෙසු රටවලට අහිතකර ලෙස බලපෑ හැක. රුසියානු-යුක්‍රේන යුද්ධය තවත් උත්සන්න වීම තුළින් බලශක්ති සහ ආහාර මිල මට්ටම් තවදුරටත් ඉහළ යා හැකි බැවින්, විශේෂයෙන් ම යුරෝපය සහ අඩු ආදායම්ලාභී රටවල් සඳහා ඉහළ අවදානම් තත්ත්වයක් ඇති කරයි. මේ වන විට ණය ගැටලුවක සිටින හෝ එවැනි ගැටලුවක් ඇති වීමේ අවදානමක පවතින රටවල් සංඛ්‍යාව වැඩිවෙමින් පවතී. මෙම ගැටලුව ඇතුළුව අඩු ආර්ථික වර්ධනය හා ඉහළ ණය පිරිවැය මෙම ආර්ථිකයන්ගේ අවදානම් තත්ත්වය වඩා තීව්‍ර කළ හැකි අතර එමගින් ගෝලීය ඉදිරි දැක්මට බලපෑම් සිදුකළ හැක. මේ අතර, ශ්‍රම වෙළඳපොළෙහි පවත්නා අඛණ්ඩ දැඩි තත්ත්වයන් සහ යුක්‍රේනයේ පවතින යුද්ධය මෙන්ම චීන ආර්ථිකය අපේක්ෂිත මට්ටමට වඩා වේගයෙන් නැවත යථා තත්ත්වයට පත්වීමේ හැකියාව තුළින් ගෝලීය උද්ධමනය නැවතත් ඉතා ඉහළ මට්ටම් දක්වා වැඩි වීමට හා උද්ධමන අපේක්ෂාවන් පාලනයෙන් ඔබ්බට යාමට ද හේතු විය හැක. තවද, මූල්‍ය තත්ත්වයන් නිසි කලට ප්‍රථම ලිහිල් කිරීම සහ ඒ ආශ්‍රිත මූල්‍ය වෙළඳපොළ අස්ථාවරත්වයන් මෙන්ම භූ දේශපාලනික බෙදීම් වැඩි වීම ගෝලීය ආර්ථිකයේ ඉදිරි දැක්මට ඇති අනෙකුත් සෘණාත්මක අවදානම් ලෙස පවතී. මීට අමතරව, ගෝලීය බැංකු පද්ධතියේ දැනට පවතින අර්බුදකාරී තත්ත්වයන් සහ එයින් සිදු විය හැකි බලපෑම්, ගෝලීය ආර්ථික වර්ධනයේ ඉදිරි දැක්මට සහ මූල්‍ය තත්ත්වයන්ට පවතින ප්‍රධාන අවදානම් මූලාශ්‍රයක් වේ.

## 1.4 සාර්ව ආර්ථික දැක්ම[3]

**ශ්‍රී ලංකා ආර්ථිකයේ මැදි කාලීන ඉදිරි දැක්ම බොහෝ දුරට ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළෙහි දක්වා ඇති සාර්ව ආර්ථික ගැළපුම් වැඩසටහනේ කාර්යසාධන නිර්ණායක සහ ව්‍යුහාත්මක මිනුම් දඬු මෙන්ම ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත කරුණු, නිසි කලට හා ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම මත රඳා පවතියි.** ඉදිරි කාලය තුළ හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ කාලෝචිත හා

3 මෙම කොටසේ ඉදිරිපත් කර ඇති මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව 2023 සැප්තැම්බර් මාසය අවසන් වීමට පෙර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම ඇතුළුව ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දක්වන වැඩසටහන සාර්ථකව ඉදිරියට ගෙන යෑමේ සහ එමගින් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් තවදුරටත් මූල්‍ය සහාය ලැබීමේ උපකල්පනය ඇතුළත් ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ මත පදනම් වී ඇත. විවිධ කාල පරාසවල තොරතුරු සහ ඒ සඳහා හේතු වූ උපකල්පන මත පදනම්ව ජාත්‍යන්තර මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රකාශයට පත් කරනු ලැබූ මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන මෙයින් වෙනස්විය හැකි බව සඳහන් කළ යුතුය.

1

**1.5 සංඛ්‍යා සටහන**

**මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව (අ)**

| දර්ශකය | ඒකකය | 2021 (ආ) | 2022 (ඇ) | 2023 | 2024 | 2025 | 2026 | 2027 |
|---|---|---|---|---|---|---|---|---|
| **මූර්ත අංශය (ඈ)** | | | | | | | | |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | සියයට | 3.5 (ඇ) | -7.8 | -2.0 | 3.3 | 4.0 | 4.5 | 5.0 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් ට්‍රිලියන | 17.6 (ඇ) | 24.1 | 28.5 | 31.0 | 33.8 | 37.1 | 40.9 |
| ඒක පුද්ගල ද.දේ.නි. | එ.ජ. ඩොලර් | 3,997 (ඇ) | 3,474 | 3,489 | 3,621 | 3,811 | 4,030 | 4,281 |
| මුළු ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 36.7 (ඇ) | 34.4 | 34.9 | 35.4 | 35.9 | 36.4 | 36.9 |
| දේශීය ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 29.4 (ඇ) | 30.8 | 30.9 | 30.8 | 32.0 | 33.0 | 33.8 |
| ජාතික ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 33.0 (ඇ) | 33.1 | 33.8 | 34.1 | 34.6 | 35.3 | 36.0 |
| **විදේශීය අංශය (ඇ)** | | | | | | | | |
| වෙළඳ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -9.2 | -6.7 | -6.9 | -7.4 | -6.7 | -6.1 | -5.9 |
| අපනයන | එ.ජ. ඩොලර් බිලියන | 12.5 | 13.1 | 14.1 | 15.5 | 17.1 | 18.8 | 20.2 |
| ආනයන | එ.ජ. ඩොලර් බිලියන | 20.6 | 18.3 | 19.4 | 21.6 | 22.9 | 24.4 | 26.0 |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -3.7 | -1.9 | -1.1 | -1.3 | -1.2 | -1.1 | -0.9 |
| විදේශීය නිල සංචිත | ආනයනික මාස වශයෙන් | 1.8 | 1.2 | 3.0 | 3.4 | 3.8 | 4.2 | 4.5 |
| **රාජ්‍ය මූල්‍ය අංශය (ඇ) (ඉ)** | | | | | | | | |
| සමස්ත ආදායම සහ ප්‍රදාන | ද.දේ.නි.යේ % වශයෙන් | 8.3 | 8.3 | 11.0 | 13.3 | 14.9 | 15.0 | 15.1 |
| වියදම හා ශුද්ධ ණය දීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 20.0 | 18.5 | 19.0 | 19.7 | 19.9 | 19.9 | 19.6 |
| වර්තන ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -7.3 | -6.4 | -4.5 | -2.1 | -0.7 | -0.4 | 0.0 |
| ප්‍රාථමික ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -5.7 | -3.7 | -0.7 | 0.8 | 2.3 | 2.3 | 2.3 |
| සමස්ත අයවැය හිඟය | ද.දේ.නි.යේ % වශයෙන් | -11.7 | -10.2 | -8.0 | -6.4 | -5.0 | -4.8 | -4.5 |
| මධ්‍යම රජයේ ණය | ද.දේ.නි.යේ % වශයෙන් | 100.1 | 113.8 | 100.0 | 101.6 | 103.3 | 102.2 | 97.6 |
| **මුදල් අංශය සහ උද්ධමනය** | | | | | | | | |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) (ඊ) | සියයට | 13.2 | 15.4 | 10.5 | 10.9 | 10.8 | 10.7 | 10.2 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය ($M_{2b}$ හි) (ඊ) | සියයට | 13.1 | 6.2 | 0.9 | 8.5 | 9.5 | 10.5 | 10.5 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය | සියයට | 6.0 (උ) | 46.4 (උ) | 20.6 (ඌ) | 5.0 (ඌ) | 5.0 (ඌ) | 5.0 (ඌ) | 5.0 (ඌ) |

(අ) 2023 මාර්තු මස අවසානය වන විට පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු මාසයේ දී නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.
(ඉ) ජා.මූ. අරමුදලෙහි පුරෝකථනයන් (ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ උපකල්පන සහිතව)
(ඊ) වසර අවසානයේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය
(උ) කො.පා.මි. දර්ශකය (2013 = 100) මත පදනම් වේ.
(ඌ) කො.පා.මි. දර්ශකය (2021 = 100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ස්ථාවර ආකාරයකින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, අනපේක්ෂිත විදේශීය හා දේශීය කම්පනවලින් සාර්ව ආර්ථික දැක්මෙහි මූලිකව අපේක්ෂිත තත්ත්වය සාක්ෂාත් කර ගැනීමට බලපෑමක් ඇති විය හැකිය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පසුගිය කාලසීමාව තුළ ප්‍රකාශයට පත් කරන ලද මැදි කාලීන සාර්ව ආර්ථික දැක්ම මගින් ව්‍යුහාත්මක අවහිරතාවලට විසඳුම් ලබා දීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම උපකල්පනය කර ඇත. කෙසේ වෙතත්, අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ අසාර්ථකත්වය හේතුවෙන් පෙර අපේක්ෂා කළ හිතකර සාර්ව ආර්ථික දැක්ම සාක්ෂාත් කර ගැනීම ප්‍රමාද වී ඇත. නිදහසින් පසු ශ්‍රී ලංකාව සිය ආර්ථික ගමන්මග තුළ තීරණාත්මක අවධියක් කරා ළඟා වී ඇති බැවින්, දිගු කාලයක් පුරා සිදු නොවී ප්‍රමාද වී ඇති ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා වන ප්‍රතිපත්තිමය කැපවීම සහ එවැනි වැදගත් ප්‍රතිසංස්කරණ සඳහා මහජන සහයෝගය ඉදිරි කාලය තුළ ලැබෙනු ඇතැයි දැනට හේතු සහගත අපේක්ෂාවක් ඇත. කෙසේ වෙතත්, ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ දැනට සිදු කරන සාකච්ඡා අවසන් කිරීමට ගත වන කාලය, ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු අවධිය තුළ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ වේගය සහ ප්‍රමාණය, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහනේ ඉලක්ක සාර්ථකව නිම කිරීම යනාදිය සම්බන්ධයෙන් ඇති විය හැකි අවදානම් හේතුවෙන් අපේක්ෂිත මැදි කාලීන ඉදිරි දැක්ම අවිනිශ්චිතතාවලින් සමන්විත වේ. මේ දක්වා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ සැලකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇත. මැදි හා

දිගු කාලීන ස්ථායීතාව තිරසාර ලෙස සහතික කිරීම සඳහා ඉදිරි කාලසීමාව තුළ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස ප්‍රතිපත්ති සම්පාදකයන් සතු අධිෂ්ඨානය සහ නුදුරු කාලීනව දුෂ්කර ප්‍රතිසංස්කරණ අනුගමනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ මහජනතාවගේ අවබෝධය අත්‍යවශ්‍ය වේ.

**ශ්‍රී ලංකා ආර්ථිකය 2022 වසරේ දී මුහුණ දුන් එහි දරුණුතම ආර්ථික පසුබෑමෙන් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමට පෙර දරමින් පසුවේ.** සාර්ව ආර්ථික ස්ථායීතාවය හා ණය තිරසාරත්වය යළි තහවුරු කිරීම, මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීම, යහපාලනය ශක්තිමත් කිරීම මෙන්ම, ආර්ථිකයේ වර්ධන විභවතාවන් උපයෝජනය කර ගැනීම සිදු කරන අතර, ජනගහනයේ දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි කාණ්ඩ මත ආර්ථික අර්බුදයේ අහිතකර බලපෑම් අවම කිරීම ඉලක්කකොටගත් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ වන සාර්ව ආර්ථික ගැළපුම් මගින් ආර්ථිකයේ මෙම යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය සැලසෙනු ඇත. මේ අතර, රජය සහ මහ බැංකුව විසින් ස්ථායීකරණ ක්‍රියාමාර්ග ගණනාවක් ආරම්භයේ දී ම ක්‍රියාවට නැංවීම ඉල්ලුම් පීඩන පාලනය කිරීම සඳහා මෙන්ම, අඛණ්ඩව ඉහළ ගිය උද්ධමනය හා විනිමය අනුපාතික අවප්‍රමාණය වීම පාලනය කර ගැනීම සඳහා උපකාරී වූ අතර, එමගින් ආර්ථිකයේ තවදුරටත් සිදු විය හැකිව තිබූ පිරිහීම කිසියම් දුරකට වළක්වා ගැනීමට හැකිවිය. මෙම වර්ධනයන් සමඟ දේශීය සැපයුම් අංශයේ වර්ධනයන් සහ විදේශ විනිමය ද්‍රවශීලතා පීඩන ලිහිල් වීම නුදුරු කාලයේ දී ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීම සඳහා විශාල සහායක් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, දැඩි මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මෙන්ම, ගෙවුම් ශේෂයට අදාළ ගැටලු මගින් 2023 වසරේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ වේගය මන්දගාමී විය හැක. 2023 වසරේ ගෝලීය ආර්ථිකයේ සියළුම අංශවල වර්ධනය මන්දගාමී වීම සහ ක්‍රමයෙන් වර්ධනය වන මූල්‍ය වෙළඳපොළ ආතතීන් මගින් පැන නගින ගෝලීය බාධක සඳහා ද ආර්ථිකයට මුහුණ දීමට සිදුවනු ඇති අතර, එම බලපෑම් මගින් රටේ වෙළඳ විභාවතාවට බාධා ඇතිවීම මෙන්ම, අපේක්ෂිත විදේශ විනිමය ලැබීම් හා විදේශ ආයෝජන අධෛර්යවත් වීම සිදු වනු ඇත. කෙසේ වෙතත්, 2023 මාර්තු මාසයේ දී ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ අනුමැතිය හිමිවීම සහ දැනට ක්‍රියාත්මක ණය ප්‍රතිව්‍යුහගතකරණ ප්‍රයත්නයන් සමඟ ආර්ථිකය පිළිබඳ ඉහළ ගිය ජනතා විශ්වාසය, සහ එහි ප්‍රතිඵලයක් ලෙස සාර්ව ආර්ථික තත්ත්වයන් ස්ථාවර වීම 2023 වසර අග භාගයේ දී ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම වේගවත් වීමට සහාය සලසනු ඇත. මැදි කාලීනව ආර්ථිකයේ වර්ධන මාවත ඉහළ විභව මට්ටමක් කරා ගෙන යෑම, ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහන යටතේ යෝජිත සැලසුම්ගත වර්ධනය ඉහළ නැංවීමේ උපායමාර්ග ක්‍රියාවට නැංවීම මත පදනම් වනු ඇතැයි අපේක්ෂිතය. තවද, රජය සතු වාණිජ ව්‍යවසායයන්වල ආයතනික ප්‍රතිසංස්කරණ, පොදු උපයෝගීතා සැපයීම් සඳහා පිරිවැය ආවරණය කෙරෙන මිල යාන්ත්‍රණ ක්‍රියාවට නැංවීම හා සමගාමීව රාජ්‍ය ආදායම් ඉපයීම් මත මූලිකව පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකග්‍රතා උපායමාර්ගය මගින් ඉදිරි කාල සීමාව තුළ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට සහාය සැලසෙන අතර, ආර්ථික ස්ථාවරත්වය ද ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, විස්තීර්ණ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියක් හරහා ණයෙහි තිරසාරත්වය යළි ස්ථාපනය වීම මගින් විදේශීය මූල්‍යන අවස්ථා සඳහා ඉඩ ප්‍රස්ථාවක්, ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු වූ පසුව නිර්මාණය කරනු ඇතැයි අපේක්ෂිත අතර, වෙනත් විදේශීය මූල්‍ය ආයතනවලින් අපේක්ෂිත සැලකිය යුතු මට්ටමේ මූල්‍ය සහාය මගින් ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී ආයෝජක විශ්වාසය ශක්තිමත් කෙරෙනු ඇත. උද්ධමනයෙහි පුරෝකථනය කරන ලද ස්ථායීකරණය සමඟ මැදි කාලීනව ආයෝජන සඳහා හිතකර පරිසරයක් නිර්මාණය වනු ඇති අතර, විනිමය අනුපාතයේ ඉහළ නම්‍යශීලීභාවය හරහා ඉදිරි කාල සීමාව තුළ දී විදේශීය අංශයේ ස්ථාවරභාවය සහ ආර්ථිකයේ වෙළඳ තරගකාරීත්වය වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂිතය. කෙසේ වෙතත්, අපේක්ෂිත මට්ටමට වඩා අඩු විදේශීය ඉල්ලුම සහ ගෝලීය සැපයුම් දාම ආශ්‍රිත ගැටලු අඛණ්ඩව පැවතීම හමුවේ ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වය සාමාන්‍ය තත්ත්වයට පත්වීම ප්‍රමාද වීමේ අවදානමක් පවතී. කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සහ ප්‍රමාණවත් මූල්‍ය වෙන් කිරීම් සිදු කරමින් සමාජ ආරක්ෂණ ජාල ක්‍රියාවට නැංවීම හරහා ආර්ථික කම්පන හමුවේ පුද්ගලයන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවෙන අතර, ඔවුන්ට ආර්ථික සවිබලගැන්වීම සඳහා හා තිරසාර සංවර්ධනය සඳහා අවස්ථා නිර්මාණය කරමින්, මැදි කාලීනව සැමට ප්‍රතිලාභ හිමිවන ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක කර නොමැති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා රජය ප්‍රමුඛ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අප්‍රතිහත කැපවීම මත ආර්ථිකයේ යථා තත්ත්වයට පත්වීම සහ වර්ධනය වීම රඳා පවතින

අතර, ආර්ථිකයේ විභවතාව ළඟා කර ගැනීම සහ ජනගහනයේ සියලුම කාණ්ඩවලට වර්ධනයේ ප්‍රතිලාභ තිරසාරව හා සමානව බෙදී යෑම සඳහා මග පැදීමේ දී, ප්‍රතිපත්තිවල අඛණ්ඩතාව සහ නිශ්චිතභාවය වඩාත් තීරණාත්මක වනු ඇත.

**දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය තත්ත්ව හේතුවෙන් සමස්ත ඉල්ලුම අඩුවීම, ගෝලීය හා දේශීය වශයෙන් ඇති වූ සැපයුම් අවහිරතා යථා තත්ත්වයට පත්වීම මෙන්ම හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑමේ සහාය ඇතිව 2023 වසරේ දී උද්ධමනය ශීඝ්‍රයෙන් පහළ ගොස් මැදි කාලීනව අපේක්ෂිත ඉලක්කගත මට්ටම්වල ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්තිය මගින් පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය ප්‍රමාණයෙහි වර්ධනය සීමා වී, එමගින් ඉල්ලුම් පීඩන අඩු වනු ඇති අතර, රජය විසින් ක්‍රියාත්මක කරන ලද, ආදායම මත පදනම් වූ දැඩි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග හේතුවෙන් ඉදිරියේ දී මහජනතාවගේ වියදම් කිරීමේ හැකියාව සැලකිය යුතු ලෙස අඩු විය හැක. මේ අතර, පොහොර සහ ඉන්ධන සැපයුම වර්ධනය වීම හේතුවෙන් සැපයුම් සම්බන්ධ අවහිරතා අඩු වනු ඇත. ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම ඉදිරියටත් සිදු වුවහොත්, ඉදිරියේ දී මිල පීඩන අඩුවීමට එම කරුණ ද දායක වනු ඇත. මෙම සාධක සහ හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම, කෙටි කාලීනව උද්ධමනය සැලකිය යුතු ලෙස අඩු වීමට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෑත කාලීන විදුලි ගාස්තු සංශෝධනවල වක්‍ර බලපෑම් මෙම නිර්-උද්ධමන ක්‍රියාවලිය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි වුවද, මහජනතාවගේ වියදම් කිරීමේ හැකියාව අඩු වීම සහ මිල සූත්‍ර මත පදනම්ව ඉන්ධන හා ගෑස් මිල පහළ දැමීම් මගින් එවැනි අහිතකර උද්ධමන පීඩන බොහෝ දුරට සමනය විය හැකිය. ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමත් සමඟ, ජා.මු. අරමුදල සහ අනෙකුත් බහුපාර්ශ්වික ආයතන මගින් සපයන ලද අරමුදල්වල සහාය ඇතිව අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය දෙමින් දැනට පවතින ආනයන සීමා ක්‍රමානුකූලව ලිහිල් කිරීමට හැකිවනු ඇති අතර, එමගින් සැපයුම් අවහිරතා තවදුරටත් අඩු වනු ඇත. කෙසේ වෙතත්, එවැනි ලිහිල් කිරීමකින් අනතුරුව විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ හැකියාවක් පැවතීම ආර්ථිකයේ පොදු මිල මට්ටම් කෙරෙහි ඉක්මනින් බලපෑ හැකි බැවින්, එබඳු තත්ත්ව ප්‍රවේශමෙන් කළමනාකරණය කළ යුතුය. මේ අතර, යෝජිත මහ බැංකු පනත බලාත්මක කිරීම මගින් මහ බැංකුවට වැඩි ස්වාධීනත්වයක් ලබා දෙමින්, මහ බැංකුව හරහා සිදු කරන රාජ්‍ය මූල්‍යනය සීමා කිරීමටත්, ඒ තුළින් උද්ධමනය හා උද්ධමන අපේක්ෂා කළමනාකරණය කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ශක්තිමත් කිරීමටත් ඉඩ සැලසෙනු ඇත. මෑත කාලීන ගෝලීය මූල්‍ය අර්බුදය සහ පවතින රුසියානු-යුක්‍රේන යුද්ධයේ දිශානතිය සහ බලපෑම බොහෝ දුරට අවිනිශ්චිත තත්ත්වයක පැවතිය ද, ගෝලීය සැපයුම් තත්ත්වයන් මැදි කාලීනව සාමාන්‍ය තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආහාර හා බලශක්ති මිල ගණන්වල සිදුවිය හැකි ඉහළ යෑම් මගින් ශ්‍රී ලංකාවේ නිර්-උද්ධමන ක්‍රියාවලිය මන්දගාමී විය හැකිය. ගෝලීය මූල්‍ය තත්ත්වයන්හි අස්ථාවරත්වය ගෝලීය මුදල් ප්‍රතිපත්තියේ ක්‍රියාකාරිත්වයට යම් ප්‍රමාණයකට බලපෑ හැකි වුවද, ලෝකයේ බොහෝ ප්‍රධාන මහ බැංකු විසින් උද්ධමන පීඩන මැඩපැවැත්වීම සඳහා 2023 වසර තුළ මෙන්ම ඇතැම්විට 2024 වසරේ මුල් කාලයේ දී ද දැඩි මුදල් තත්ත්ව පවත්වාගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ. පවතින ඉහළ උද්ධමනය 2023 වසර අවසාන භාගයේ දී තනි ඉලක්කමක මට්ටමට ගෙන ඒමට මහ බැංකුව කැපවී සිටී. කෙසේ වෙතත්, රාජ්‍ය මූල්‍ය හා විදේශීය ස්වාරක්ෂක තිරසාර ලෙස ශක්තිමත් කිරීමේ ප්‍රයත්න සමඟින් ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දක්වෙන වැඩසටහන සාර්ථකව අඛණ්ඩව පවත්වාගෙන යෑම මෙන්ම ආර්ථික විභවයන් වැඩිදියුණු කිරීම සඳහා යෝජිත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මැදි කාලීනව ආර්ථික හා මිල ස්ථායීතාව සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වනු ඇත.

**නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ ප්‍රතිපත්ති රාමුව යටතේ ආර්ථික වර්ධනය එහි විභව මට්ටමෙහි ස්ථායී කිරීම සඳහා නිසි අවධානය යොමු කරමින් මුදල් ප්‍රතිපත්තිය මැදි කාලීනව මිල ස්ථායීතාව සහතික කිරීම සඳහා අඛණ්ඩව අවධානය යොමු කරනු ඇත.** හිතකර උද්ධමන ඉදිරි දැක්ම, වැඩිදියුණු වන දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්ව සහ නුදුරේ දී ම නිවේදනය කිරීමට අපේක්ෂිත රජයේ සමස්ත ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය හා දේශීය ණය ප්‍රශස්තකරණය පිළිබඳ 2023 මාර්තු 30 වැනි දින සිදු කළ නිවේදනයෙන් අනතුරුව දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ අවිනිශ්චිතතා බොහෝ දුරට සමනය වීමෙන් පසු රජයේ සුරැකුම්පත් හා සම්බන්ධ අවදානම් පහළ යෑම යන කරුණුවල සහාය ලබමින්, රජයේ සුරැකුම්පත්, විශේෂයෙන්ම භාණ්ඩාගාර බිල්පත් මෙන්ම, තැන්පතු සහ ණය උපකරණවලට අදාළ වෙළඳපොළ පොලී අනුපාතික ඉදිරි කාලය තුළ දී පහළ යනු ඇතැයි අපේක්ෂා

## විශේෂ සටහන 3
## 'ශ්‍රී ලංකා මහ බැංකු පනතේ' විශේෂ කරුණු

### පසුබිම

ස්ථායීකරණය සහ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් බහුවිධ අරමුණු සහිතව, 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ ලංකා මහ බැංකුව 1950 වසරේ දී පිහිටුවන ලදී (එහි නාමය 1985 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව ලෙස වෙනස් කරන ලදී). *එක්ස්ටර් වාර්තාවේ* නිර්දේශ මත මුදල් නීති පනත කෙටුම්පත් කර ඇත. කෙසේ වෙතත්, එකිනෙකට නොගැළපෙන බහුවිධ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී ඇති වන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් මහ බැංකුකරණයේ ප්‍රවණතාවලට අනුකූලව, 2000 දශකයේ මුල් භාගයේ දී මහ බැංකුව විසින් නවීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, මහ බැංකුවේ අරමුණු ප්‍රධාන අරමුණු දෙකක්, එනම් ආර්ථික සහ මිල ස්ථායීතාවය පවත්වා ගැනීම හා මූල්‍ය පද්ධති ස්ථායීතාවය පවත්වා ගැනීම ලෙසින් විධිමත් කරන ලදී.

### නව මහ බැංකු පනතක අවශ්‍යතාවය

ඉහත සඳහන් කළ පරිදි ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ අරමුණු විධිමත් කරමින් 2002 වසරේ සිදු කළ සංශෝධන හැරුණු විට, පසුගිය වසර 74 තුළ මුදල් නීති පනත පුළුල් ලෙස සමාලෝචනය කරමින් සංශෝධනය කර නොමැත. එබැවින්, ආර්ථික ප්‍රවණතා සහ මහ බැංකුකරණයේ විකාශනය මධ්‍යයේ, මුදල් නීති පනතෙහි විධිවිධාන කිහිපයක් ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලව නැවත සමාලෝචනය කිරීම සහ සංශෝධන කිරීම අවශ්‍ය විය. මෙමගින්, ශ්‍රී ලංකාවේ මිල ස්ථායීතාව තිරසාර ලෙස සහතික කිරීම සඳහා මහ බැංකුවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම, විනිවිදභාවය හා වගවීම වැඩිදියුණු කිරීම සහ මුදල් ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීමට අදාළ විධිවිධාන ඇතුළත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකු පනත කෙටුම්පත් කිරීමට අවස්ථාව සැලසිණි. මේ අතර, මහ බැංකු පනත මගින් මූල්‍ය අංශය හා සාර්ව විචක්ෂණ අධීක්ෂණය ශක්තිමත් කිරීමට සහ මහ බැංකුවේ පාලනය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. මුදල් නීති පනත සඳහා සිදු කළ සංශෝධන සහ ඉන් අනතුරුව කෙටුම්පත් කළ මහ බැංකු පනත, මහ බැංකුකරණය සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලවනු ඇති බවත් මුදල් නීති පනතෙහි පවතින දුර්වලතා මග හරිනු ඇති බවත් අපේක්ෂා කෙරේ.


### මහ බැංකු පනතෙහි ප්‍රධාන ලක්ෂණ

මුදල් නීති පනත හා සසඳන විට මහ බැංකු පනත තුළ ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ අරමුණු සහ මුදල් ප්‍රතිපත්ති රාමුව, මහ බැංකුවෙහි ආයතනික ව්‍යුහය හා පාලනය, මහ බැංකුව සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස පිළිගැනීම මෙන්ම පාර්ලිමේන්තුව, රජය හා මහජනතාව සඳහා වන මහ බැංකුවේ වගවීම යන ප්‍රධාන ක්ෂේත්‍රවල වැදගත් සංශෝධන කිහිපයක් ඇතුළත් වේ.

### ප්‍රධාන අරමුණ ලෙස දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම

මුදල් නීති පනතට අනුව සමාන වැදගත්කමක් ඇති මහ බැංකුවේ ප්‍රධාන අරමුණු දෙකට සාපේක්ෂව, මහ බැංකු පනත මගින් දේශීය මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීම සඳහා ප්‍රමුඛතාව ලබා දෙයි. මෙමගින් අනාගතයේ දී අඩු සහ ස්ථායී උද්ධමනයක් පවත්වා ගැනීමට මහ බැංකුව කැපවී සිටින බව සහතික කෙරේ. උද්ධමනය පහළ මට්ටමක පවතින විට සහ ඉදිරියේ දී උද්ධමනය අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන විට ආර්ථිකය මනාව ක්‍රියාත්මක වන බව පසුගිය අත්දැකීම් මගින් පෙන්වා දී ඇත. පොලී අනුපාතික ස්ථායී මට්ටමක පවත්වා ගැනීම සඳහා අඩු සහ ස්ථායී උද්ධමනය උපකාරී වේ. එවැනි පරිසරයක් තුළ ආර්ථිකයට එහි වර්ධන විභවතාව සාක්ෂාත් කර ගැනීමට අවස්ථාව සැලසේ. තවද, සිය ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීමේ දී මහ බැංකුව, ආර්ථිකය එහි විභව මට්ටම කරා ස්ථායී කිරීම පිළිබඳ සැලකිල්ලට ගත යුතුය. මෙම ක්‍රියාමාර්ග, මූර්ත ආර්ථිකයෙහි ක්‍රියාකාරිත්වය

රූප සටහන වි.ස. 3.1
මහ බැංකු පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය සහ සංවිධානය



සඳහා වන බාධා අවම කරමින් උද්ධමනය එහි ඉලක්කගත මට්ටම වටා ස්ථාවර කිරීම අරමුණු කරගත් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූල වේ. තවද, මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව යන දෙඅංශය සම්බන්ධයෙන්ම අවධානය යොමු කිරීමට සිදු වන සහ මින් එක් අංශයක් සම්බන්ධයෙන් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනෙක් අංශය වෙත අහිතකර ලෙස බලපාන, එහෙත් මහ බැංකුව කුමන ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කළ යුතු ද යන්න තීරණය කළ යුතු දුලබ අවස්ථාවක දී, ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රධාන අරමුණ වන මිල ස්ථායීතාවය පවත්වා ගැනීම සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

### පාලන ව්‍යුහය

මුදල් නීති පනත යටතේ, මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම මෙන්ම අනෙකුත් ප්‍රතිපත්ති සහ මෙහෙයුම් තීරණ ගැනීම සඳහා මුදල් මණ්ඩලය වෙත වගකීම පැවරේ. කෙසේ වෙතත්, මහ බැංකු පනත යටතේ, පාලක මණ්ඩලය සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙත සමාන්තර තීරණ ගැනීමේ බලතල පැවරී ඇති අතර දේශීය මිල ස්ථායීතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් පවත්වා ගැනීම ඇතුළුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙත පවරා ඇත. මුදල් ප්‍රතිපත්තිය හැර මහ බැංකුවේ අනෙකුත් සාමාන්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීමේ වගකීම පාලක මණ්ඩලය වෙත පැවරී ඇත.

මහ බැංකු පනතට අනුව, භාණ්ඩාගාර ලේකම් තවදුරටත් මහ බැංකුවේ තීරණ ගැනීමේ මණ්ඩලයක සාමාජිකයෙකු නොවේ. කෙසේ වෙතත්, රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතාව පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය සහතික කිරීම සඳහා සම්බන්ධීකරණ කවුන්සිලයක් පිහිටුවනු ලබන අතර භාණ්ඩාගාර ලේකම් එම සම්බන්ධීකරණ කවුන්සිලයේ සාමාජිකයෙකු වනු ඇත. මහ බැංකුවේ අනෙකුත් කාර්යයන් අධීක්ෂණය කරන සහ මූල්‍ය අංශය සහ අනෙකුත් ප්‍රතිපත්ති සම්පාදනය කරන පාලක මණ්ඩලය වෙතින් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙන් කිරීම සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය තුළට තාක්ෂණික දැනුම ලබාගැනීම සඳහා අභ්‍යන්තර සාමාජිකයින් දෙදෙනෙකු (නියෝජ්‍ය අධිපතිවරුන්) සහ බාහිර විශේෂඥයින් නියෝජනය කිරීම මගින් මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයනු ලැබේ. මුදල් ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ අවශ්‍ය දැනුම සහ ප්‍රවීණත්වය සහිත බාහිර හා අභ්‍යන්තර සාමාජිකයන් ඇතුළත් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයක් ක්‍රියාත්මක වීම ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයකි. එසේම, ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවූ තීරණ ගැනීමේ මණ්ඩලයක් පැවතීම මගින් මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ මුල් අවස්ථාව තුළම ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වැඩිදුරටත් සාකච්ඡා කිරීමට සාමාජිකයින්ට අවස්ථාව සලසා දෙන අතර එමගින් මුදල් ප්‍රතිපත්ති සම්පාදනය ශක්තිමත් කෙරේ.

### මහ බැංකුවේ ස්වාධීනත්වය සහ වගවීම වැඩිදියුණු වීම

මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ මෙහෙයුම් තීරණ ගැනීමේදී මහ බැංකුවේ ස්වාධීනත්වය සහ වගවීම ශක්තිමත් කිරීමේ පුළුල් දැක්මක් සහිතව මහ බැංකු පනතෙහි විධිවිධාන සකස් කරන ලදී. මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ මෙහෙයුම් ස්වාධීනත්වය වඩාත් අවධාරණය කරනු ලබන පරිපාලන සහ මූල්‍ය ස්වාධීනත්වය සහතික කිරීම සඳහා මහ බැංකු පනත තුළ පැහැදිලි විධිවිධාන ඇත. තවද, අධිපතිවරයා, පාලක මණ්ඩලය හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙත පත් කරන ලද සාමාජිකයින් සහ මහ බැංකු සේවකයින්ට බාහිර බලපෑම් සිදු කිරීම මහ බැංකු පනත යටතේ පැහැදිලිවම තහනම් වේ.

මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා, මහ බැංකු පනත මගින් මහ බැංකුවේ තීරණ ගැනීමේ මණ්ඩලවල කිසිදු ආකාරයක රජයේ නියෝජනයක් නොමැත. කෙසේ වෙතත්, සම්බන්ධීකරණ කවුන්සිලය මගින් මූල්‍ය ස්ථායීතාව හෝ ආර්ථික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සැලකිය යුතු අවදානමක් ඇති කරන සිදුවීම් පිළිබඳ තොරතුරු සහ අදහස් හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ. මේ අතර, මහ බැංකුව රජයේ මූල්‍ය උපදේශක, රාජ්‍ය මූල්‍ය නියෝජිත සහ රජයේ බැංකුකරු ලෙස තවදුරටත් ක්‍රියා කරනු ඇත. කෙසේ වෙතත්, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවෙහි සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය වන, රාජ්‍ය මූල්‍ය හිඟය මහ බැංකුව මගින් මූල්‍යනය කිරීම සීමා කිරීම සහ රජය වෙත තාවකාලික අත්තිකාරම් සැපයීම සීමා කිරීම මගින් අතීතයේ දී මුදල් ප්‍රතිපත්තිය කෙරෙහි වූ ප්‍රධාන අවහිරතාව වන මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ දී පැවති රාජ්‍ය මූල්‍ය ආධිපත්‍යය වළක්වා ඇත. ඒ අනුව, මහ බැංකුව විසින්, රජය වෙත හෝ රජය සතු ඕනෑම ආයතනයකට හෝ වෙනත් පොදු අධිකාරියක් වෙත සෘජුව හෝ වක්‍රාකාරව ණය ප්‍රදානය කිරීම සීමා කර ඇති අතර, මහ බැංකුවෙහි කටයුතු සඳහා අදාළ වන වියදම් හැර රජය වෙනුවෙන් මහ බැංකුව විසින් යම් පිරිවැයක් නොදැරිය යුතුය. එමෙන්ම, රජය විසින් හෝ රජය සතු යම් ආයතනයක් විසින් හෝ වෙනත් පොදු අධිකාරියක් විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලදී නොගත යුතුය.[2] කෙසේ වෙතත්, රජය වෙත සෘජු ණය ලබා දීම සීමා කිරීම සඳහා ඇතැම් කොන්දේසිවලට යටත්ව, වසර ආරම්භයේදී[3] වියදම් මූල්‍යනය සඳහා රජය වෙත තාවකාලික අත්තිකාරම් ලබා දීමට මහ බැංකු පනත මගින් අවස්ථාව සලසනු ලැබේ. රජය වෙත ලබා දුන් එවැනි තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය, පසුගිය මුදල් වර්ෂයේ පළමු මාස හතරෙහි ආදායමෙන් සියයට දහයක් නොඉක්මවිය යුතු අතර එම අත්තිකාරම් සඳහා වෙළඳපොළෙහි පවතින පොලී අනුපාතික යටතේ පොලිය අය කරනු ලැබේ.

---

2 පවතින රාජ්‍ය මූල්‍ය සීමා සැලකිල්ලට ගනිමින්, පනත ක්‍රියාත්මක වන දින සිට මාස හයක කාලයක් තුළ මහ බැංකුව සඳහා රාජ්‍ය සුරැකුම්පත් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලදී ගැනීමට තාවකාලිකව අවසර ලබා දී ඇත.

3 මහ බැංකුව විසින් රජය වෙත ලබා දී ඇති ණය ගණනය සඳහා තාවකාලික ගැළපීමක් සිදු කරනු ඇත.

මේ අතර, මෙහෙයුම් සහ මූල්‍ය ස්වාධීනත්වය සැපයීම මගින් මහ බැංකු පනත හරහා මහ බැංකුවේ ප්‍රතිපත්ති, ප්‍රතිඵල සහ අසාර්ථකවීම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව සහ මහජනතාව වෙත වැඩි වගවීමක් සහතික කරයි. ස්වාධීන තීරණ ගැනීම වැඩිදියුණු කිරීම, වගවීම සහතික කිරීම සහ මහජන විශ්වාසය පවත්වා ගැනීම සඳහා බලතල බෙදීමක් ඇති කරන මෙන්ම කිසිදු අධිකාරියක් අවශ්‍ය ප්‍රමාණයට වඩා බලය භාවිත නොකරන බව සහතික කරන සංවරණ හා තුලන ක්‍රම (Checks & Balances), වැදගත් වේ. ඒ අනුව, ව්‍යවස්ථාපිත මහජන අනාවරණ අවශ්‍යතා, පාර්ලිමේන්තුව වෙත වරින් වර වාර්තා ඉදිරිපත් කිරීම සහ පාර්ලිමේන්තුවට හෝ එහි ඕනෑම කමිටුවකට අධිපතිවරයාගෙන් වරින්වර විමසීම් සිදු කළ හැකි වීම වැනි ක්‍රම හරහා මහ බැංකුවේ වගවීම වැඩිදියුණු කිරීම අරමුණු කරගත් විධිවිධාන මහ බැංකු පනතෙහි ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන්, මහ බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී කිසියම් අසාර්ථක වීම් ඇතිවුවහොත් ඒ සඳහා හේතු, මෑතකාලීන ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම පිළිබඳව සඳහන් කරමින්, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ මහ බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් වාර්තා කිහිපයක් පාර්ලිමේන්තුව සහ මහජනතාව වෙත මහ බැංකුව විසින් ඉදිරිපත් කළ යුතුය.

### මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය

2015 වසරේ සිට මුදල් ඉලක්කකරණය සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යන ක්‍රමවේද දෙකෙහිම ලක්ෂණවලින් සමන්විත මුදල් ප්‍රතිපත්ති රාමුවක් අනුගමනය කිරීමෙන් අනතුරුව, මහ බැංකුව 2020 වසරේ සිට මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කරණය අනුගමනය කළේය. කෙසේ වෙතත්, මුදල් නීති පනත යටතේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා වන අවශ්‍යතා සඳහා පහසුකම් සලසා තිබුණ ද, මුදල් නීති පනත මගින් ශ්‍රී ලංකාවට අදාළ මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලකක්කරණය නිශ්චිත වශයෙන් හඳුනාගෙන නැත. අදාළ කොන්දේසි ද ඇතුළත්ව මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය මහ බැංකු පනත මගින් විධිමත්ව පිළිගැනේ. මෙම සැලසුම තුළ, මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා විසින් එක්ව උද්ධමන ඉලක්කය සහ ප්‍රධාන පරාමිතීන් ඇතුළත් මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමක් අත්සන් කළ යුතු අතර, එම ගිවිසුම අත්සන් කළ දින සිට සතියක කාලයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මගින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ සුදුසු මුදල් ප්‍රතිපත්තිය සහ මුදල් ප්‍රතිපත්ති උපකරණ පිළිබඳව තීරණය කළ යුතු අතර, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා එම උපකරණ සුදුසු පරිදි ගළපා ගැනීමට මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙත බලය ලබා දී ඇත. උද්ධමන ඉලක්කය සහ ඊට අදාළ පරාමිතීන් සෑම වසර තුනකට වරක් හෝ සුවිශේෂී තත්ත්වයන් යටතේ අවශ්‍ය පරිදි වෙනත් කාල පරාසයන් තුළ සමාලෝචනය කරනු ලැබේ. තවද, උද්ධමන ඉලක්කය සකස් කරන අවස්ථාවේ තීරණය කරන ලද උද්ධමන පරාසය තුළ අඛණ්ඩව කාර්තු දෙකක දී උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට මහ බැංකුව අපොහොසත් වුවහොත්, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, එය මහජනතාවට ද ලබා දිය යුතුය. මේ අතර, මහ බැංකු පනත යටතේ උද්ධමනයේ මෑතකාලීන ප්‍රවණතා, උද්ධමනය සඳහා හේතු වූ කරුණු සහ උද්ධමනය සඳහා වන මැදි කාලීන පුරෝකථන හා එම පුරෝකථන සඳහා ඇති ප්‍රධාන අවදානම් පැහැදිලි කරමින් සෑම මාස හයකටම වරක් මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති වාර්තාවක් ප්‍රකාශයට පත් කළ යුතුය.

### මූල්‍ය ආයතන අධීක්ෂණය හා නිරාකරණය සහ සාර්ව විචක්ෂණ අධිකාරිය

මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා මූල්‍ය ආයතන නියාමනය, බලපත්‍ර ලබා දීම, ලියාපදිංචිය සහ අධීක්ෂණය මෙන්ම මූල්‍ය ආයතන නිරාකරණය සඳහා ප්‍රධාන වගකිව යුතු මූල්‍ය ආයතනය ලෙස මහ බැංකුව අඛණ්ඩව කටයුතු කරයි. තවද, සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා මහ බැංකු පනත මගින් මහ බැංකුව සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස පත් කර ඇත. මේ සම්බන්ධයෙන් මහ බැංකුව විසින් මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවක් පිහිටුවනු ඇති අතර, එමගින් මූල්‍ය පද්ධතියට බලපාන හඳුනාගත් පද්ධතිමය අවදානම් ඇති වීම අවම කිරීම සඳහා සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිය පරීක්ෂා කිරීම සහ සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කරමින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ අදාළ රාජ්‍ය ආයතනවලට නිර්දේශ නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.[4]

### රාජ්‍ය ණය කළමනාකරණය

රාජ්‍ය ණය කළමනාකරණ ආයතනයකට හෝ කාර්යාලයකට අදාළ නීතිය ක්‍රියාත්මක වූ පසු දැනට රාජ්‍ය ණය කළමනාකරණ නියෝජිතයා වශයෙන් මහ බැංකුව ඉටු කරන කාර්යය මහ බැංකු පනතට අනුව මහ බැංකුවේ විෂය පථයෙන් ඉවත් කිරීමට නියමිතය. කෙසේ වෙතත්, එතෙක් මහ බැංකුව රජයේ නියෝජිතයෙකු වශයෙන් රාජ්‍ය ණය කළමනාකරණය අඛණ්ඩව සිදු කරනු ඇත.

### සාරාංශය

මහ බැංකු පනත යටතේ, දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම යන අනිවාර්ය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මහ

4 සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස මහ බැංකුව විසින් ඉටු කරන කාර්යභාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා විශේෂ සටහන 10 බලන්න.

බැංකුව වෙත ස්වාධීන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකියාව ලබා දෙමින් මහ බැංකුවේ ස්වාධීනත්වය සෑම විටම ආරක්ෂා කරනු ලැබේ. මේ අතර, ව්‍යවස්ථාදායකය සහ මහජනතාව සඳහා වගකියමින් මහ බැංකුවේ වගවීම සහ විනිවිදභාවය මහ බැංකු පනත මගින් වැඩිදුරටත් තහවුරු කෙරේ. මිල ස්ථායීතාවය සහ මහ බැංකුවේ වගවීම ඉහළ නැංවීම යන මූලික අරමුණු මගින්, ඉහළ සහ විචලනය වන උද්ධමනය සහ ඒ හා සම්බන්ධ පොලී අනුපාතිකවල සැලකිය යුතු වෙනස්වීම් මගින් වන අයහපත් බලපෑම්වලින් රට ආරක්ෂා කරන අතර තිරසාර දිගුකාලීන ආර්ථික වර්ධනයක් ඇති කරනු ලැබේ.

---

**මූලාශ්‍ර**


1. Central Bank of Sri Lanka – A Bill (7 March 2023)
2. Jegajeevan, S. (2023) *Why do we need independent and publicly accountable central bank?,* Daily FT. Available at: https://www.ft.lk/columns/Why-do-we-need-independent-and-publiclyaccountable-central-bank/4-745738. (Accessed on 10 March 2023).


කෙරේ. එසේ වුවද, උද්ධමන පීඩන ප්‍රමාණවත් සහ ස්ථායී මට්ටමකට පාලනය වන තෙක් මෙන්ම උද්ධමන අපේක්ෂා මහ බැංකුවේ උද්ධමන ඉලක්කයට අනුකූලව පාලනය වන තෙක් මුදල් තත්ත්වයන් අවශ්‍ය පරිදි දැඩිව පවතිනු ඇත. තැන්පතු පොලී අනුපාතික ඒවායේ උපරිම මට්ටමේ සිට ක්‍රමයෙන් අඩු වීමත් සමඟ බැංකු අංශයෙහි තැන්පතු වර්ධනය ඉදිරි කාලයේ දී පහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතින වෙළඳපොළ ණය පොලී අනුපාතික මගින් පෞද්ගලික අංශයට ලබා දෙන ණය වර්ධනය අඩු කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නුදුරු කාලීනව සමස්ත ණය තොගය සංකෝචනය වනු ඇත. කෙසේ වෙතත්, පොලී අනුපාතිකවල අපේක්ෂිත පහළ යෑම, ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම සහ ව්‍යාපාරික අපේක්ෂා වැඩිදියුණු වීමත් සමඟ 2023 වසරේ අග භාගයේ සිට පෞද්ගලික අංශයට ලබා දෙන ණය වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සහ අපේක්ෂිත විදේශ මූල්‍යනයන් රජයට ලැබීම හේතුවෙන් ඉදිරි කාලය තුළ දී රජය විසින් බැංකු අංශයෙන්, විශේෂයෙන් ම මහ බැංකුවෙන්, මූල්‍යන ලබා ගැනීම සඳහා යොමු වීම අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, රජය සතු වාණිජ ව්‍යවසායවල සැලසුම් කර ඇති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ ඵලදායීතා වැඩිදියුණු කිරීම් මගින් එම ආයතන රජයේ ප්‍රතිපාදන මත මෙන්ම බැංකු අංශය මත රඳා පැවතීම ක්‍රමානුකූලව අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, ඉදිරි කාලය තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් ප්‍රසාරණය හිතකර මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මහ බැංකුවේ විදේශීය සංචිත නැවත ක්‍රමයෙන් වර්ධනය කරගැනීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශීය වත්කම් තත්ත්ව (වගකීම් ගැළපීමෙන් පසුව) වැඩිදියුණු වීම හේතුවෙන් ඉදිරි කාලයේ දී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් තත්ත්වය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දේශීය හා ගෝලීය වශයෙන් මෑත කාලීන සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා මෙන්ම පුරෝකථන මගින් සහාය ලබමින්, ඉදිරි දැක්මක් සහිතව සහ දත්ත මත පදනම් වූ ප්‍රවේශයක් තුළින් ඉදිරි කාලයේ දී ද මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වනු ඇත. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ නවතම තොරතුරු ලැබීම අනුව මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ උපායමාර්ග සඳහා කාලීන ගැළපීම් සිදු කිරීමට අපේක්ෂිතය. මිල ස්ථායීතාවය යථා තත්ත්වයට පත් කිරීම සහ ඉන් පසුව උද්ධමනය අඩු සහ ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමෙන් පොලී අනුපාතිකවල විශාල විචලන ඇති වීම අවම වනු ඇති අතර, එමගින් ආර්ථික වර්ධනයට සහාය වීමට ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීම සහ ආයෝජන සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය වනු ඇත. ඉදිරියේ දී බලාත්මක කිරීමට නියමිත මහ බැංකු පනත මගින් මහ බැංකුවේ ස්වාධීනත්වය සහ වගවීම තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇති අතර, එමගින් එහි ප්‍රධාන අරමුණ වන මිල ස්ථායීතාව තහවුරු කෙරේ. මේ අතර, වත්මන් ආර්ථික තත්ත්වය සහ ආර්ථිකයෙහි ඉදිරි දැක්ම පිළිබඳව ඵලදායී හා විනිවිදභාවයකින් යුතු සන්නිවේදන හරහා මහ බැංකුව මහජනතාව සමඟ අඛණ්ඩව සම්බන්ධ වනු ඇත. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳ විනිවිදභාවය තවදුරටත් වැඩිදියුණු කරමින් ආර්ථිකයේ ඉදිරි දැක්ම පිළිබඳව මහජනතාව වඩාත් හොඳින් දැනුම්වත් කිරීම සඳහා ඉදිරි දැක්මකින් යුතු මුදල් ප්‍රතිපත්ති වාර්තාවක් මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කිරීමට ද නියමිතය.

**2023 වසර සහ ඉන් ඉදිරියට විදේශීය අංශයේ ඉදිරි දැක්ම, බොහෝ දුරට ණය ප්‍රතිව්‍යුහගතකරණයේ ප්‍රගතිය, ජා.මූ. අරමුදල යටතේ වන විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහන අඛණ්ඩව**

**ක්‍රියාත්මක කිරීම සහ ගෝලීය ආර්ථික හා මූල්‍ය දැක්ම මත රඳා පවතිනු ඇත.** ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ ඉදිරියේ දී විදේශ වෙළඳාම සඳහා පනවා ඇති ඇතැම් සීමා ලිහිල් කිරීම මගින් වෙළඳ භාණ්ඩ ආනයනවල අපේක්ෂිත වැඩිවීමත් සමඟ, 2023 වසරේ දී වෙළඳ හිඟය යම් මට්ටමකට පුළුල් වීමට ඉඩ ඇත. 2023 වසර සඳහා වන වෙළඳ හිඟය පිළිබඳ පුරෝකථනය, එක්සත් රාජධානියේ, යුරෝපීය සංගමයේ සහ එක්සත් ජනපදයේ ඇතිවන ආර්ථික පසුබෑමක් තුළින් අඩු විය හැකි විදේශ ඉල්ලුම මගින් ද බලපෑමට ලක් විය හැක. මීට අමතරව, රුසියානු-යුක්‍රේන යුධ තත්ත්වය තවදුරටත් උත්සන්න වීමක් තුළින් ගෝලීය සැපයුම් දාමයන්ට බලපෑම් සිදු විය හැකි අතර, එමගින් ආනයන වියදම් ඉහළ යා හැකිය. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් වීම සහ 2023 වසරේ දෙවන භාගයේ දී රට තුළ උද්ධමනයේ අපේක්ෂිත අඩුවීමත් සමඟ, සංචාරක ඉපැයීම්වල පුරෝකථනය කරන ලද වැඩිවීම මෙන්ම අනෙකුත් සේවා අපනයනවල තරගකාරිත්වයේ අපේක්ෂිත ප්‍රවර්ධනයන් සමඟ සේවා ගිණුමේ අතිරික්තය 2023 වසරේ දී ඉහළ යෑමට ඉඩ ඇත. දියුණු ආර්ථිකයන්ගේ මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම නිසා ඇති විය හැකි ණය ගැනීමේ පිරිවැය ඉහළ යෑම හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2023 වසරේ දී සුළු වශයෙන් පුළුල් වීමට ඉඩ ඇත. විදේශ රැකියා සඳහා පිටත්වීම් අඛණ්ඩව වැඩිවීම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල අපේක්ෂිත ඉහළ යෑම හේතුවෙන් ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය 2023 වසරේ දී පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළඳ ගිණුමේ සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟයන්හි පුළුල් වීම, සේවා සහ ද්විතීයික ආදායම් ගිණුම්වල අපේක්ෂිත ඉහළ යෑම් මගින් ආවරණය කෙරෙනු ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2023 වසරේ දී ජංගම ගිණුමේ හිඟය තරමක් පහළ මට්ටමක පවතිනු ඇත. බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික හවුල්කරුවන්ගෙන් ලැබෙන අනෙකුත් විදේශීය මූල්‍ය ප්‍රවාහ සමඟ ඇතැම් යටිතල පහසුකම් ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම, අපේක්ෂිත විදේශීය සෘජු ආයෝජන සහ කොළඹ කොටස් වෙළඳපොළ හා රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත විදේශීය විවිධ ආයෝජන ලැබීම් සමඟ මූල්‍ය ගිණුම වෙත වන ලැබීම් 2023 වසරේ දී තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ලැබීම් මගින්, ඉදිරි කාලය තුළ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සමඟ සම්බන්ධ වීමට අපේක්ෂා කරනු ලබන විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. තවද, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අපේක්ෂිත සාර්ථක ප්‍රගතිය මෙන්ම ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ ඇති ආර්ථික ගැළපුම් වැඩසටහන ඔස්සේ විදේශීය අංශය නැවත මැදි කාලීනව තිරසාර මාවතකට යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අපනයනවල වර්ධනය, ආනයනවල වැඩිවීම අබිබවා යනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, වෙළඳ හිඟය මැදි කාලීනව පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ගෝලීය ආර්ථිකය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් වීම මෙන්ම ලොව පුරා පුද්ගල සංචරණය ඉහළ යෑමත් සමඟ, ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී වර්ධනය වන සංචාරක ව්‍යාපාරය එහි විභවතා මට්ටම් කරා ළඟා වීමෙන් ශ්‍රී ලංකාවට හිතකර තත්ත්වයන් ඇතිවනු ඇත. මෙය, ප්‍රවාහන සේවා ක්‍රියාකාරකම්වල අපේක්ෂිත යථා තත්ත්වයට පත් වීම සහ තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ සේවා උප අංශයේ ඉහළ වර්ධනය ද සමඟින්, සේවා ගිණුමේ අතිරික්තය ශක්තිමත් කිරීමට මැදි කාලීනව දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන හේතුවෙන් අපේක්ෂිත පරිදි පොලී ගෙවීම් අඩුවීමත් සමඟ, ඉදිරි කාලය තුළ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, විදේශ රැකියා සඳහා පිටත්වීම් ක්‍රමානුකූලව ඉහළ  යෑම, සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑම සහ විධිමත් මාර්ග හරහා ප්‍රේෂණ ගලා ඒම යථා තත්ත්වයට පත් වීම අඛණ්ඩව සිදු වීම සමඟ, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මැදි කාලීනව ක්‍රමානුකූලව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විදේශීය ජංගම ගිණුමේ හිඟය, මැදි කාලීනව තිරසාර ලෙස පහළ මට්ටමකට ක්‍රමයෙන් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, කොළඹ වරාය නගරය, බටහිර කොළඹ බහාලුම් පර්යන්ත සහ හම්බන්තොට කාර්මික කලාපය වැනි කාර්මික කලාප සංවර්ධනය සඳහා අපේක්ෂිත ණය නොවන මූල්‍ය ප්‍රවාහ ලැබීම් හේතුවෙන් විදේශීය මූල්‍ය ප්‍රවාහ මැදි කාලීනව ශක්තිමත් වනු ඇතැයි බලාපොරොත්තු වේ. ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි ආර්ථික ගැළපුම් වැඩසටහන සාර්ථක ලෙස අවසන් කිරීම හරහා ඇති වන ඉහළ ආයෝජක විශ්වාසය, මූල්‍ය ගිණුම වෙත ගලා ඒම්  සඳහා සහාය වනු ඇතැයි බලාපොරොත්තු වේ. මැදි කාලීනව, සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය සහ ආයෝජකයන්ගේ සුබවාදී අපේක්ෂා ඉහළ නැංවීම මගින් විවිධ ආයෝජන මෙන්ම අනෙකුත් විදේශීය මූල්‍ය ප්‍රවාහ ක්‍රමයෙන් යථා

තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දළ නිල සංචිත මැදි කාලීනව ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය.

**ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහනෙහි නියම කර ඇති මැදි කාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමේ අරමුණ ඇතිව, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීම සහ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන වෙනුවෙන් අඛණ්ඩව කැපවීමෙන් යුතුව රජය කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මැදි කාලීන සිට දිගු කාලීන පදනමකින් ප්‍රාථමික ගිණුමේ අතිරික්තයන් ඇති කර ගැනීම සහ 2027 වසර වන විට රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 15ක් අබිබවා යෑමේ අපේක්ෂිත ආදායම් ඉලක්කය රජය විසින් නිවේදනය කරන ලදි. මේ සඳහා රජය දැනටමත් එකතු කළ අගය මත බදු, විදුලි සංදේශ බද්ද සහ පුද්ගලික හා ආයතනික ආදායම් බදු අනුපාතික ඉහළ දැමීම, එකතු කළ අගය මත බදු හා පුද්ගලික ආදායම් බදු පදනම පුළුල් කිරීම, ඛනිජ තෙල් නිෂ්පාදිත, මත්පැන් හා දුම්කොළ නිෂ්පාදිත මත නිෂ්පාදන/සුරා බදු ඉහළ නැංවීම, සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම ඇතුළු ආදායම් වැඩිදියුණු කිරීමේ දැඩි ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කර තිබේ. මෑත වසරවල දී නිරීක්ෂණය වූ අසතුටුදායක ආදායම් කාර්යසාධන ප්‍රවණතාව නැවත හිතකර තත්ත්වයට හැරවීම මගින් මෙම ආදායම් වර්ධන ක්‍රියාමාර්ග නුදුරු කාලයේ සිට මැදි කාලීනව ප්‍රතිලාභ අත්කර දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, දැනටමත් අධික වශයෙන් ඉහළ බදු බරකට යටත්ව සිටින බදු ගෙවන්නන්ගේ කාණ්ඩ සඳහා යම් සහනයක් සපයන අතර, රජයේ මැදි කාලීන ආදායම් ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ආදායම් පරිපාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. මේ අතර, රජය විසින් රාජ්‍ය මූල්‍ය හිඟය අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය වන වියදම් තාර්කීකරණය සඳහා පියවර ගෙන ඇත. කෙසේ වෙතත්, ආර්ථික කටයුතු මත ඇති විය හැකි සෘණාත්මක බලපෑම් අවම කරන අතරතුර, මැදි කාලීනව රාජ්‍ය වියදම සීමා කිරීමේ සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීමේ ප්‍රයත්න ශක්තිමත් කිරීම සඳහා, ප්‍රමුඛතා පදනමකින් ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ඵලදායී නොවන පුනරාවර්තන වියදම් හඳුනා ගැනීම සහ අවම කිරීම, රාජ්‍ය අංශයේ සේවක බඳවා ගැනීම් සීමා කිරීම, සමාජ ආරක්ෂණ ජාල වඩා ඉලක්කගත කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කඩිනමින් සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වේ. ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහන යටතේ අපේක්ෂා කෙරෙන පරිදි, දැනට සිදු කෙරෙමින් පවතින ණය ප්‍රතිව්‍යුහගතකරණය නිමා කිරීමෙන් පසු, 2027-2032 කාලය තුළ දී වාර්ෂික දළ මූල්‍යන අවශ්‍යතාවල සාමාන්‍යය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13කට අඩු ප්‍රමාණයකට සීමා වීම හරහා රජයේ ණය සේවාකරණ බර සැලකිය යුතු ලෙස පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, රජයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම්, 2027-2032 කාලය තුළ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.5කට වඩා අඩු මට්ටමක පවත්වා ගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ණය සේවාකරණ පීඩනය විශාල ප්‍රමාණයකට ලිහිල් වනු ඇත. තවද, 2032 වසර වන විට, රාජ්‍ය ණය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 95කට පමණ අඩු වනු ඇතැයි අපේක්ෂිත ය. මැදි කාලීනව ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් පවත්වා ගැනීමේ ඉහළ අභිප්‍රායකින් යුතු අපේක්ෂිත ගමන්මග හේතුවෙන් මැදි කාලීනව ණය ඒකරාශී වීම අවම කර ගැනීමට සහාය ලැබෙනු ඇත. ඒ සමඟ ම, උපායමාර්ගික නොවන රජය සතු ව්‍යවසායයන්හි ආයෝජන ඉවත් කර ගැනීම, උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු වන මිල ගණන් අඛණ්ඩව පවත්වා ගෙන යෑම, සහ රජය සතු ව්‍යවසායයන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුළින් එවැනි ආයතන මගින් රාජ්‍ය අයවැය මත පැටවෙන බර අවම කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, රාජ්‍ය මූල්‍ය රීති තවදුරටත් ශක්තිමත් කරන, අපේක්ෂිත නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීති සම්පාදනය බලාත්මක කිරීමත් සමඟ ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහන යටතේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු වනු ඇතැයි බලාපොරොත්තු වේ. යෝජිත ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්පූර්ණ කිරීම සහ රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව, වගවීම සහ විනිවිදභාවය සඳහා පුළුල් පදනමක් සහිත ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමත් සමඟ, රාජ්‍ය මූල්‍ය අංශ කාර්යසාධනය මැදි කාලීනව තිරසාරාත්මක ව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, දශක ගණනාවක් පුරා ආර්ථිකයට බලපෑම් ඇති කළ රාජ්‍ය මූල්‍ය අංශයෙන් ආර්ථික වර්ධනයට එල්ල වූ ප්‍රධාන බාධක වළක්වා ගැනීමට හැකි වනු ඇත.

## 1.5 ගැටලු හා ප්‍රතිපත්ති

**දශක කිහිපයකට පෙර සංවර්ධනය වෙමින් පැවති රටවල් අතරින් වඩාත් ඉදිරියෙන් සිටි රාජ්‍යයක සිට වර්තමානය වන විට අර්බුද රාශියකින් අත්මිදීම සඳහා ප්‍රයත්න දරන රටක් දක්වා ගමන් කළ කාලය තුළ දී තිරසාර සමාජ-ආර්ථික ප්‍රගතිය සහ සෞභාග්‍යය කරා ශ්‍රී ලංකාව මෙහෙයවීමට පැවති රජයන් අසමත් වී ඇත.** නිදහසින් පසු බොහෝ ක්‍රියාමාර්ග ගනු ලැබූව ද ශක්තිමත් සහ ස්ථාවර ජාතික ප්‍රතිපත්ති රාමුවක් නොමැතිකම හේතුවෙන් රට සංවර්ධනය වීමේ දුෂ්කරතාවලට මුහුණ දුන් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය දුර්වල වීම, දීර්ඝ කාලයක සිට පැවත එන ගැටලු පිළිබිඹු කරමින් අඛණ්ඩ ද්විත්ව හිඟයක් පැවතීම සහ මන්දගාමී ලෙස වෙනස්වීම, අනුගත වීම සහ පරිවර්තනය වීම හේතුවෙන් විශේෂයෙන් ම මෑත දශක කිහිපය තුළ දී ආර්ථික වර්ධන වේගය අඩාල වී කලාපයේ අනෙකුත් රටවල ආර්ථිකයන්ට සාපේක්ෂව පසුබෑමට ලක් විය. දශක තුනක් පුරා පැවැති අභ්‍යන්තර ගැටුමේ අවසානය රටට නව ආරම්භයක් සඳහා අවස්ථාව සැලසුව ද දූරදර්ශී ප්‍රතිපත්ති නොමැතිකම සහ නිවැරදි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හා ප්‍රතිසංස්කරණ නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මෙන්ම විවිධ සමාජ, දේශපාලන සහ සාර්ව ආර්ථික අභියෝග හේතුවෙන් ආර්ථිකයට එහි විභව මට්ටම කරා ළඟා වීමට බාධා ඇති විය. මෙම අභියෝග සහ දිගු කාලීන ගැටලු බොහොමයක් විසඳීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ අදාළ බලධාරීන් විසින්, දුෂ්කර විය හැකි, එහෙත් අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ රාශියක් කඩිනමින් ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. විශේෂයෙන්ම, අර්බුදයක් මගින්, ව්‍යුහාත්මක ගැටලු විසඳීම සඳහා වෙනස්කම් සිදු කිරීමට මෙන්ම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට, එනම් ආර්ථිකය 'නැවත නගා සිටුවීම' සඳහා, අවස්ථා නිර්මාණය කරයි. දීර්ඝ කාලයක සිට පවතින මෙවැනි ගැටලු කිහිපයක් විසඳීම සඳහා මෑතක දී රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග අගය කළ යුතුය. මැදි කාලීනව ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ කැපවීම අත්‍යවශ්‍ය වන අතර, දේශපාලන වැඩපිළිවෙළින් ස්වායක්තව ඉතිරි ක්‍රියාමාර්ග ඉටු කරන බවටත් එහිදී නුදුරු කාලීන ක්‍රියාමාර්ග මැදි කාලීන වැඩපිළිවෙළ හා අනුකූල වන බවටත් සහතික විය යුතුය.

**දිගු කාලයක සිට ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වූ ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ අධිෂ්ඨානය සහ කැපවීම, මැදි කාලීනව සිට දිගු කාලීනව ආර්ථිකයේ දිශානතිය හැඩගැස්වීමේ ප්‍රධාන සාධකයක් වනු ඇත.** 2023 වසරේ මාර්තු මාසයේ දී අනුමත කරන ලද, දළ වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 3ක් වන ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සහ අනෙකුත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල අපේක්ෂිත සහාය ද සමඟින්, ආර්ථිකයෙහි පෙර නොවූ අයුරින් පැවති ස්වෛරීත්ව ණය සහ ගෙවුම් තුලන අර්බුදවලින් නුදුරු කාලීනව යම් හිතකර මාවතකට යොමු වීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය අවකාශය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, අනාගතයේ දී මෙවැනි අර්බුද නැවත ඇති නොවීමට සහ මැදි කාලීනව සිට දිගු කාලීනව ආර්ථිකය තිරසාරව යළි යථා තත්ත්වයට පත් වීම සඳහා දැඩි දේශපාලන අභිමතයක් සහ කැපවීමක් යටතේ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ දක්වා ඇති සාර්ව ආර්ථික ගැළපුම් වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. මෙම සාර්ව ආර්ථික ගැළපුම් වැඩසටහනට ඇතුළත් අනිවාර්ය අංග වන්නේ, (i) රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය නැවත ඇති කිරීම සහ මූල්‍ය විනය ශක්තිමත් කිරීම අරමුණු කරගත්, සමාජ ආරක්ෂණ ජාලය, රාජ්‍ය මූල්‍ය ආයතන සහ රජය සතු ව්‍යවසායයන් වෙත සිදු කෙරෙන ප්‍රතිසංස්කරණ මගින් සමන්විත ප්‍රධාන වශයෙන් ආදායම් රැස් කිරීම මගින් මෙහෙයවනු ලබන ඉහළ අභිලාෂයකින් යුත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය (ii) රජයේ ණය තිරසාරභාවය නැවත ඇතිකර ගැනීම අරමුණු කරගත් ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගතකරණය උපායමාර්ගය (iii) විනිමය අනුපාතිකයෙහි ඉහළ නම්‍යශීලීභාවය හමුවේ, මිල ස්ථායීතාව නැවත ඇති කිරීමට සහ ජාත්‍යන්තර සංචිත නැවත ගොඩ නැංවීම සඳහා බහුවිධ උපායමාර්ග (iv) මූල්‍ය ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා වූ ප්‍රතිපත්ති (v) යහපාලනය ඇති කිරීම සහ වංචා හා දූෂණ අවදානම් මැඩපැවැත්වීම සඳහා මූලික වන ප්‍රතිසංස්කරණ, සහ (vi) ශ්‍රී ලංකාවේ වර්ධන විභවතාව ළඟා කර ගැනීම සඳහා පුළුල් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ යනාදියයි. 1965 වසරේ සිට ශ්‍රී ලංකාව ජා.මූ. අරමුදලේ වැඩසටහන් දහසයක් වෙත යොමු වුව ද, ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ හදිසියේ අත්හැර දැමීම හේතුවෙන් එවැනි වැඩසටහන් සම්පූර්ණ කිරීම සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සතුව අසතුටුදායක වාර්තාවක් ඇත. මෙමගින් ආර්ථික දුෂ්කරතා පවතින කාලපරිච්ඡේදයන් තුළ එවැනි වැඩසටහන්වලට පිවිසීමේ සහ ඉන් පසුව ආර්ථිකයේ ඇතිවන කෙටි කාලීන වැඩි දියුණුවීම් සමඟ එම වැඩසටහන් සම්පූර්ණ කිරීමට පෙර ඉන් ඉවත්වීමේ අහිතකර ප්‍රවණතාවක් පැවතුණි. මෙම පසුබිම හමුවේ, ඉහළ දැනුම්වත්භාවයකින් සහ

විනිවිදභාවයකින් යුත් සන්නිවේදනය තුළින් අවශ්‍ය ආර්ථික ගැළපීම් සිදු කිරීමට මහජන සහයෝගය ලබා ගනිමින්, වත්මන් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ සිදු කිරීමට නියමිත එක් එක් සමාලෝචනය තුළ දී, අපේක්ෂිත කාලානුරූපී ඉලක්ක සපුරා ගැනීමට ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් දැඩි කැපවීමක් සහ විනයක් පෙන්නුම් කිරීම අත්‍යවශ්‍ය වේ. මෙමගින්, දිගු කාලයක් තිස්සේ නොසලකා හරින ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමට අවස්ථාවක් ලැබීම පමණක් නොව, දැඩි අස්ථාවරවීම් සහ වේදනාකාරී ගැළපීම්වලට නිරන්තරයෙන් මුහුණ නොදී මැදිකාලීනව තිරසාර වර්ධන මාවතකට යොමු වීම සඳහා ආර්ථිකයට ශක්තිමත් පදනමක් ද ලබා දෙනු ඇත. අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් හදිසි අරමුදල් අවශ්‍යතා සඳහා ජා.මූ. අරමුදල වෙත නැවත නැවතත් ප්‍රවේශ වීමේ අවශ්‍යතාවයක් ඇති නොවනු ඇති අතර ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ අවශ්‍යතාවය ද වැළැක්වෙනු ඇත. 2022 වසරේ වැඩි කාලයක් තුළ ආර්ථිකයේ පැවති ඉතා දුෂ්කර තත්ත්වයන්ගෙන් ශීඝ්‍රයෙන් යථා තත්ත්වයට පත්වීම, ඉහත සඳහන් කළ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජා.මූ. අරමුදලේ පෙර පැවති වැඩසටහන් මෙන් නොව, වත්මන් විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ වඩා වේදනාකාරී ප්‍රතිසංස්කරණ පළමුව සිදු කළ යුතු වීම සැලකිය යුතු කරුණක් වන අතර, එවැනි ප්‍රතිසංස්කරණ අඛණ්ඩව පවත්වා ගෙන යාම සාපේක්ෂ වශයෙන් පහසු වනු ඇතැයි අපේක්ෂා කළ හැකි අතර, එමගින් දැනට පවතින වැඩසටහන සම්පූර්ණ කිරීමේ දී ආර්ථිකය වඩාත් සාර්ථක කර ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ඉදිරි කාලයේ දී, පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ කාල සීමාව තුළ විදේශීය ණය තිරසාරභාවය පවත්වා ගැනීම සඳහා විදේශීය මූල්‍යනය ඵලදායී ලෙස යොදා ගැනීම ප්‍රමුඛතාවය කර ගැනීම සහ භාවිත කිරීමට ශ්‍රී ලංකාව සහතික විය යුතුය.** ශ්‍රී ලංකාව 2007 වසරේ සිට එ.ජ. ඩොලර් බිලියන 17.6ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කර ඇති අතර 2001 වසරේ සිට එ.ජ. ඩොලර් බිලියන 17.2ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කර ඇත. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල මුල් නිකුතුවල දී ලද ලැබීම් මූලික වශයෙන් සංවර්ධන කටයුතු සඳහා පමණක් භාවිතා කරන ලදී. පසුකාලීනව සැලකිය යුතු ලෙස ඉහළ ගිය අයවැය හිඟයන් සහ රජයේ දළ මූල්‍යන අවශ්‍යතා මගින් තීව්‍ර වූ විදේශීය ණය වැඩිවීම හේතුවෙන්, නිකුත් කළ බැඳුම්කර බොහොමයක ලැබීම් මූලික වශයෙන් අයවැය සහාය සඳහා හෝ ණය ආපසු ගෙවීම හෝ එම ණය සඳහා වන පොලී ගෙවීම සඳහා යොදා ගත් බැවින්, ගෝලීය වෙළඳපොළවලින් වාණිජ පොලී අනුපාතික යටතේ තවදුරටත් විදේශ විනිමය ණය ගැනීමට සිදු විය. ඒ අනුව, ජාත්‍යන්තර ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් සහ රටේ ආර්ථික තත්ත්වයන්හි අපේක්ෂා කරන වර්ධනයන් මධ්‍යයේ, ශ්‍රී ලංකාවේ ණය උපායමාර්ගය, ඉහළ වාණිජමය විදේශීය ණයවලින් ඉවත් වූ, හිමිකම් කොටස් මත විදේශීය මූල්‍යනය පදනම් වීම ඉතා වැදගත් වේ. විදේශ විනිමය ලැබීම් උත්පාදනය කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ දැක්මක් සහිතව, එවැනි අරමුදල් යොදා ගන්නා අරමුණු හඳුනා ගනිමින් විදේශීය මූල්‍යන සංයුතිය සහ උපායමාර්ගය ප්‍රවේශමෙන් සකස් කළ යුතුය. නිදසුනක් වශයෙන්, පුනර්ජනනීය බලශක්තිය වැනි උපායමාර්ගික වශයෙන් වැදගත් ව්‍යාපෘති වෙත විදේශීය මූල්‍යන ආකර්ෂණය කර ගැනීම, රාජ්‍ය මූල්‍ය අංශයට සහ විදේශීය අංශයට දැඩි පීඩනයක් ඇති නොවන පරිදි බලශක්ති අංශයේ දුර්වලතා මග හරවා ගැනීම සඳහා ඉතා වැදගත් වනු ඇත. එපමණක් නොව, ඕනෑම ආකාරයක ණය මූල්‍යනයක් වෙත යොමු වීමට දරන ඉදිරි ප්‍රයත්නවල දී, පිරිවැය සහ ප්‍රතිලාභ මෙන්ම මූල්‍යන අවශ්‍යතාවය පිළිබඳව ද නිසි ඇගයීමට ලක් කිරීම, අනාගතයේ දී ණය අවදානම් ඇති නොවීම සහතික කිරීම සඳහා අවශ්‍ය වනු ඇත.

**ගෝලීය මූල්‍ය සහ ප්‍රාග්ධන වෙළඳපොළ සඳහා රට විවෘත කිරීමට පෙර, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ දක්වා ඇති තිරසාර ණය ඉලක්කවලට අනුකූලව, ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම තීරණාත්මක වේ.** ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි සඳහන් කර ඇති ආකාරයට ණය තිරසාර ඉලක්කවලට අනුකූලව, ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කළ යුතුය. ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කඩිනමින් ආරම්භ කිරීමට හැකි වන පරිදි, 2023 වසරේ මාර්තු මස අග දී දේශීය ණය සඳහා අපේක්ෂිත ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයෙන් පසුව ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණ උපායමාර්ගය නුදුරු කාලයේ දී ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් සකස් කරමින් පවතී. එමෙන්ම, 2023 වසරේ සැප්තැම්බර් මාසයට පෙර මෙම ක්‍රියාවලිය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. සාර්ථක ණය ප්‍රතිව්‍යුහගතකරණයකින් පසුව වුව ද, ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වල යම් වර්ධනයක් ඇතිවීම ක්‍රමානුකූල ක්‍රියාවලියක් වන අතර එය ආර්ථිකය යළි ගොඩනැගීමේ සාර්ථකත්වය මත රඳා පවතී.

ජාත්‍යන්තර අත්දැකීම්වලින් පෙනී යන්නේ, ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසුව, ද්විපාර්ශ්වික සහ වාණිජමය ණය හිමියන්ගෙන් විදේශ මූල්‍යන ආකර්ෂණය කර ගැනීමට පෙර, ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් වර්ධනය කර ගැනීමට සහ ආර්ථිකය කෙරෙහි ඇති විශ්වාසය ගොඩනගා ගැනීමට රටවල් සැලකිය යුතු කාලයක් ගත කර ඇති බවයි. මෙම පසුබිම හමුවේ, කෙටිකාලීන හා මැදිකාලීන ණය මූල්‍යනවලින් ඉවත් වීමට රට උත්සාහ කළ යුතු අතර, මූලික වශයෙන් විදේශීය සෘජු ආයෝජන සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව වැඩපිළිවෙළ හරහා සිදු කෙරෙන හිමිකම් කොටස් මූල්‍යනය වැනි ණය නොවන මූල්‍ය ප්‍රභවයන් ආකර්ෂණය කර ගැනීමේ ආකාර හඳුනාගත යුතුය.

**පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායයන් එම තත්ත්වයෙන් මුදවාගෙන ලාභ ලබන ආයතන බවට පත් කිරීම මෙන්ම, එම ආයතන, රජයේ අයවැය මත ඇති කෙරෙන පීඩනය සහ වාණිජ බැංකු මත අධික ලෙස රඳා පැවතීම වැළැක්වීම සඳහා දිගු කාලයක් පුරා ක්‍රියාත්මක නොවුණු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ තවදුරටත් ප්‍රමාද වීමකින් තොරව සිදු කළ යුතු අතර, එමගින් රාජ්‍ය මූල්‍ය, සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවයට බාධා ඇති කරන මෙම ආයතන හේතුවෙන් උද්ගත වන අවදානම් වළක්වාගත හැකිය.** විදුලිය, ඛනිජ තෙල්, ජලය, බැංකු, ප්‍රවාහන සහ ගුවන් සේවා වැනි උපායමාර්ගික වශයෙන් වැදගත් ආර්ථික අංශවල රජය සතු ව්‍යවසායයන් ප්‍රධාන භූමිකාවන් ඉටු කළත්, මෙම ආයතනවලින් සැලකිය යුතු ප්‍රමාණයක් මෙහෙයුම් අකාර්යක්ෂමතා, දුර්වල පරිපාලනය සහ අයථා කළමනාකරණය, වගවීම හා විනිවිදභාවය නොමැතිකම, වෙළඳපොළට ගැළපෙන ලෙස හැඩ ගැසීම දුර්වල වීම, දේශපාලන මැදිහත්වීම් හරහා ඉහළ මට්ටමේ පත්වීම් සිදු කිරීම දිගින් දිගට ම සිදු වීම, සහ අධික ශ්‍රම බලකාය ඇතුළු ගැටලු රාශියකින් පීඩාවට පත්ව සිටියි. මෙම ගැටලු රාජ්‍ය ව්‍යවසායයන්ගේ දුර්වල මූල්‍ය කාර්යසාධනයට හේතු පාදක වී ඇති අතර, එම දුර්වල මූල්‍ය කාර්යසාධනය නිසා රාජ්‍ය බැංකුවලට සහ මෑත කාලීනව ඇතැම් පෞද්ගලික බැංකුවලට ඇති කෙරෙන අහිතකර බලපෑම, ප්‍රාග්ධනය යෙදීමට සිදු වීමෙන් රජයට සිදු වන මූල්‍ය හානි, රජයේ අවිනිශ්චිත වගකීම් වැඩි වීම සහ මහජනතාවට සපයනු ලබන සේවාවන්වල ගුණාත්මකභාවය පිළිබඳ සතුටුදායක තත්ත්වයක් නොපැවතීම වැනි අහිතකර තත්ත්ව ඇති වීම හේතුවෙන් රට තුළ බහුවිධ සාර්ව ආර්ථික පීඩන නිර්මාණය වී ඇත. උදාහරණයක් ලෙස, 2022 වසර අවසානයේ දී බැංකු අංශයෙන් රජයේ සංස්ථා වෙත ලබා දී ඇති ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 1.7ක්[4] වන අතර, 2022 වසර තුළ දී රජය විසින් ද්‍රවශීලතා ගැටලු ලිහිල් කිරීම සඳහා රුපියල් බිලියන 80ක පමණ ප්‍රාග්ධනය ලං.වි.ම.ට ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ ස්ථාපිත රාජ්‍ය ව්‍යවසායයන් සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කර ඇතත්, රාජ්‍ය ව්‍යවසායයන් කිහිපයක් සමාගම් පනත යටතේ ස්ථාපනය කර ඇති අතර, පාර්ලිමේන්තු අධීක්ෂණය මගහැරීමට එයින් යම් ඉඩකඩක් සැලසේ. මීට අමතරව, රාජ්‍ය ව්‍යවසායයන් බහුතරයක මූල්‍ය ගිණුම් නියමිත වේලාවට සකස් කිරීම සහ එම ප්‍රකාශන හෙළිදරව් කිරීම සිදු නොවන බැවින්, ඒවායෙහි විනිවිදභාවයට සහ මහජන නිරීක්ෂණයට බාධා ඇති වේ. ඇතැම් රාජ්‍ය ව්‍යවසායයන්හි වංචා, දූෂණ, අයථා කළමනාකරණය සහ නොසැලකිලිමත්කම හඳුනාගෙන තිබියදීත්, අදාළ ආයතනවල අධ්‍යක්ෂක මණ්ඩලයේ හෝ පාර්ලිමේන්තු කාරක සභා මට්ටමේ දී එවැනි ගැටලුවලට කඩිනම් විසඳුම් ලැබී නොමැති තරම්ය. මීට අමතරව, දිගින් දිගටම පත්වුණු රජයන් මගින් ජනප්‍රිය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන් අවභාවිත කර ඇත. උදාහරණයක් වශයෙන්, දීර්ඝ කාලයක් තිස්සේ, බලශක්තිය, ඛනිජ තෙල්, ජලය, ප්‍රවාහනය ඇතුළු උපයෝගිතා සහ රාජ්‍ය අංශයේ සේවා පිරිවැය ප්‍රතිසාධන මට්ටමට වඩා අඩු මිලකට පාරිභෝගිකයන්ට ලබා දී ඇත. මෙම ඉලක්කගත නොකළ සහනාධාරවල පිරිවැය රාජ්‍ය ව්‍යවසායයන් විසින් දරනු ලැබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විශාල වශයෙන් සමුච්චිත අලාභ ඇති වූ අතර, ඒවා බොහෝ දුරට මධ්‍යම රජයේ අයවැයෙන් සිදු කරන පැවරුම් මගින් ආවරණය විය. මෙරට ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්ගේ දුර්වල මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ වෙළඳපොළට අනුව හැඩ ගැසීමට නොහැකි වීමට ප්‍රධාන ම හේතුව වී ඇත්තේ පිරිවැය පිළිබිඹු කරන මිලකරණයක් නොමැති වීමය. ඉහත සඳහන් කරන ලද සියලුම ගැටලු රාජ්‍ය ව්‍යවසායයන් ලාභ ලබන වාණිජ ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක වීම අධෛර්යමත් කර ඇති අතර, එමගින් රජයට, බැංකුවලට සහ මහජනතාවට අනවශ්‍ය පීඩන ඇති කර තිබේ. රාජ්‍ය ව්‍යවසායයන්ගේ ණය තිරසාර නොවන ඉහළ මට්ටම් කරා ළඟා වන විට, රජයේ ආදායම් යොදාගෙන එම ණය බර අඩු කිරීමට පසුගිය කාලයේ දී රජයට සිදු විය. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ එකඟ වූ ක්‍රියාමාර්ගවලට අනුව, ලං.ඛ.නී.සං.හි නොපියවූ විදේශ මුදල් ණය රුපියල් බිලියන 884.1ක්

4 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී මධ්‍යම රජයේ ණය යටතේ ඇතුළත් කෙරුණු, රජය විසින් ලබා දුන් ඇපකර මත ලබා ගන්නා ලද ලං.ඛ.නී.සං.හි විදේශ මුදල් ණයවල හිඟ ශේෂය ද මෙහි ඇතුළත් වේ.

(එ.ජ. ඩොලර් මිලියන 2,434.8ක්) 2022 වසර අවසානයේ දී මධ්‍යම රජයේ ණය යටතට ඇතුළත් කරගෙන ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලං.වි.ම., සහ ගුවන්තොටුපළ හා ගුවන් සේවා (පුද්ගලික) සමාගම යටතේ වාර්තා කෙරුණු, චීන අපනයන-ආනයන බැංකුවෙන් (EXIM Bank of China) ලබා ගත් රුපියල් බිලියන 518.3ක් (එ.ජ. ඩොලර් මිලියන 1,427.3ක්) වූ ණය පහසුකම් අටක නොපියවූ ශේෂය 2022 වසර අවසානයේ දී මධ්‍යම රජයේ ණය යටතේ වර්ගීකරණය කිරීමට සිදු විය. මෙවන් පසුබිමක, රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යක්ෂමතාවය, මූල්‍ය ශක්‍යතාවය සහ වගවීම වැඩිදියුණු කිරීම සඳහා ආයතනික ප්‍රතිසංස්කරණ සිදු කිරීම ඉතා වැදගත් වේ. රාජ්‍ය ව්‍යවසායයන්ගේ මූල්‍ය ශක්‍යතාව ඇති කිරීමේ අවශ්‍යතාව හඳුනාගනිමින් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන මගින් ප්‍රධාන උපයෝගිතා කිහිපයක පිරිවැය පිළිඹිබු කෙරෙන මිල සංශෝධන හඳුන්වා දීමට නියම කරන ලදී. රාජ්‍ය ව්‍යවසායයන් විසින් ලබන ආදායම් ඉහළ නැංවීමට පමණක් නොව, ඔවුන්ගේ අකාර්යක්ෂමතාවය නිසා උද්ගත වන වියදම් ඉහළ මිල ගණන් පැනවීම මගින් පියවා ගැනීම සිදු නොකර, පිරිවැය අඩු කිරීමට උත්සාහ කරන බව සහතික කිරීම සඳහා එවැනි මිලකරණ යාන්ත්‍රණයන් වඩා ඉහළ විනිවිදභාවයකින් යුතුව අඛණ්ඩව පවත්වාගෙන යාම අවශ්‍ය වේ. තවද, එවැනි ආයතන මගින් රජයේ අයවැය මත වන පීඩනය අඩු කිරීම සහ ආයතනික හා වාණිජමය වශයෙන් වඩා ඉහළ කාර්යක්ෂමතාවක් සහතික කිරීම සඳහා උපායමාර්ගික නොවන ව්‍යවසායයන් විකිණීමට හෝ කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීම සඳහා හෝ සලකා බැලිය යුතුය. අනිවාර්ය සහ නිරන්තර පාර්ලිමේන්තු අධීක්ෂණය මගින් ඉතිරි රාජ්‍ය ව්‍යවසායයන්ගේ ආයතනික විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කළ යුතුය. ප්‍රධාන කාර්යසාධන දර්ශකවලට සම්බන්ධව, අනිවාර්යයෙන් ම ළඟා කරගත යුතු ආයතනික ඉලක්ක සහ අරමුණු රාජ්‍ය ව්‍යවසායයන් වෙත ලබා දිය යුතු වන අතර, ඒ සඳහා රාජ්‍ය ව්‍යවසායයන්ගේ කළමනාකරණය වගකිව යුතු බව තහවුරු කළ යුතුය. මෙම රාජ්‍ය ව්‍යවසායයන්හි අධ්‍යක්ෂක මණ්ඩලයට, කළමනාකාරීත්වයට සහ සේවකයින්ට ලැබෙන වරප්‍රසාද සහ ප්‍රතිලාභ ඔවුන්ගේ කාර්යසාධනය සහ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සමඟ සම්බන්ධ කළ යුතුය. ඒ අනුව, එවැනි රාජ්‍ය ව්‍යවසායයන් ආර්ථිකයේ වර්ධනයට සහාය සපයන ආයතන බවට පත් කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට රජය කැපවී සිටීම ඉතා වැදගත් වේ. තවද, රජය විසින් දැනටමත් හඳුනාගෙන ඇති පරිදි, විදුලිබල ක්ෂේත්‍රයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම යන උප අංශ ආයතනික වශයෙන් වෙන් කිරීම හරහා බලශක්ති අංශයේ පුළුල් ප්‍රතිසංස්කරණ සිදු කිරීම අවශ්‍ය වනු ඇත. ලං.වි.ම. වැනි රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලික අංශයේ බලශක්ති සපයන්නන් සමඟ එළඹුණු වාණිජ ගිවිසුම් නැවත සමාලෝචනයකට ලක් කිරීම මගින්, එම ගිවිසුම්වලින් ලං.වි.ම.ට වැඩි වියදමක් දැරීමට සිදු වන ආකාරයට එම සැපයුම්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා නොදෙන බව සහතික කළ යුතුය. මධ්‍යම රජයේ මූල්‍යන මත ඇති වන පීඩන අවම කර ගනිමින් රාජ්‍ය ව්‍යවසායයන්ගේ කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය සහතික කිරීම සඳහා මෙම ආයතනික ප්‍රතිසංස්කරණ ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කළ යුතුය.

**බදු ප්‍රතිපත්ති හා බදු පරිපාලනය ප්‍රතිසංස්කරණය කිරීම සහ නීතිමය අනුකූලතා රාමුව ශක්තිමත් කිරීම රජයේ ආදායම් ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතා වැදගත් වන අතර, එමගින් ඉදිරි කාලය තුළ දී සාර්ව ආර්ථික සමතුලිතතාව යථා තත්ත්වයට පත් කෙරෙනු ඇත.** ශ්‍රී ලංකාවට සමාන ආර්ථිකයන් හා සසඳන විට ශ්‍රී ලංකාවේ අඛණ්ඩව පවතින දුර්වල ආදායම් කාර්යසාධනය හඳුනා ගනිමින්, බදු අනුපාත වැඩි කර ගන්නා අතර බදු පදනම පුළුල් කරගැනීමට රජය විසින් පියවර කිහිපයක් දැනටමත් අනුගමනය කර ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ආදායම් රැස් කිරීම තිරසාර පදනමක් සහිතව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා දියුණු තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධව කටයුතු කිරීමට විශේෂ අතිරේක ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය වේ. ප්‍රධාන වශයෙන්, සෑම වසරකම අපේක්ෂිත ආදායම් මට්ටමට ළඟා වීමට නොහැකි වීම හමුවේ කෙටි කාලීන විසඳුම් ලෙස සිදු කරන ලද නොගැළපෙන, අස්ථාවර සහ නිසි සැලැස්මකින් තොරව ක්‍රියාත්මක කෙරෙන ප්‍රතිපත්ති හේතුවෙන් ශ්‍රී ලංකාවේ බදු ක්‍රමය තුළ අසාර්ථක තත්ත්වයන් ඇති වී තිබේ. අතීතයට බලපාන පරිදි හඳුන්වා දුන් අධිභාර බද්ද සහ ව්‍යාපාර පිරිවැටුම මත පනවනු ලබන බදු සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය නිතර වෙනස් වීම, එවැනි අස්ථාවර බදු ප්‍රතිපත්තිවලට උදාහරණ වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ව්‍යාපාර සහ පුද්ගලයන්ට බදු වාර්තා ගොනු කිරීම සහ සිය බදු වගකීම් පුරෝකථනය කිරීම අපහසු කටයුත්තක් වී ඇති අතර, බදු ගෙවන්නන් ස්වේච්ඡාවෙන් බදු ගෙවීමට වන අනුකූලතාව පවත්වා ගැනීම එමගින් අධෛර්යමත් වේ. දුර්වල බදු පරිපාලන ක්‍රමයක් මගින්

ඉහළ බදු ආදායමක් උපයා ගැනීමට පහසුවෙන් බදු අය කර ගත හැකි ක්ෂේත්‍ර යොදා ගැනෙන නමුත්, සිදු විය යුත්තේ ජනතාව අතර බදු බර සාධාරණ ලෙස බෙදී යන, සාධාරණ බදු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමය. ඒ අනුව, රටේ බදු ප්‍රතිපත්ති සකස් කළ යුත්තේ රජයේ ආදායම් අවශ්‍යතා, රටේ සංවර්ධන අරමුණු, බදු ප්‍රතිපත්තිවල සාධාරණත්වය සහ බදු ගෙවන්නන් හා බදු පරිපාලකයන් යන දෙපාර්ශ්වයේ ම පහසුව සලකා බැලීමෙනි. මේ අතර, පරිපාලන වියදම්, බදු මගහැරීම්, බදු පැහැර හැරීම් සහ විවිධ බදු වංචා අවම කිරීම සඳහා බදු පරිපාලනය ශක්තිමත් කළ යුතුය. රජයට සැලකිය යුතු ආදායම් අහිමිවීමක් සිදු වීමට හේතුවක් වූ ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධතියේ (RAMIS) දැනට පවතින දුර්වලතා කඩිනමින් නිවැරදි කළ යුතු අතර, ඍජු සහ වක්‍ර බදු ආදායම් එකතු කිරීම සඳහා නව තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතුය. උදාහරණයක් ලෙස, තත්කාලීන ඉන්වොයිස් ක්‍රමයක් හඳුන්වා දීම මගින් එකතු කළ අගය මත බදු සහ පිරිවැටුම් බදු සම්බන්ධ වංචා වළක්වා ගැනීමට සහ බදු විගණනය කාර්යක්ෂමව සිදු කිරීමට අවස්ථාව උදා වේ. මීට අමතරව, ආදායම් එකතු කිරීමේ ආයතන, මූල්‍ය ආයතන සහ අනෙකුත් දේපළ ලියාපදිංචි කිරීමේ ආයතනවල දත්ත සමුදායන් සම්බන්ධ කිරීම බදු පැහැර හැරීම අවම කිරීමට උපකාරී වන අතර, එමගින් බදු ගෙවන්නන්ගේ පදනම පුළුල් වේ. බ්ලොක්චේන්, ඒකාබද්ධ රේගු කළමනාකරණ පද්ධති, භාණ්ඩ තොග සුපරීක්ෂක (cargo scanner) සහ භාණ්ඩ තොගවල ගමන්මග නිරීක්ෂක (trackers) වැනි නවීන තාක්ෂණයන් හඳුන්වා දීම මගින් දේශසීමාවල දී බදු පැහැර හැරීම් අවම කර ගැනීමට බොහෝ රටවලට හැකි වී ඇත. ශ්‍රී ලංකාවේ පවතින විශාල අවිධිමත් අංශය බදු ජාලයට හසු නොවන තරම් වන අතර, පුද්ගලයන් සහ ව්‍යාපාර විසින් මුදලින් සිදු කරන ගනුදෙනු නිසා ඔවුනට ඒ හරහා ලැබෙන ආදායම සොයා ගැනීමට ආදායම් එකතු කිරීමේ ආයතනවලට අපහසු වන බැවින් විධිමත් අංශයේ බොහෝ පිරිසක් ද බදු ගෙවීම් පැහැර හරිති. එබැවින්, බදු වංචා කරන්නන් මෙන්ම, තමන්ගේ ප්‍රතිලාභය සඳහා වෙනත් පුද්ගලයෙකු හෝ ආයතනයක නමින් දේපළ ගනුදෙනු (benami transactions) සිදු කරන්නන් සොයා ගැනීමට, 'මුදල් ගනුදෙනු රහිත ආර්ථිකයක්' ප්‍රවර්ධනය කිරීම තුළින් ආදායම් එකතු කිරීමේ ආයතනවලට හැකියාව ලැබේ. මේ අතර, වර්තමාන අභියාචනා සහ පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීමේ ක්‍රියාවලියට ඉතා දිගු කාලයක් ගත වීම බදු එකතු කිරීමේ ක්‍රියාවලියට සැලකිය යුතු මට්ටමින් අහිතකර ලෙස බලපා ඇති අතර, එය ආදායම් එකතු කිරීමේ ආයතනවලට ඔවුන්ගේ ආදායම් රැස් කිරීමේ ඉලක්ක සපුරා ගැනීමට බාධාවක් වී ඇත. බදු මග හැරීම, බදු නොගෙවීම සහ බදු පැහැර හරින්නන්ට බදු ගෙවීම සඳහා දිගු කාලයක් ලබා දීම සම්බන්ධයෙන් නොවිසඳුණු සිද්ධීන් රැසක් ඇති බව පෙනී යයි. විනිවිදභාවය වැඩි කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තවමත් නොවිසඳුණු සහ විසඳන ලද බදු සම්බන්ධ නඩු සහ සිද්ධි සංඛ්‍යාව වරින් වර ප්‍රකාශයට පත් කිරීම මගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් බදු එකතු කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට දරන ප්‍රයත්න මහජනතාවට පැහැදිලි වනු ඇත. තවද, බදු සම්බන්ධ ආරවුල් විසඳීම සඳහා කාර්යක්ෂම අභියාචනා ක්‍රියාවලියක් සහ කඩිනම් අධිකරණ ක්‍රියාවලියක් හඳුන්වා දීම මගින් රජයට සිදුවන බදු අහිමි වීම් විශාල ලෙස අඩු කර ගත හැකි වනු ඇත. එයට අමතරව, ස්වේච්ඡාවෙන් බදු ගෙවීම සඳහා වන අනුකූලතාව වැඩිදියුණු කිරීම සඳහා, අනුකූල නොවීම සම්බන්ධයෙන් දැඩි දඬුවම් හඳුන්වා දිය යුතු අතර, බදු ගෙවන්නන් සඳහා නිසි මග පෙන්වීමක් ලබාදෙන සේවා වැඩිදියුණු කළ යුතුය. පුද්ගලික ආදායම් බදු වාර්තා ගොනු කිරීම අනිවාර්ය කිරීමට සහ පුද්ගලික ආදායම් බදු ඉලෙක්ට්‍රොනික ක්‍රමයට ගෙවීම සඳහා රජය විසින් මෑතකාලීනව ගත් ප්‍රයත්න, බදු පරිපාලනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ගත්, අගය කළ යුතු මුලපිරීමකි. බදු පරිපාලනය වැඩිදියුණු කිරීමට රජය දරන උත්සාහයන් තවදුරටත් වැඩි කළ යුතු අතර, බදු පදනම පුළුල් කිරීමටත්, දැනටමත් බදු ගෙවන්නන් මත දැරිය නොහැකි බරක් පැටවීමකින් තොරව රජයේ ආදායම ඉහළ නැංවීමටත් එමගින් රජයට හැකි වනු ඇත.

**මැදි කාලීනව හා දිගු කාලීනව රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයෙහි තිරසාර බව සහතික කිරීම සඳහා මෑත කාලයේ දී හඳුන්වා දුන් දැඩි බදු ප්‍රතිසංස්කරණවලට සමගාමීව නිසි වියදම් කළමනාකරණ උපායමාර්ග ද ක්‍රියාත්මක කළ යුතුය.** රාජ්‍ය මූල්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා බදු ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය වුවද, කාර්යක්ෂම රාජ්‍ය වියදම් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක නොකරන්නේ නම්, වියදම් අඩු කර ගැනීමේ සහ වියදම් තාර්කිකරණය කිරීමේ උපායමාර්ග නොමැති වීම නිසා බදුවලින් ලැබෙන අමතර ආදායම අකාර්යක්ෂම රාජ්‍ය වියදම් වැඩසටහන්වලට වෙන් කිරීමට ඉඩ ප්‍රස්ථා ඇති බැවින් එම ක්‍රියාමාර්ග ප්‍රතිඵල රහිත විය හැක. වැටුප් හා වේතන, විශ්‍රාම වැටුප් හා සහනාධාර සහ පොලී ගෙවීම් සඳහා රජයේ වියදමින් සැලකිය යුතු තරම් කොටසක් වෙන් කෙරෙන නිසා ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම්වලින් වැඩි ප්‍රමාණයක් පහසුවෙන් අඩු කළ නොහැකි වියදම් වේ. කෙසේ වුවද, වියදම් කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමවේද ක්‍රියාත්මක

කිරීම තුළින් වියදම් අඩුකර ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථාව සලසාගත හැකිය. රජයේ අයවැය පිළියෙල කිරීමේ දී, ප්‍රවර්ධී අයවැයකරණ ක්‍රමවේදය[5] (Incremental budgeting) වැනි සාම්ප්‍රදායික අයවැයකරණ ක්‍රමවේද වෙනුවට ශුන්‍ය මූලක අයවැයකරණ ක්‍රමවේදය[6] (Zero-based budgeting) වැනි වඩාත් සඵලදායී ක්‍රමවේද භාවිත කිරීම මගින් අනවශ්‍ය සහ ඵලදායී බවින් අඩු ක්‍රියාකාරකම් හඳුනාගැනීමට සහ එවැනි වියදම් කපා හැරීමට රජයට හැකියාව ලැබෙන අතර, වර්ධනය සහ සංවර්ධනය සඳහා ඉඩ සලසමින් ආර්ථිකයේ ඉතාමත් ම වැදගත් අවශ්‍යතා වෙත හිඟ සම්පත් වෙන් කිරීමට ද මෙමගින් හැකියාව ලැබේ. ශුන්‍ය මූලික අයවැයකරණය ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් දැනටමත් ප්‍රයත්න දරා තිබුණ ද, මෙම අයවැයකරණ ක්‍රමවේදය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා, විශේෂයෙන් ම, රජයේ අයවැය සැකසීමට දායක වන වියදම් සිදු කරන ආයතනවල කාර්යමණ්ඩල පුහුණු කිරීම මගින්, සාමූහික ප්‍රයත්නයක් දැරීම අවශ්‍ය වේ. තවද, වියදම් සිදු කරන ආයතනවල වියදම් කපා හැරීම සඳහා සැමට එක සේ ක්‍රියාත්මක වන ප්‍රවේශයක් වෙනුවට, සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ඇති ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රමුඛතාවය, ඒවායෙහි සම්පත් අවශ්‍යතාවය සහ සම්පත් ලබා ගැනීමට ඇති හැකියාව සැලකිල්ලට ගෙන, අවශ්‍ය පියවර ක්‍රියාත්මක කළ යුතුය. ඵලදායී ලෙස වියදම් සිදු කරන ආයතනවලට අවශ්‍ය පරිදි සම්පත් ලැබෙන බව සහතික කිරීම සඳහාත්, ඵලදායී නොවන ආකාරයෙන් වියදම් සිදු කරන ආයතන ඔවුන්ගේ ඵලදායී බව තක්සේරුකොට අවශ්‍ය පරිදි වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග අනුගමනය කරන බව සහතික කිරීම සඳහාත්, එක් එක් අවස්ථා සහ ආයතන පිළිබඳව වෙන් වෙන් වශයෙන් සලකා බලමින් වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. මේ අතර, ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති සඳහා ඵලදායී ලෙස අරමුදල් වෙන් කිරීම සහතික කිරීම සඳහා 'වැය කරන මුදලට සරිලන වටිනාකමක් ලබා දෙන' සහ සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ව්‍යාපෘතිවලට ඇති වැදගත්කම මත පදනම්ව ප්‍රාග්ධන වියදම් ප්‍රමුඛතාගත කිරීම ඉතා වැදගත් වේ. එබැවින්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි පරාමිතීන්ට අනුකූල වන පරිදි මැදි කාලීනව රජය විසින් ප්‍රාථමික ශේෂයෙහි අතිරික්තයක් ලබා ගැනීම සඳහා වැඩිදියුණු කරන ලද අයවැයකරණය ක්‍රමවේද සහ තාර්කික ලෙස සම්පත් වෙන් කිරීම අත්‍යවශ්‍ය වේ.

**බලශක්ති අංශයේ පවතින අකාර්යක්ෂමතා විසඳීමේ අවශ්‍යතාව අවධාරණය කරමින්, මෑත කාලීන ආර්ථික අර්බුදය විසින් මෙරට බලශක්ති සුරක්ෂිතතාව අභියෝගයට ලක් කර ඇත.** බාහිර කම්පන සඳහා බලශක්ති අංශයේ ඔරොත්තු දීමේ හැකියාවේ පවතින දුර්වලතා මෙන්ම, ඉහළ විභවතාවක් පැවතිය ද විදුලිබල උත්පාදනයේ පවතින සීමිත විවිධාංගීකරණය පිළිබිඹු කරමින්, විදුලිය සහ අනෙකුත් බලශක්ති සේවා සැපයුමට 2022 වසරේ දී දැඩි බාධා එල්ල වූ අතර, ඒ හේතුවෙන් දීර්ඝ විදුලි සැපයුම අත්හිටුවීම් සහ උග්‍ර ඉන්ධන හිඟයක් නිර්මාණය කරමින් උද්ගත වූ බලශක්ති අර්බුදය මගින් ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි අහිතකර බලපෑම් එල්ල විය. ජල විදුලිය, විදුලිබල උත්පාදනයේ වඩාත්ම ලාභදායී මූලාශ්‍රය වුව ද, දේශගුණික වෙනස්වීම් කෙරෙහි එහි සංවේදීතාව ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන්, විදුලිය සැපයීමේ තිරසාරභාවය පිළිබඳ සැලකීමේ දී, ජලවිදුලි උත්පාදනය මත විශාල වශයෙන් ශ්‍රී ලංකාව රඳා පැවතීම අවධානය යොමු විය යුතු කරුණකි. තවද, ආනයනික තාප බල ප්‍රභව වන ගල් අඟුරු සහ පෙට්‍රෝලියම් නිෂ්පාදන මත වැඩි වශයෙන් යැපීමත් සමඟ ගෝලීය බලශක්ති මිල ගණන්වල සිදුවන විචලන සඳහා ද විදුලි උත්පාදනය දැඩි ලෙස නිරාවරණය වේ. විදුලිබල උත්පාදනය සඳහා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභවයන්හි දායකත්වය ඉහළ නැංවීමට නොයෙකුත් ක්‍රියාමාර්ග අනුගමනය කෙරුණ ද, මේ සඳහා බහුවිධ ආයතනවලින් අනුමැතිය ලබාගැනීමට සිදුවීම, පාරිසරික බලපෑම් පිළිබඳ ගැටලු මෙන්ම, විදුලි නිෂ්පාදකයන්ට ගෙවන ගාස්තු නිතර සංශෝධනයකට ලක් නොකිරීම වැනි නොයෙකුත් අභියෝගවලට පුනර්ජනනීය බලශක්ති අංශයේ නියැළී සිටින පෞද්ගලික ආයෝජකයින් මුහුණදෙන අතර, එය පුද්ගලික අංශයේ වැඩි දායකත්වයක් සහිතව සිදුවිය යුතු සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය අංශයේ ව්‍යාප්තියට බාධාවක්ව පවතී. මේ තත්ත්වය තුළ, විදුලිබල උත්පාදන මූලාශ්‍රවල උපයෝජ්‍යතාව සහ එම මූලාශ්‍රවල උත්පාදන පිරිවැය අනුව වඩාත් සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමේ කඩිනම් අවශ්‍යතාවක් පවතින අතර, එමගින් ඉදිරියේ දී කාර්යක්ෂම උත්පාදන සංයුතියක් තෝරා ගැනීමට ද හැකියාව ලැබෙනු ඇත. විදුලි උත්පාදන සංයුතියේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව දායකත්වය වැඩි කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් සුලබ සම්පත්වන, සූර්ය හා සුළං වැනි සුපිරිසිදු විදුලිබල ප්‍රභව සඳහා පුද්ගලික සහ විදේශීය මූලාශ්‍රවලින් ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අවශ්‍යතාවක් පවතින අතර, ඒ සඳහා අනෙකුත් පියවර

5 ප්‍රවර්ධී අයවැයකරණ ක්‍රමයේ දී, පෙර වසරේ අයවැය පදනම ලෙස සලකන අතර, වර්තමාන මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යෑම සඳහා, පදනම් කරගත් අයවැයට අවශ්‍ය පරිදි කිසියම් ප්‍රතිශතයක් එකතු කිරීම මගින් ගැළපුම් සිදු කරනු ලබයි.

6 පෙර අයවැයෙන් පටන්ගෙන අවශ්‍යතාවයන්ට සරිලන ගැළපුම් සිදු කිරීම වෙනුවට අලුත් කාලපරිච්ඡේදයක් හෝ වසරක් සඳහා ශුන්‍ය පදනමින් පටන්ගෙන, සියලුම වියදම් සාධාරණීකරණය කිරීම හරහා අයවැයට එකතු කර ගැනීම ශුන්‍ය මූලක අයවැයකරණ ක්‍රමවේදයේ දී සිදු කරනු ලබයි.

අතර නියාමනයට හා බදුකරණයට අදාළ ඍජු ප්‍රවේශ, ප්‍රමාණවත් යටිතල පහසුකම් මෙන්ම යහපාලනයෙන් සමන්විත හිතකර ආයෝජන පරිසරයක් හරහා පහසුකම් සැලසිය යුතුය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ 2022 වසර සඳහා වූ තිරසාර සංවර්ධන ඉලක්ක ආයෝජන සිතියම (Sustainable Development Goals Investor Map - 2022) අනුව, ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති අංශය ඉහළ ආයෝජන විභවතාවක් ඇති ප්‍රමුඛතා අංශයක් ලෙස පිළිගෙන ඇති අතර, එමගින් පුනර්ජනනීය බලශක්ති අංශයේ ආයෝජන දිරිමත් කිරීම අරමුණු කරගත් පියවර සඳහා වන අවශ්‍යතාව ද අවධාරණය කෙරේ. මේ සඳහා, විදුලිය නිපදවන්නා සහ මිලදීගන්නා ඍජුව සම්බන්ධ වන මිලදී ගැනීමේ ගිවිසුම් පුද්ගලික අංශය සඳහා සක්‍රීය කිරීම සහ විදුලිය පාරිභෝගිකයින්ට තම ප්‍රදේශයෙන් පිටත විදුලිය උත්පාදනය කරන පෞද්ගලික උත්පාදකයින්ගෙන් විදුලිය ලබා ගැනීමේ පහසුකම (power wheeling) ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය වෙත අවධානය යොමු කළ යුතු අතර, එමගින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව අංශය සඳහා වෙළඳපොළ සාධක මත තීරණය කෙරෙනු ලබන මිල ගණන් සහතික කෙරෙනු ඇත. මේ අතර, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල වැඩිදියුණු කිරීම තුළින් විදුලිබල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, විදුලිබල උත්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම, සුහුරු ජාල කළමනාකරණය සහ විදුලිබලය ගබඩා කිරීමේ විසඳුම් වැඩිදියුණු කිරීම හරහා විදුලිබල හානිය අවම කිරීම සහ විදුලි සැපයුමේ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම අවශ්‍ය වේ. මේ අතර, වාහනවල ඉන්ධන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා දෙමුහුන් තාක්ෂණ ආදිය හඳුන්වා දීම තුළින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ යුතු අතර, ප්‍රවාහන ක්ෂේත්‍රයට පිරිසිදු බලශක්ති ප්‍රභව යොදා ගැනීම සඳහා විකල්ප සෙවීම ද සිදු කළ යුතුය. තවද, ප්‍රවාහන ක්ෂේත්‍රයේ බලශක්ති පරිභෝජනය අවම කිරීම සඳහා පොදු ප්‍රවාහන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කෙරෙන ප්‍රතිපත්තිමය ප්‍රවේශයක් අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව, නාගරික ප්‍රදේශවල පවතින වාහන තදබදය හේතුවෙන් සිදුවන බලශක්ති හානිය අවම කිරීම අරමුණු කර ගනිමින් පොදු ප්‍රවාහන ක්‍රම සහ මාර්ග යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ පුළුල් කිරීම කළ යුතුය. එමෙන්ම, බලශක්ති කාර්යක්ෂමතාව හා සංරක්ෂණ පියවර පිළිබඳ මහජනතාව අතර දැනුම්වත්භාවය වැඩි කිරීම සහ ගෘහ, ව්‍යාපාර හා කර්මාන්තශාලාවල බලශක්ති කාර්යක්ෂමතා ප්‍රමිති ක්‍රියාත්මක කිරීම තුළින් බලශක්තිය කාර්යක්ෂමව භාවිතා කිරීම ප්‍රවර්ධනය කෙරෙනු ඇත. සමස්තයක් ලෙස, අවහිරතාවකින් තොරව බලශක්තිය ලබා ගැනීමේ හැකියාව ඉහළ නැංවීම සහ වැඩිවන බලශක්ති ඉල්ලුම පාරිභෝගිකයින්ට දැරිය හැකි මිලකට ලබා දීම තුළින් බලශක්ති සුරක්ෂිතතාව සාක්ෂාත් කරගත හැකිය. ඊට අදාළව, සැපයුමේ සහ ඉල්ලුමේ සිදුවන හදිසි වෙනස්වීම්වලට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම සඳහා බලශක්ති අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම නුදුරු කාලය තුළ දී සිදු කළ යුතු ය. එසේම, දිගු කාලීනව ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයට අමතරව, ආර්ථික සංවර්ධනය සහ පාරිසරික අවශ්‍යතාවලට සරිලන පරිදි බලශක්ති සම්පාදනයට අවශ්‍ය ආයෝජන දිරිගැන්වීම ද අත්‍යාවශ්‍ය වේ.

**රාජ්‍ය මූල්‍ය අංශයේ වගවීම ඉහළ නැංවීම සඳහා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය අධීක්ෂණය ශක්තිමත් කිරීම පිණිස ආයතනික සහ ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ සිදු කිරීම මෙන්ම නීති රීති බලාත්මක කිරීම ද අවශ්‍ය වේ.** දශක දෙකකට පමණ පෙර ශ්‍රී ලංකාව විසින් රාජ්‍ය මූල්‍ය නීති බලාත්මක කළ ද, එම නීතිවලට අනුගත නොවීම, පසුගිය රජයන් විසින් සිදු කරන ලද විචක්ෂණශීලී නොවන කළමනාකරණයට හේතු වී ඇත. එබැවින්, යථාර්ථවාදී ඉලක්ක සහිත අනිවාර්යයෙන් ම පිළිපැදිය යුතු රාජ්‍ය මූල්‍ය නීති හඳුන්වා දීම සඳහා ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ සිදු කිරීමට අවශ්‍ය වන අතර, එම නීතිවලට අනුකූල වීමේ දී ඒ සඳහා වගකිව යුතු බලධාරීන් ද හඳුනාගත යුතුය. ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ, බලාත්මක කිරීමට නියමිත නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් මුදල් අමාත්‍යාංශයේ සහ වියදම් සිදු කරන ආයතනවල කාර්යභාරය හා වගකීම් පැහැදිලි කෙරෙන අතර, තොරතුරු ලබා දීමේ සහ වගවීමේ අවශ්‍යතාවයන් ද එමගින් ස්ථාපිත කරනු ලබයි. මෙයට අමතරව, අයවැයෙන් වෙන් කර ඇති සීමාව තුළ වියදම් පවත්වා ගැනීමට පමණක් නොව, කාර්යක්ෂම බව සහ ඵලදායී බව ඉහළ නැංවීමට ද රජයේ ආයතන දිරිමත් කළ යුතුය. තවද, කාර්යසාධනය පදනම් කරගත් වගවීම සහ ඒ පිළිබඳ තොරතුරු මහජනයා වෙත හෙළිදරව් කිරීම රජයේ ආයතන සහ රජයේ නිලධාරීන් සඳහා හඳුන්වා දිය යුතු අතර විනිවිදභාවය ඉහළ නැංවීම, විශ්වාසනීයත්වය ඉහළ නැංවීම සහ යහපාලනයට සහාය වීම පිණිස විගණන කාර්යයන් තවදුරටත් ශක්තිමත් කළ යුතුය. තවද, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ, ජා.මූ. අරමුදලේ තාක්ෂණික සහාය ද ඇතිව, දූෂණයට එරෙහි එක්සත්

ජාතීන්ගේ සම්මුතියට අනුකූල වන පරිදි දූෂණ විරෝධී පනතක් හඳුන්වා දීමට නියමිතය. 2022 වසරේ දූෂණ සංජානන දර්ශකයේ [7] (Corruption Perception Index) රටවල් 180ක් අතරින් ශ්‍රී ලංකාව 101 වන ස්ථානයේ පසුවීමෙන් පැහැදිලි වන ආකාරයට, රට තුළ දූෂණය බහුල බවට ප්‍රචලිතව ඇති අදහස පිළිබඳව සැලකීමේ දී මෙවැනි පනතක් ගෙන ඒම ඉතාමත් ම සුදුසුය. දූෂණය පාලනය කිරීමේ ක්‍රියාමාර්ග සහ විනිවිදභාවය ඉහළ නැංවීමේ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම ද, ඵලදායී නොවන රාජ්‍ය වියදම් කපා හැරීමේ දී ඉතා වැදගත් වේ. එබැවින්, ඉදිරි කාලය තුළ රාජ්‍ය මූල්‍ය විචක්ෂණභාවය හා රාජ්‍ය මූල්‍ය අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා වන අඛණ්ඩ කැපවීම මෙන්ම දූෂණය පාලනය කිරීම සඳහා පියවර ගැනීම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග සඳහා මහජන සහයෝගය ලබා ගැනීමට සහ රාජ්‍ය මූල්‍ය අංශයේ සමස්ත තිරසරභාවය සහ විනය සහතික කිරීමට අත්‍යවශ්‍ය වේ.

**භාණ්ඩ හා සේවාවල නවීනත්වය වැඩිදියුණු කිරීම කෙරෙහි අපනයන අංශයේ ප්‍රතිපත්ති අවධානය යොමු කිරීම මගින් දේශීය අගය එකතු කිරීම සහ අපනයන තරගකාරීත්වය ශක්තිමත් කළ යුතුය.** 2022 වසරේ දී ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉහළම අපනයන ඉපැයීම් වාර්තා කළ ද, කලාපයේ සමාන ආර්ථිකයන් වාර්තා කළ අපනයන ආදායම් හා සැසඳීමේ දී එම ඉපැයීම් ඉතා සුළු අගයකි. කාලයක් මුළුල්ලේ නිෂ්පාදනයන්හි නවීනත්වයේ විශේෂ ප්‍රගතියක් නොපෙන්වීම සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම නිසා රටේ තරගකාරීත්වය අඩු වීම හේතුවෙන් ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා වෙළඳපොළ කොටස් අහිමි වෙමින් පවතී. අපනයන ආදායම් සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පවතින සාපේක්ෂ වාසි තවදුරටත් වැඩිදියුණු කිරීම හරහා ඉහළ ගුණාත්මක නිපැයීම, ගෝලීය වෙළඳපොළ තුළ තරග කිරීමට උපකාරී වේ. අපනයන කර්මාන්ත, අපනයනයන්හි ප්‍රමාණාත්මක අවශ්‍යතාවන් සපුරාලන අතරම, අපනයන විවිධාංගීකරණය, අගය එකතු කිරීම, සන්නාමකරණය සහ අපනයනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම ඉලක්ක කර ගත යුතුය. අපනයන ප්‍රවර්ධන ප්‍රතිපත්ති මගින් මැදි කාලීන සිට දිගු කාලීනව, නවෝත්පාදන ඉලක්ක කර ගත් පර්යේෂණ සහ සංවර්ධන (R&D) කටයුතුවල සහාය ඇතිව, අඩු නිෂ්පාදන පිරිවැයකින් ඉහළ අගය එකතු කිරීමක් සහිතව වැඩි දියුණු කළ ගුණාත්මක භාණ්ඩ අපනයනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. අපනයන අංශයෙහි නවෝත්පාදන හඳුනා ගැනීමටත්, සරල නිෂ්පාදනවල සිට සංකීර්ණ නිෂ්පාදන දක්වා පරිවර්තනය වීමටත් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වැඩිදියුණු කළ යුතුය. එසේම, ශ්‍රී ලංකාව කලාපීය සහ ගෝලීය සැපයුම් දාමයන් වෙත පිවිසීමේ සහ නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි වෙළඳපොළ කොටස් අත්පත් කර ගැනීමේ අරමුණින් සිය නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවිය යුතුය. මීට අමතරව, යෙදවුම්වල ගුණාත්මකභාවය අවසාන නිමැවුමේ ගුණාත්මකභාවය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන බැවින්, ආනයනික අමුද්‍රව්‍ය සඳහා තරගකාරී ලෙස ආදේශ කළ හැකි ද්‍රව්‍ය නිපදවන වක්‍ර අපනයනකරුවන්ට සහ දේශීය කර්මාන්ත සඳහා රජය විසින් දිරිගැන්වීම් ලබා දීම අවශ්‍ය වේ. තවද, මෑත වර්ෂවල කෘෂිකාර්මික අපනයනවල දක්නට ලැබෙන පහළ යෑමේ ප්‍රවණතාවය, ගෝලීය වශයෙන් තරගකාරී වීමට කෘෂිකාර්මික නිෂ්පාදිතයන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. මේ සම්බන්ධයෙන්, ගෝලීය වෙළඳපොළ තුළ ශක්තිමත් ගුණාත්මක සහ සන්නාම වාසි ඇති කර ගැනීම සඳහා අපනයන ඉලක්ක කරගත් කලාපයට විශේෂිත වූ කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. පර්යේෂණ සහ සංවර්ධන හැකියාව වැඩිදියුණු කිරීමට සහ අඩු පිරිවැයක් යටතේ නිෂ්පාදනය ඉහළ නැංවීම හරහා පරිමාණානුකූල පිරිමැසුම් ලබා ගැනීම සඳහා ගොවි සමිති (farmer societies) ක්‍රමවේදයන් භාවිත කළ හැක. ගොවි මට්ටමේ සහභාගීත්වය සමඟ ඉහළ අස්වැන්නක් සහ වඩා ගුණාත්මකභාවයකින් යුත් බෝග වර්ග වැඩිදියුණු කිරීම සඳහා ජාතික මට්ටමේ කෘෂිකාර්මික පර්යේෂණ ක්‍රමෝපාය සංවර්ධනය කිරීම අවශ්‍ය විය හැකිය. කෘෂිකාර්මික නිෂ්පාදිතවල පසු අස්වනු හානි අවම කිරීම සඳහා ප්‍රධාන කෘෂිකාර්මික කලාපවල වාණිජ සැපයුම් සහ ගබඩා පහසුකම් ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය කළ යුතුය. තවද, දියුණු අපනයන වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කරන අතර, ආයතනික ගුණාත්මකභාවය ඉහළ නැංවීම, නිදහස් හා ස්ථාවර වෙළඳ ප්‍රතිපත්ති පවත්වාගෙන යාම, අපනයන අංශයට විදේශීය සෘජු ආයෝජන ගලා ඒම ප්‍රවර්ධනය කිරීම, අපනයනයන්හි ගුණාත්මක බව ඉහළ නැංවීමේ හැකියාව ඇති මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා හිතකර දේශීය පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි ප්‍රතිපත්ති මගින් අවධානය යොමු කළ යුතුය.

7 දූෂණය අවම මට්ටමක ඇති රට දූෂණ සංජානන දර්ශකයේ පළමු ස්ථානයට පත් වේ.

**ජාතික වෙළඳ ප්‍රතිපත්තිය සැලකිය යුතු ආකාරයෙන් නැවත දිශානතිගත කිරීම තුළින් අපනයන කරා වඩාත් කේන්ද්‍රගතවීමටත් සහ ආනයන මත අධික ලෙස යැපීමෙන් ඉවත් වීම සඳහාත් අවශ්‍ය ව්‍යුහාත්මක ගැළපීම් සඳහා කැපකිරීම් කිරීමට රටට අවශ්‍ය වේ.** ශ්‍රී ලංකාව පරිභෝජන හා ආයෝජන අවශ්‍යතා සඳහා සහ ප්‍රධාන අපනයන හා දේශීය නිෂ්පාදනය සඳහා අවශ්‍ය යෙදවුම් සඳහා ආනයන මත දැඩි ලෙස රඳා පවතී. 2009 වසරේ සිට ආනයන වියදම දෙගුණයකට ආසන්න ප්‍රමාණයකට වැඩි වී ඇත. මේ අතර, සාම්ප්‍රදායික කෘෂිකාර්මික අපනයනවලට සහ ඇඟලුම් වැනි අඩු එකතු කළ අගයක් සහිත කාර්මික අපනයනවලට සීමා වූ අපනයන පැසෙහි සංයුතිය දශක ගණනාවක් පුරා එක ලෙසම පැවතුණි. 2018 වසරේ ජූලි මාසයේ දී ක්‍රියාත්මක කරන ලද 2018-2022 යන කාලපරිච්ඡේදය සඳහා වන සංශෝධිත ජාතික අපනයන ක්‍රමෝපාය, නවෝත්පාදන සහ ආයෝජන මගින් මෙහෙයවනු ලබන අපනයන කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම අරමුණු කර ගෙන ඇත. සේවා පහසුකම්, වෙළඳ තොරතුරු හා ප්‍රවර්ධනය, ජාතික තත්ත්ව යටිතල පහසුකම් සහ නවෝත්පාදනය හා ව්‍යවසායකත්වය තුළින් සියලුම අපනයන අංශ සඳහා වන ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම එමගින් අපේක්ෂා කරන ලදී. ජාතික අපනයන ක්‍රමෝපායෙහි විශේෂිත අරමුණ වූයේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (IT/BPO) සහ පුද්ගල සුවතාවය හා සබැඳුණු සංචාරක කර්මාන්තය (Wellness tourism) ඇතුළුව අපනයන අංශ හයක නවෝත්පාදනය සහ විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීමයි. අපනයන කර්මාන්ත සඳහා ශ්‍රම සැපයුම හා සම්බන්ධ ගැටලු විසඳීම, ආනයන ප්‍රතිපත්තිවල ස්ථාවරභාවය, පැහැදිලි හා විනිවිදභාවයෙන් යුත් බදු ප්‍රතිපත්ති, ශ්‍රී ලංකාව වෙත ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා විදේශීය රජයන් වෙත යොමුවීම සහ තරුණ පරපුර අතර ව්‍යවසායකත්වය වර්ධනය කිරීම වෙළඳ අංශය සම්බන්ධයෙන් කඩිනමින් සැලකිය යුතු ප්‍රමුඛතා අතර වේ. ගෙවුම් තුලන අර්බුද මධ්‍යයේ ආනයන සීමා කිරීමට සහ අත්හිටුවීමට ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වූ නමුත්, ආනයන මත යැපීම අඩු කිරීමෙන් සහ ආර්ථිකය තුළ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමෙන් අනාගතයේ දී එවැනි තාවකාලික පියවර වළක්වා ගත හැකිය. සුදුසු අතරමැදි යෙදවුම් සඳහා පසු මෙහෙයුම් ඒකාබද්ධ කිරීම, පැහැදිලිව හඳුනාගත් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ දේශීය ආදේශන මගින් අධෛර්යමත් කිරීම, ආනයන සඳහා ලබා දී ඇති සහන ඉවත් කිරීම සහ වෙළඳපොළ මගින් තීරණය වන නම්‍යශීලී විනිමය අනුපාතයක් පවත්වා ගැනීම මෙහිදී වැදගත් අංගයන් වේ.

**දිගින් දිගටම බලයට පත් සෑම රජයක් විසින්ම රටේ සංවර්ධන උපායමාර්ගවල මූලික ප්‍රමුඛතාවය ලෙස විදේශීය සෘජු ආයෝජන හඳුනාගෙන තිබුණ ද, පසුගිය දශක කිහිපය තුළ විදේශීය සෘජු ආයෝජනවල ප්‍රමාණය සහ වර්ධනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අත්දැකීම් පිළිබඳව සෑහීමකට පත් විය නොහැක.** 2010 වසරේ සිට විශාල ලෙස බදු විරාම ලබා දී තිබියදීත්, සෘජු ආයෝජන ව්‍යවසායයන් සඳහා ලැබුණු විදේශීය ණය ද ඇතුළුව, විදේශීය සෘජු ආයෝජන ලෙස සාමාන්‍යයෙන් වසරකට ශ්‍රී ලංකාවට ලබාගත හැකි වූයේ ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.2ක් පමණි. එසේම, කලාපයේ අනෙකුත් රටවල් හා සසඳන විට, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස විදේශීය සෘජු ආයෝජන ඉතා පහළ මට්ටමක පවතී. මීට අමතරව, ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්තමාන තත්ත්වය සැලකූ විට, ආර්ථික ක්‍රියාකාරකම්වලට සිදුවන බාධා, ඉහළ සමාගම් ආදායම් බදු අනුපාත, ශ්‍රමය සහ උපයෝගිතා ඇතුළු ඉහළ නිෂ්පාදන පිරිවැය, පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය, පහසුවෙන් ලබාගත හැකි සුදුසු ඉඩම් නොමැතිකම, නිලධාරිවාදී හා බහු අනුමැතීන් අවශ්‍ය වන ක්‍රියාපටිපාටි සහ වංචා දූෂණවලට ඇති ඉඩකඩ හේතුවෙන් සමාගම්වලට ඔවුන්ගේ ප්‍රධාන සමාගම් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීමට ඇති දිරිගැන්වීම් ඉතා අල්ප වේ. මෙම අංශයට අදාළ ආයතනික ව්‍යුහය විධිමත් කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය සඳහා වන යෝජිත ඒකාබද්ධ කිරීම වැනි රජයේ මෑතකාලීන ප්‍රයත්න, ඇගයීමට ලක් කළ යුතු පියවර වේ. එහෙත්, ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සහ කාර්යක්ෂම ලෙස අනුමැතිය ලබා ගැනීමට එවැනි අධිකාරීන් බල ගැන්වීම අත්‍යවශ්‍ය වේ. මේ අතර, බලශක්ති සුරක්ෂිතතාව, ආහාර සුරක්ෂිතතාව සහ අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත වැනි සමස්ත ආර්ථිකයට පුළුල් ලෙස බලපෑම් ඇති කරනු ලබන උපාය මාර්ගික ආයෝජන ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍යන සම්පාදනය කිරීම සඳහා මිත්‍ර රටවල් සමග සමීපව කටයුතු කිරීම ආයෝජන අවස්ථා ගවේෂණය කිරීමට උපකාරී වනු ඇත. රටේ ආයෝජන අවශ්‍යතා පැහැදිලිව හඳුනාගෙන අනාගත ආයෝජකයින් ප්‍රවර්ධනය කළ යුතු අතර, එක් ස්ථානයකින් සියලු කටයුතු සිදු කරගැනීමේ හැකියාව (one-stop shop approach) සහිත ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් එවැනි ආයෝජන අනුමත

කිරීම් සහ ක්‍රියාත්මක කිරීම් කඩිනම් කළ යුතුය. මේ සම්බන්ධයෙන්, 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී ආයෝජන මණ්ඩලය යටතේ ආයෝජක පහසුකම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම ප්‍රශංසනීය මුල පිරීමකි. ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ ආයෝජකයින්ගේ පහසුව සඳහා අන්තර් සම්බන්ධතා සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම හරහා ආයෝජකයන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීමට ආයෝජක පහසුකම් මධ්‍යස්ථානය කැපවී සිටී. වගකීම් පදනමකින් නොවන ආයෝජන ප්‍රවාහ ඉදිරි කාලපරිච්ඡේදය තුළ ආකර්ෂණය කරගැනීම ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවන සඳහා වූ උපායමාර්ගයෙහි එක් වැදගත් අංගයක් විය යුතුය.

**ශ්‍රී ලංකාව සංචාරක ව්‍යාපාරය වේගවත් ලෙස ප්‍රවර්ධනය කරන කාලයක දී සංචාරක පැමිණීම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග සහ සංචාරක ඉපැයීම් ග්‍රහණය කර ගැනීම සඳහා විධිමත් ජාලයක් ඇති කිරීම කඩිනමින් අවශ්‍ය වේ.** විදේශ විනිමය ඉපැයීම් සඳහා ශ්‍රී ලංකාව සංචාරක ක්ෂේත්‍රය මත දැඩි ලෙස රඳා පවතින අතර, 2011 වසරේ සිට මුහුණ දෙන විශාල වෙළඳ ගිණුමේ හිඟයෙහි පීඩනය අර්ධ වශයෙන් සමනය කර ගැනීමට සංචාරක ඉපැයීම් භාවිත කරයි. සංචාරක පැමිණීම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පවතින බැවින් සංචාරක ඉපැයීම්වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට රට උත්සාහ කළ යුතුය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විසින් සංචාරක කර්මාන්තයෙන් ලැබෙන විදේශ විනිමය පිළිබඳ ඇස්තමේන්තුව සම්පාදනය කරනු ලබන්නේ, හෝටල් මගින් හා සංචාරකයින් රටින් පිටවීමේ දී ගුවන්තොටුපළ තුළ සිදු කරන සමීක්ෂණයක් මගින් සපයා ගන්නා දත්ත මත පදනම්ව සංචාරකයෙකු ගත කරන සාමාන්‍ය ආගන්තුක රාත්‍රී සංඛ්‍යාව සහ සංචාරකයෙකු ශ්‍රී ලංකාවේ දිනකට සාමාන්‍යයෙන් කොපමණ මුදලක් වැය කරන්නේද යන්න මතය. සංචාරකයින් රටින් පිටවීමේ දී ගුවන්තොටුපළ තුළ සිදු කරන සමීක්ෂණය මගින් තීරණය කරනු ලබන සංචාරකයෙකුගේ දෛනික වියදම, කලාපයේ අනෙකුත් බොහෝ ජනප්‍රිය සංචාරක ගමනාන්තවලට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා අතර එමගින් එහි නිරවද්‍යතාවය පිළිබඳ සැක මතු වී ඇත. එසේම, අනෙකුත් බොහෝ සාධක අතරින් විවිධ සංචාරක කාණ්ඩ, නවාතැන් පහසුකම් වර්ග, සංචාරකයින් පැමිණෙන රටේ ස්වභාවය ආදිය අනුව සංචාරකයෙකුගේ දෛනික වියදම් වෙනස් විය හැකිය. එබැවින්, සංචාරක කර්මාන්තයෙහි නියුතු එක් එක් පාර්ශ්වකරුවන්ගේ ඉපැයීම් නිවැරදිව හඳුනා ගැනීමට සුදුසු තොරතුරු ජාලයක් අත්‍යවශ්‍ය වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි තාක්ෂණික මඟපෙන්වීම යටතේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ සහයෝගයෙන් ස්ථාපනය කරන සංචාරක සැටලයිට් ගිණුම්කරණය (Tourism Satellite Accounting) ශ්‍රී ලංකාවේ තවමත් සංවර්ධනය වෙමින් පවතින අතර, එමගින් සංචාරක ඉපැයීම් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට සහාය විය හැකිය. තවද, බොහෝ සංචාරකයින් එයාර් බී ඇන්ඩ් බී (Airbnb), අගොඩා (Agoda) සහ බුකින් ඩොට් කොම් (Booking.com) වැනි විදේශීය වෙබ් අඩවි හරහා තම නවාතැන් වෙන්කරවා ගන්නා බැවින් එම වෙබ් අඩවි සංචාරක තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇත. මේ අතර, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරකයින් සඳහා නවාතැන් වෙන්කරවා ගැනීමට සහ සංචාරක සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහා සංචාරක යෙදුමක් (tourism travel app) සංවර්ධනය කරමින් පවතී. කෙසේ වෙතත්, සංචාරකයින් නවාතැන් පහසුකම් වෙන් කිරීමේ දී, විශේෂයෙන්ම ගෙවීම් සිදු කිරීම, පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සහ ඉහළ වට්ටම් ලබා ගැනීම සඳහා ජනප්‍රිය යෙදුම් විශ්වාස කරයි. එම නිසා, ජාත්‍යන්තර වෙබ් අඩවි හා යෙදුම් මෙන්ම මෙම වෙබ් අඩවි හා යෙදුම්වල ලැයිස්තුගත කර ඇති අවිධිමත් නවාතැන් සපයන්නන්ගෙන් නවාතැන් පහසුකම් වෙන්කරවා ගැනීම් හරහා රටට විදේශ විනිමය ගලා ඒම සහතික කිරීමේ ක්‍රමවේද සොයා ගන්නා අතරම, දේශීය වශයෙන් නවාතැන් සහ ප්‍රවාහන පහසුකම් වෙන්කරවා ගැනීමේ වෙබ් අඩවි සහ යෙදුම් සංවර්ධනය කිරීම අවශ්‍ය වේ. තවද, සංචාරක කර්මාන්තයට සම්බන්ධ සියලුම පාර්ශ්වයන්හි විදේශ විනිමය ඉපැයීම් වාර්තා ලබාගෙන ඒවා බැංකු පද්ධතියට ඇතුළත් කිරීමට නිසි යාන්ත්‍රණයක් අවශ්‍ය වන අතර, සංචාරක අංශයේ ඉහළ මට්ටමේ අවිධිමත් බව තුරන් කිරීම සඳහා ලියාපදිංචි නොකළ ආයතන පද්ධතියට ඇතුළත් කිරීම කඩිනම් කළ යුතුය.

**වෘත්තිකයන් සහ පුහුණු ශ්‍රමිකයන් විශාල වශයෙන් සංක්‍රමණය වීම හේතුවෙන් ඇතැම් කර්මාන්තවල ශ්‍රම හිඟයක් මෙන්ම ඵලදායීතාවේ සැලකිය යුතු පහළ යෑමක් ඇතිවිය හැකි අතර, එය රට යථා තත්ත්වයට පත් වෙමින් සිටින අවධිය තුළ සහ ඉන්පසු කාලය තුළ රටේ ආර්ථික වර්ධනයට සැලකිය යුතු ලෙස බලපානු ඇත.** උග්‍ර ආර්ථික අර්බුදය හේතුවෙන් වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, බැංකුකරුවන් සහ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් වැනි වෘත්තීය සුදුසුකම් ලත් පිරිස් විශාල වශයෙන් විදේශගත වී ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා

නියුක්ති කාර්යාංශයේ සංඛ්‍යා ලේඛනවලට අනුව, විදේශ රැකියා සඳහා ලියාපදිංචි වූ පිටත්ව යෑම් සංඛ්‍යාව 2015-2019 අතර වාර්ෂික සාමාන්‍යය වන 226,510ට සාපේක්ෂව 2022 වසරේ දී 311,056ක් දක්වා සියයට 37කින් වැඩි වී ඇති අතර, වෘත්තීය සංක්‍රමණිකයන්ගේ අනුරූප ඉහළ යෑම සියයට 87ක් ඉක්මවා ඇත. නිල සංඛ්‍යාලේඛන සීමිත වුව ද, රැකියා සඳහා පිටත්වන තාවකාලික සංක්‍රමණවලට අමතරව ස්ථිර වශයෙන් මානව ප්‍රාග්ධන සංක්‍රමණය වීම් 2022 වසරේ සිට කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පවතින සංඛ්‍යාලේඛන මගින් තවදුරටත් අනාවරණය වන පරිදි, වෘත්තීය සංක්‍රමණ, සමස්ත ශ්‍රම සංක්‍රමණවල ප්‍රතිශතයක් ලෙස, සාමාන්‍ය වශයෙන් සියයට 20කට වැඩි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින්, පශ්චාත් යුධ සමයේ ක්‍රමානුකූලව ඉහළ යමින් පවතී. මෙමගින් ශ්‍රී ලංකාවේ බුද්ධිගලනය වත්මන් ආර්ථික අර්බුදයට බොහෝ කලකට පෙර සිට සිදුවන බව පෙනී යයි. වත්මන් තත්ත්වය තුළ, ශ්‍රී ලාංකිකයන්ගේ සංක්‍රමණය වීම සඳහා ආර්ථිකය සංකෝචනය වීම හේතුවෙන් ආර්ථික හා මූල්‍ය අවිනිශ්චිතතා මධ්‍යයේ මූර්ත වැටුප් පහළ යෑම සහ ජීවන තත්ත්වය පහත වැටීම හේතු වී ඇත. සමාජ ආර්ථික තත්ත්ව පිරිහීම සඳහා සෞඛ්‍යය සේවා, නීති ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය පරිපාලනය, පොදු ප්‍රවාහනය ආදී අංශවල ආයතනික යටිතල පහසුකම් දැඩි ලෙස දුර්වල තත්ත්වයට පත්කිරීමට හේතු වූ දිගු කාලීන ව්‍යුහාත්මක ගැටලු ද හේතු වී ඇත. සේවා නියුක්තිකයින් විශාල වශයෙන් රටින් සංක්‍රමණය වීම මගින් ව්‍යාපාර කටයුතු දුර්වල කෙරෙන අතර එමගින් ප්‍රවීණයින් අහිමි වීම හේතුවෙන් නව සේවකයින් අඛණ්ඩව පුහුණු කිරීමේ අවශ්‍යතාවයක් ඇති කරනු ලබයි. ඒ සඳහා සැලකිය යුතු කාලයක් හා සම්පත් අවශ්‍ය වන අතර එය කෙටි කාලීනව ධාරිතාවය හා නිමැවුම අහිමි වීමට හේතු වේ. නව සේවකයින් බඳවා ගනිමින් පුහුණු කිරීම සඳහා දැරීමට සිදුවන සැපයුම් පිරිවැය එම සේවකයින් ප්‍රශස්ත මට්ටමකට පුහුණු කරන තෙක් නිෂ්පාදිතය අහිමි වීමේ පිරිවැයෙන් සියයට 20කට වඩා ඉක්මවන බව ඇතැම් අධ්‍යයන මගින් පෙන්වා දී ඇත.[8] විශේෂයෙන්ම, සමස්ත වයස්ගත ජනගහනය පිළිබඳ සලකා බැලීමේදී පුහුණු ශ්‍රමිකයන් විශාල වශයෙන් සංක්‍රමණය වීම හේතුවෙන්, රටේ ඵලදායීතාව අහිමි වීමෙන් සැලකිය යුතු අන්දමේ දිගු කාලීන බලපෑම් ඇති විය හැකිය. පර්යේෂණවලට අනුව, බුද්ධිගලනය හේතුවෙන් ඇතිවන සම්බන්ධතා දියුණුවීම, නිපුණතා හුවමාරුව සහ විදේශීය ප්‍රේෂණ ඉහළ යෑම රටකට ධනාත්මකව බලපායි.[9] කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වය තුළ බුද්ධිගලනය මගින් ඇති කරන අයහපත් ප්‍රතිඵල එවැනි ප්‍රතිලාභවලට වඩා වැඩි විය හැකිය. මෑතක දී සංක්‍රමණය වූ බොහෝ පුද්ගලයන්, සැලකිය යුතු ව්‍යවසායකත්ව හැකියාවක් ඇති ජාත්‍යන්තරව රැකියා කළ හැකි සහ ඉහළ සුදුසුකම්ලත් පුද්ගලයන්ය. එබැවින් ඇතැම් අවස්ථාවල දී, ඔවුන්ගේ සංක්‍රමණය වීම් අපනයන ව්‍යාපාර ඇතුළුව සමස්ත ව්‍යාපාර ප්‍රතිස්ථාපනය කිරීම හෝ වසා දැමීම සඳහා හේතු විය හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එවැනි සංක්‍රමණයවීම්වල ආර්ථික පිරිවැය, අදාළ පුද්ගලයන්ගේ සෘජු දායකත්වය අහිමි වීමෙන් ඇතිවන අහිතකර ප්‍රතිඵල ඉක්මවිය හැකිය. වෘත්තිකයන් හිඟ වීම හේතුවෙන් නිපුණතා මට්ටම් පහළ ගොස් බොහෝ ආයතනවල අඩු මට්ටමක පවතින කාර්යක්ෂමතාව තවදුරටත් දුර්වල වීම මගින් ඉදිරි කාලපරිච්ඡේදය තුළ රාජ්‍ය අංශය කෙරෙහි බහුවිධ බලපෑම් ඇති කළ හැකිය. රාජ්‍ය සේවකයන්ට විදේශ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට ඉඩ සැලසීම වැනි රාජ්‍ය අංශයේ මෑත කාලීනව හඳුන්වා දී ඇති වෙනස්කම් මගින් මෙම ගැටලු තවදුරටත් උග්‍ර විය හැකි නමුත් එම ගැටලු සංක්‍රමණික පිරිස් රැකියාව සිදු කරන ලද ආයතනය, නිපුණතා මට්ටම සහ ප්‍රවීණත්වය අනුව සැලකිය යුතු ලෙස වෙනස් විය හැකිය. මෙම ශ්‍රමිකයන්ගේ දායකත්වය අහිමි වීම හේතුවෙන් දැරීමට සිදුවන ආර්ථික පිරිවැයට අමතරව අධ්‍යාපනය සහ සෞඛ්‍යය සේවා නොමිලේ ලබාදීම සඳහා සිදු කරන ලද ආයෝජනවලින් ප්‍රමාණවත් ප්‍රතිලාභයක් නොලැබීම හේතුවෙන් රටට සැලකිය යුතු අලාභයක් සිදු වේ. බොහෝ අංශවල දුර්වලතා පැවතිය ද විශ්වවිද්‍යාල මට්ටම දක්වා සිය පුරවැසියන්ට නොමිලේ අධ්‍යාපනය ලබා දෙන ලෝකයේ සීමිත රටවල් කිහිපයක් අතර ශ්‍රී ලංකාව ද සිටී. කෙසේ වෙතත්, මෙම සුවිශාල ආයෝජනයේ පූර්ණ ප්‍රතිලාභ රටට ලබා ගැනීමට නොහැකි වී ඇති අතර, ඒ සඳහා බුද්ධිගලනය ද ප්‍රධාන සාධකයක් වී ඇත. මෙම ගැටලු මධ්‍යයේ ඇතැම් අංශ විසින් සිය සේවකයන් ආයතනය තුළ රඳවා තබා ගැනීම සඳහා වැටුප් වැඩිකිරීම සහ නම්‍යශීලී රැකියා තත්ත්ව, බදු බර අඩුකිරීම සඳහා මුදල් නොවන ප්‍රතිලාභ ලබා දීම, උද්ධමනයට අනුරූපව වැටුප් වැඩි කිරීම සහ එ.ජ. ඩොලරයට සාපේක්ෂව වැටුප් ලබා දීම

8 Oxford Economics, (2014). The cost of brain drain: understanding the financial impact of staff turnover, February [Online] (Accessed 22 March 2023).

9 Docquier, F. and Rapoport, H., (2012). Globalization, brain drain, and development. Journal of Economic Literature, Vol. 50, No. 3.; Gibson, J. and McKenzie, D., (2012). The economic consequences of 'brain drain' of the best and brightest: Microeconomic evidence from five countries. The Economic Journal, Vol. 122, No. 560.

ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ ලබාදීම වැනි කෙටි කාලීන ක්‍රියාමාර්ග කිහිපයක් අනුගමනය කර ඇත. පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතිවන ගැටලු විසඳීම සඳහා එවැනි කෙටි කාලීන ක්‍රියාමාර්ග සහාය විය හැකිය. කෙසේ වෙතත්, තිරසාර වර්ධනයක් ඇති කිරීම ඇතුළුව ජීවන තත්ත්වයට බලපාන ආර්ථිකයේ දිගු කාලීන ව්‍යුහාත්මක දුර්වලතා නිවැරදි කිරීම, පසුගිය වසර තුළ වේගවත් වූ බුද්ධිගලනය විශාල වශයෙන් ඉහළ යෑම අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය වනු ඇත. තවද, සංක්‍රමණය වීම් මධ්‍යයේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වීමට අවශ්‍යතා ඇති අංශ සඳහා නුදුරු කාලීනව විදේශීය පුහුණු වෘත්තිකයන් සඳහා රට විවෘත කිරීමේ හැකියාව රජයට සොයා බැලිය හැකිය. එවැනි ප්‍රයත්න ඇතුළුව, විශේෂ ප්‍රතිලාභ යෝජනා ක්‍රම සහ සුදුසුකම්ලත් පුද්ගලයින්ට පර්යේෂණ සඳහා අරමුදල් ලබාදීම වැනි ඉලක්කගත ක්‍රියාමාර්ග තුළින් සංක්‍රමණික වෘත්තිකයින් නැවත මෙරටට පැමිණීමට පෙළඹවිය හැකිය.

**ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය මෑත කාලීනව පැවති සහ වර්තමානයේ පවතින ආර්ථික අර්බුදවල දී ආර්ථිකයේ වඩාත්ම බලපෑමට ලක් වූ අංශය වන අතර, සමස්ත ආර්ථික සංවර්ධනය සහ සුබසාධනය සඳහා එම අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ වැදගත්කම අවධාරණය කරයි.** 2019 වසරේ සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාර, 2020 සහ 2021 වසරවල දී කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම සහ ඉන් පසුව 2022 වසරේ දී ඇති වූ ආර්ථික අර්බුදය වැනි පසුගිය වසර කිහිපය තුළ අඛණ්ඩව පැවති අහිතකර සිදුවීම් හේතුවෙන්, ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා ප්‍රධාන වශයෙන් දායක වන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය අභියෝග රැසකට මුහුණ දුන්නේය. ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍ර තුළ ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වය කෙරෙහි, අවිනිශ්චිතතා මධ්‍යයේ ඉල්ලුම පහළ යෑම, ඉහළ උද්ධමනය සහ වේතන, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම, නිෂ්පාදන අමුද්‍රව්‍ය හිඟ වීම, විදුලිබලය සහ අනෙකුත් උපයෝගිතා සේවාවලට අවහිරතා ඇති වීම සහ මූල්‍ය පිරිවැය ඉහළ යෑම ආදී සාධක මගින් දැඩි ලෙස බලපෑම් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ජාතික නිෂ්පාදනය, රැකියා සහ ජීවනෝපායන් දැඩි බලපෑමට ලක් වූ අතර, මෙම දුෂ්කර කාලය තුළ දී ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සඳහා සහාය වීමට ගත යුතු ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය ඇති විය. මුදල් ප්‍රවාහ සඳහා පැවති අභියෝග තාවකාලිකව විසඳීමට, ලබා ගත් ණය සඳහා සහන සැලසීම මෙන්ම ණය ආපසු ගෙවීම සඳහා සහන කාලයක් ලබා දීම වැනි ක්‍රියාමාර්ග කිහිපයක් මෙම අංශය වෙත හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, අහිතකර මූල්‍ය හා ආර්ථික තත්ත්වයන්ට මුහුණදීම සඳහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ධාරිතාව සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට දිගු කාලීන විසඳුම් අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල මුදල් අවශ්‍යතා සලකා බැලීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස හඳුනාගෙන ඇති ණය ඇපකර ආයතනයක් (Credit Guarantee Institution) පිහිටුවීම එහි අවසන් අදියර වෙත ළඟා වී ඇති අතර එය කඩිනමින් ස්ථාපිත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ණය ඇපකර ආයතනය ක්‍රියාත්මක වූ පසු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මුදල් ලබා ගැනීමේ අවශ්‍යතා පිළිබඳ පවතින බාධා ඉදිරියේ දී සැලකිය යුතු ලෙස අඩු වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එම අංශය ආශ්‍රිත ණය අවදානම් බෙදීයෑමක් සිදු වන බැවින් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ණය ලබා දීම දිරිමත් කෙරෙනු ඇත. මීට අමතරව, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන ද සිය ණය ලබා දීමේ කටයුතුවල දී මෙම ව්‍යාපාර ප්‍රමුඛතා අංශයක් ලෙස හඳුනා ගනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් ද එම අංශය වෙත අරමුදල් ලැබෙනු ඇත. දේශීය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යවසායයන් බවට පත්වීමට සහාය වීම සඳහා අදාළ බලධාරීන් විසින් දැනට පවතින ජාත්‍යන්තර සබඳතා භාවිත කිරීම සහ නිදහස් වෙළඳ ගිවිසුම් තුළින් ප්‍රතිලාභ ලබා ගැනීම සිදු කළ යුතු අතර, එමගින් මෙම ව්‍යාපාර ගෝලීය අගය දාමයන්ට මෙන්ම ජාත්‍යන්තර වෙළඳාම සමඟ ද අනුකූල වීමට අවස්ථාව සැලසිය යුතුය. එවැනි අවස්ථා, එම ව්‍යාපාරවලට ගෝලීය ප්‍රමිතීන් කරා ළඟා වීමට උපකාරී වෙමින් රටට විදේශ විනිමය ගලා ඒම ඉහළ නැංවීමට ද දායක වනු ඇත. මෙම ප්‍රයත්නයට සහාය වීම සඳහා මූල්‍ය හා තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීමට පියවර ගත යුතු අතර, ජාත්‍යන්තර වෙළඳපොළ වෙත පිවිසීම සඳහා සහාය වන විද්‍යුත් වාණිජ්‍ය (e-commerce) තාක්ෂණ භාවිත කිරීම සඳහා අවශ්‍ය හැකියාව සහ ධාරිතාව ඉහළ නැංවීමට ද පියවර ගත යුතුය. එසේම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා රජය සහ අදාළ බලධාරීන් විසින් නීති, රෙගුලාසි සහ නිලධාරිවාදී ගැටලු අවම කිරීම මගින් ව්‍යවසායකත්ව පරිසරයක් සහ පසුබිමක් නිර්මාණය කළ යුතුය. ඉහත ක්‍රියාමාර්ග ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සිය ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට, අහිතකර සමාජ-ආර්ථික ප්‍රවණතා මගින් ඇති වන අභියෝග ජය ගැනීමට සහ

ශ්‍රී ලංකාවේ අභිවෘද්ධියට දායක වන අත්‍යවශ්‍ය ව්‍යාපාරික ආයතන ලෙස ගොඩනැගීමට උපකාරී වන නමුත්, එම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා සැමට එක ලෙස සලකා කටයුතු කිරීම ප්‍රශස්ත ක්‍රමවේදයක් නොවනු ඇත. ශක්‍යතාවයකින් තොර සහ ඵලදායීතාව අඩු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සහාය වීම අහිතකර මෙන්ම ඉහළ පිරිවැයක් ගන්නා බැවින් එවැනි ව්‍යාපාරවලින් වෙන් කර ආර්ථිකයට ධනාත්මක දායකත්වයක් දක්වන වර්ධන විභවතාවයක් සහිත බලපෑමට ලක් වූ ව්‍යාපාර හඳුනා ගැනීමට යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතු අතර, එමගින් ප්‍රතිලාභ සහිත ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සහාය වීම ඉලක්කගත කළ හැකිය. තවද, විශේෂයෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට අදාළව බුන්වත්භාවයට අදාළ නීති (insolvency laws) ස්ථාපිත කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

**ආනයනික භාණ්ඩ මිල ගණන්වල පසුගිය කාලයේ දී වාර්තා වූ අධික ඉහළ යෑම සමග සැසඳීමේ දී, එම මිල ගණන් විදේශීය වෙළඳපොළෙහි පහළ යන විට ඊට සාපේක්ෂව දේශීය මිල ගණන් පහළ යෑමෙහි පවතින ප්‍රමාදය ජීවන වියදම පහත හෙළීමට බාධා විය හැකිය.** පසුගිය වසරක පමණ කාලය තුළ, බනිජ තෙල්, ගෑස් සහ අනෙකුත් ආනයනික භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය කිහිපයක මිල ගණන් තියුණු ලෙස ඉහළ ගිය අතර ඒ සඳහා ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම පූර්ණ වශයෙන් හෝ ඊටත් වඩා වැඩියෙන් දේශීය මිල ගණන් වෙත ක්ෂණිකව සම්ප්‍රේෂණය වීම සහ දේශීය මුදල් අවප්‍රමාණය වීම හේතු විය. කෙසේ වෙතත්, ගෝලීය මිල ගණන් පහළ යෑම, සැපයුම් පිරිවැය අඩු වීම, මෙහෙයුම් පිරිවැය සංශෝධනය වීම සහ මෑත කාලීනව විනිමය අනුපාතිකයේ සිදු වූ වැඩිදියුණුවීම් සැලකිය යුතු කාල සීමාවක් ඉක්ම ගිය ද ආනයනික භාණ්ඩ හා සේවා මිල ගණන්වල ප්‍රමාණවත් පරිදි නිරූපණය වී නොමැත. පැරණි භාණ්ඩ තොගවල ඉහළ පිරිවැය, පෙර එකඟ වන ලද ගිවිසුම්, ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම් කෙරෙහි ඇති සීමිත විශ්වාසය හා ධනාත්මක ප්‍රවණතාවල තිරසාරභාවය පිළිබඳව පවතින අවිනිශ්චිතතා සහ ඉල්ලුම අඩු වීම හේතුවෙන් අහිමිවන ආදායම කිසියම් දුරකට පියවා ගැනීමට කටයුතු කිරීම වැනි සාධක හේතුවෙන් වෙළඳුන් මිල සංශෝධන සිදු කිරීමට පසුබට වන වාතාවරණයක් තුළ, රටෙහි ආර්ථික තත්ත්වයන් සම්බන්ධයෙන් වර්තමානයේ පවතින අවිනිශ්චිතතාව මෙම මිල ගණන් පහළ යෑමෙහි පවතින ප්‍රමාදය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය හැකිය. කෙසේ වෙතත්, සමස්ත ආර්ථික තත්ත්වයන්හි ස්ථායීතාව යථා තත්ත්වයට පත් වීමත් සමඟ, ආර්ථිකයට එහි පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීමට නම්, ආනයන ආශ්‍රිත ඇතැම් භාණ්ඩ හා සේවාවල ඉහළ ගිය මිල ගණන් පහළ දැමීම සිදු විය යුතුය. සුදුසු පරිදි මිල ගණන් සංශෝධනය වීමත් සමඟ ඉල්ලුම් තත්ත්වයන් ද සාමාන්‍යකරණය වනු ඇති බැවින්, එවැනි මිල සංශෝධන සියලු පාර්ශ්ව සඳහා ප්‍රතිලාභ ළඟා කරනු ඇත. මේ අතර, ගෝලීය මිල ප්‍රවණතා දේශීය ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය කරන මූලික මාර්ග යක් වන බලශක්ති මිල සංශෝධන මේ සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය සාධකයකි. ගෝලීය මිල ගණන් හා අනුකූල වන පරිදි දේශීය බලශක්ති මිල ගණන් සංශෝධනය කිරීම හා එම සංශෝධන වර්තමානයේ සිදු වන පරිදි විනිවිදභාවයකින් යුතුව සිදු කිරීම දේශීය බලශක්ති මිල ගණන් පිළිබඳ පුරෝකථන සිදුකිරීම පහසු කරවනු ඇත. මෙමගින් ව්‍යාපාරවලට සිය අනාගත පිරිවැය විශ්වාසයෙන් යුතුව සැලසුම් කිරීමට සහාය වන අතර, සමස්ත මිල මට්ටම් ස්ථායී කරමින් අනපේක්ෂිත උද්ධමන පීඩන අවදානම අවම කර උද්ධමන අපේක්ෂා කළමනාකරණය කිරීමට දායක විය හැකිය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ උද්ධමන ඉලක්ක සැකසීමට සහ ප්‍රතිපත්ති තීරණවලට සහාය වීමට වඩාත් සාර්ථක උද්ධමන පුරෝකථන සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම පුරෝකථන බොහෝ විට ගෝලීය මිල විචලන මත රඳා පවතින බැවින්, ප්‍රතිපත්ති දෝෂ අවම කිරීම සඳහා ගෝලීය මිල ප්‍රවණතා දේශීය මිල ගණන් තුළින් නිසි ලෙස පිළිබිඹු වීම ඉතා වැදගත් වේ. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, දේශීය බලශක්ති මිල සංශෝධනවලට සම්බන්ධ අධිකාරීන් සහ පාරිභෝගික කටයුතු අධිකාරිය වැනි අනෙකුත් නියාමන අධිකාරීන් ඇතුළු අදාළ බලධාරීන්, සාධාරණ ලෙස මිල ගණන් පහළ යෑම සිදුවන බව තහවුරු කිරීමට ආනයනික භාණ්ඩවල මිල ගණන් පිළිබඳව අවධානයෙන් සිටිය යුතුය. අපේක්ෂා කළ පරිදි උද්ධමනය ශීඝ්‍රයෙන් පහළ යෑමත් සමඟ ඉහළ ගිය ජීවන වියදම අඩු කිරීම සඳහා එවැනි මිල ගණන් දේශීය වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම උපකාරී වනු ඇත.

**උග්‍ර වූ ආර්ථික අර්බුදය හමුවේ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ සුබසාධනය මත ඇති කළ සැලකිය යුතු හා දිගු කාලීන බලපෑම් මගින්, වඩාත් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල සුබසාධනය සහතික කිරීම සඳහා ප්‍රතිපත්තිමය උපායමාර්ග නැවත සකස් කිරීමේ කඩිනම් අවශ්‍යතාව අවධාරණය කරයි.** ආර්ථික අර්බුදයෙන් පැන නැගුණු පීඩනය ජනතාවට විෂමකාර ලෙස බලපා ඇත. ජීවනෝපායන් අහිමි වීම සහ

උද්ධමනය ඉහළ යෑම ඇතුළු විවිධ පැතිකඩ හරහා සමාජයේ අවදානමට ලක්විය හැකි ජනගහනයේ ජීවන තත්ත්වය බොහෝ දුරට පිරිහී ඇත. ශ්‍රී ලංකාව සඳහා යාවත්කාලීන කරන ලද ජාතික දරිද්‍රතා රේඛාව සියයට 74ක වාර්ෂික වර්ධනයක් වාර්තා කරමින් 2022 වසරේ දී රුපියල් 13,777ක් දක්වා ඉහළ ගොස් ඇත. එක් පුද්ගලයෙකු සඳහා වන අවම මාසික වියදම ඉහළ නංවමින්, මූලික ආහාර, ඇඳුම් පැළඳුම් සහ නවාතැන් වැනි අත්‍යවශ්‍ය භාණ්ඩවල පිරිවැය වැඩි වී ඇති බව උද්ධමනයේ මෙම ඉහළ යෑම මගින් පිළිඹිබු කරයි. ලෝක ආහාර වැඩසටහනේ දුරස්ථ ගෘහස්ථ ආහාර සුරක්ෂිතතා සමීක්ෂණයට (The Remote Household Food Security Survey) අනුව, ජනගහනයෙන් සියයට 85ක් මුදල් ණයට ගැනීම, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා වියදම් අඩු කිරීම, ඉතුරුම් වියදම් කිරීම හෝ ගෙවීමට ඇති ණය මුදල් කල් දැමීම වැනි ජීවනෝපාය මත පදනම් වූ විකල්ප ආර්ථික උපායමාර්ග මත වෙත යොමු වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. සේවා නියුක්තියෙන් වැඩි කොටසක් අවිධිමත් අංශයේ රැකියාවල නියුතු වී සිටීම සහ ජනගහනයෙන් සියයට 14.3ක් දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන තත්ත්වයක් තුළ, අර්බුදයේ පීඩනය වඩාත් උග්‍ර විය හැකි අතර, එය ජනතාවගෙන් විශාල පිරිසක් දරිද්‍රතාවයට ඇද දැමීමට හේතු විය හැකිය. එසේම, වර්තමාන අර්බුදය, පරම්පරාවෙන් පරම්පරාවට දරිද්‍රතාවය වර්ධනය කරමින්, ජනගහනයේ කොටස් අතර සමාජ ආර්ථික විෂමතාවන් පුළුල් කරයි. පවුල් ඒකක දරිද්‍රතාවෙන් පෙළෙනවිට, රැස් කළ හැකි ධනය අවම වීම හේතුවෙන් එය මෙම පවුල් ඒකක වලට ලබාගතහැකි අධ්‍යාපන සහ සෞඛ්‍යය සේවාවන්ට අහිතකර ලෙස බලපාන අතර, එමගින් ඔවුන්ගේ අනාගත ආදායම් උත්පාදන හැකියාව ද නැවතත් බලපෑමට ලක් කරමින් දරිද්‍රතාවයේ විෂම චක්‍රයක් නිර්මාණය කෙරේ. මෙම පසුබිම තුළ, රජය විසින් පවතින සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් යටතේ සහනාධාර මට්ටම් ඉහළ නැංවීම හා විදේශීය මූල්‍ය නියෝජිත ආයතනවල සහාය ඇතිව මුදල් හා ප්‍රදාන ලබා දීම තුළින් ජනගහනයේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් ආරක්ෂා කිරීමට සහ දරිද්‍රතා මට්ටම් තවදුරටත් උග්‍ර වීම වැළැක්වීම සඳහා පියවර රාශියක් ගෙන ඇතත්, එම වැඩසටහන්වල දුර්වල ඉලක්ක කිරීම් හේතුවෙන් ඒවායෙහි කාර්යක්ෂමතාව අභියෝගයට ලක්ව ඇත. වසංගතය ආරම්භයේ සිටම, රටේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් මෙන්ම, දරිද්‍රතා මට්ටමට ආසන්නයේ සිටින කණ්ඩායම් ද ආදායම් අහිමි වීම් සමග දුෂ්කරතාවලට මුහුණ දුන් අතර, විශ්වසනීය හා යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතියක් නොමැති වීම හේතුවෙන් රජයේ ආධාර දැඩි ලෙස අවශ්‍ය දරිද්‍රතාවයෙන් පෙළෙන නව ජන කොටස් හඳුනා ගැනීමේ දී ඇති වන ප්‍රමාදයන්, පවතින සීමිත අරමුදල් සහ විදේශ ආධාර අකාර්යක්ෂම ලෙස වෙන් කිරීමට හේතු වී ඇත. එබැවින්, අපේක්ෂිත ප්‍රතිලාභීන් වෙත සහනාධාර නියමිත කාලයේ දී ළඟා වීම සහතික කිරීම සඳහා අවශ්‍යතා ඇති පුද්ගලයින්ගේ ලේඛනයක් සකස් කිරීම සඳහා සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය යටතේ දැනටමත් ක්‍රියාත්මක කර ඇති ක්‍රියාමාර්ග කඩිනම් කිරීම අත්‍යවශ්‍ය වේ. මේ අතර, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, අවශ්‍යතා ඇති පුද්ගලයින්ගේ ලේඛනයක් සකස් කිරීම සඳහා වන අඛණ්ඩ ප්‍රයත්නයන් සමග සුදුසුකම් තීරණය කිරීමේ නිර්ණායක වැඩිදියුණු කිරීම මෙන්ම, සුබසාධන ප්‍රතිලාභ ගෙවීමේ නව ක්‍රමයක් හඳුන්වා දීම ඇතුළුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වලට අදාළ ප්‍රතිසංස්කරණ සම්පූර්ණ කිරීමත් සමග ආර්ථික අර්බුදයේ බලපෑමෙන් සහ ප්‍රතිපත්තිමය ගැළපීම්වලින් අවදානමට ලක් වූ පුද්ගලයින්ට සහාය සැපයෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ යටතේ, 2023 වසරේ මැයි මාසය වන විට සුබසාධන ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය හා සුදුසුකම් තීරණය කිරීමේ නිර්ණායක සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම සහ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහනෙහි වියදම් මට්ටම පුළුල් කිරීමේ සැලැස්ම වැනි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට රජයේ ඇති කැපවීම, දිළිඳුකම පිටුදැකීම සඳහා දිගු කාලීන වශයෙන් අත්‍යවශ්‍ය වේ. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන අතර, දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවයෙන්, රජයේ මූලිකත්වය සහිත බහුආංශික ප්‍රතිපත්ති ප්‍රවේශයක් බලාත්මක කිරීම වැදගත් වන අතර, එමගින් ජනගහනයේ සියලුම කොටස් සඳහා අනාගත වර්ධන අපේක්ෂාවන්හි සාධාරණ ප්‍රතිලාභ ලැබීම සහතික කෙරේ. තවද, ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳව ගෘහස්ථ සමීක්ෂණයක් පැවැත්වීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවය ඇතිව රජය විසින් මෑතක දී ගන්නා ලද ක්‍රියාමාර්ග ප්‍රශංසනීය වන අතර, එමගින් පවුල් ඒකකයන්හි අවදානම් තත්ත්වයන් පිළිබඳ නිසි තක්සේරුවක් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. එවැනි දත්ත පද්ධති සහ සමීක්ෂණවල සොයා ගැනීම් මගින් දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල සඵලතාවය වර්ධනය කරන අතර, දත්තවල ගුණාත්මක බව, ප්‍රමාණවත් බව සහ කාලානුරූපී බව වැඩිදියුණු කිරීම තුළින් අනාගතයේ දී සාක්ෂි මත පදනම් වූ සහ

දැනුම්වත් ප්‍රතිපත්ති තීරණ ශක්තිමත් කිරීම මෙන්ම, පවතින සමාජ ආරක්ෂණ ජාල යාන්ත්‍රණ වැඩිදියුණු කිරීම ද වැදගත් වේ. මේ යටතේ, ඩිජිටල් බැංකු පද්ධති හඳුන්වාදීම, ගෙවීම් කාඩ්පත මෙන්ම ඩිජිටල් හඳුනාගැනීමේ විකල්ප ක්‍රමවේද සැපයීම මගින් සහනාධාර බෙදා හැරීමේ යාන්ත්‍රණය ඩිජිටල්කරණය කිරීම, සුබසාධන ගෙවීම්වල අකාර්යක්ෂමතා සහ සිදුවිය හැකි මුදල් අවභාවිතාවන් අවම කිරීමට සහාය වනු ඇත. තවද, රජයේ වියදම් සීමා කිරීම් මධ්‍යයේ, මෙම වියදම්වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා දරිද්‍රතාවය තුරන් කිරීමට දැනට පවතින උපායමාර්ග පිළිබඳ පරිපූර්ණ තක්සේරුවක් කිරීම අවශ්‍ය වේ. එවැනි තක්සේරුවක් මගින් රජය විසින් පෞද්ගලික අංශය සහ අදාළ බහුපාර්ශ්වික සංවිධාන සමඟ සහයෝගීතාවය අපේක්ෂා කළ හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහාය සැපයේ. දරිද්‍රතාවය තුරන් කිරීමේ ප්‍රයත්නයන් අතරට, කෘෂිකාර්මික අංශයේ අගය එකතු කිරීම් ප්‍රවර්ධනය කිරීම, අනාගත ආදායම් අවස්ථා සහතික කිරීම සඳහා දිළිඳු සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා වන අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රම වෙළඳපොළෙහි කාන්තා සහභාගීත්වය සවිබල ගැන්වීම මෙන්ම, ආදායම් මට්ටම් ක්‍රමයෙන් වැඩිදියුණු වීමත් සමග පවතින ආරක්ෂිත ජාල වැඩසටහන්වලින් ක්‍රමානුකූලව ඉවත් වීමට ඉඩ සලසන ප්‍රතිපත්ති රාමුවක් ඇති කිරීම වැනි අනෙකුත් විවිධාකාර මැදිහත්වීම් ද ඇතුළත් විය යුතුය.

**ශක්තිමත් ආර්ථික පුනර්ජීවනයක් සහ වර්ධනයක් කරා රට ගෙන යාමට සහාය වීම සඳහා ජාතික ප්‍රතිපත්ති සැලසුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ සියලු පැතිකඩ ආවරණය වන පරිදි එම සැලසුම් ක්‍රියාත්මක කිරීම වඩාත් ශක්තිමත්ව සිදු කළ යුතුය.** ආර්ථික හා මූල්‍ය තීරණ ගැනීමට මෙන්ම ව්‍යාපාර සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් සකස් කිරීමට බාධාවක් වන, එකිනෙකට ගැළපෙන ස්ථාවර ප්‍රතිපත්ති නොමැතිකම, රට තුළ දේශීය හා විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා වන ප්‍රධාන දුෂ්කරතාව වේ. අනුප්‍රාප්තික රජයන් බොහෝ විට පැවති ප්‍රතිපත්ති විශාල ලෙස වෙනස් කරන බැවින්, ප්‍රතිපත්ති ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්කම්වල බලපෑමෙන් මුළුමනින්ම තොර විය යුතුය. සියලු සම්පත් මනා ලෙස උපයෝජනය කෙරෙන ආර්ථිකයක් තුළ, ඵලදායිතාව වැඩිදියුණු කිරීම කෙරෙහි ජාතික ප්‍රතිපත්ති සැලසුම්කරණය මගින් අවධානය යොමු කළ යුතුය. එක් එක් ක්ෂේත්‍රවල රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම ප්‍රවීණයන් විසින් ජාතික සැලසුමක් සකස් කර එය ක්‍රියාත්මක කිරීමට පෙර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. අංශ අතර පවතින සහසම්බන්ධය සලකා උපාය මාර්ගික ප්‍රතිපත්ති පොකුරු නිර්මාණය කිරීම ද වැදගත් වේ. නිදසුනක් ලෙස, පෝෂණය හා බැඳුණු කෘෂිකර්මය සහ පශු සම්පත් නිෂ්පාදනය, ඉඩම් පරිහරණය මෙන්ම දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කිරීම පිළිබඳ අවධාරණය කෙරෙන පාරිසරික ප්‍රතිපත්ති යන ක්ෂේත්‍රවල සහසම්බන්ධය හඳුනාගෙන සකස් කෙරෙන ප්‍රතිපත්ති මගින් එම ක්ෂේත්‍රවල දිගු කාලීන ප්‍රශස්ත ප්‍රතිඵල අත් කර ගත හැකිය. එසේම, අපනයන ප්‍රතිපත්තිය විදේශ කටයුතු, ආයෝජන ප්‍රවර්ධන, කාර්මික හා කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට සම්බන්ධ විය යුතු අතර, ඛනිජ භාවිතා කිරීමේ ප්‍රතිපත්තිය, කාර්මික ප්‍රතිපත්තිය හා සම්බන්ධ විය යුතුය. අපනයන, ආයෝජන, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ විදේශ අරමුදල් සඳහා ඇතැම් ද්විපාර්ශ්වික හවුල්කරුවන් මත පමණ ඉක්මවා රඳා පැවතීම මගින් විදේශ ප්‍රතිපත්තිය, ජාතික ආරක්ෂාව සහ රටේ ස්වාධිපත්‍යය සම්බන්ධයෙන් සුවිශාල අවදානමක් ඇති විය හැකිය. අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වන පුද්ගලයන් ඒ සඳහා වගවීම තහවුරු කෙරන ස්වාධීන ප්‍රතිපත්ති නිරීක්ෂණ යාන්ත්‍රණයක් ද ක්‍රියාත්මක විය යුතුය.

**මෑත වසරවල දී රාජ්‍ය අංශය බැංකු පද්ධතිය මත රඳා පැවතීම අඛණ්ඩව පැවති අතර එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශයට ආයෝජන සිදු කිරීමට ඇති හැකියාව සීමා වීම, උද්ධමන පීඩන ඉහළ යෑම සහ මූල්‍ය පද්ධතියේ ගැටලු ඇති විය.** දුර්වල රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය මෙන්ම ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම් මධ්‍යයේ විදේශීය මූල්‍යන සඳහා ප්‍රවේශය සීමා වීම හේතුවෙන්, වසංගතය ආරම්භයේ සිට අයවැය හිඟය මූල්‍යනය කිරීමට සහ ණය සේවාකරණය සඳහා ප්‍රධාන වශයෙන් මහ බැංකුවෙන් සහ රජය සතු වාණිජ බැංකුවලින් අරමුදල් ලබා ගැනීමට රජයට සිදු විය. මේ අතර, ඉන්ධන සහ විදුලිය සම්බන්ධයෙන් විධිමත් මිල සූත්‍ර පදනම් කර ගනිමින් සංශෝධන ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම සහ අකාර්යක්ෂමතාව සහ අඩු ඵලදායිතාව වැනි දිගුකාලීන ගැටලු හේතුවෙන් රජය සතු වාණිජ ව්‍යාපාර මූල්‍යමය වශයෙන් දුර්වල වී ඇති අතර එමගින් රජයේ භාණ්ඩාගාරයට මෙන්ම සමස්ත බැංකු පද්ධතියටම පීඩන ඇති කර තිබේ. වසර ගණනාවක් පුරා එවැනි මූල්‍යන ලබා ගැනීම්වල ප්‍රතිඵලයක් ලෙස, බැංකු පද්ධතිය රාජ්‍ය අංශය වෙත නිරාවරණය වීම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර එමගින්

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට අවදානම් ඇති වී තිබේ. තවද, රාජ්‍ය අංශයේ ණය ගැනීමේ අවශ්‍යතා ඉහළ යෑම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික මත පීඩන ඉහළ ගොස් ඇති අතර රාජ්‍ය අංශය අධික ලෙස බැංකු පද්ධතියෙන් මූල්‍යනය සිදු කිරීම උද්ධමනය ඉහළ නැංවීමට හේතු විය හැකිය. රජය විසින් මහ බැංකුවෙන් ලබාගෙන ඇති විශාල අරමුදල් ප්‍රමාණය සහ ඵලදායීතාවයේ සහ නිෂ්පාදිතයේ කැපී පෙනෙන වර්ධනයකින් තොරව රජය සතු වාණිජ ව්‍යාපාර විසින් බැංකු අංශයෙන් ලබාගෙන ඇති ණය පහසුකම් මගින් වෙළඳපොළ මිල ගණන් මත ඉහළ පීඩන ඇති කරනු ලබයි. එබැවින්, මෙමගින් විශේෂයෙන්ම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කර ඇති අවස්ථාවක මුදල් ප්‍රතිපත්තියේ කාර්යක්ෂමතාවයට බලපෑම් ඇති කරනු ලබයි. මෙම පරිච්ඡේදයේ මීට පෙර සඳහන් කර ඇති මෑත කාලීනව ක්‍රියාත්මක කර ඇති ඇතැම් විසඳුම් රාජ්‍ය අංශය බැංකු පද්ධතිය මත රඳා පැවතීම අඩු කිරීමට හේතු වනු ඇත. මේ අතර, රාජ්‍ය අංශයේ මූල්‍යනය ඉහළ යෑම සහ බැංකු මගින් අධික ලෙස මූල්‍යන ලබා ගැනීමේ අවශ්‍යතාවය අවම කිරීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ගත හැකිය. කාර්යසාධනය මූලික කරගත් රාජ්‍ය අංශයක් තුළින් ඵලදායීතාව ඉහළ නංවමින් මූල්‍ය ශක්‍යතාව වර්ධනය කරන අතර එමගින් එම ආයතන බැංකු මගින් සිදු කරන මූල්‍යනය අඩු කිරීමට හේතු වේ. මේ අතර, දේශීය සාර්ව ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු වීම සහ රටේ පවතින තත්ත්වය වාසිදායක ලෙස යොදා ගනිමින් රජය අනෙකුත් ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ණය හිමියන්ගෙන් අඩු පිරිවැයක් සහිත අරමුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර, එමගින් රජය දේශීය බැංකු පද්ධතිය මත අධික ලෙස රඳා පැවතීම අඩු වනු ඇත. එසේම, විශේෂයෙන්ම රජය වෙත බහුපාර්ශ්වික අරමුදල් නැවත ලැබීමත් සමඟ රජය සතු වාණිජ ව්‍යාපාර සිය මූල්‍යන අවශ්‍යතා සඳහා ආයෝජන සහ ව්‍යාපෘති පදනම් කරගත් වෙනත් මූලාශ්‍ර, එනම් විදේශීය මූල්‍යන වුවද ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. මීට අමතරව, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේද හරහා පාඩු ලබන, එහෙත් උපායමාර්ගික වශයෙන් වැදගත් රජය සතු වාණිජ ව්‍යාපාර ලාභ ලබන ආයතන බවට පත් කිරීම සලකා බැලිය යුතු අතර, එමගින් පෞද්ගලික අංශයේ කළමනාකරණ දැනුම හුවමාරු කර ගැනීමට හැකි වීමෙන් එවැනි රජය සතු වාණිජ ව්‍යාපාරවල ඵලදායීතාව සහ ලාභදායිත්වය ඉහළ නංවනු ඇත. තවද, රාජ්‍ය අංශයේ අනවශ්‍ය නාස්තිය හා දූෂණය අවම කළ යුතු අතර, එම අංශ සඳහා පළපුරුද්ද සහ ප්‍රවීණත්වය සහිත සුදුසුකම්ලත් දක්ෂ නිලධාරීන් පත් කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, දේශීය බැංකු පද්ධතිය මත රාජ්‍ය අංශය අඛණ්ඩව රඳා පැවතීම අවම වනු ඇති අතර එමගින් බැංකු පද්ධතිය තුළ පවතින සීමා සහිත අරමුදල් පෞද්ගලික අංශයේ නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට වැඩි අවකාශයක් සහ අවස්ථාවක් සැලසෙනු ඇත.

**අවිධිමත් ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආහාර සැපයුම් පද්ධතිවල වර්ධනය වන අවදානම්කාරී තත්ත්ව පිළිබඳව වූ මෑත කාලීන අත්දැකීම් මගින්, දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ගැටලු විසඳීම සඳහා සහ රටේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමට මනාව සම්බන්ධීකරණ වූ මෙන්ම ස්ථාවර වූ ප්‍රතිපත්තිමය ප්‍රවේශයක් ස්ථාපිත කිරීම සඳහා රජයේ දැඩි කැපවීමෙහි අවශ්‍යතාව නැවත අවධාරණය කෙරෙයි.** කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පසුගිය දශක කිහිපය තුළ සහනාධාර ලබා දීම, විශේෂයෙන් ම පොහොර සහනාධාරය ලබා දීම, සහතික මිල ගණන් ක්‍රියාත්මක කිරීම, ඉහළ අස්වැන්නක් ලබා දෙන ප්‍රභේද සැපයීම මෙන්ම කෘෂි ව්‍යාප්ති සේවා සැපයීම සඳහා බලයට පත් වූ රජයන් විසින් අඛණ්ඩව සහයෝගය ලබා දුන්න ද, රටේ කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව සැලකිය යුතු අන්දමේ වර්ධනයක් නොපෙන්වන අතර, කෘෂිකාර්මික අංශය දේශගුණික කම්පනයන්ට මෙන්ම මිනිසා විසින් නිර්මාණය කරන කම්පනවලට ද ගොදුරු වීමේ වැඩි ඉඩකඩක් පවතී. කෘෂිකාර්මික අංශය වෙත පොහොර සහනාධාරය ලබා දීම තීරණාත්මක මැදිහත්වීමක් ලෙස පවතින අතර, එය රට තුළ දේශපාලනික වශයෙන් අතිශය සංවේදී කාරණයක් බවට පත්ව ඇති හේතුවෙන්, එවැනි ප්‍රතිපත්තිවලින් ලැබෙන ප්‍රතිඵලය කෙබඳු වුවද එවැනි ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යාමට බලයට පත් වූ ඒ ඒ රජයන් යොමු වී ඇත. ඒ අනුව, රටේ ආනයන වියදම මත වන පීඩනය අවම කර ගනිමින්, අධික ලෙස රසායනික පොහොර භාවිතය වැළැක්වීම සහ කාබනික වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා තිරසාර හා කාර්යක්ෂම පොහොර ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ අවශ්‍යතාව ඉහළ යමින් පවතී. එහෙත්, 2021 වසරේ දී රසායනික පොහොර ආනයනය හදිසියේ තහනම් කිරීම මගින් රටේ ප්‍රධාන ආහාර වර්ග නිෂ්පාදනයට ඇති කළ හානිකර බලපෑම්, 2022 වසරේ දී ආහාර අර්බුදයකට තුඩු දුන් අතර, විදේශ විනිමය ද්‍රවශීලතාවයේ හිඟය මධ්‍යයේ සීමිත ආහාර ආනයනය සමඟ එය තවදුරටත් උග්‍ර විය. කෙසේ වෙතත්, කෘෂිකර්මාන්තය තුළ රසායනික පොහොර භාවිතය ඉවත් කිරීම ක්‍රමානුකූලව සිදු කිරීමේ අවශ්‍යතාව හඳුනාගැනීමත් සමඟ මාස හයක් බලාත්මකව පැවති පොහොර තහනම පසුව ඉවත් කරන ලදී. දැරිය හැකි

මිලකට ආහාර ලබා දීම සහ ආහාර වෙත සැමට ප්‍රවේශයක් ඇති බව සහතික කිරීම සඳහා මිල පාලනය පිළිබඳ ප්‍රතිපත්ති මගින් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ හැකි වුවද, පාර්ශ්වකරුවන් අතර පවතින අඩු සම්බන්ධීකරණය සහ මිල පීඩනය වැළැක්වීම සඳහා ප්‍රමාණවත් ස්වාරක්ෂක තොග නොමැති වීම මෙන්ම ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස ආහාර සැපයුම් පිරිවැය ඉහළ යෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ පැවති ආහාර හිඟය මධ්‍යයේ ශ්‍රී ලංකාවේ ආහාර මිල පීඩනය ලිහිල් කිරීමෙහිලා රජය විසින් ක්‍රියාත්මක කරන ලද මිල පාලනයන්ගේ සාර්ථකත්වය සීමාසහිත විය. 2022 වසරේ අග භාගයේ දී, ගොවීන්ට සහාය වීම සඳහා වැඩි මිලට වී මිලදී ගැනීමට ක්‍රියාත්මක කරන ලද රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන, වී අලෙවි මණ්ඩලයේ ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා දීමට අපොහොසත් විය. තවද, ආනයනික සත්ත්ව ආහාර සීමිත වීමත් සමග, මිනිස් පරිභෝජනය සඳහා පවතින සහල් ප්‍රමාණය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් සත්ත්ව ආහාර නිෂ්පාදනයේ දී වී හෝ සහල් භාවිතය තහනම් කිරීම කුකුළු නිෂ්පාදන අංශයට අහිතකර ප්‍රතිවිපාක ඇති කළේය. රටෙහි ආහාර සුරක්ෂිතතාවයේ ප්‍රධාන අංගයක් වන ආහාරවල ගුණාත්මකභාවයට බලපෑම් ඇති කරමින්, කුකුළු නිෂ්පාදනවල මිල අධික ලෙස ඉහළ යෑමට මෙය කිසියම් දුරකට දායක වන්නට ඇත. මහජනතාවට දැරිය හැකි මිලක් යටතේ කුකුළු මස් ලබා ගැනීමට ඇති හැකියාව සහතික කිරීමට එම නිෂ්පාදන සඳහා රජය විසින් උපරිම මිලක් හඳුන්වා දුන්නද, එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොළ තුළ කුකුළු නිෂ්පාදන හිඟයක් ඇති වූ අතර, එමගින් එම නිෂ්පාදන සුලබතාව පිළිබඳ ගැටලු ඉස්මතු විය. ක්‍රියාත්මක කරන ලද බොහෝ කෘෂිකාර්මික ප්‍රතිපත්ති මගින් අපේක්ෂිත ප්‍රතිඵලයට ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵල ළඟා කර දුන් බව ශ්‍රී ලංකාවේ මෑත කාලීන අත්දැකීම් තුළින් පෙනී යන අතර, එමගින් කෘෂිකාර්මික අංශය තුළ පවතින අවිධිමත් සහ කෘෂිකර්මාන්තයේ එක් අංශයක් පමණක් පිළිබඳව සලකා ගනු ලැබූ ප්‍රතිපත්ති සම්පාදනයේ දුර්වලතා කෙරෙහි අවධානය යොමු කරවයි. ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන්ම ආහාර නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත නොවුවද, ආහාර සුලබතාව, ආහාර සඳහා වන දැරිය හැකි මිල, ආහාර සඳහා ප්‍රවේශය සහ ස්ථායිතාව යන ආහාර සුරක්ෂිතතාවට අදාළ ගැටලු මගින් මෑත දශකවලදී මෙරට දැඩි තර්ජනයකට ලක්වී නොමැත. 2021-2022 කාල සීමාව තුළ ක්‍රියාවට නැංවූ අවිධිමත් ප්‍රතිපත්ති හේතුවෙන්, වී සහ එළවලු නිෂ්පාදනය දිගින් දිගටම පහළ යෑම හමුවේ, ශ්‍රී ලංකාව ආහාර අනාරක්ෂිතතාවකට මුහුණ දුන් අතර, එම තත්ත්වය අද වනවිටත් සුළු පරිමාණයෙන් පවතී. රටේ ආහාර අවශ්‍යතාවයෙහි පවතින ඉහළ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ගොවි ප්‍රජාවන් සමඟ නිසි සහයෝගීතාවෙන් යුතුව කඩිනමින් මෙම ගැටලු සඳහා පිළියම් යෙදිය යුතුය. රජයේ යෝජිත ප්‍රතිපත්ති පිළිබඳව ගොවි ප්‍රජාවන් දැනුම්වත් කළ යුතු අතර, ඔවුන්ට කෘෂිකාර්මික අනුවර්තනයන් පිළිබඳව පුහුණුවක් ලබා දිය යුතුය. ඵලදායී ලෙස සංවර්ධනයට පහසුකම් සැලසීමට සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රය හැඩගැස්වීමෙහිලා කෘෂිකර්මාන්තයට සම්බන්ධ සියලුම රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සහ ගොවීන් අතර සම්බන්ධීකරණයක් සහිතව කෘෂිකාර්මික අංශය සඳහා පරිපූර්ණ සහ තිරසාර උපායමාර්ගයක ඇති අවශ්‍යතාව, කෘෂිකාර්මික අංශයේ මෙම අවදානම් සහගත තත්ත්වය මගින් අවධාරණය කරයි. එවැනි පුළුල් පදනමකින් යුත් ප්‍රතිපත්ති ප්‍රවේශයක් මගින් අඩු කෘෂිකාර්මික ඵලදායිතාව, ඉහළ පසු අස්වනු හානි, ප්‍රශස්ත නොවන කෘෂිකාර්මික පිළිවෙත්, දුර්වල මට්ටමේ අගය එකතු කිරීම, මිල විකෘතිතා සහ කෘෂිකාර්මික නිෂ්පාදනවල දුර්වල අලෙවිකරණය වැනි ගැඹුරට මුල් බැස ගත් ගැටලු විසඳීම ඉලක්ක කර ගත යුතු අතර, එමගින් කෘෂිකාර්මික වටිනාකම් දාමයේ පාර්ශ්වකරුවන්හට ප්‍රමාණවත් ආදායම් මට්ටමක් උත්පාදනය කළ හැකි තිරසාර කෘෂිකාර්මික අංශයක් ගොඩනැගීමට හැකි වන අතර ම, රටේ ආහාර සුරක්ෂිතතාව සහ කාර්යක්ෂම පරිසර පද්ධති කළමනාකරණයක් සහතික කරනු ඇත.

**අර්බුදයෙන් පසුව ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම වේගවත් කිරීම සහ මැදි කාලීනව ආර්ථික වර්ධනයට සහාය සැපයීම සඳහා, දීර්ඝ කාලයක් මුළුල්ලේ ප්‍රමාද වූ වෙළඳපොළ ප්‍රතිසංස්කරණ කඩිනමින් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.** අනම්‍යශීලී ප්‍රතිපත්ති සහ ප්‍රමාණවත් නොවන නීති බලගැන්වීම් සමඟ රටේ ඉඩම් සහ ශ්‍රම වෙළඳපොළ අඛණ්ඩව අභියෝග සහ සීමාකම්වලට මුහුණ දෙන අතර, ඒ හේතුවෙන් ගෝලීය වෙළඳපොළ තුළ නැගී එන යෝග්‍ය අවස්ථා ග්‍රහණය කර ගැනීමට අපොහොසත් වීම මෙන්ම විදේශ රටවලින් ඍජු ආයෝජන ගලා ඒමට ද බාධා එල්ල වී ඇත. ශ්‍රම වෙළඳපොළ තුළ දැනට පවතින නීති සහ රෙගුලාසි සේවකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වඩා ප්‍රමුඛතාවක් දී ඇත. මෙමගින් ශ්‍රම බලකායේ උපයෝජ්‍යතාවය සහ ඵලදායිතාවය යන අංශ දෙක කෙරෙහිම අයහපත් බලපෑමක් ඇති කළ හැකිය. මේ අතර, රාජ්‍ය අංශයේ රැකියා, සේවක දායකත්වය රහිත විශ්‍රාම වැටුප් යෝජනා

ක්‍රමයක් සමඟ ආකර්ෂණීය රැකියා ප්‍රතිලාභ ලබා දෙන අතර, එය වඩාත් ඵලදායී අංශ සහ ක්‍රියාකාරකම් කරා ශ්‍රම බලකාය ප්‍රවේශ වීම අධෛර්යමත් කරයි. තවද, නම්‍යශීලී වැඩ පැය සහ සම්පීඩිත වැඩ පැය ක්‍රම නොමැති වීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ බාධක, කාර්යසාධනය පදනම් කරගත් වැටුප් ක්‍රමයක් නොමැතිකම, ශ්‍රම බලකායේ නිපුණතා පිළිබඳ පවතින ගැටලු යනාදී ශ්‍රම වෙළඳපොළ තුළ අඛණ්ඩව පවතින යාවත්කාලීන නොවීම පිළිබඳ ගැටලු, පසුගිය දශක කිහිපය තුළ රටෙහි සේවා නියුක්තිය සහ ශ්‍රම ඵලදායිතාව කෙරෙහි බොහෝ දුරට අහිතකර ලෙස බලපා ඇත. එබැවින්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය යළි නගාසිටුවීම සඳහා පහසුකම් සැලසීමට, ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රම වෙළඳපොළ නීති සහ රෙගුලාසි යාවත්කාලීන කිරීම සහ සුදුසු පරිදි ලිහිල් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. මෙම රාමුව තුළ, ශ්‍රම වෙළඳපොළ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර අතරට, සේවය අවසන් කිරීමේ පිරිවැය අඩු කිරීම සහ රැකියා අවසන් කිරීම/වෙනස් කිරීම පහසු කිරීම, තාවකාලික රැකියා අවස්ථා ප්‍රවර්ධනය, අවම සහ ව්‍යවස්ථාපිත විශ්‍රාම යන වයස් පිළිබඳ නම්‍යශීලී ප්‍රතිපත්ති හඳුන්වා දීම, විශ්‍රාම යන වයස ආයු අපේක්ෂාව සමඟ ගැළපීම සහ කාන්තා සේවා නියුක්තිය ඉහළ නැංවීම ඇතුළත් වේ. එසේම, කාලීන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සේවා නියුක්තියට අදාළ  නැගී එන අංශ, මෙම රෙගුලාසි වලට ඇතුළත්  විය යුතු අතර, ඒ යටතේ කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා විරැකියා රක්ෂණ යෝජනා ක්‍රම, නම්‍යශීලී වැඩ පැය, ආරක්ෂිත පොදු ප්‍රවාහනය සහ දිවා සුරැකුම්/ළමා රැකවරණ මධ්‍යස්ථාන පිහිටුවීම වැනි අංශ දිරිමත් කළ යුතුය. තවද, අර්බුදකාරී වාතාවරණය මධ්‍යයේ  මානව ප්‍රාග්ධනය අධික ලෙස රටින් පිටවීම පාලනය කිරීමට ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වන අතර, ගෝලීය කුසලතා ආකර්ෂණය කරගැනීමට සහ රටේ ශ්‍රම වෙළඳපොළ තුළ කුසලතා සඳහා පවතින අවස්ථා සම්පූර්ණ කිරීමට, පවතින සංක්‍රමණ නීති සමාලෝචනය කිරීම ඉතා වැදගත් වේ. එසේම, ආර්ථික අර්බුදය හේතුවෙන් අනපේක්ෂිත ලෙස පවුල් ජීවිත වලට  දුෂ්කරතා මෙන්ම සංක්‍රමණික සෞඛ්‍ය ගැටලු නිර්මාණය කළ අභ්‍යන්තර සහ බාහිර ශ්‍රම සංක්‍රමණ ගැටලු පිළිබඳව අවධානය යොමුකළ යුතු වේ. ඉඩම් සම්බන්ධ විවිධ නීති ක්‍රම මගින් නිර්මාණය කරන ලද හිමිකාරීත්වය පිළිබඳ විවිධ මට්ටම්, ඉඩම් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා බහුවිධ ආයතන පැවැතීම, ඉඩම් කළමනාකරණයට අදාළ ආයතන විසින් අනුගමනය කරන නීතිවල වෙනස්කම්, ඉඩම්වල හිමිකාරීත්වය සම්බන්ධ ගැටලු, සහ ව්‍යාපෘති සඳහා ඉඩම් භාවිත කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා දීර්ඝ හා අකාර්යක්ෂම ක්‍රියා පටිපාටි පැවතීම ඇතුළු විවිධ සංකීර්ණතා හේතුවෙන් ඉඩම් වෙළඳපොළ දීර්ඝ කාලයක් තිස්සේ බාධකවලට මුහුණ දෙයි. ප්‍රයෝජනයට නොගත් / ඵලදායි නොවන ලෙස භාවිතා කරන ඉඩම් සහ සංවර්ධනය සඳහා පවතින ඉඩම් කළමණාකරණය කිරීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට විවිධ ආයතනවල කාර්යයන් ඒකාබද්ධකර තනි ආයතනයක් යටතේ මධ්‍යගත ආයතනයක් පිහිටුවීම හා සමගාමීව  ඉඩම්වලට අදාළව නීතිය ක්‍රියාත්මක වීම විධිමත් කිරීම ඉඩම් වෙළඳපොළ පවතින සංකීර්ණතා සරල බවට පත්කිරීමට කිරීමට දායක වනු ඇත. තවද, පැහැදිලි සහ ගැටලු සහගත නොවන ආකාරයට හිමිකාරීත්වය සහතික කරන මධ්‍යගත ඩිජිටල් ඉඩම් තොරතුරු දත්ත සමුදායක් මගින් ඉඩම් දත්ත වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම මගින් ඉඩම් වෙන් කිරීමේ ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාව නිරාකරණය කළ හැකි අතර, එමගින් රට තුළ ආයෝජන සඳහා පහසුකම් සැලසේ. මංගත ඉඩම් ලේඛනයක් ස්ථාපිත කිරීම සඳහා වන රජයේ මුලපිරීම මේ සම්බන්ධයෙන් ගත්කල ප්‍රශංසනීය උත්සාහයක් වන අතර, එමගින්  පහසු, ආරක්ෂිත සහ කාර්යක්ෂම ලෙස ඉඩම් ලියාපදිංචිය සහතික කෙරෙමින්, රජයේ ආයතන, පෞද්ගලික අංශය සහ පොදු මහ ජනතාව ඇතුළු අවශ්‍ය පාර්ශ්ව වෙත ඉඩම් තොරතුරු සහ අදාළ සේවාවන් සඳහා ඉක්මන් ප්‍රවේශයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, රට තුළ ඉඩම් වෙළඳපොළ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති රාමුවක් සංවර්ධනය කිරීම සහ ඉඩම් පරිපාලන පද්ධති ශක්තිමත් කිරීම ද ඉතා වැදගත් වේ. එබැවින්, ශ්‍රම සහ ඉඩම් වෙළඳපොළවල  දීර්ඝ කාලීන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම කඩිනම් කිරීම මගින් සාධක වෙළඳපොළ තුළ සම්පත් වෙන්කිරීම සහ උපයෝගීතා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට හැකි වන අතර, එමගින් රැකියා, ආයෝජන සහ ආර්ථිකයේ සමස්ත වර්ධන වේගය ඉහළ නැංවිය හැකි වනු ඇත.

**ඩිජිටල් ආර්ථිකයක් කරා පරිවර්තනය කිරීමට විශාල ශක්‍යතාවයක් ශ්‍රී ලංකා ආර්ථිකය සතුව ඇති අතර, ඩිජිටල් යුගයේ ප්‍රතිලාභ අත්කරගනිමින් ආර්ථිකයේ අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීමට පහසුකම් සැලසීම සඳහා ගෝලීය ඩිජිටල් ක්ෂේත්‍රයේ සිදුවන වර්ධනයන් වේගයෙන් ග්‍රහණය කර ගැනීම රටට ඉතා වැදගත් වේ. ඩිජිටල් ආර්ථිකයක් යනු ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය**

උපයෝගී කර ගැනෙන තාක්ෂණය මත පදනම් වූ ආර්ථික ක්‍රමයකි. ඩිජිටල් තාක්ෂණය භාවිතයත් සමඟ සම්බන්ධතා ඉහළ නැංවීම සහ විනිවිදභාවය ඉහළ යෑම මගින් කාර්යක්ෂමතාව හා ආර්ථික වර්ධනය සාක්ෂාත් කර ගැනීමට සහාය සැලසීම, මහජනතාවට වඩාත් පහසු ලෙස විවිධ ක්‍රියාකාරකම්හි නියුතුවීමට හැකියාව ලබාදීම, සම්පත් බෙදා හැරීමේ කාර්යක්ෂමතාව ඉහළ යෑම, තත්කාලීන දත්ත ප්‍රවේශය හරහා දත්ත මත පදනම් වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවලට යොමු වීමට හැකිවන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයේ සංවර්ධනය ද වේගවත් වේ. නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව සඳහා නව අපේක්ෂාවන් නිර්මාණය කරමින් බොහෝ ගෝලීය සමාගම් රට තුළ මෙහෙයුම් ආරම්භ කිරීමත් සමඟ, මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ සේවාවල, විද්‍යුත් රාජ්‍ය සේවාවල සහ ඩිජිටල් යටිතල පහසුකම් වල දියුණුව හරහා මූල්‍ය තාක්ෂණයේ ද කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගනිමින්, ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතී. තවද, කොවිඩ්-19 වසංගත සමය තුළ ඩිජිටල් තාක්ෂණය භාවිතය ඉහළ ගිය අතර, බොහෝ ව්‍යාපාර සහ පුද්ගලයින් තම රැකියා සහ සන්නිවේදන කටයුතු සඳහා මංගත ක්‍රමවේද භාවිතයට යොමු වී ඇත. මීට අමතරව, මූල්‍ය තාක්ෂණය මගින් මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කරමින් නව්‍ය මූල්‍ය සේවා සඳහා අවස්ථා උදා කර ඇති අතර, විද්‍යුත් රාජ්‍ය සේවා මගින් පුරවැසියන්හට වඩාත් හොඳින් ඒ හා සම්බන්ධ වීමට මෙන්ම විනිවිදභාවය සහ වගවීම ඉහළ නැංවීමට හැකිව ඇත. මේ අතර, රට පුරා අඩු පහසුකම් සහිත ප්‍රජාවන්ට දැරිය හැකි මිලකට අන්තර්ජාල සම්බන්ධතාව සහ ඩිජිටල් සාක්ෂරතා පුහුණුව ලබා දීම අරමුණු කරගත් විවිධ මුලපිරීම් සමඟ, ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් අන්තර්ගතභාවයෙහි ප්‍රගතිශීලී පරිවර්තනයක් සිදු වී ඇත. රජයේ මුලපිරීමක් වන ඩිජිටල් රජය, ඩිජිටල් ආර්ථිකය සහ ඩිජිටල් සේවා යන ප්‍රධාන අංශ තුනක් මත පදනම් වූ ජාතික ඩිජිටල් පරිවර්තන උපායමාර්ගය (2021-2024 වසර සඳහා) ඩිජිටල් යුගයක් කරා යන ගමනේ ගත් ප්‍රශංසනීය උත්සාහයකි. මේ අතර, 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත බලාත්මක කිරීම සහ 2023 වසර සඳහා වන අයවැයෙන් ප්‍රකාශයට පත් කර ඇති පරිදි දත්ත ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීම සඳහා ගෙන ඇති මූලික ක්‍රියාමාර්ග, ඩිජිටල් පරිවර්තනය සඳහා අත්‍යවශ්‍ය වන මූලිකාංග වේ. ශ්‍රී ලංකාව ආර්ථිකය ඩිජිටල්කරණය කිරීමෙහිලා ප්‍රගතියක් අත්කරගෙන තිබුණ ද, රටේ ඩිජිටල් පරිවර්තනය ශ්‍රී ලංකාව හා සමාන ආර්ථිකයන්ට සාපේක්ෂව තවමත් සංවර්ධනය අතින් මුල් අවධියක පවතින බව පිළිබිඹු කරමින්, අන්තර්ජාලයෙහි දැරිය හැකි මිල, අන්තර්ජාල ගුණාත්මකභාවය, විද්‍යුත් රජය, විද්‍යුත් ආරක්ෂාව සහ විද්‍යුත් වාණිජ්‍යය ඇතුළු විවිධ නිර්ණායක මත පදනම් කරගෙන නිර්ණය කරන ඩිජිටල් ජීවන තත්ත්ව (Digital Quality of Life) දර්ශකය අනුව 2022 වසරේ දී රටවල් 117ක් අතරින් ශ්‍රී ලංකාව 89 වැනි ස්ථානයෙහි පසුවේ. ඩිජිටල්කරණයෙහි වර්ධනයක් අත් කරගැනීම සඳහා තවදුරටත් අභියෝග රාශියක් ජයගත යුතුව පවතින අතර, බොහෝ ක්ෂේත්‍ර තුළ තවදුරටත් ඩිජිටල් තාක්ෂණය වැඩිදියුණු කිරීම් සඳහා සැලකිය යුතු ඉඩකඩක් පවතී. ඒ අනුව, ඩිජිටල් යටිතල පහසුකම්වල ආයෝජනයට, ඩිජිටල්කරණය මගින් ඇතිවන විෂමතා මගහරවා ගැනීම සඳහා ඩිජිටල් සාක්ෂරතාවය සහ කුසලතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට මෙන්ම නවෝත්පාදන, තාක්ෂණ භුවමාරුව සහ විදේශ ආයෝජන දිරිමත් කිරීමට සහාය දක්වන නියාමන පරිසරයක් නිර්මාණය කිරීමට අදාළව සිය ප්‍රයත්නයන් වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකාව උත්සාහ ගත යුතුය. ආර්ථිකයේ මානව ප්‍රාග්ධනයෙහි ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වැඩි ඉඩප්‍රස්ථා නිර්මාණය කරන අතර ම, සමාජ ආරක්ෂණ ජාල මගින් පුද්ගලයන් ඉලක්ක කිරීමෙහි පවතින දුර්වලතා, බදු පරිපාලනයේ සහ අධීක්ෂණයේ පවතින අභියෝග, සැපයුම් දාමවල ඇති අකාර්යක්ෂමතාව, අලෙවිකරණය සඳහා ඇති බාධා, සහ රාජ්‍ය අංශය තුළ පවතින සම්බන්ධීකරණ හා විනිවිදභාවය පිළිබඳ ගැටලු වැනි ආර්ථිකයේ ව්‍යුහාත්මක අවහිරතා මගහරවා ගැනීමට ඩිජිටල්කරණය මගින් ශ්‍රී ලංකාවට හැකියාව ලැබේ. තවද, ඩිජිටල්කරණය මගින් ගෝලීය වටිනාකම් දාමයන් වෙත ප්‍රවේශවීම ඉහළ නංවාලමින් ඒ හා ඒකාබද්ධ වීමට පහසුකම් සපයන අතර, අවසානයේ දී වෙළඳපොළ අවස්ථා අත්පත් කර ගැනීමට සහ ඉදිරි කාලය තුළ ආර්ථිකය යථා තත්ත්වයට ගෙනයාමට රටට ඇති හැකියාව වර්ධනය කරනු ඇත. රජය විසින් ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලිය මෙහෙයවනු ලැබුව ද ඩිජිටල් සංවර්ධනයේ දී පෞද්ගලික අංශයට සැලකිය යුතු වගකීමක් පැවරෙනු ඇත. තාක්ෂණයේ වෙනස්වීම්වලට සමගාමීව සමාජය තුළ පුළුල් ලෙස පැතිරී ඇති ඩිජිටල් භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ මට්ටමින් පවතින ඩිජිටල්කරණයෙහි විෂමතා අවම කිරීම අරමුණු කරගත් ආයෝජන, නවෝත්පාදන, තාක්ෂණ භුවමාරු සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය මෙයට ඇතුළත් වේ. ඒ අනුව, ආරක්ෂිත හා විශ්වාසදායක ඩිජිටල් පද්ධති සංවර්ධනයක් සඳහා වැදගත් වන රජය, නියාමනය සිදු කරන පාර්ශ්ව, නීති අධිකාරීන් සහ පෞද්ගලික අංශය ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්

අතර ක්‍රියාකාරී සහයෝගීතාවයෙන් යුතු බහුවිධ මෙන්ම මනා සම්බන්ධීකරණයක් සහිත, ස්ථාවර ප්‍රතිපත්තිමය ප්‍රවේශයක් මගින් වර්තමානයේ ඩිජිටල්කරණයෙහි විෂමතා අවම කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් ආර්ථිකයේ ක්‍රියාකාරකම්හි අනෙකුත් අංශයන් වෙත ධනාත්මක බලපෑම් ඇති කරනු ඇත. එසේම, සයිබර් ආරක්ෂාව සඳහා අදාළ නීති බලගැන්වීම ද අවශ්‍ය වන අතර, ඉන් පුළුල් මූල්‍ය පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා සුදුසු නීති සහ නියාමනයන් සකස් කිරීමට ද සහාය සැලසේ.

**ආර්ථික අර්බුදයෙන් නැගී සිටීම සඳහා දැඩි උත්සාහයෙන් යුතුව කටයුතු කිරීම සහ ආර්ථික ස්ථායිතාව හා වර්ධනය සඳහා උපාය මාර්ග සකස් කිරීම අත්‍යවශ්‍ය වන නමුත්, තිරසාර වර්ධනයක් සහතික කිරීමට පරිසරය සංරක්ෂණය ද අත්‍යවශ්‍ය වේ.** වන විනාශය, අලි මිනිස් ගැටුම, නීතිවිරෝධී පතල් කැණීම්, අසංවිධිත කසළ බැහැර කිරීම, කාබන් විමෝචනය, වනජීවී හා කාලගුණික විපර්යාස හේතුවෙන් සිදු වන භෝග හානි වැනි දිගුකාලීන පාරිසරික ගැටලු හේතුවෙන් නොයෙක් සමාජ-ආර්ථික බලපෑම් ඇති කෙරෙයි. ශ්‍රී ලංකාවේ පාරිසරික උෂ්ණත්වයෙහි සැලකිය යුතු ඉහළ යෑමක් මෙන්ම මෑත දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ෂාපතනය සහ එක දිගට පවතින වියළි දින ගණන ද ඉහළ ගොස් ඇති බව සාක්ෂි මගින් පෙන්නුම් කෙරේ. ජාත්‍යන්තර අධ්‍යයනයන් කිහිපයක් ද ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස සඳහා වඩාත් ම අවදානමට ලක්විය හැකි රටක් ලෙස හඳුනාගෙන ඇත. ගංවතුර, නියඟ, අක්‍රමවත් වර්ෂාපතන රටා, තාප තරංග, නාය යෑම් සහ පළිබෝධ පැතිරීම් වැනි දේශගුණය ආශ්‍රිත ගැටලුවලින් පසුගිය දශක දෙක තුළ ආර්ථිකය සැලකිය යුතු ලෙස පීඩාවට පත්ව ඇත. අපනයන ආදායම් උපයන අතර ම, රටෙහි පුරවැසියන්ගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සඳහා ද වැදගත් ප්‍රභවයක් වන මත්ස්‍ය සම්පතේ සුලබතාව සඳහා ඉහළ යන උෂ්ණත්වය සහ සාගර ආම්ලිකතාවය අහිතකර බලපෑම් ඇති කරයි. ආහාර සැපයුම අහිමි වීමේ ප්‍රතිඵලයක් ලෙස උද්ධමනය, ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ සුබසාධනය පහළ යෑම, ආහාර ආනයනය කිරීම සඳහා සීමිතව පවතින විදේශ විනිමය වැය කිරීමට සිදු වීම, සහ කෘෂිකාර්මික නිෂ්පාදනවලින් ලැබෙන අපනයන ආදායම අහිමි වීම සිදු වේ. ශ්‍රී ලංකාව, බලශක්තිය සඳහා ජල විදුලිය මත බොහෝ දුරට යැපීම (2022 වසරේ දී සියයට 33.7) සහ වැසි රටාවන්හි මෑතක දී සිදු වූ වෙනස්කම් සලකා බලන විට, දේශගුණික විපර්යාස මගින් බලශක්ති උත්පාදනය කෙරෙහි එල්ල කළ හැකි බලපෑම් ප්‍රබල වී ඇත. ශ්‍රී ලංකාවේ අඛණ්ඩව පවතින විදේශ විනිමය හිඟය සහ බලශක්ති අනාරක්ෂිතාව ගැන සලකා බැලීමේ දී, ගෝලීය තෙල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම මගින් මෙම ගැටලුව තවත් උග්‍ර කරවයි. තවද, විදේශ මුදල් හිඟය හේතුවෙන් විදුලිය නිපදවීමට ද්‍රව ඉන්ධනවල දායකත්වය ඉහළ නැංවීමට නොහැකි වීම නිසා වාර්ෂිකව බලශක්ති උත්පාදනය සඳහා ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 2කට අධික ප්‍රමාණයක් ආනයනය කෙරේ. අවාසනාවකට මෙන්, ශ්‍රී ලංකා ආර්ථිකය විශාල ලෙස යැපෙන කර්මාන්තයක් වන සංචාරක ව්‍යාපාරයට, අහිතකර දේශගුණය, ස්වභාවික විපත් සහ පරිසර දූෂණය සෘණාත්මක බලපෑමක් ඇති කරයි. රජය සහ මහ බැංකුව විසින් මෑතක සිට පරිසර සංරක්ෂණ ව්‍යාපාරයට සහයෝගය දැක්වීමටත්, ආර්ථික ක්‍රියාකාරකම්වලින් පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමටත්, පරිසර සංරක්ෂණයට සහාය ලබා දෙන ක්‍රියාකාරකම් සඳහා අරමුදල් ප්‍රවාහ යොමු කිරීමටත් පියවර කිහිපයක් ගන්නා ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව තිරසාර මූල්‍ය පෙර දැක්මක් සහ ඒ සම්බන්ධ වර්ගීකරණයක් (taxonomy) නිර්මාණය කිරීමට ලෝක බැංකුවේ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (International Finance Corporation) සමඟ එක්ව කටයුතු කළේය. එමෙන්ම, දේශගුණ සෞභාග්‍යය පිළිබඳ සැලැස්මක් මෑතක දී දියත් කරන ලදී. පාරිසරිකව මතු විය හැකි ගැටලුවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට අවශ්‍ය ආයෝජන සිදු කිරීම සඳහා රටේ ආර්ථිකමය ශක්තිමත්භාවය ඉහළ නැංවීම ද අවශ්‍ය වේ. හඳුනාගත් අධිකාරියක් විසින් මහජනතාව වෙත දේශගුණය, වායුගෝලීය උණුසුම, වන ආවරණය, වන සත්ත්ව ගහන, ඛනිජ සම්පත්, පරිසර දූෂණය යනාදී පරිසරයේ සියලු අංශ ආවරණය වන පරිදි පරිසරය පිළිබඳ පරිපූර්ණ සහ මධ්‍යගත වාර්තා ඉදිරිපත් කිරීමක් කලින් කලට කළ යුතුය. එමගින්, පාරිසරික ගැටලු පිළිබඳව ජනතාව අතර දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීමට සහ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සාර්ථක ලෙස සම්බන්ධීකරණය කිරීමට හැකි වේ. පුනර්ජනනීය බලශක්තිය, ජල කළමනාකරණය සහ කසළ කළමනාකරණය වැනි ක්ෂේත්‍ර කිහිපයක් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරන පරිසර හිතකාමී ව්‍යාපෘති සහ පරිසර සංරක්ෂණයට අදාළ ව්‍යාපෘති සඳහා විදේශ ආයෝජන සහ ප්‍රදාන ආකර්ෂණය කර ගත යුතුය. තිරසාර සහ සියලුදෙනා හට ප්‍රතිලාභ සලසන වර්ධනයක් උදෙසා, හරිත සහ නීල ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමට දේශීය මූල්‍ය ආයතන දිරිමත් කළ යුතුය. පාරිසරික ආරක්ෂාව පිළිබඳ නිසි සැලකිල්ලකින් යුතුව කටයුතු

කරන බව පිළිබිඹු කිරීමෙන්, බහුපාර්ශ්වික, ද්විපාර්ශ්වික සහ වගකිවයුතු පෞද්ගලික අංශයේ ආධාර සපයන්නන්ගෙන් සහනදායී මූල්‍ය විකල්ප කිහිපයක් ලබා ගැනීමට ඉඩ සැලසෙනු ඇති අතර, එය රටෙහි ණය තිරසාරභාවය යළි ඇති කිරීමට වර්තමානයේ ගනු ලබන ප්‍රයත්නයට උපකාරයක් වනු ඇත. දිගු කාලීනව පාරිසරික වගවීම ඉහළ නැංවීම සඳහා, සිදුවන පාරිසරික හානිය සඳහා ගැළපුම් සිදු කරමින් ද.දේ.නි. ගණනය කිරීමෙන් ලබා ගන්නා 'හරිත දළ දේශීය නිෂ්පාදිතයක්' වැනි නව්‍ය පියවර යොදා ගත යුතුය.

දැනට සිදු කෙරෙමින් පවතින ණය ප්‍රතිව්‍යුහගතකරණ ප්‍රයත්නයන්ගෙන් ප්‍රතිලාභ ලබන අතරම, **ආර්ථිකයේ ප්‍රධාන ක්ෂේත්‍රවල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කඩිනමින් සිදුකිරීම මත ආර්ථික වර්ධනයේ තිරසාරභාවය රඳා පවතී.** ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු රටක ආර්ථික වර්ධනය කෙරෙහි මිශ්‍ර බලපෑම් ඇතිකළ හැකි බව ඒ පිළිබඳව විශ්ලේෂණය කිරීමේ දී පෙනී යයි. ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය මගින් ඇති විය හැකි ආයෝජක සහ ව්‍යාපාරික විශ්වාසය පලුදු වීම, වාණිජ ණය සඳහා ප්‍රවේශය අඩුකම, ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම හා සම්බන්ධ ණය පිරිවැය ඉහළ යෑම සහ රජයේ වියදම් අඩු කිරීම වැනි සාධක ආර්ථික වර්ධනයට ඍණාත්මකව බලපෑ හැකිය. කෙසේ වෙතත්, ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට ධනාත්මක ලෙස බලපෑ හැකි මැදි කාලීනව රජයේ ණය ගැනීම් අඩු කිරීමට සහ පුද්ගලික අංශයේ ආයෝජන සඳහා ණය ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීමට ණය ප්‍රතිව්‍යුහගතකරණය සහාය විය හැකිය. ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් අනතුරුව වුව ද, පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ කාල සීමාව තුළ රටක ණය ආපසු ගෙවීමට ඇති හැකියාව සඳහා ආර්ථිකය වර්ධනය වීම ප්‍රධාන සාධකයක් ලෙස පවතියි. රටක් තම ආර්ථික වර්ධනය යථා තත්ත්වයට පත් කිරීමට අසමත් වූ විට, පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ කාල සීමාව තුළදී පෙර පරිදි රාජ්‍ය ණයවල තිරසාරභාවය පවත්වාගත නොහැකි වීම වැනි ගැටලුවලට ලක් නොවී ණය ප්‍රතිව්‍යුහගතකරණයේ ප්‍රතිලාභ පවත්වා ගැනීම මෙන්ම ණය වගකීම් සපුරාලීම වඩාත් දුෂ්කර විය හැකිය. පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ කාල සීමාව තුළ රටක ආර්ථික ක්‍රියාකාරිත්වය සාධක කිහිපයක් හේතුවෙන් එහි විභව මට්ටමට වඩා පහතට වැටිය හැකිය. එම සාධක අතර, විදේශීය හෝ දේශීය ආර්ථික වර්ධනයට ඇති බාධා හේතුවෙන් ඇතිවිය හැකි අහිතකර ආර්ථික තත්ත්ව, ණය හිමියන් සමඟ ගිවිසුම්වලට එළඹීම හෝ ප්‍රතිව්‍යුහගතකරණය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ඇති අභියෝග, විශේෂයෙන් ම අපේක්ෂිත ආර්ථික වර්ධනයක් ලබාගැනීමට අපොහොසත් වන ප්‍රමාණවත් නොවන ප්‍රතිපත්තිමය පියවර මෙන්ම, ණය අර්බුදයක දී ඉහළ මට්ටමක පැවතිය හැකි දේශපාලන අස්ථාවරත්වය, සහ එමගින් ඇතිවන ආයෝජක විශ්වාසය අඩපණ වීම ඇතුළත් වේ. ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගතකරණයකින් පසු ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාවට නංවා විවිධ මට්ටමින් සාර්ථක වූ රටවල් පිළිබඳ උදාහරණ කිහිපයක් ඇත. 2010 වසරේ දී අයර්ලන්ත රජය විසින් සිය ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමෙන් පසු ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා බදු අඩු කිරීම්, රජයේ වියදම් වැඩි කිරීම සහ තරගකාරිත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇතුළුව ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රාශියක් ක්‍රියාවට නංවන ලදී. මෙම ප්‍රතිසංස්කරණ, ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සහ තාක්ෂණික අංශයේ ඇති වූ පිබිදීම සමඟ, ඉල්ලුම ඉහළ නැංවීමට සහ ආර්ථික වර්ධනයට උපකාරී විය. තවත් උදාහරණයක් ලෙස ඉක්වදෝරය විසින් රජයේ වියදම් වැඩි කිරීම, යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම සහ ඉලක්කගත සමාජ වියදම් වැඩසටහන් ඇතුළුව ආර්ථික වර්ධනය ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාවට නැංවීම සඳහන් කළ හැකිය. මෑත වසරවල දී රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීමේ අභියෝගවලට මුහුණ පෑමට මෙම රටට සිදු වුවත් ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු ඉල්ලුම වර්ධනය කිරීමට සහ ආර්ථික වර්ධනයට සහාය වීමට මෙම ක්‍රියාමාර්ග උපකාරී විය. ආර්ථික, දේශපාලනික සහ සමාජීය අභියෝග රැසකට මුහුණ දී සිටි අවස්ථාවල දී, ශ්‍රී ලංකාව පසුබෑම්වලින් යථා තත්ත්වයට පත් වීමට විශිෂ්ඨ හැකියාවක් ඇති බව පෙන්නුම් කර ඇත. මෙම ඔරොත්තු දීමේ හැකියාව සඳහා රටේ ශක්තිමත් සංස්කෘතික හා සමාජ ව්‍යුහය මෙන්ම එහි උගත් සහ කුසලතා ඇති ශ්‍රම බලකාය ද හේතු වේ. ශ්‍රී ලංකාවේ ඔරොත්තු දීමේ හැකියාව එහි ජනතාවගේ සහ ආයතනවල ශක්තිය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ සාක්ෂියක් වන අතර, එමගින් ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් අනතුරුව අනාගත ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සඳහා ශක්තිමත් පදනමක් සපයනු ලැබේ. කෙසේ වෙතත්, ආර්ථික වර්ධනය ඉක්මනින් යථා තත්ත්වයට පත් කිරීමේ දී අභියෝග කිහිපයක් පවතියි. පළමුව, තෝරාගත් ණය සේවාකරණ පරාසයක් තාවකාලිකව අත්හිටුවීම

මෙන්ම ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ නිරත වීමේ පළමු අත්දැකීමට ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටියි. ණය ප්‍රතිව්‍යුහගතකරණය සූක්ෂමව සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී මෙන්ම යථා තත්ත්වයට පත් වීම සඳහා පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ උපාය මාර්ග කාලෝචිත ලෙස සකස් කිරීමේ දී අත්දැකීම් නොමැතිවීම මගින් එම ක්‍රියාවලිය දුර්වල විය හැකිය. තවද, වෙනත් බොහෝ රටවල් මෙන් නොව, ශ්‍රී ලංකාවේ තත්ත්වය වඩාත් සංකීර්ණ වේ. ගෙවුම් තුලන අර්බුදය, උද්ධමනය ඉහළ යෑම, ශ්‍රී ලංකා රුපියල කැපී පෙනෙන ලෙස දුර්වල වීම, සමාජ නොසන්සුන්තාවය හා දේශපාලනික අර්බුදය ඇතුළු වෙනත් අස්ථාවර තත්ත්ව හා දුෂ්කරතා සමඟ තිරසාර නොවන රාජ්‍ය ණය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ගනු ලැබූ පූර්ව ණය සේවාකරණ අත්හිටුවීමේ ක්‍රියාමාර්ගය බැඳී පවතියි. මෙම බහුවිධ අර්බුදය විසඳීම සඳහා දැනටමත් ගෙන ඇති සහ අපේක්ෂිත ක්‍රියාමාර්ග ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කර නොමැති අතර සාර්ව ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. එබැවින්, ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ ප්‍රගතියට සමගාමීව, විදේශීය හා දේශීය පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව ආර්ථික වර්ධනය වැඩිදියුණු කිරීමේ දැක්මක් රජය විසින් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. ජා.මූ. අරමුදලේ සහ අනෙකුත් බහුපාර්ශ්වික නියෝජිතායතනවල මූල්‍යාධාර ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නැවත විශ්වාසය ඇති කර ගැනීම සඳහා ශක්තිමත් පදනමක් ගොඩනැගීමට උපකාරී වනු ඇත. රාජ්‍ය අංශයේ සහ රජය සතු ව්‍යවසායයන්හි ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිව්‍යුහගතකරණ එම අංශයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට උපකාරී වන අතරම වක්‍ර ලෙස පුද්ගලික අංශය සඳහා ද සහාය වනු ඇත. දූෂණය වැළැක්වීම සහ නීතිය හා සාමය පිළිපැදීම වර්ධනය කිරීම ද අත්‍යවශ්‍ය වන අතර, ඒ සඳහා වන ඉල්ලුම සමස්ත සමාජයෙන් ම ඇති විය යුතුය. එමගින් නිසැකවම ව්‍යාපාර සිදු කර ගෙන යෑමේ පරිසරය වැඩි දියුණු වීම තුළින් ආයෝජන කලාපයක් ලෙස රටේ ආකර්ෂණය වැඩි වනු ඇත. කෘෂිකර්මාන්තය, කර්මාන්ත, ජාත්‍යන්තර වෙළඳාම සහ ආයෝජන ප්‍රතිපත්ති වැනි ප්‍රධාන ක්ෂේත්‍රවල ජාතික ප්‍රතිපත්ති සැකසීම මෙන්ම ඒවා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තුළින් ආර්ථික වර්ධනය ඉහළ නංවනු ඇත. ණය ප්‍රතිව්‍යුහගතකරණය මගින් ශ්‍රී ලංකා ආර්ථිකය නැවත ස්ථායීතාවයට පත්වීමට අවශ්‍ය අවකාශය නිර්මාණය කෙරෙන බව නොඅනුමානය. කෙසේ වෙතත්, මෙම අවකාශය තිරසාරව පවත්වා ගනිමින් ආර්ථික විභවය කරා ළඟාවීම මගින් මෙම ඉතිහාසගත මොහොතේ පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීමට දොරගුළු විවර කෙරෙණු ඇත.

**මෙම පසුබිම තුළ, වසර ගණනාවක් තිස්සේ ඉස්මතු කරන ලද සමහර ගැටලු විසඳීම සඳහා දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග අගය කරන අතර ම, ක්‍රමානුකූල හා තිරසාර ලෙස ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් කර ගැනීමට, අනෙකුත් දිගුකාලීන ව්‍යුහාත්මක ගැටලු විසඳීම පිණිස උපායමාර්ග සැකසීමට රජය, අදාළ බලධාරීන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් සාමූහික උත්සහයක් දැරිය යුතුය.** ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දක්වන වැඩසටහනකින් පමණක් මේ අවස්ථාවෙහි රට මුහුණ පාමින් සිටින සියලු ගැටලු විසඳිය නොහැකි බව ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ වෙනුවට, සියලු පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම මගින් කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක කෙරෙන වැරදි පියවර නිවැරදි කිරීමට සහ ඒවාට පිළියම් යෙදීමට රටක් ලෙස මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගත යුතු අතර, එමගින් එවැනි සහාය ලබා ගැනීමේ වැඩසටහන් නැවත නැවතත් අවශ්‍ය වීම වළක්වා ගත හැකිය. එබැවින්, අවශ්‍ය රාජ්‍ය මූල්‍ය හා රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ ප්‍රතිසංස්කරණ සිදු කිරීම, රටේ වර්ධන විභවය වැඩිදියුණු කිරීම, විදේශ සංචිත නැවත ගොඩනංවා ගනිමින් මිල සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව සහතික කිරීම, රාජ්‍ය ණය තිරසාරත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ වඩාත් වැදගත් කරුණක් ලෙස දූෂණය අවම කිරීම හා සුදුසු සමාජ ආරක්ෂණ ජාල යෝජනා ක්‍රම හරහා අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට සහාය වීම ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සියලුම පාර්ශ්වකරුවන් විසින් දැඩි නොපසුබට උත්සාහයක් යෙදීම අවශ්‍යය. මෙම ක්‍රියාවලියේ දී, රටට වඩාත් සුදුසු දේ පිළිබඳව දැනුම්වත්ව සිටීමටත්, කෙටිකාලීන දේශපාලන වාසි උදෙසා ඉහත සඳහන් කළ ප්‍රතිසංස්කරණ වැඩසටහන් ක්‍රියාත්මක නොකර සිටීමට උත්සාහ ගන්නේ නම් එය වළක්වාලීමටත්, මහජනතාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් වග බලා ගත යුතුය. මෙමගින් රටේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කරමින් තිරසාර ආර්ථික වර්ධන මාවතේ ස්ථාවර ප්‍රගතියක් ලබා ගැනීම සහතික කෙරෙනු ඇත.